# කුසජාතක විවරණය

(ප්‍රථම භාගය)

මුනිදස කුමාරණතුංග

විසිනි

ප්‍රකාශකයෝ :-

ජේ. ඩී. ප්‍රනාන්දු

කොළඹ ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයේ මුද්‍රිතයි

2475

# සංඥාපනය

කුස ජාතක කාව්‍යය අලගියවන්න මුකවෙටි තුමන් ගේ කෘතියෙකි. ඔහු පළමු වන රාජසිංහ නරපතින් ගේ සමයයෙහි ප්‍රසිද්ධියට පැමිණීය හ. ධර්මධ්වජ නම් පණ්ඩිතයාණන්ට පුත් වූ හ. දෙ වැනි රාජසිංහ රජුන් ගේ කාලයෙහි දු ඔහු වැජැඹුණ හ. ඒ කාලයෙහි නාමශෙෂ වූ හ යි සිතියැ හැකි.

තමන් උපන් ගම කිස්වැල්ල නමැ යි කවීහු මැ කියති. සියනෑ කෝරළයෙහි කිස්සැල්ල නම් ගමෙක් දැනුදු වෙයි. කිස්වැල්ල නම් එ මැ යැ යනු නතු දතුවන් ගේ පිළිගැනීම යැ.

රාජසිංහ සමය යුද්ධ කොලාහලාදියෙන් නිරන්තර වූයෙන් රටෙහි ශාස්ත්‍ර ඥානය ඉතා පහත් වැ පැවැතිණ. එ හෙයින් අලගියවන්න මුකවෙටි තුමන් ගේ දැනුම අසාර සේ පෙනී යැම කාලානුරූප වෙයි. පාලි සංස්කෘත භාෂාවන් මනා සේ උගන්නට ඉඩෙක් එ කලැ නො ලැබිණ. කොතරම් තියුණු වූ නුවණකට ද ගොදුරු බිම් වැ පැවැත්තේ සිංහල පොත් කිහිපය පමණෙකි. ලිපි දෙසින් ගහණ වූ ඒ පොත් මැ ඉගෙනැ ව්‍යාකරණය තමන් විසින් මැ නිපැදවියැ යුතු වැ තුබූ කාලයෙකැ මෙ බඳු කෘතියෙකින් වත් රටට සඞ්ග්‍රහ කිරීම සැබැවින් මැ ප්‍රශංසාහි යැ.

බෞද්ධ වැ උපන්, වැඩුණු, හික්මුණු, හික්මැවූ අලගිය වන්න මුකවෙටි තුමෝ මැතෙකැ දී පරංගින් ගේ සමවායයට පැමිණැ කිතු සමය වැලැඳැ ගත් හ. තතඵල වශයෙන් 'දොන් ජෝරෝනිමෝ' යන්න ද ඔවුන් ගේ නමට එක් වියැ. එ කලැ ඔවුන් අතින් 'මහ හටන' නම් කාව්‍යය කැරුණේ යැ. යළි දු බුදු සමයට පෙරළිණු මොවුන් 'පරංගි හටන' නම් කාව්‍යය කළ හ යි යෙති. අවසාන ශයනයෙහි හෙවැ ඔවුන් කී හ යි මුව පරපුරෙ එන "කාත් නැතැ යි නො සිතන්නැ" යනාදි පද්‍යයෙන් හැගෙනුයේ ඔවුන් එ කලැ බෞද්ධයකු වැ සිටි බව යි.

අලගියවන්නයන් ගේ කෘති කිහිපයෙකි. මේ කාව්‍යය ද සුභාෂිතය, සැවුල් අස්න, දහම් සොඬ ද කව යන තුන ද මුද්‍රිත වැ තිබේ. නිති සාරය, මහ හටන, පරංගි හටන, මුනි ගුණ රතන මාලය, දුසිල වත, ශෘඞ්ගාරය යන පොත් මුද්‍රිත නුවූයේ යැ. දහම් සොඬ ද කව මොවුන් පියන් ගේ කෘතියෙකැ යන මතයෙක් ද වෙයි.

**කථා ශරීරය**

මේ කාව්‍යයෙන් කියැවෙනුයේ ඉතා ප්‍රසිද්ධ ජාතක කථාවෙකි. මේ කථාව සිංහල පද්‍යයට නැගුණු ප්‍රථම වාරය මේ නො වේ. දෙ වැනි පැරකුම්බා මහ රජාණෝ මේ ජාතක කථාව ශරීර කොට ගෙනැ පරම රමණීය වූ මහා කාව්‍යයක් සිංහලයෙන් කළ හ. 'කුස ද' 'කව් සිළු මිණ' යන නාමයන් ගෙන් ඒ දුනුදු සහෘදය හෘදයානන්දකර වැ පවති. අලගියවන්නයන් වැන්නාන් ගේ බැඳුම්හි ද කව් සිළු මිණ් බැඳුම් හි ද අතර මහත් වෙනසෙකි. එහි කතීෘන් ගේ කවිත්වයට සාක්ෂ්‍යයක් හෝ මෙහි කතීෘන් ගේ අකවිත්වයට සාක්ෂ්‍යයක් හෝ සොයා ගැන්ම අතිදුෂ්කර යැ. එ සේ කලැ එ සා මහත් ශ්‍රෙෂ්ඨ කාව්‍යයක් තිබියැ දී එහි මැ කථා ශරීරය ගෙනැ අලගියවන්නයෝ කවර හෙයින් නව කාව්‍යයක් කළෝ ද? ඒ, භාෂා ඥානය ඉතා පහත් වැ පැවැති කාලයෙකි. කව් සිළු මිණ කියවා තේරුම් ගැනීමට සමත් වූවාහු එ කලැ දුනට ද වඩා දුලීභ වූ හ. අලගියවන්නයනට ද එහි තේරුණු තැනට වඩා නො තේරුණු තැන් මැ බොහෝ වූ බව සිතියැ හැකි යැ. අන්‍යයන් ගැනැ කවර කථා ද? කරුණු එ සේ පැවැති හෙයින් කව් සිළු මිණින් රස මිරිකන්නට අපොහොසත් වූ එ කලැ සිංහලයනට කුස ජාතකය කාව්‍ය ආකාරයෙන් දැක්වීම සුදුසු බව අලගියවන්නයනට වැටැහිණි. අයුක්ත මැ නො වේ.

**කාව්‍ය තත්ත්වය**

මේ මහා කාව්‍යයෙකැ යි ඇතැමෙක් ගන්ති. අලඞ්කාර ශාස්ත්‍රාගත පරිදි නම් මේ මහා කාව්‍යයෙක් නො වේ. මහා කාව්‍යත්වය තිබී යේ වා සාමාන්‍ය කාව්‍යත්වයට නැගීමට ද මෙහි පැනෙන සුදුසු කම් ඉතා අල්ප යැ. සගී යැ යි ඇතැමුන් විසින් මෙහි ලා කරන ලද බෙදීම මහත් විහිළුවෙකි. සෙස්ස තිබියැ දී යටත් පිරිසෙයින් සගීාන්තයෙහි ව්‍යාකඝාන්තයක්

වියැ යුතු යැ. එ හෙත් මේ කාව්‍යය සඟී කොට බෙදන්නන් අට වැනි සඟ කෙළවර කරනු සැපි බැලූව මැනැවි.

"දුරැරැ දළ ලොබ සි                    ත
මෙ ළද නෙත් මට කම් නැ               ත
මෙ අප මවු පිය වෙ                    ත
යමැ යි සලකත මෙ අප බෝ ස           ත"

මෙහි ලා සඟී විභාගය හාස්‍ය ජනක බවට අනෙක් සාක්‍ෂ්‍යයක් නුවූව මනා යැ.

කුස ජාතකය අර්ථ ගෞරවයෙන් හෝ පද ලාලිත්‍යයෙන් හෝ රමණීයත්වයක් නො උසුලයි. එ සේ නම් සාමාන්‍යයන් අතරැ මෙය මෙ තරම් සම්භාවිත වීමට හෙතු කිම? අකවිත්වය මැ කවිත්වය සේ ගැනෙන මේ කාලයෙහි එළි සම වූ කිමෙක් නම් කවෙක් නො වේ ද? දුන් කව් ලෙස ගැනෙන දෑ සැබැවින් මැ කව් වත් හොත්, අළගියවන්නයන් ගේ බැඳුම් අග්‍ර ස්ථානයෙහි ලා ගිණීම කිසි සේත් වරදෙක් නො වේ.

අළගියවන්නයන් ගේ ඉතා මහත් වරද නම්, පාද පූරණය සඳහා මැ ඇඳූ හෙළු, නිරර්ථක වූ, ඇතැම් තන්හි විරුද්ධාර්ථ ද වූ, විශෙෂණයන් ගෙන් සව පද්‍යයන් දූෂණය කිරීම යි. 90 වන පද්‍යයෙහි හය රළට කළ විශෙෂණ කෙ සේ නම් ගැළැපේ ද? 314 වන පද්‍යයෙහි විරූප වූ කුස රජු ලවා තමා මැ 'සොබමන්' බව කියැවීම කො තරම් අපරාධයෙක් ද?

ඇතැම් තන්හි ව්‍යාකරණ රීතීනට ඉදුරා විරුද්ධ වැ ගිය සේ ද පෙනෙයි. හැකි තන්හි එ බඳු දෙස් ලෙඛකයන් පිටට නඟන්නට ද අපි නො මැළි වූම් හ. අළගියවන්නයන් ව්‍යාකරණ ඥානයෙන් ආඪ්‍ය වීමට උපන් කාලය නුසුදුසු යැ. ඒ ඔවුන් ගේ මැ වරද නුවූව ද ව්‍යාකරණ විරොධ වූ තැන් දකැ දකැ, "පුරාතනයන් යෙදූ සැපි යැ" යි ගුරු කමට ගැන්ම නො මැනැවි. වර්තමානයෙහි නො දතුවන් ගේ අද්භුත වූ ක්‍රියා මාර්ගයෙක් වෙයි. රීතියට සාධක වශයෙන් පූරාණ ප්‍රයොගයන් දක්වූ කලැ, "ඒ පොළොන්නරු කාලයේ යෙදුම් යැ, දඹදෙණි කාලයේ යෙදුම් යැ, වර්තමාන ව්‍යවහාරයට නුසුදුසු යැ" යි තමන් ගේ ගර්හ්‍ය වූ යෙදුම් වලැ අගර්හ්‍යත්වය සපුට කෙරෙති. පුරාතන ව්‍යවහාරයට මෙන් මැ වර්තමාන

ව්‍යවහාරයට ද අනනුකූල වූ නිත්‍ය වූ යෙදුම් දක්වා දෙස් නැගූ විටැ, පුරාතනයෙහි තතු නො දැනැ ලියූ යම් කිසිවක්හු ගේ නිත්‍ය වූ යෙදුමක් අවුලා ගෙනැ විජෘම්භණය කරවා, "පුරාතනයන්හු මෙ සේ යෙදූ කලැ අප යෙදුවා කෙ සේ නම් නිත්‍ය වේ ද" යි කියමින්, තමන් ගේ නිර්දෝෂත්වයට පුරාතන යෙදුම් සාධක කෙරෙති. මොවුන් ගේ මේ ද්වෛධීභාවය නො හඳුනන්නා වූ ආධුනිකයෝ මහත් මුලාවට පැමිණෙත්. එ හෙයින් පුරාතනයන් ගේ යෙදුම්හි වුව ද සාවද්‍ය නිරවද්‍ය භාවය තත්ත්වාකාරයෙන් ප්‍රකාශ කිරීම විවරණ කාරයන් ගේ පරම යුතු කම යැ. අපි මේ යුතු කම නො පිරිහෙළීමට මැ උත්සාහ කළම් හ.

අධ්‍යයන – අධ්‍යාපනයෙහි දී පද්‍යයන් ගේ
**විවරණය** පදානුපදිකාර්ථ කථනය අනර්ථකර වූ ද එ හෙයින්
මැ නිත්‍ය වූ ද ක්‍රමයක් බව සියලු තත්ත්වඥයන් විසින් පිළිගන්නා ලද්දෙකි. "සුඛබෝධ පදයකට දුර්බෝධ පදයෙකින් ද, දුර්බෝධ පදයට සුබොධ පදයෙකින් ද අර්ථ කියැ යුතු යැ. එයින් උගන්නහු ගේ කොෂ ඥානය වැඩෙයි" යනාදිය අවිචාරක කථා යැ. කාව්‍යයක් පරිශීලනය කැරෙනුයේ රසය පිණිස යැ. කොෂ ඥානාදියට ද එයින් පිහිට නො ලැබෙන්නේ නො වේ. එ හෙත් ප්‍රධාන ස්ථානය රසයට දියැ යුතු යැ. රස ග්‍රහණයට යම් ක්‍රමයෙක් සම්බාධක වැ පවති නම් ඒ සර්වෝත්සාහයෙන් මැඬැ ලියැ යුත්තේ යැ. පදානුපදිකාර්ථ කථනය එබන්දෙකි. එ හෙයින් එය මැඩැ ලූම් හ.

සිංහල ග්‍රන්ථ පරිශීලනයෙහි දී මහත් අපහසු කම් ඇති වනුයේ ව්‍යාකරණය නො දත්මෙනි. ව්‍යාකරණය ඉගැන්මට පොතෙකුදු නැත. කෙලෙහි ගුණ සැලැකීම සඳහා කුවෙණිය ගේ කැත්තෙන් මැ පලා ලියන්නට ඉන්නාක් මෙන්, සිදත් සඟරායෙන් මැ ව්‍යාකරණය උගන්නට ඉන්නා හෙයින්, සිංහල ව්‍යාකරණය ක්‍රමවත් හෝ කාලානුරූප හෝ නො වෙයි. මේ ඌනත්වය පිරිමසා ලීමට විවරණය මාර්ගය කරන්නට උත්සාහ කළම් හ. ව්‍යාකරණයෙහි දූ ආඛ්‍යාත ප්‍රමාණ නො දනෙන්නෙක් නැති. එ හෙයින් ආඛ්‍යාතය සඳහා මැ විවරණයෙහි වැඩියෙක් ඇරිණ,

අප්‍රාසංගික වුව ද කියැ යුක්තෙක් වෙයි. පුරාතන් ග්‍රන්ථයන් ගෙන් ඉගෙනැ ඒ ග්‍රන්ථයනට මැ දෙස් කියති යි ද, නවීන ග්‍රන්ථයක් නො කොට ඒ දෙස් කියන ග්‍රන්ථයනට මැ විවරණ ලියා රැකෙති යි ද අපට කියන මහ දෙස් දෙකෙකි. පළමු වැන්න සිනාවට සුදුසු යැ. සසරෙහි මැ ඇති වැ සසරින් මැ ඉගෙනැ සසරට මැ දෙස් කී බුදුන් වහන්සේට කවර හෙයින් දෙස් නො කියත් ද? තමන් වදා වඩා ඇති කොට සික්මවා රටට දුන් මවු-පියන් ගේ මළ කුණු කවර හෙයින් නො රකිත් ද? දෙ වැන්න නම් මදක් සලකා බැලියැ යුත්තේ යැ. එ හෙත්, එක් මැසි දරුවනට කිරින් විනා බතින් ප්‍රයොජන නැත්තා සේ, නිරවුල් ලෙස භාෂාව තේරුම් ගෙනැ ඇති පොතකුදු පරිශීලනය කරන්නට සමත් වූවන් මහ දුවල් හුළු එළි බැදැ සෙවියැ යුතු වූ මේ රටට මේ කාලයෙහි කවර නවීන ග්‍රන්ථ ද? පළමු කොට කළ යුත්තේ ඇති පොත් නිරවුල් ලෙස තේරුම් ගන්නට, හොඳ නො හොඳින් බේරා වෙන් කැරැ ගන්නට, සුදුසු පත පොත තෝරා ගැන්මෙහි දී නාසා ලණුවක් නො පතන්නට, තමනට වැටැහුණු දෑ අනුන් ගේ ද වැටැහීම පිණිස අභීත වැ ප්‍රබල වූ වජ්‍ර-සාර වූ පද මාලායෙන් කියන්නට ශක්තිය ඇති කැරැවීම යි. නවීනයෝ පුරාතන ග්‍රන්ථයෙහි භක්තිය දුනුදු බුරුල් නො කෙරෙති. එ හෙයින් පළමු කොට කළ යුත්තේ ඔවුන් ගේ භක්තිය පිටැ මැ සිටැ ඔවුන් ගේ ඇස් පැහැදැවීම යි. ඒ යැ විවරණ ග්‍රන්ථයන් ගෙන් කැරෙනුයේ.

අප ගේ අදහස් ගෙනැ මෙහි බොහෝ තැන් ලියා දෙන ලද්දේ වීරසේකර මහතුන් විසිනි. ඔවුනට අප ගේ ස්තුතිය වේ වා!

මෙහි විවරණය පමණක් නො වැ පාඨ ශුද්ධිය ද අප අයත් බව සලකත් වා!

මුනිදස කුමාරණතුංග

2475, බිනර පුර 8.
කොළොඹ වැල්ලේවත්තේ 34 වන පටු මගැ
කුමාර ගිරියේ දී යැ.

# කුස ජාතක විවරණය

නැමැදැ මුනි ස රණය
දුහුනනට පිළිස රණය
සිටැ මගැ විය රණය
කෙරෙමි නව කුස දා විව රණය

අවස්ථා. තථාගත සර්වඥයන් වහන්සේ ගේ චරිතාපදානයක් වූ කුස ජාතකය කවි භාෂායෙන් කියපි වූ අලගියවන්න මුකවෙටි තුමෝ ග්‍රන්ථයා ගේ අවිඝ්න පරිසමාප්තිය පිණිස ඉෂ්ට දෙවතා නමස්කාරය කරන්නාහු "තින් ගනඳුරු මිතුරු" යනාදිය කියත්.

1. තින් ගන'ඳුරු මිතු රු
විනෙදන කුමුදු නිසයු රු
ගුණ මිණි මහ සයු රු
වඳිමි මුනිඳු තුමන් තිලෝ ගු රු

**අන්වය:** තිත් ගන අඳුරු මිතුරු විනෙ දන කුමුදු නිසයුරු ගුණ මිණි මහ සයුරු තිලෝ ගුරු මුනිඳු උතුමන් වඳිමි.

**පදාර්ථ:** තීර්ථක නමැති ඝනාන්ධකාරයට සූර්ය වූ, විනෙය ජන නමැති කුමුදයනට නිශාකර වූ, ගුණ නමැති මණිනට මහා සාගර වූ, තුන් ලොවට ගුරු වූ මුනීන්ද්‍රොත්තමයනට නමස්කාර කෙරෙමි.

**ටිප්පණි:** **තින්** — තීර්ථකයෝ නම් සත්ත්වයන් ගේ මොක්ෂයට මාර්ගය මේ යැ යි උපදෙස් දෙමින් බුද්ධ කාලයෙහි විසූ පිරිසෙකි. **විනෙ දන** — බුදුන් විසින් හික්මැ වියැ යුතු සත්ත්වයෝ. **කුමුදු** — රාත්‍රි කාලයට පිපෙන්නා වූ දිය මල් වෙසෙසෙකි. 'එළ මානෙල්' යනු ව්‍යවහාර නාමය යි. කුමුදු පුබුදුවන්නේ චන්ද්‍රයා යැ යනු කවි සමය යි. **නිසයුරු** —

නිශාකර. චන්‍ද්‍රයා. රාත්‍රිය කරන්නේ චන්‍ද්‍රයා යැ යි සලකා දුන් නාමකි. ගුණ — ශීලසමාධ්‍යාදිය ද අභිඥාවාදිය ද ගුණ යැ. මහ සයුරු — සාගර පත්ල මැණික්වලින් පිරුණ හ යි යෙති. එ හෙයින් සාගරයට මිණිඅකර යන ආදී නාම ද වෙයි. තිලෝ — කාම, රූප, අරූප, වශයෙන් ද ස්වර්ග, මර්ත්‍ය, පාතාල වශයෙන් ද ලොකය ත්‍රිවිධ වෙයි. මුනිඳු — මුනිනට ඉඳු=මුනිඳු. මෞන යැ යි කියන ලද ඥානයෙන් යුක්ත හෙයින් මුනි නම් වූ අගාර මුනි, අනගාර මුනි, සෙඛ මුනි, අසෙඛ මුනි, පච්චෙක මුනි යන පඤ්චවිධ මුනිනට ඉන්ද්‍ර (ප්‍රධාන) හෙයින් බුදුහු මුනිඳු නම් වෙත්. වඳිම් — 'වද' (වැඳීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'වද' ධාතුව 'රක්' ආදි ගණ යි. පරස්මෛ පද යි. (කතෘ කාරු) වඳි–වඳිති–වැඳි. (කර්ම කාරු) වැදේ–වැදෙති–වැදිණි–වැඳුණු.

2. සව් කෙලෙස් මුලුපු ට
බුදු වැ මොක් සිරි පළ කො ට
දෙසූ සව් ලෙව් හ ට
අනැගි සදහම් වඳිම් හැම වි ට

**අන්වය:** සව් කෙලෙස් මුල් උපුට බුදු වැ මොක් සිරි පළ කොට සව් ලෙව් හට දෙසූ අනැගි සදහම් හැම විට වඳිම්.

**පදාර්ථ:** සියලු කෙලශයන් මුලින් උදුරා දමා සර්වඥ වැ නිර්වාණ ශ්‍රීය ප්‍රකාශ කොට සකල ලොකයා හට දෙශනා කළා වූ අනර්ඝ වූ සද්ධර්මයට හැම කල්හි නමස්කාර කෙරෙමි.

**විසඳුම්:** කෙලෙස් — සිත කිලුටු කරන්නා වූ රාග දොෂාදීහු කෙලශයෝ යැ. උපුට — 'උප්පුර' (උදුරා දැමීමෙහි) ධාතුව නිසා නිපනිත වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'උප්පුර' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛ පද යි. (කතෘ කාරු) උපුරා–උපුරති–ඉපිරී–ඉපිරූ. (කර්ම කාරු) ඉපිරේ–ඉපිරෙති–ඉපිරිණි–ඉපුරුණු. මේ ධාතුයෙන් 'උපුළ' යි නිපන්න වන්නා වූ අතීත ආඛ්‍යාත රූපයක් වෙයි. දෙ බස්හි සම යි. 'වපුර' ධාතුයෙන් වන 'වපුළ', 'වදුර' ධාතුයෙන් වන 'වදුළ' යනාදිය ද සලකත්තේ යැ. බුදු වැ — බුදු වීම නම් දත යුතු සියල්ල දැන ගැන්මේ නුවණ ලැබීම යි. වැ — 'ව' ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'බල' ආදි ගණ 'ව' ධාතුව පරස්මෛ පද යි. වා–වති–වී–වූ. 'රක්' ආදි ගණ 'ව' ධාතුව ආත්මනෙ පද යි. වේ–

ඓවනි-විණි-වුණු. මොක් — සියලු සංසාර දුකින් මිදීම. කොට — 'කර' ධාතුව නිසා නිපතින වූ පූර්ව ක්‍රියා නිපාත පද යි.

3. බඹ සුර නර මු　　　දුන්
සිය සිරි පා කමල　　　දුන්
පින් කෙත් ගුණ බ　　　දුන්
වඳිම් මහ සඟ ලොවට සෙත　දුන්

**අන්වය:** බඹ සුර නර මුදුන් සිය සිරි පා කමල දුන් පින් කෙත් ගුණ බදුන්, ලොවට සෙත දුන් මහ සඟ වඳිම්.

**පදවි:** බ්‍රහ්මාමරමනුෂ්‍යයන් ගේ මුදුනෙහි ස්වකීය ශ්‍රී පාද නමැති පද්මය දුන්නා වූ, පින් කෙත් වූ, ගුණයනට භාජන වූ, ලොකයට ශාන්තිය දුන්නා වූ මහා සඞ්ඝයා වහන්සේට නමස්කාර කෙරෙමි.

**විස්තර:** පා වඳින්නට හිස බිමැ තුබූ කලැ වැඳෙන්නහු ගේ පය වඳින්නහු ගේ මුදුනෙහි ගැවෙ යි. මහ සඟුන් ගේ ශ්‍රී පාද නමැති පද්මය බ්‍රහ්මයන් ගේ ද දෙවියන් ගේ ද මිනිසුන් ගේ ද මුදුනෙහි දීම නම් ඒ ශ්‍රී පාදයට ඔවුන් නමස්කාර කිරීම යි.

**විපසණි:** පින් කෙත් — මනුෂ්‍යයෝ මහා සංඝයාට දන් දී ඔවුනට ආදර ගෞරව දක්වා පින් රැස් කෙරෙති. එ හෙයින් මහා සඞ්ඝයා මිනිසුනට පින් බිජුවට වැපිරීමට කෙතක් හා සමාන යැ. ගුණ — සුප්‍රතිපන්නතාදී ගුණ සමූහය. ගුණ බඳුන් — ගුණයනට ආධාර වූ. ගුණ දරන්නා වූ. දුන් — 'දෙ' (දීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'දෙ' ධාතුව 'බස්' ආදි ගණ යි. පරස්මෛ පද යි. දේ-දෙති-දිනි-දුනු.

4. ස ත් අත් සක් සක　　　ත්
ව ත් අත් තිනෙත් බරණෙ　　ත්
ප ත් මත් හලත් න　　　ත්
ෂසත් කෙරෙත් සත් ලොවට මෙ සුග　ත්

**විපසණි:** සත්අත් — මහා බ්‍රහ්ම. අතෙහි ඡත්‍රයක් (කුඩයක්) දරනුයෙන් මේ නම යෙදෙයි. සක් — ශක්‍ර. සකත් — විෂ්ණු. අතෙහි චක්‍රයක් වනුයෙන් (සක්+අත) මේ මේ නම්.

**වන්අත්** — ගණ දෙවි. වකාත්‍රයෙහි හෙවත් මූහූණෙහි අතක් ඇති හෙයින් ගණ දෙව මේ නමින් ද හැඳින්වෙයි. මොහුට ඇත් මුහුණක් වේ ල. මූහුණෙහි වූන්නා වූ අත නම් සොඬ යැ. **තිනෙත්** — ඊශ්වර. මොහුට ඇස් තුනෙකි. තුන් වන ඇස නළල මැද පිහිටියේ යැ. **බරනෙත්** — සකන්ද කුමාර. මොහුට මූහුණු සයෙකි. බර (දොළොස්) නෙත් වනුයේ එ හෙයිනි. **පත්මත්** — (පත්ම + අත්) සූසී. මොහු ගේ හස්තයෙහි නෙළුම් මලෙක් ඇත්තේ යැ යි යෙති. **තලත්** — (තල් + අත්) බලභද්‍ර. මොහු ගේ හස්තයෙහි තල් ගසෙකැ රූපයක් ඇති ධවජයෙක් වෙයි. එ හෙයින් මේ නම යෙදෙ යි. **නත්** — අනන්ත නම් නා රජ. **සුගත්** — යහපත් ශරීර ඇති හෙයින් දෙවියනට 'සුගත්' යැ යෙත්. **ඛොරෙත්**, — 'කර' (කිරීමෙහි) ධාතුයෙන් වූ අඛ්‍යාත පද යි. මෙහි ආශිර්වාදාර්ථයෙහි යෙදිණ. ආශිඃ ක්‍රියායෙහි 'වා' නිපාතය මෙ තන්හි ලොප් වැ සිටියේ යැ. මේ නිපාත ලොපය සිංහල සත් කවීන් විසින්දු කරන ලද බව, ගුත්තිලයෙහි,— "මෙ සත් සුර සත් ලොවට සෙත් දෙත්" යන්නෙන් ද, කාව්‍යශෙඛරයෙහි,— "මෙ දෙවි ගණ නිති ඛොරෙත් සුබ සෙත" යන්නෙන් ද පෙනේ.

'කර' ධාතුහු ගේ වරනැගීම ගැනැ මහත් මත හෙද පවති.

1. 'කරා' 'කරත්' යනාදිය 'බල' ආදි හෝ 'බම' ආදි හෝ වන බව හඟවයි.
2. 'කැරූ' යනු 'බල' ආදි නො වන බව හඟවයි.
3. 'කළ' (කල) යනු 'බස්' ආදි බව හඟවයි.
4. 'කිරීම්' යනු 'බණ' ආදි බව හඟවයි.
5. 'කළ' යනු 'උපුරු' ආදි ධාතු පඞ්ක්තියට අයත් බවක් හඟවයි.
6. කෙරේ – කෙරෙති – යනාදිය බල ආදි හෝ 'බම' ආදි හෝ 'බණ' ආදි හෝ වියැ යුතු බව හඟවයි.

ඉතින් මේ අවුලින් කෙ සේ මිදෙමු ද?

1. 'බල' ආදි වූව හොත් කරා–කරති–කැරී–කැරූ– ආ විසින් වරනැගියැ යුතු යැ. එ කලැ 'කරා' යි පූර්ව ක්‍රියා රූපයක් වූව මනා යැ. එ හෙත් එය හෝ කැරී–කැරූ–

යනාදිය හෝ ප්‍රයුක්ත බවෙක් නො පෙනේ. 'කළු' යන්නට ද එහි ඉඩෙක් නැති. 'කිරිම්' 'කැරැ' යන දෙක ද නො ලැබේ.

2. 'බම' ආදි වූව හොත් කරා–කරති–කිරි–කුරු– ඈ විසින් වරනැගියැ යුතු යැ. 'කැරැ' යන්නට අවසර ලැබේ. 'කිරීම්' 'කළු' යන දෙකට ඉඩ නැති. 'කිරි' 'කුරු' යනාදිය ද කෙවල වැ නො ලැබෙයි.

3. 'බණ' ආදි වූව හොත් කරී–කරිති–කිරි–කිරු හෝ කුරු ඈ විසින් වරනැගේ. 'කැරැ' 'කිරීම්' යන දෙකට මැ ඉඩ ලැබේ. 'කළු' යන්නට නො ලැබේ. කරී–කරිති යන දෙක මැ අප්‍රයුක්ත යැ.

4. 'රක්' ආදි වන්නට හේතු නැති.

5. 'බස්' ආදි වූව හොත් කරී–කරිති–කළි–කළු– ඈ විසින් වරනැගෙයි. 'කළු' යන රූපය රහල් හිමියෝ යෙදූහ. කරී–කරිති යනාදිය පෙරැ සේ මැ යැ. 'කිරීම්' යන්නට මෙහි දූ ඉඩ නැති.

5. මුනි සරණ මුඳුන ත
කෙවලා දහම් සවන ත
විජය සිරි කග ප ත
සැඳූ බුවනෙක බාහු නම් යු ත

විසඳුම්: මුඳුනත — හිසෙහි. 'මුදුනතැ' යි වියැ යුතු තන්හි එළි වැට රක්නා පිණිස 'මුදුනත' යී කරන ලද්. 'සවනත'–'පත' යන දෙ තැන්හි ද මෙ සේ යැ. කෙවලා — සූත්‍ර යැ, අභිධර්ම යැ, විනය යැ යන ත්‍රිපිටකය. සවනත — සවන්+අත. මෙහි 'අත' යන්න විශෙෂාර්ථයක් නො දෙයි. විජය සිරි — සියලු සතුරන් ජය ගැනීමේ සම්පත්තිය්. සැඳූ — 'සඳ' (සැදීමෙහි=සැරැසීමෙහි) ධාතුයෙන් නිපන් අතීත කෘදන්ත නාම යි. 'සඳ' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛ පද යි. (කතු කරු) සඳ–සඳති–සැදි–සැඳූ (කම් කරු) සැදේ–සැදෙති–සැදිණි–සැදුණු. 'බස්' ආදි ගණ ආත්මනෙ පදයෙහි සැදේ–සැදෙති–සැදිණි, සනි, සැදි–සැඳුණු, සනු, සැදී. බුවනෙක බාහු — බුද්ධ වර්ෂ 2077 දී රජ පැමිණැ ජයවර්ධන පුරය රාජධානි කොට ගෙනැ අට අවුරුද්දක් රාජ්‍යානුශාසනය කළ පස් වැනි භුවනෙක බාහු.

මේ පද්‍යය, ගුත්තිලයෙහි,—

“මුනි පද උතුම් ගේ
තෙවලා දහම් දිව , ගේ
ජය සිරි මඩල ගේ
සැදූ පැරකුම්බා නිරිඳු ගේ”—

යන පද්‍යය බලා කැරුණු සේ පෙනේ.

6. නරනිඳු ගෙන් මහ රු
ලත් මහ ඇමැති තනතු රු
වෙළෙඳ කුල පිවිතු රු
සේපාල අදිකාරි නම් ග රු

**විසඳුම්:** **ලත්** — ‘ලබ’ ලැබීමෙහි ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. ‘ලබ’ ධාතුව ‘බල’ ආදි ගණ ද ‘බස්’ ආදි ගණ ද වෙයි. ‘බල’ ආදි ගණ ‘ලබ’ ධාතුව පරස්මෛ පද යි. (කතු කරු) ලබා-ලබති-ලැබී-ලැබූ. (කම් කරු) ලැබේ-ලැබෙති-ලැබිණි-ලැබුණු. ‘බස්’ ආදි ගණ ‘ලබ’ ධාතුව ආත්මනෙ පද යි. ලැබේ-ලැබෙති-ලැබිණි, ලැබි, ලදී-ලැබුණු, ලැබි, ලදු. ‘ලදු’ යන්නෙහි අන්ත්‍යස්වරය ලොප් වීමෙන් ‘ලද්’ යනු වැ ඉක්බිති අඝොෂාදෙශයෙන් ‘ලත්’ යනු වී යැ. නැවැතැ ‘අ’ කාරවත් වූ කලැ ‘ලද’ යන රූපය ලැබේ. **වෙළෙඳ කුල පිවිතුරු** — වණිග්වංශයට ආභරණ වූ. ‘පිවිතුරු’ යනු ආභරණයට නම්. ඒ කුලයේ ගෞරවයට හේතු වන බැවින් ආභරණයෙකි.

7. මැති සඳුව මිනිපි රි
රුසිරින් දෙවඟනක ස රි
රස බසැති සුමිහි රි
උබය කුලයෙන් සදිසි සක කි රි

**විසඳුම්:** **සඳුව** — මෙහි ‘සඳ’ යනු චන්ද්‍රයාට නම්. උත්තමාර්ථ පිණිස වෙයි. චන්ද්‍ර, සූර්‍ය, සිංහ, හස්ති, ව්‍යාඝ්‍ර, වෘෂභ, හංස, යන මේ ආදීන් හඟවන නාමයෝ අන්‍ය නාමයකට පර වැ යෙදුණානු ගෞරව පිණිස වෙති. **උබය කුලයෙන්** — මව ගේ කුලය යැ පියා ගේ කුලය යැ යන දෙ කුලයෙන්. කුල නම් පවුල යැ. සක කිරි - සකෙහි ලූ කිරි=සක කිරි. කිරි සුදු යැ, පවිත්‍ර යැ. සක ද සුදු යැ, පවිත්‍ර යැ. එ හෙයින්

සකෙහි වූ කිරි අත්‍යර්ථයෙන් සුදු ද පවිත්‍ර ද වෙයි. යම් කිසිවෙකු අතිපරිශුද්ධත්වය හැගැවීමට අවශ්‍ය වූ කල්හි එය සක, කිරි වැන්නැයි කීම කවීන් ගේ සිරිති.

8. රිවි කුල කොත් පබ ඳ
රජසිහ රජු ගෙ මන න ඳ
සිරි පද සෙවණැ සො ඳ
වැඩුණු සැප සේ සව් ඉසුරැ වි ඳ

අන්වය: පබඳ රිවි කුල කොත් මන නඳ රජසිහ රජු ගෙ සොඳ සිරි පද සෙවණැ සව් ඉසුරු විඳැ සැප සේ වැඩුණු.

විසඳුම්: රිවි කුල — සූර්ය වංශය. ආදිකල්පික 'මනු' නම් රජ සූර්යයා ගේ පුත්‍ර වී ල. එ හෙයින් ඔහු ගේ කුලය රිවි කුලය වී යැ. විඳැ — 'විඳු' (විඳීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'විඳ' යනු වූයේ එළි වැට රක්නා පිණිස යැ. 'විඳු' ධාතුව 'රක්' ආදි ගණ යි. පරස්මෛ පද යි. (කතු කරු) විඳි–විඳිති–විඳි– (කම් කරු) විඳේ–විඳෙති–විඳිණි–විඳුණු. මේ ධාතුව 'බස්' ආදි ගණ පරස්මෛ පද ද වේ. විඳි–විඳිති–විනි–වුනු. වැඩුණු — 'වඩ' (වැඩීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. මේ 'වඩ' ධාතුව රක් ආදි ගණ යි. අකර්මක යි. ආත්මනෙ පද යි. වැඩේ–වැඩෙති–වැඩිණි, වැඩි–වැඩුණු, වැඩි. සකර්මක 'වඩ' ධාතුව 'බල' ආදි ගණ පරස්මෛ පද යි. (කතු කරු) වඩා–වඩති–වැඩි–වැඩූ. (කම් කරු) වැඩේ–වැඩෙති–වැඩිණි–වැඩුණු.

9. යසසින් ලොවැ පසි ඳු
අත්තනායක මැති ස ඳු
සුරතුර වැලැඳි මු ඳු
සුපුල් ලෙල රන් ලතාවක් බ ඳු.

විසඳුම්: සුර තුර — දිව්‍ය වෘක්ෂය. දිව්‍ය ලොකයෙහි ඇතැයි යෙන මේ ගස සිතූ පැතූ සියලු සම්පත් දීමෙහි සමත් ල. මෙ බඳු ගුණසම්පන්න වූ දිව්‍ය වෘක්ෂ පසෙකි. ඒ බව්,

"පඤ්චෛතෙ දෙවතරවො
මන්දාරඃ පාරිජාතකඃ
සන්තානඃ කල්පවෘක්ෂශ්ච
(පුංසි වා) හරිචන්දනම්" —

යනුමයෙන් කියැවිණ. මුදු — කරුණා ආදි ගුණ ද සුකොමලතාව ද මෙයින් හැඟැවෙයි. සුපුල් — මනා වැ පිපුණු. ගුණවත් බව මෙයින් ධ්වනිත යි. ලෙළ — ලීලෝපෙත. ලීලා සම්පන්න භාවය ප්‍රකාශ කෙරෙයි. රන් — වර්ණ සම්පත්තිය ද පිරිසුදු උසස් කුලවංශ ඇති බව ද මෙයින් හැඟැවිණි.

10. කුලඟන නළල සැ ඳු
කොකුම් තිලකෙව් සිරිසු ඳු
දිලෙන 'මරඟන බ ඳු
මැණික්සාමි නමින් පරසි ඳු

විපසණී: කුලඟන — වංශවත් ස්ත්‍රීන් ගේ. සැඳු — අලඞ්කාර කළා වූ. නළල සැඳු කොකුම් තිලක එව් — නළලෙහි කොකුම් ආදියෙන් තිලක තිබීම පෙර දිග කාන්තාවන් ගේ සිරිතෙකි. මැණික්සාමි නම් කාන්තාව වංශවත් ස්ත්‍රීන් ගේ නළල අලඞ්කාර කළා වූ පිරිසුදු කොකුම් තිලකයක් වැනි යැ යි කීමෙන් ඇය අති සුපරිශුද්ධ වංශ ඇත්තියක් හෙවත් ඒ වංශවත් ස්ත්‍රීන් විසිනුදු ගෞරවාදරයෙන් සෙවිත තැනැත්තියක් බව කියැවිණි. දිලෙන — 'දුල්' (දිලීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'දුල්' ධාතුව 'බම' ආදි ගණ යැ. පරස්මෙ පද යැ. දුලා-දුලති-දිලී-දුළු. මේ 'රක්' ආදි ගණ ආත්මනෙ පද ද වෙයි. දිලේ-දිලෙති-දිලිණි, දිලි-දිලුණු, දිලි. 'දිලෙන' යනු 'රක්' ආදි ගණ දයින් වී යැ. අමරඟන — (අමර + අඟන). දිව්‍ය ස්ත්‍රිය. දෙවියනට 'අමර' යනු නමෙකි.

11. තෙරුවන් වෙතැ නිදො ස
සපිරි සැදැහැති මෙ දිගැ ස
විසාකාවන් මි ස
වෙතින් සරි වෙති සාවුරු දිය කු ස

අන්වය: තෙරුවන් වෙතැ නිදොස සපිරි සැදැහැ ඇති මෙ දිගැස විසාකාවන් මිස දිය කුසැ වෙතින් සාවුරු සරි වෙති.

විපසණී: තෙරුවන් — බුද්ධ, ධර්ම, සඞ්ඝ යන රත්නත්‍රයය. නිදොස — නිර්මල වූ. 'සැදැහැ' යන්නට විශෙෂණ යි. දිගැස —

දීඝීඝජීයට (සත්‍රියට.) දිය කුසෑ — ලොකයෙහි. විසාඛාවන් — විශාඛාවෝ බුදුන් ජීවත් වූ, වැඩැ සිටි කාලයෙහි තමහි ගුණයෙන් ශ්‍රෙෂ්ඨ වැ බුදුන්ට අග්‍ර උපස්ථායිකා වැ සිටි කාන්තාවෝ යැ. පූර්වාරාමය තනවා බුදුනට පූජා කළෝ මොහු යැ.

බෞද්ධොපාසිකාවන් විසාකාවනට සමාන කොට වර්ණනා කිරීම සත් කවීන් විසින් සම්භාවිත යැ. කියැවිණි මැ නො, සිරි රහල් හිමියන් විසිනුදු,—

"යස සුර නි — කාවන්
නිලිනෙත් දෙන එ කාවන්
කල්ප සා කාවන්
ලොවට පැ වැනි විසා කාවන්"—සි?

12\. රකිනා තම බිජු ව ල්
කිරල සෙමෙරෙව් හැම කා ල්
පොහො දවසැ අට සි ල්
රකි නිති පිරිසුදු වැ පන් සි ල්

අන්වය: හැම කල් තම බිජු වල් රකිනා කිරල සෙමෙර එව් පොහො දවසැ අට සිල් නිති පන් සිල් පිරිසුදු වැ රකි.

විපසුණි: වල් — වාලධීන්. නඟුට. සෙමෙර — චමරී මෘගයන්. හිමාලය අසල ටිබැට් ආදී රටවලැ වෙසෙන සතකු විශෙෂයෙකි. මොවුන් ගේ වාලධියෙන් යැ සෙමෙර හෙවත් චාමර ලැබෙනුයේ. තම බිජු වල් රකිනා කිරල සෙමෙර— කිරලා ස්වකීය බිජු ද සෙමෙර ස්වකීය වාලධිය ද ඉතා මහත් ආදරයෙන් රකිති යි යෙහි. * රකිනා – 'රක්' (රැක්මෙහි) ධාතුයෙන් වූ වෘත්තමාන කෘදන්ත නාම යි. 'රක්' ධාතුව පරශෙම පද යි. (කතෘ කරු) රකී–රකිති–රැකි. (කම් කරු) රැකේ–රැකෙති–රැකිණි–රැකුණු. මේ ධාතුව මෙන් වර නැගෙන ධාතු 'රක්' ආදි ගණයට අයත් යැ. රකි – මෙයින් උක්ත වනුයේ 'මෝ' යන අධ්‍යාහාර්‍ය සර්ව නාම පදය යි. එය පූර්ව පද්‍යයෙහි වූ 'මෙ දිගැස' යනු හා සම්බන්ධ යි.

---

* "සිඛිව අණ්ඩං චමරීව වාලධිං" යන ආදිය ද සලකත්තේ යැ.

13. **සිත සවනත සැප ත**
**මුනි දම් මහ සඟන වෙ ත**
**සලසා ලයි සත් ත**
**එසින් මුන් සරි කවු ද මෙ දිය ත**

**විසඳුම්: සිත සවනත සැපත, මුනි දම් මහ සඟන වෙත** — සිත මුනී (වෙතැ), සවනත දම් (වෙතැ), සැපත මහ සඟන වෙතැ. හැම කල්හි බුදුන් ගැනැ හකනිමිත් සිතින් වාසය කරන බව ද, නිතර බණ අසන බව ද, අනවරතයෙන් මහා සඞඝයා වෙත මහ දන් පවත්වන බව ද මේ කී පරිදි සි. **සැපත** — සම්පත්තිය. **සලසා** — 'සලස' (සැලැසීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'සලස' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛ පද යි. (කතු කරු) සලසා-සලසති-සැලැසී-සැලැසූ. (කම් කරු) සැලැසේ-සැලැසෙති-සැලැසිණි-සැලැසුණු. **ලයි** — (ලා + යි) 'ලා' යනු 'ල' (ලීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'ල' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛ පද යි. (කතු කරු) ලා-ලති-ලී-ලූ. (කම් කරු) ලැවේ-ලැවෙති-ලැවිණි-ලැවුණු. කර්මකාරකයෙහි දී ධාතුව හා විභක්තිය අතරෙහි 'ව' වෙයි. මේ ධාතුයෙහි ප්‍රයෝජ්‍ය රූපයෝ ද කර්මකාරක රූපයනට සමාන ය හ. **දියත** — ජගත්හි. ලොකයෙහි. 'දියතැ' යි වියැ යුතු තන්හි එළිය රක්නා පිණිස 'දියත' යි කරන ලද. දෙ වන පාදයෙහි 'වෙත' යනු ද මෙ සේ මැ යැ. **මුන්** — මැණික්සාමි නම් කානතාවන්.

මේ පද්‍යය කාව්‍යශෙඛරයෙහි,—

"සිතු බුදු රුවන වෙ ත
සදහම් කෙරේ සවන ත
සැපත් මහ සඟ වෙ ත
මොවුන් සරි කො ද එයින් මෙ දිය ත"—

යන පද්‍යය බලා කැරුණු සේ පෙනේ.

14. **සිරි රති පලමුයෙ න**
**සැක හැරැ මවා බලමි න**
**සළි ලොවැදුරැ විසි න**
**මවා ලූ වැනි රුසිරැ මෙ කදු න**

**අන්වය:** සිරි රති පලඹුයෙන මවා බලමින සැක හැරැ ලොව ඇඳුරු විසින යළි රුසිරු මෙ කළුන මවා ලූ වැනි.

**විස්තර:** සකල ලොකය මවන්නේ ලොකාචාර්ය යි. එ හෙත් මැණික්සාමී නම් ස්වල්පමාත්‍ර වූ දෝෂාංශුවකුදු නැති වැ මැ මැවියැ යුතු යැ. එ හෙයින් ස්වකීය නිර්මාණ කෞශල්‍යය පිළිබඳ වූ සඬකාවිනොදනය පිණිස පලඹු කොට ශ්‍රී කාන්තාව ද රතිය ද මවා ඒ දෙ දෙනාට ද වඩා අග්‍ර රූප ශ්‍රීයෙන් යුක්ත කොට මැණික්සාමී මැවූ සේ පෙනේ.

**විසඳුම්:** **සිරි** — විෂ්ණු දෙවයා ගේ භාර්‍යාව. ලක්ෂ්මිය. මෑ අතිශය රූපසෞන්දර්යයෙන් විරාජමාන යැ. සුරාසුරයන් කිරි සයුර කැලැඹීමේ දී එයින් උදගත වූ යැ. **රති** — අනඞ්ගයා ගේ භාර්‍යාව රති නමු. සකල දිව්‍ය ලොකයෙහි මැයට වඩා රූපයෙන් අග්‍ර වූ කාන්තාවක් නැති. **මවා** — 'මව' (මැවීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'මව' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෙ පද යි. (කතු කරු) මවා–මවති–මැවී–මැවූ. (කම් කරු) මැවේ–මැවෙති–මැවිණි–මැවුණු. **බලමින** — 'බල' (බැලීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියාර්ථයෙහි මිශ්‍ර ක්‍රියා නිපාත පද යි. 'බල' ධාතුව පරස්මෙ පද යි. (කතු කරු) බලා– බලති– බැලී– බැලූ. (කම් කරු) බැලේ–බැලෙති–බැලිණි–බැලුණු. මේ ධාතුව මෙන් වරනැගෙන ධාතු 'බල' ආදි ගණයට අයත් වේ. **හැරැ** — 'හර' (හැරුම්හි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'හර' ධාතුව 'බස්' ආදි ගණ යි. පරස්මෙ පද යි. (කතු කරු) හරී–හරිති–හළි–හළු. (කම් කරු) හැරේ–හැරෙති–හැරිණි–හැරුණු. **ලොවැඳුරු** — මහා බ්‍රහ්මයා. ලොකය මවන්නේ මේ යැ. **රුසිරු** — රුචිර වූ. **මෙ කළුන** — මේ (මැණික්සාමී) නම් කාන්තාව. මෙහි 'කල්' ශබ්දය යි. 'උන්' විභක්තිය යි. එළි රැකෙන පිණිස අගැ 'අ' කාරයෙක් වී යැ.

15. වනත් ශං හෝ පැ ... න
නො යනෙ'වි සිඳු වෙරළ පැ ... න
මහත් වැ ද ඉසුරි ... න
උඞගු නො වැ දව'සරී නුවණ් ... න

**අන්වය:** ශං හෝ පැන වනත් සිඳු වෙරළ පැනැ නො යනා එව්, 'ඉසුරින මහත් වැ ද උඞගු නො වැ නුවණින දවස් හරී

**විසඳුම්:** **පැන්** — ජලය. **වනත්** — පැමිණියේ නමුත්. වන + දු = වන + ද් = වනත්. , වන — 'වද' (ප්‍රවේශනයෙහි) ධාතුයෙන් වූ අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. 'වද' ධාතුව 'බස්' ආදි ගණ යැ. උභය පද යැ. (පරස්මෛ පදයෙහි) වදී-වදිති-වනී-වනු. (ආත්මනෙ පදයෙහි) වැදේ-වැදෙති-වැදිණි-වැදුණු. **පැනැ** — 'පත්' (පිනීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'පත්' ධාතුව 'බණ' ආදි ගණ යි. උභය පද යි. (පර පද) පනී-පනිති-පිනී-පිනූ. (අත් පද) පෙනේ-පෙනෙති. **යන** — 'යා' (යෑමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'යා' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛ පද යි. (කතු කරු) යා - යති - ගිය. අතීතයෙහි දෙ බසෙහි මැ ධාතු ප්‍රත්‍යයනට 'ගිය' යනු ආදෙශ වෙයි. **දවසරී** — දවස් + හරී = දවස් + අරී = දවසරී. මෙහි 'හර' ධාතු යැ. 'හ' කාර ලොපයෙනි 'අර' යනු වනුයේ. 'අර' ධාතුව නො වේ.

16\. නිසි සිතුරුවන ම න
නිල් මිණ් යුග යැ දෙ නුව න
මැණික්සාමි ය න
නම යෙදෙයි මේ ළඳට එ බැවි න

**අන්වය:** මන සිතු රුවන නිසි. දෙ නුවන නිල් මිණී යුග යැ. එ බැවින මේ ළඳට මැණික්සාමි යන නම යෙදෙයි.

**විසඳුම්:** **මන** — සිත. **සිතුරුවන** — චින්තාමාණික්‍යයට. මේ වනාහි සිතූ පැතූ සම්පත් ප්‍රදානයෙහි සමර්ථ වූ මාණික්‍යයෙකැ යි යෙති. මැණික්සාමි ගේ සිත සිතුරුවනෙකැ යි කීමෙන් ඇය ගේ අසදෘශ ත්‍යාගිත්වය පැවැසිණ. **නිසි** — සුදුසු යැ. **දෙ නුවන** — දෙ ඇස. ඇස් නිල් මිණ් වැනි යැ යි කීමෙන් එහි දීප්තිය ද නීල වර්ණය ද ප්‍රකාශිත යි. ස්ත්‍රීන් ගේ ඇස් නීල වර්ණ වීම ඔවුන් ගේ රූප සෞන්දර්‍ය වර්ධනයට කාරණයෙකැ යි යෙති. **යෙදෙයි** — (යෙදේ + යි) සුදුසු වේ. යෝග්‍ය වේ. 'යෙදේ' යනු 'යොද' (යෙදීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'යොද' ධාතුව 'බල' ආදි ගණ පරස්මෛ පද යි. (කතු කරු) යොදා-යොදති-යෙදී-යෙදූ. (කම් කරු) යෙදේ-යෙදෙති-යෙදිණි-යෙදුණු.

17\. එළු මගද සකු බ  ස
සුත් පොත් කියත මෙ දිගැ  ස
පද සබඳ තැනැ මි  ස
අතරතුරු නො සිටී මොවුන් බ  ස

**අන්වය:** මෙ දිගැස එළු මගද සකු බස සුත් පොත් කියත මොවුන් බස පද සබඳ තැනැ මිසැ අතරතුරු නො සිටී.

**විසඳුම්:** **දිගැස** — දිගු + ඇස. ස්ත්‍රිය. ස්ත්‍රීන් ගේ ඇස් දික් වීම ශොභන යැ. **එළු** — සිංහල. **මගද** — මාගධ. පාලි. **සකු** — සංස්කෘත. **කියත** — 'කිය' (කීමෙහි) ධාතුයෙන් වූ කාලාර්ථයෙහි අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. 'කිය' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛ පද යි. (කතු කරු) කියා-කියති-කියී, කී-කියූ, කී. (කම් කරු) කියැවේ-කියැවෙති-කියැවිණි-කියැවුණු. **පද සබඳ තැනැ** — පදයන් ගේ සම්බන්ධතාව අවිපරීත වැ තේරුම් ගත හැකි වන පරිද්දෙන් නැවැත්විය යුතු තැන්හි. විරාම ස්ථානයන්හි. **සිටී** — 'සිටු' (සිටීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන ආඛ්‍යාත පද යි. මෙයින් උක්තවනුයේ 'බස' යනු යැ. 'සිටු' ධාතුව 'රක්' ආදි ගණ යි. පරස්මෛ පද යි. සිටි-සිටිති-සිටි.

18\. නිල් මුහුල දෙ  වුවන්
නැමි බැම සුරිඳු සැ  වුවන්
නිසි පිරි සඳ  වුවන්
පතළ කුළුණෙන් ලොවට ම වුවන්

**විසඳුම්:** **නිල් මුහුල** — නීල වර්ණ වූ කෙශ කලාපය. කෙස් වැටිය කාළ වර්ණ යැ. කවර හෙයින් නීල වර්ණ යැ යි කියැවිණි ද? පෙර දිගැ කවීන් ගේ භාෂායෙහි නීල-කාළ යන වර්ණ ද්වයයා ගේ භෙදයෙක් නො සැලැකිණ. **දෙව** — මෙඝය. වැසි වලා කුළු. වැසි වසා කුළු ද කළු යැ. කෙශ කලාපය ද කළු යැ. **සුරිඳු සැවු** — ඉන්ද්‍රචාප. දෙව් දුනු. **පතළ** — 'පතුරු' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'පතුරු' ධාතුව 'බස්' ආදි ගණ ආත්මනෙ පද යි. පැතිරේ-පැතිරෙති-පැතිරිණි, පැතිරි, පතිළි-පැතුරුණු, පැතිරි, පතුළු. පතුළු=පතළ. 'බල' ආදි ගණ පරස්මෛ පද සකර්මක 'පතුරු'

ධාතුවෙක් ද වේ. (කතු කරු) පතුරා-පතුරති-පැතිරී-පැතුරු. (කම් කරු) පැතිරේ-පැතිරෙති-පැතිරිණි-පැතුරුණු.

19. මෙ කුල'ඹ සිතු පැහැ ද
බුදුන් පෙර සිරිතක් සො ඳ
ඇසියවි සිතින් යැ ද
කෙළෙන් ආරාදනා මන න ඳ

අන්වය: මෙ කුල අඹ සිතු පැහැදූ බුදුන් සොඳ පෙර සිරිතක් ඇසියැ අවි සිතින් යැදූ මන නඳ අරාදනා කෙළෙන්. (මතු සම්බන්ධ යි.)

විසඳුම්: කුල අඹ — කුලාම්බිකාව. කුල සත්‍රිය. උතුම් කුලයෙකැ වූ සත්‍රිය. පැහැදූ — 'පහද' (පැහැදීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'බස්' ආදි ගණ 'පහද' ධාතුව පරසෙම පද යි. පහදී-පහදිති-පහනි-පහනු. 'රක්' ආදි ගණ 'පහද' ධාතුව අතමනෙ පද යි. පැහැදේ-පැහැදෙති-පැහැදිණි-පැහැදුණු. 'බල' ආදි ගණ 'පහද' ධාතුව පරසෙම පද යි. සකර්මක යි. (කතු කරු) පහදා-පහදති-පැහැදී-පැහැදූ. (කම් කරු) පැහැදේ-පැහැදෙති-පැහැදිණි-පැහැදුණු. පෙර සිරිතක්— පූර්ව චරිතයක්. බොධිසත්ත්ව භූමියෙහි දී ගත කළ ජීවිතයක්. ඇසියවි— ඇසියැ + අවි = ඇසියවි. ඇසියැ — 'අස' (ඇසීමෙහි) ධාතුයෙන් වූ අසම්භාව්‍ය කෘදන්ත නිපාත පද යි. අස + ඉයැ = අසියැ = ඇසියැ. 'ඉයැ' යනු කාලාර්ථ අනියමාර්ථ දෙකට මැ සාධාරණ වූ අසම්භාව්‍ය ප්‍රත්‍යය යි. මේ ප්‍රත්‍යය ගැන්මෙහි දී ධාතු ස්වරයනට අනම්‍යදෙශය වේ. 'අස' ධාතුව 'බල' ආදි ගණ යි. පරසෙම පද යි. (කතු කරු) අසා-අසති-ඇසී-ඇසූ. (කම් කරු) ඇසේ-ඇසෙති-ඇසිණි-ඇසුණු. අවි-අභිප්‍රාය. යැදූ — 'යද' (යැදුම්හි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'යද' ධාතුව 'රක්' ආදි ගණ යි. පරසෙම පද යි. (කතු කරු) යදී-යදිති-යැදී. (කම් කරු) යැදේ-යැදෙති-යැදිණි යැදුණු.

කාව්‍යශෙඛරයෙහි ද මෙ මැ කියැවිණි,—

"උතුම් මෙ බිසෝ ස ද
හෙළු බසිති තිසි පද බැ ද
කියනුව බණක් සො ද
කෙළෙන් අරාදනා මන න ද"— යි.

20. සුගතිඳු ගුණ ගැඹ ර
,, කියමි ම සිතනා වැරසැ ර
,, මදුරු දළිනෝකා ව ර
සුනෙර විදිනට තැත් කරන සු ර

අන්වය: සුගතිඳු ගුණ ගැඹර කියමි දී ම සිතන වැරසැර මදුරු දළින් සුනෙර එක වර විදිනට තැත් කරන අයුරු.

ටිප්පණි: සුගතිඳු — බුදුන් ගේ. මනා ගති ඇති හෙයින් ද ශොභන වූ ශරීර හා ගමන් හා ඇති හෙයින් ද මැනැවින් නිර්වාණයට ගිය හෙයින් ද බුදුහු සුගත් නම් වෙති. සුගත්+ඉඳු=සුගතිඳු. මෙහි 'ඉඳු' යනු උත්තමාර්ථය දෙයි. ගුණ ගැඹර — ගුණ ගාම්භීර්ය. කියමි — 'කියම්' දී විය යුතු තන්හි ඡන්දෝ හෙතුයෙන් 'කියමි' යී වී. 'කියමි' යනු කියම්+දී= කියම්+ඉ=කියමි යන විසින් නිපදී. 'කියමි දී' යන තන්හි 'දී' යනු වාක්‍ය සම්බන්ධයෙහි නිපාත යි. සිතන — 'සිත' (සිතීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'සිත' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛ පද යි. (කතු කරු) සිතා-සිතති-සිනි-සිතූ. (කම් කරු) සිතේ-සිතෙති-සිතිණි-සිතුණු. වැරසැර — වීර්‍ය සාර භාවය. එඩිතර බව. සුනෙර — මහා මේරු පර්වතය. විදිනට — 'විදු' (විදීමෙහි) ධාතුයෙන් නිපන් භාව කෘදන්ත නාමය සිවු වන විබත් ගෙන සිටි තැන. 'විදු' ධාතුව 'රක්' ආදී ගණ යි. පරස්මෛ පද යි. (කතු කරු) විදී-විදිති-විදී. (කම් කරු) විදේ-විදෙති-විදිණි-විදුණු.

මේ පද්‍යය, බුදු ගුණ අලංකාරයෙහි,-

"මහ කිවිවරන් පෙ ර
පවසා නො පත් පර තෙ ර
සුගතිඳු ගුණ ගැඹ ර
මෙ මා කියමි සිතන වැරසැ ර

"සුවාසු දහස ක්
නොහාදුන් ගැඹුරැති මුහුද ක්
ගොඩ කෙරෙමි යි උද ක්
ලෙහෙතු කල තැත් වැන්නැ දවසක්" —

යන පද්‍යද්වයයට අනු වැ කැරුණෙකි.

ආරබ්ධ වූ ස්වකීය කාර්‍ය්‍යයෙහි මහත්ත්වය ද එය මැනැවින් සම්පූර්ණ කිරීමට තමන් ගේ ශක්තිය මද බව ද කීමෙන් ස්වකීය නිගතමානත්වය ප්‍රකාශ කිරීම සත් කවීන් ගේ සිරිති. කී හූ මැ යි, මහා කවි කාලිදාසයෝ ද,—

"මන්දඃ කවි යශඃ ප්‍රාර්ථී, ගමිෂ්‍යාම්‍යුපහාස්‍යතාම්
ප්‍රාංශු ලභ්‍යෙ ඵලෙ මොහාදුද්බාහුරිව වාමනඃ"—යි.

(මන්දඃ- මෝඩ වූ සිටැ, කවි යශඃ ප්‍රාර්ථී- කවි කීර්තිය පතන්නෙම්, උපහාස්‍යතාම්- උපහාස කළ යුතු බවට, ගමිෂ්‍යාමි- යෙමි, ප්‍රාංශු ලභ්‍යෙ- ඉතා උස් වූවකු විසින් ලැබිය හැකි, ඵලෙ- ඵලයෙහි, මොහාත්- මුළායෙන්, උද්බාහුඃ- අත් නගන, වාමනඃ ඉව- මිටි පුරුෂයකු මෙන්.)

21. ම කියනා මෙ පද'රු ත
දුරු කැරැ දෙසක් ඇත හො ත
මුනි සඳු ගුණ මහ ත
අසවු වියතිනි නමා සවන ත

**අන්වය:** වියතිනි, ම කියනා මෙ පද රුතැ දෙසක් ඇත හොත දුරු කැරැ මුනි සඳු ගුණ මහත සවනත නමා අසවූ.

**විසඳුම්:** **වියතිනි** — ව්‍යක්තයෙනි. පණ්ඩිතයෙනි. **මෙ පද අරුතැ** — මේ පද්‍යාර්ථයන්හි. **ගුණ මහත** — ගුණ මහත්ත්වය. **නමා** — නම (නැමීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'බල' ආදි ගණ 'නම' ධාතුව පරස්මෙ පද යි. සකර්මක යි. (කතෘ කාරු) නමා–නමති–නැමී–නැමූ. (කර්ම කාරු) නැමේ–නැමෙති–නැමිණි–නැමුණු. 'බස්' ආදි ගණ 'නම' ධාතුව ආත්මනෙ පද යි. නැමේ–නැමෙති–නැම්ණි, නැමි, නති–නැමුණු, නැම්, නතු. **අසවු** — 'අස' (ඇසීමෙහි) ධාතුයෙන් වූ මධ්‍යම පුරුෂ බහු වචන ආඛ්‍යාත පද යි. මෙහි 'හු' විභක්ති යි. අස+හු='හ' කාරයට 'ව' කාරාදෙශයෙන් අසවූ.

මෙ මැ කියන ලද, බුදු ගුණ අලංකාරයෙහි,—

"නුවණැතියෙනි මෙ මා
බස දෙස ඇතත් එ ද මා
දෙ සවන් පුට නමා
පමා නො වැ ගනුව මුනි ගුණ මා"—යි.

22. ලොවැ සියලු මැ සැප  ත්
සැපත් තැන් මෙන් සිරි ග  ත්
දඹදිව් තල මහ  ත්
සැවැත් නම් වී පුරෙක් සහප  ත්

**විසඳුම්:** **සැපත්** — සම්පත්තිය. **සැපත්** — සම්ප්‍රාප්ත වූ. 'සැපත්' යනු 'සැපමුණු' (සැපැමිණීමෙහි) ධාතුයෙන් නිපන් අතීත කෘදන්ත නාම යි. 'සැපමුණු' ධාතුව 'බස්' ආදි ගණ යි. ආත්මනෙපද යි, සැපැමිණේ-සැපැමිණෙති-සැපැමිනිණි, සැපැමිණි, සැපති-සැපැමුණුණු, සැපැමිණි, සැපතු. සැපතු= සැපත්. **සිරි ගත්** — ශ්‍රිය (ශොභාව) ගත්තා වූ **ගත්** — 'ගත්' (ගැනීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'ගත්' ධාතුව 'බස්' ආදි ගණ යැ. පරස්මෛ පද යැ. (කතු කරු) ගනී-ගනිති-ගනි-ගතු. (කම් කරු) ගැනේ-ගැනෙති-ගැනිණි-ගැනුණු.

මෙ මැ කියැවිණි, කාව්‍යශෙඛරයෙහි,-

"දඹදිවැ ඉසුරු බ  ර
රැස් කොට තුබූ තැන් සු  ර
කොසොල් රටැ මනහ  ර
සැවැත් නම් වී පුරෙක් පුවත  ර"-යි.

23. සව සිරි පිරි එ පු  ර
වට කැරැ රැඳි ගැඹර ත  ර
අගල පිළිමිණ් ළ  ර
සිවි නා සුර දෙ පුර හිම් කැ  ර

**විසඳුම්:** රැඳි — අකර්මක 'රඳ' (රැඳීමෙහි) ධාතුයෙන් නිපන් අතීත කෘදන්ත නාම යි. මේ 'රඳ' ධාතුව 'රක්' ආදි ගණ යි. ආත්මනෙපද යි. රැඳේ-රැඳෙති-රැඳිණි, රැඳි-රැඳුණු, රැඳි. 'බල' ආදි ගණ 'රඳ' ධාතුවෙක් ද වෙයි. ඒ පරස්මෛපද යි: රඳා-රඳති-රැඳි-රැඳු ඈ වියින් වර නැඟෙයි. **ගැඹර** — 'අගල' යන්නට විශෙෂණ යි. **තර** — මහත් වූ. 'උර' යන්නට විශෙෂණ යි. මෙහි ගත යුතු 'උස්' අරුත හඟවන්නෙකි. **නා සුර දෙ පුර** — නාග පුරය හා සුර පුරය යන දෙ පුර. අගල, නා පුර හිම් කැරැ සිටී. එය එ තරම්

ගැඹුරු යැ. උර — ප්‍රාකාරය. උර, සූර පූර හිම් කැරැ සිටි. එය එ තරම් උස් යැ. සිටි — මේ අඛ්‍යාතයෙන් උක්ත වනුයේ 'දෙ පුර' යන බහුවචන පදය යැ. එ හෙත් උක්තය නපුංසක ලිඞ්ගික වූ කල්හි එය බහුවචන වුව ද අඛ්‍යාතය එකවචනයෙන් මැ සිටීම සිංහල රීතිය වන හෙයින් නිදොසි. පුරාතනයෙහි නගරයක් වටා පරිඛාවෙක් ද ප්‍රාකාරයෙක් ද ඇත් වී.

24. එහි පහ මුදුනැ බ ඳ
ලෙලෙන රන් දද නල වැ ඳ
හිමවු කුළු හිසැ සො ඳ
කෙළන වැනි සිදඟනන් හැම ස ඳ

අන්වය: එහි පහ මුදුනැ බඳ රන් දද නල වැදූ ලෙලෙන සොඳ හිමවු කුළු හිසැ සිදු අඟනන් හැම සඳ කෙළන් වැනි.

විසඳුම්: එහි — ඒ ශ්‍රාවස්ති නගරයෙහි. බඳ — 'බඳ' (බැඳීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'රන් දද' යන්නට සමානාධිකරණ විශෙෂණ යි. 'බඳ' ධාතුව බස් ආදි ගණ ද රක් ආදි ගණ ද වෙයි. උභය පද යි. 'බස්' ආදි ගණ පරස්මෙ පදයෙහි (කතු කරු) බඳී-බඳිති-බැඳී-බඳු. (කම් කරු) බැඳේ-බැඳෙති-බැඳිණි-බැඳුණු. 'රක්' ආදි ගණ 'බඳ' ධාතුව පරස්මෙපද යැ. (කතු) බඳී-බඳිති-බැඳි. කම් කරු පෙරැ මෙනි. 'බඳ' යනු 'බස්' ආදි ගණ පරස්මෙපද 'බඳ' දයින් වූ අතීත බහුවචන 'බඳු' යන්නෙන් නිපන්නේ යැ. 'බඳු'=(අන්ත්‍යස්වර ලොපයෙන්) බඳ්=(නැවැතැ 'අ' කාරවත් කිරීමෙන්) 'බඳ'. අතීතයෙහි දී ධාත්වන්තයට ආදෙශයක් වැ නිපැදෙන 'බඳ්' යන ආදි රූපයන් ගේ අන්තය 'අ' කාරවත් වැ සිටුනා කල්හි ධාත්වන්තාදෙශයට පළමුයෙන් තුබූ ව්‍යඤ්ජනය යළි දු පැමිණේ. ලෙලෙන — සෙලැවෙන කල්හි. වැදූ — 'වඳ' (වැඳීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'වඳ' ධාතුව 'බස්' ආදි ගණ යි. උභයපද යි. (අත් පද) වඳී-වඳිති-වනී-වඳු. (පර පද) වැඳේ-වැඳෙති-වැඳිණි-වැඳුණු. මෙහි 'වැඳූ' යනු 'ලෙලෙන' යන කෘදන්ත නිපාතයට විශෙෂණ වැ සිටියේ යැ. හෙත්වර්ථය ප්‍රකාශ කෙරේ. "වැඳීම හෙතු කොට ගෙනැ"

යන අර්ථය ලැබේ. කෙළන—'කෙළ' (ක්‍රීඩා කිරීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'කෙළ' ධාතුව 'රක්' ආදි ගණ යි. පරස්මෛපද යි. අකර්මක යි. කෙළ්-කෙළිති-කෙළි.

25. මිණි බිතු වෙතැ දිගැ ස
රගන පිළි බිඹු දිසි ලෙ ස
සුරඟන'වුන් තිද ස
පුරුදු කරනෙ'වි රැඟුම් එක ලෙ ස

අන්වය: දිගැස මිණි බිතු වෙතැ රගන පිළි බිඹු දිසි ලෙස තිදස සුර අඟන අවුන් රැඟුම් එක ලෙස පුරුදු කරන එව.

විස්තර: ඒ ශ්‍රාවස්ති පුරයෙහි සත්‍රීහු එහි මැ වූ මැණික් භිත්ති සමීපයෙහි රඟති. එ විටැ ඔවුන් ගේ පිළිබිඹු ඒ භිත්ති වලැ පෙනෙයි. එය කෙබඳු ද? ත්‍රිදශයෙහි හෙවත් ශක්‍ර පුරයෙහි දිව්‍ය ස්ත්‍රීන් බිමට බැසැ මේ නගරයෙහි ස්ත්‍රීන් ගේ රැඟුම් බලමින් ඒ අනු වැ රඟමින් රැඟුම් උගන්නා වැනි යැ. ශ්‍රාවස්ති නගරයෙහි ගෙවලැ භිත්ති මැණික්මය යැ යි කීමෙන් එහි උදාර ශ්‍රී සෞභාග්‍යය ද එහි ස්ත්‍රීන් ගේ පිළිබිඹු දිව්‍ය ස්ත්‍රීන් මෙනැ යි කීමෙන් ඔවුන් ගේ අතිමනොහර රූපලාවණ්‍යය ද ඔවුන් ගේ රැඟුම් ඉගැන්මට දිව්‍ය ස්ත්‍රීන් පැමිණිය හ යි කීමෙන් ඒ ස්ත්‍රීන් නෘත්‍යයෙහි අතිසමර්ථ බව ද ප්‍රතීත යැ.

මෙ මැ කියන ලද, තිසර සන්දේශයෙහි,—

"පැහැ සර පැපැ සිවුමැලි තුනුව ගේ යා
රඟ දෙන නළඟනන් මිණි බිතු ල ගේ සා
පිළිබිඹු ලෙසින් එහි සැදී සිටැ ර ගේ යා
අඩු වැඩි සුරඟනන් උගතිති හැ ගේ යා"—යි.

විසඳුම්: රඟන—'රඟ' (රැඟුම්හි) ධාතුයෙන් වූ කාලාර්ථ අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. 'රඟ' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛපද යි. අකර්මක යි. රඟා-රඟති-රැඟි-රැඟු. දිසි ලෙස — පෙනුණු ආකාරයෙන්. පිළිබිඹු පෙනුණු ලෙසක් දක්වා. දිසි — 'දිස්' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'දිස' ධාතුව 'බස්' ආදි ගණ ද 'රක්' ආදි ගණ ද

වෙයි. 'බස්' ආදි ගණ 'දිස්' ධාතුව පරස්මෛපද යි. (කතු කාරු) දකී-දකිති-දිටි-දුටු. වර්තමානයෙහි දී 'දිස්' යන්නට 'දක්' ආදේශ වෙයි. (කම් කාරු) පෙනේ-පෙනෙති-පෙනිණි-පෙනුණු. කම් කාරකයෙහි දී 'දිස්' යන්නට 'පෙන්' යනු ආදේශ වෙයි. 'රක්' ආදි ගණ 'දිස්' ධාතුව ආත්මනෙපද යැ. අකර්මක යැ. දිසේ-දිසෙති-දිසිණි, දිසී-දිසුණු, දිසි. අවුත්— 'එ' (පැමිණීමෙහි) ධාතුව නිසා නිපතිත වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'එ' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛපද යි. අකර්මක යි. ඒ-එති-ආ. අතීතයෙහි දෙ බස්හි මැ 'ආ' යනු නිපතිත වෙයි. වර්තමානයෙහි දි විභක්තිය පූර්ව රූපයට යෙයි.

26. පහනැ කොත් මිණි ර ස
වැදූ රත් තරිඳු මැදූ ස ස
බෝසත් සස දව ස
රැසැසි ගිනි රස් මැදට පිනු ලෙ ස

විසඳුම්: රස—රශ්මිය. රත්—රතු වූ. රතු වූයේ ප්‍රාසාදශ්‍රෘංග හි කොත්වලැ වූ මාණික්‍ය රශ්මිය වැදීමෙන් යැ. බෝසත් සස දවසැ ගිනි රස් මැදට පිනු ලෙස— මෙයින් කියැවෙන්නේ ශශ ජාතකය යි. පිනු—'පත්' (පිනීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'පත්' ධාතුව 'බණ' ආදි ගණ යි. උභය පද යි. පනි-පනිති-පිනී-පිනූ. (අත් පද) පෙනේ-පෙනෙති. රැපැසි—ඇරැ+පැ+සි ('ඇරැ' යන්නෙහි 'ඇ' ලොපයෙන්)=රැපැ+සි=(පැ+සි යන තන්හි හ්‍රස්ව වීමෙන්) රැපැයි. මෙහි 'ඇරැ' යනු 'අර' (එළැවූමීහි=ඉදිරියට ගෙනැ පැමිණවීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'අර' ධාතුව 'බස්' ආදි ගණ යි. (කතු කාරු) අරී-අරිති-අළි-අළු. (කම් කාරු) ඇරේ-ඇරෙති-ඇරිණි-ඇරුණු. 'පැ' යනු 'පා' (පැමෙහි) ධාතුයෙන් වූ අතීත ආඛ්‍යාත යි. 'පා' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛපද යි. (කතු කාරු) පා-පාති-පැ. (කම් කාරු) පැවේ-පැවෙති-පැවිණි-පැවුණු.

27. ගන'බ නිල'පුල් ස ර
රන'කුසු මුතු පබල'කු ර
සක් රන දම් තිස ර
ළකල් රන ලිය සරති එ නුව ර

විසඳුම්: ඝන'බ — ඝන අබ· ඝන අභ්‍ර. වැසි වලා කුළු. නිලු'පුල් — නිල් උපුල්. සර — පදුම. රන'කුසු — රන් අකුසු. රත්‍රන්කළ අංකුස. පබල'කුර — පබළු අකුරු. ප්‍රවාලාඞ්කුර. පබළු දළු. සක් — හක් ගෙඩි. රන දම් — රනින් කළ දම්. තිසර — හංසයන්. ළකල් — ළයට (සිතට) කාන්ත වූ. සිතට ප්‍රිය කර වූ. රන ලිය — ස්වර්ණ ලතා. රන් වැල්. සරති — හැසිරෙති. මෙයින් උක්ත වන 'ලිය' යනු නපුංසක ලිඞ්ගික යැ. එ හෙයින් සිංහල රීත්‍යනුකූල වැ ආඛ්‍යාතය එක වචන විය යුතු යැ. කවර හෙයින් එය බහු වචන වී ද? 'ලිය' යනු නපුංසක වුව ද එයින් අභිප්‍රෙත වූවෝ නම් ස්ත්‍රීහු මැ යැ. 'සරති' යන බහු වචන රූපය එ හෙයිනි. 'සරති' යනු 'සර' (සැරැම්හි=හැසිරීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'සර' ධාතුව 'බල' ආදි ගණ යි. උභයපද යි. (පර පද) සරා-සරති-සැරී-සැරූ. (අ:ත් පද) සෙරේ-සෙරෙති.

එ නුවර ළකල් රන ලිය සරති. කෙ බඳු රන ලිය ද? කුමකින් ළකල් රන ලිය ද? ඝන අබ, නිල් උපුල්, සර, රන අකුසු, මුතු, පබළු අකුරු, සක්, රන දම්, තිසර යන මෙ තෙක් දැයින් ළකල් රන ලිය. මෙහි රන ලිය යි ගැනුණාහු නම් ස්ත්‍රීහු යැ. ඔවුන් කෙරෙහි වූ ඝන අබ නම් කෙශ කලාප යැ, නිල් උපුල් නම් නෙත් යැ, සර නම් මුහුණු යැ, රන අකුසු නම් නාසා යැ, මුතු නම් දත් යැ, පබළු අකුරු නම් තොල් යැ, සක් නම් ග්‍රීවා යැ, රන දම් නම් අත් යැ, තිසර නම් පයොධර යැ.

මේ පද්‍යය සැල ළිහිණි අස්නෙහි—

“සුනිල් වලා නව සඳ නිලුපුල් පබ ළු
විමල් සක් ගිජිඳු කුඹු සිරිවැස බැබැ ළු
විපුල් පුලින රඹ සිකි ගල මුතු ළ ද ළු
ළකල් රන ලියන් සරනා බල යහ ළු”

යනු පද්‍යය බලා බැඳුණු සේ පෙනේ.

28\. වන නෙත කමලු'පු ල
දුවන් වැලි තල පැහැ දු ල
එ පුර ලිය තුනු වි ල
සරති සලෙළුන් නුවන් මිහිලා ල

අර්‍ථ: වත (මුහුණ) නමැති කමල් ද නෙත නමැති උපුල් ද දුවන් නමැති පැහැ දුල මැලි තල ද ඇති එ පුර ලියන් ගේ තුනු නමැති විල්හි සලෙළුන් නුවන් නමැති මිනලොල සරති.

විසඳුම්: කමල් — නෙළුම්. සත්‍රීන් ගේ මුහුණු නෙළුම් වලට සමාන කිරීම අති ප්‍රසිද්ධ යැ. උපුල — උත්පල. නිල් මානෙල්. දුවන් — ජඝනය. උකුළ. තුනු — ශරීර. නුවන් — නෙත්‍ර. ඇස්. මිනිලොල — මධුලොලයෝ. මී මැස්සෝ.

ඒ සත්‍රීන් ගේ ශරීර විල් හා සමාන යැ. විල්හි නෙළුම් ද මානෙල් ද වැලි තලා ද මී මැස්සෝ ද වෙති. මේ සත්‍රීන් ගේ මුහුණු නෙළුම් වැනි යැ. ඇස් මානෙල් බඳු යැ. උකුළු වැලි තලා මෙන් යැ. ඔවුන් ගේ රූපයෙන් මත් වැ ඔවුන් දෙස නෙත අයා බලා සිටින්නා වූ කාමුක ජනයන් ගේ ඇස් මී මැස්සන් හා සමාන යැ.

| | | |
|---|---|---|
| 29. | රත්'දරිනි | නා ලිය |
| | ගමනින් සදිසි | නා ලිය |
| | එ පුර සර | නා ලිය |
| | කවුරු නම් හැකි වෙති ව | නා ලිය |

අන්වය: රත් අදරිනි නා ලිය ගමනින් නා ලිය සදිසි එ පුර සරනා ලිය කවුරු නම් වනා ලියැ හැකි වෙති.

විසඳුම්: අදරිනි — අධරයන් ගෙන්. තොල්වලින්. නා ලිය — නා දළු. නා ලිය — නාග අඞ්ගනාවන්. ඇතින්නන්. සරනා — හැසිරෙන. ලිය — සත්‍රීන්. වනා ලියැ — වණිනා කැරැලත් හොත්. වනා — 'වන' (වණිනා කිරීමෙහි) ධාතුයෙන් වූ පූර්‍ව ක්‍රියා නිපාත පද යි. 'වන' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛපද යි. (කතු කරු) වනා-වනති-වැනී-වැනූ. (කම් කරු) වැනේ-වැනෙති-වැනිණි-වැනුණු. ලියැ — අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. ල + ඉයැ = ලියැ.

නා දළු රතු යැ. සත්‍රීන් ගේ තොල් ද රතු යැ. ඇතින්නෝ බර ගමනින් යුක්තයෝ යැ. සත්‍රීන් ගේ ගමන ද එ බඳු යැ.

30\. හස තනිඳුවර නෙ ති
බමර බැම පුල් සර ව ති
නිල් සෙවෙල් වරලැ ති
එ පුර විල් කල්බඳුන් එක සු ති

අර්ථ: හංස නමැති තන ද ඉඳුවර නමැති නෙත් ද බමර නමැති බැම ද පුල් සර නමැති වත් ද නිල් සෙවෙල් නමැති වරල් ද ඇති එ පුර විල් කල් බඳුන් හා එක සුති.

විසඳුම්: ඉඳුවර — ඉන්දීවර. නිල් මානෙල්. බමර — භ්‍රමර. මී මැස්සන්. පුල් සර — පිපුණු නෙළුම්. වත් — මුහුණු. වරල් — කෙශ කලාප. කල්බඳුන් — කාන්තා දෙගිනීන්. සිත් කලු වූ ශරීර ඇත්තන්. සත්‍රීන්. එක සුති — එකාකාර යැ. සමාන යැ. 'නෙත්' 'වත්' යනු එළි සමය පිණිස 'ඉ' කාරවත් කරන ලද.

28 වන පද්‍යය කියා යළි මේ පද්‍යය කීම කවිහුට ගෞරව පිණිස නොවේ.

31\. උදුල දල කොක වැ ල
ගන රන් පොරොඳු විදු ලෙ ල
මද වැසි පොද වත ල
සරණ ගන කුළු වැන්නැ ගජ ර ල

විසඳුම්: උදුල — බබළන්නා වූ. වැල — පඞ්ක්තිය. පොරොඳු — හස්ත්‍යාභරණයට මේ නම්. විදු — විදු ලිය. පොද — බින්දු. වතළ — 'වතුරු' (ව්‍යප්ත වීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'වතුරු' ධාතුව 'බස්' ආදි ගණ යි. ආත්මනෙපද යි. වැහිරේ-වැහිරෙති-වැහිරිණි-වැහිරි, වහිළි-වැතුරුණු, වැහිරි-වතුළු. වතුළු=වතළ. වැන්නැ — වැනි+යැ=වැන්+යැ=වැන්නැ. රළ — සමූහය.

එ නුවර සරන ගජ රළ ගන කුළු වැන්නැ. ශරීරයෙහි විශාල බව සහ කාල වර්ණත්වය ගැන පමණක් සැලැකුව ද මේ උපමාව යෙදෙතුදු, සමානත්වය එ පමණෙකින් නො නවතී. ගන කුළු ආශ්‍රිත වැ කොක් පඞ්ක්ති වෙති. මේ ගජ රළ ගේ දන්ත කොක් පෙළ වැනි යැ. ගන කුළුවලැ විදු ලිය ඇත්තේ යැ. ගජ රළ ගේ ඝන රන් මය පොරොඳු විදු ලිය හා සම යැ. ගන කුළුවලින් වැසි පොද වැහිරේ. ගජ රළ ගේ මද ඉසීම වැසි පොද වැහිරීම හා එක බදු යැ.

මේ පද්‍යය කොවුල් අස්නෙහි,—

"දිලි විදුලී සැරැහූ ගන රන් පොරෙ දු,
නිසුණු වූලී දළු දළු කොක වැළ විහි දු,
කනාත හැල් ගිලි මද වැසි පොද සිහි දු
සරනබලි ගජ මුළු මේ කුළුන් බ දු"

යන පද්‍යය බලා කැරුණෙකි.

32. නරවර සුනෙර දු ළු
ඇමැති ගණ කුල ගිරි පෙ ළු
පුර කිරණවැ නැබ ළු
විසුල රළු වැළු වැන්නෑ හය ර ළු

අන්වය: හය රළු, නරවර සුනෙර ඇමැති ගණ කුල ගිරි පෙළු දුළු නැබළු පුර කිරි අණවැ විසුළු රළු වැළු වැන්නෑ.

අර්ථ: (ඒ ශ්‍රාවසති පුරයෙහි) හය රළු (කෙ බඳු ද?) නරවර (නමැති) සුනෙර දුළු, ඇමැති ගණ (නමැති) කුල ගිරි පෙළු දුළු පුර (නමැති) නැබළු කිරි අණවැ විසුළු රළු වැළු වැන්නෑ.

**විපසණි:** **හස රළ** — අශ්ව පඞ්ක්තිය. **නරවර** — නරේන්ද්‍ර නමැති. **සුනෙර** — මහා මෙරුව. **ඇමැති ගණ** — අමාත්‍ය සමූහ නමැති. **කුල ගිරි පෙළ** — (සපත) කුල පර්වත පඞ්ක්ති. **නැබල** — විශාල වූ. **කිරි අණවැ** — ක්ෂීරාර්ණවයෙහි හෙවත් කිරි මුහුදෙහි. **විසුල** — විසිරී ගියා වූ. 'විසුල' යනු 'විසුරු' (විසිරීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'විසුරු' ධාතුව 'බස්' ආදි ගණ ආත්මනෙපද යි. විසිරේ–විසිරෙති–විසිරිණි, විසිරි, විසිළි–විසුරුණු, විසිරි, විසුළු. **රළ වැළ** — තරඞ්ග පඞ්ක්තිය.

සැවැත් නුවර හය රළු විසුළු රළු වැළු වැන්නෑ. කොහි රළු වැළු ද? ඒ නගරය නමැති කිරි මුහුදෙහි. ඒ කිරි මුහු ද මැද නරේන්ද්‍ර නමැති මහා මෙරු පර්වතය වෙයි. එය පිරිවරා අමාත්‍ය සමූහ නමැති කුල පර්වත පඞ්ක්තිය වෙයි. කුල පර්වත නම් මේරුව වටා පිහිටි යුගන්ධර, ඊෂධර, කරවීක, සුදර්ශන, නෙමින්ධර, විනතක, අශ්වකර්ණ යන පර්වත වළලු හත යැ.

33. සුදු සිඳු යොදන ල ද
රන් දද නැඟූ මන න ද
එ පුරැ රිය සක් න ද
පැතිරැ පවති දිගතැ විනිවි ද

අන්වය : සුදු සිඳු යොදන ලද මන නද රන් දද නැඟූ එ පුරැ රිය සක් නද දිගු අතැ විනිවිදැ පැතිරැ පවතී.

විපසණි : සිඳු — අශ්වයන්. රන් දද — සවණී ධවජ–රන් කොඩි. නැඟූ — 'නග' (නැඟීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'නග' ධාතුව 'බල' ආදි ගණ ද 'රක්' ආදි ගණ ද වෙයි. 'බල' ආදි ගණ 'නග' ධාතුව පරස්මෛ පද යි. සකර්මක යි. (කතෘ කාරක)–නගා–නගති–නැඟි–නැඟූ. (කර්ම කාරක)– නැඟේ–නැඟෙති–නැඟිණි–නැඟුණු. 'රක්' ආදි ගණ 'නග' ධාතුව පරස්මෛපද යි. අකර්මක යි. නගී–නගිති–නැගී. රිය සක් හඬ — රථ චක්‍ර නාදය. විනිවිදැ — 'වි' 'නි' පූර්ව 'විදු' ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'විදු' ධාතුව 'රක්' ආදි ගණ යි. විදී–විදිති–විදී. (කර්ම කාරක) විදේ–විදෙති–විදිණි–විදුණු. පවති — 'පවත්' (පැවැත්මෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාතපද යි. 'පවත්' ධාතුව 'රක්' ආදි ගණ යි. උභය පද යි. පරස්මෛපදයෙහි, පවතී–පවතිති–පැවැති. ආත්මනෙ පදයෙහි,–– පැවැතේ– පැවැතෙති– පැවැතිණි– පැවැතුණු. දිගතැ — දිගු+අතැ. දිශා අන්තයන්හි. දිශා කෙළවරැ.

මෙ මැ කියන ලද, බුදු ගුණ අලංකාරයෙහි,—

"එ පුර රජ මහ ව ත
බන් රන් දේදෙන් පැහැ ප ත
සක් සන් ගත් දිග ත
තිතොර රත සෙන් විතර වන නැ ත" යි.

34. ජය ගත් අසුර සෙ න්
විකුමෙන් සදිසි මහ සෙ න්
දිනූ නෙක රුපු සෙ න්
එ පුරැ හැසිරෙති තුමුල බල සෙ න්

අන්වය : අසුර සෙන් ජය ගත් මහසෙන් සදිසි විකුමෙන් නෙක රුපු සෙන් දිනූ තුමුල බල සෙන් එ පුරැ හැසිරෙති.

**විසඳුම්:** **අසුර සෙන්** — අසුර සේනාවත්. **මහසෙන්** — මහාසෙනයා. ස්කන්ද කුමාරයා. මහා සේනාව ඇති වූයෙන් හේ 'මහාසෙන' නම් වී. **දිනූ** — 'දින' (දිනීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'දින' ධාතුව 'බල' ආදි ගණ යැ. පරස්මෛපද යැ. (කතු කරු)– දිනා– දිනති– දිනී– දිනූ. (කම් කරු)-දිනේ-දිනෙති-දිනිණි-දිනුණු. **තුමුල බල සෙන්** — මහත් වූ භට සේනා. **හැසිරෙති** — 'හසුරු' (හැසිරීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'හසුරු' ධාතුව 'බස්' ආදි ගණ ආත්මනෙපද යි. හැසිරේ-හැසිරෙති-හැසිරිණි, හැසිරි, හසිළි-හැසුරුණු, හැසිරි, හැළි. **සෙන්** — ප්‍රකෘතිය 'සෙනඟ' යනු යැ. බහුවචන ප්‍රථමා ද්විතීයා විභක්ති රූප ගැනීමේ දී ප්‍රකෘතියෙහි 'අඟ' යන්න ද විභක්තිය ද ලොප් වෙයි.

**35.** **සුර පුර යුත් පබ ද**
**එ නුවරැ සව් ඉසුරු වි ද**
**කොසොල් රජ මන න ද**
**නිතොර වැජැඹේ සක් දෙව්දු ලෙ ද**

**අන්වය:** මන නද කොසොල් රජ සුර පුර යුත් පබඳ එ නුවරැ සව් ඉසුරු විඳැ සක් දෙව්දු ලෙද නිතොර වැජැඹේ.

**විසඳුම්:** **යුත්** — වැනි වූ. **සක් දෙව්දු ලෙද** — ශක්‍රයාගේ ඓශ්වර්යයෙන් ඉතා උසස් හ. **නිතොර** — විඳිනා සව් ඉසුරෙහි අඩුවක් කිසි කලෙකත් නො වන හෙයින් මෙසේ කියන ලද. **වැජැඹේ** — 'වජඹ' (විජෘම්භණයෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත යි. 'වජඹ' ධාතුව 'රක්' ආදි ගණ යි. උභය පද යි. පරස්මෛපදයෙහි, වජඹී- වජඹිති- වැජැඹි. ආත්මනෙපදයෙහි- වැජැඹේ-වැජැඹෙති-වැජැඹිණි-වැජැඹුණු.

**36.** **රජ දම් නුබ පසි දු**
**සැපැමිණී මෙ රජ පුත් ස දු**
**ගුණ අම රැසින් මු දු**
**උදම් කෙළෙ සව් සතුන් පෙම් සි දු**

**අන්වය:** පසිදු රජ දම් නුබ සැපැමිණි මෙ රජ පුත් සඳු මුදු ගුණ අම රසින් සව් සතුන් පෙම් සිඳු උදම් කෙළෙ.

**විසඳුම්:** රජ දම්, රාජ ධර්‍ම: පුරාතනයෝ සියලු රාජ ධර්‍මය ගුණ දශයක් කෙරෙහි හකුළුවා දැක්වූ හ. ඒ නම්, දාන, ශීල, පරිත්‍යාග, ඍජු බව, මෘදු බව, තපො ගුණ, අක්‍රොධ, අවිහිංසා, ක්ෂාන්ති, අවිරොධිතා යන මේ යැ. නුබ— ආකාශය. අම රැසින් — අමෘත රශ්මියෙන්. ප්‍රිය ජනක සුව පහස් දෙන රශ්මියෙන්. කවර ඉන්ද්‍රියයක් සුව ද පිනවන ගුණය අමෘත ගුණය යි. පෙම් සිඳු — ප්‍රෙම නමැති සාගරය. උදම් කෙළෙ — උදෑම කෙළේ යැ. උදෑමය නම් ඉදිමීම යි. මහත් වීම යි. සාගරයෙහි වඩ දිය ඇති වන්නේ චන්ද්‍රයා හෙනි. එ හෙයින් සාගරය පුන් සඳින් උදම් වෙති යි කවීහු යෙති.

මේ රජ රාජ ධර්‍ම නමැති ආකාශයට පැමිණි පූර්ණචන්ද්‍රයා යැ. රාජ ධර්‍මයට පත් වීම නම් රජ බවට පත් වීම මැ යැ. පත් වැ මෘදු ගුණ නමැති අමෘත රශ්මියෙන් සකල සත්ත්ව යන් ගේ ප්‍රෙම නමැති සාගරය උදෑම කෙළේ යැ. ස්වකීය රාජ්‍ය වාසීන් ගේ සිත් ගෙන රාජ ධර්‍ම අනුල්ලංඝනයෙන් රජ කම් කළ බව යැ මෙයින් කියැවුණේ.

37. වදන් අම රසි නා
ගුණ මිණි තිළිණ රළි නා
මෙ නරවර දිය නා
වැජැඹි මනු නය වෙරළ නො පැ නා

**අර්ථය:** මේ නරවර තෙමේ සමුද්‍රයෙකි. ඒ සමුද්‍රයෙහි ඇත්තා වූ අමෘත රසය නම් මේ රජු ගේ වචන යි. ඒ වචන එ පමණට රසවත් යැ. ඒ සාගරයෙහි මැණික් නම් මොහු කෙරෙහි වූ සාධු ගුණ යි. රළ (තරඞ්ග) නම් මොහු ගේ ත්‍යාග යි. සාගරයෙහි රළ නැඟීම කලෙකැත් නො නවතින්නාක් මෙන් මේ රජු ගේ ත්‍යාගය ද කලෙකැත් නො නවතී. මේ සාගරයෙහි වෙරළ නම් මේ රජු කිසි කලෙකැත් ඉක්මැ නො යන්නා වූ මනු නීතිය යි. රාජ්‍යානුශාසනය එ තරම් නීත්‍යනුකූල වැ මැ කෙරෙයි.

**විසඳුම්:** — අම රසිනා — අමෘත රසය වූයේ සාගරයෙහි යැ. විෂ්ණුහු කිරි මුහුද අළලන කලැ ධන්වන්තරි මහර්ෂි තෙමේ අමෘතය පිරූ කමණ්ඩුලුව ගෙනැ නික්මිණ. දිය නා—

ජලනාථකයා. සාගරය. මනු නෘ — මනු නීතිය. මනු නම් අතිපූර්ණයෙහි පහළ වැ සිටි මහාසෘෂිවරයෙකි. ගේ මහා නීති ග්‍රන්ථයක් කෙළේ යැ. ඒ දැනුදු පවනී.

38. මෙ රජ තෙද නල වැ ද
රුපු රජ අගිලැ'විළැ සෙ ද
යස දුම ඝෙන විඟි ද
මිදූ රුපු කල් වරල් එක බ ඳ

අන්වය: මෙ රජ තෙද අනල වැදූ රුපු රජ අගිලැ සෙද ඇවිළැ යස දුම විඟිදූ යෙන, රුපු කල් වරල් මිදූ එක බඳ.

අර්ථ : මේ රජු ගේ තෙජස මහත් ගින්නෙකි. එය වැදී ශත්‍රු රාජ නමැති අගිල් වනයෙහි වහා මැ ඇවිළැ යෙයි. එ විටැ ඒ රජු ගේ කිර්තිය නමැති දුම ඒ අගිල් වනයෙන් විහිදී යෙයි. ඒ දුම වදිනු පිණිස සතුරු රජුන් ගේ කාන්තා-වන් ස්වකීය කෙශ කලාපයන් මිදුවාක් වැන්නැ. යුද්ධ-යෙහි දී මේ රජුට විරුද්ධ වැ එන්නා වූ සියලු සතුරු රජුන් වැනැසෙන බව ද ඒ සතුරු රජවරුන් ගේ භාර්‍යාවන් ස්වකීය ස්වාමිවරුන් ගේ වියොගයෙන් කෙශ කලාපයන් මුදා හෙනැ වැලැපෙන බව ද මේ කී සැටි යැ.

තෙජස රතු යැ යනු කවි සමය යි. එයට ගින්න උප මිත වනුයේ එ හෙයිනි. කිර්තිය සුදු යැ යනු සම්මත යි. එ හෙයිනි එයට දුම සමාන කැරෙනුයේ.

විශෙෂ: අනල—ගින්න. ඇවිළැ—'අවුළු' (ඇවිළීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'අවුළු' ධාතුව 'රක්' ආදි ගණ ආත්මනෙපද යි. ඇවිළේ-ඇවිළෙති-ඇවිළිණි-ඇවිළි-ඇවිළුණු, ඇවිළි. 'රක්' ආදි ගණයට අයත් ආත්මනෙපද ධාතුහු පූර්ව ක්‍රියායෙහි 'ඇ' ප්‍රත්‍යයය ද ගනිති. විහිදූ — 'විහිදු' (විහිදීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'විහිදු' ධාතුව 'බල' ආදි ගණ ද 'රක්' ආදි ගණ ද වෙයි. 'බල' ආදි ගණ වූ විටැ එය පරස්මෛපද යැ. සකර්මක යැ, (කතෘ කාරු) විහිදා-විහිදති-විහිදී-විහිදූ (කර්ම කාරු)-විහිදේ-විහි දෙති- විහිදිණි- විහිදුණු. 'රක්' ආදි ගණ වූ විට එය ආත්මනෙපද යි. අකර්මක යි. විහිදේ- විහිදෙති- විහිදිණි-

විගිදි-විගිඳුණු, විඟිදි. රුපු කල් — ශත්‍රු කාන්තාවන්. සතුරු රජුන් ගේ කාන්තාවන්. මිදූ — 'මුද' (මිදීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. ''මුද' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛපද යි. (කතු කරු) මුදා-මුදති-මිදි-මිදූ-. (කම් කරු) මිදේ-මිදෙති-මිදිණ-මිදුණු. එක බඳ — එකාකාර ලෙ.

මේ පද්‍යය, පරෙවි අස්නෙහි,—

" ශු ග ත පත සහසපත සිය කිරණ බ ඳු
දි මු ත මොංගු තෙද'ග රුපු අගිලැ'විලැ රු ඳු
දි ග ත දිවෙත යස දුම ගුණ සුවද රැ ඳු
මලොා ත සරල් වරලස උනඹුවෝ මි ඳු "

යන පද්‍යය බලා කැරුණෙකි.

39. පුවතර මෙ රජ මි ණ
විකුම් සබවස විතර ණ්
රජ දහමින් පොර ණ
සතර වැනි කොට රකී සිය ප ණ

අන්වය : පුවතර මෙ රජ මිණ විකුම් සබවස, විතරණ, සිය පණ සතර වැනි කොට, පොරණ රජ දහමින් රකී.

විවරණ : මිණ—මාණික්‍යය. මෙහි උත්තමාර්ථය දෙයි. සබවස — සත්‍ය වචනය. විතරණ — ත්‍යාග ගුණය.

මේ රජ සවකීය ජීවිතයට ද වඩා උසස් කොට රකින් නා වූ කරුණු තුනෙක් වෙයි. එයින් පළමු වැන්න වික්‍රමය යි. දෙවැන්න සත්‍ය වචනය යි. තුන් වැන්න ත්‍යාග ගුණය යි. ජීවිතය රැකෙනුයේ සතර වැනි කොට යැ. පුරාණ රාජ ධර්මානුකූල වැ ප්‍රජා පාලනය කරන්නා වූ යහපත් රජවරුන් මේ තී ගුණයන් ජීවිතයට ද වඩා උසස් කොට සැලැකිම සිරිති. කීයේ මැ නො, බුදු ගුණ අලංකාරයෙහි,—

" විකුමට නිබොරුව ට
දෙන මහ දනට දන හ ව
දිවි සතර වැනි කො ට
රකින සිහිපත් ඇති වැ හැම වි ට "යැ යි?

40. තෙ - සක් - සිවුපායෙ න
සගුණ - දස - රජ - දහම් න
සිවු සගරා වති න
සතන් රැකැ පවති යැ සතති න

විසඳුම්: තෙසක් — ප්‍රභාව, උත්සාහ, මන්ත්‍රණ යන ත්‍රිශක්තිය. 'ප්‍රභාව' නම් තේජස යි. 'උත්සාහ' නම් නො පසුබස්නා බව යි. 'මන්ත්‍රණ' නම් දත්තවුන් එක් වැ සංවාද කිරීම යි. සිවුපායෙන — සිවු උපාය. සාම, දාන, භෙද, දණ්ඩ යනා සතර උපාය. 'සාම' නම් මිත්‍ර වීම යි. 'දාන' නම් සිත් ගන්නා පිණිස පඬුරු දීම යි. 'භෙද' නම් ඔවුනොවුන් බිඳවීම යි. 'දණ්ඩ' නම් දඬුවම් කිරීම යි. සගුණ — ෂඩ්ගුණය. සන්ධි, විග්‍රහ, යාන, ආසන, ද්වෛධ, ආශ්‍රය යන මොහු යැ. සන්ධි-එකතු වීම. විග්‍රහ- යුද්ධය. යාන- ඉදිරියට යැම. ආසන- නැවැති සිටීම. ද්වෛධ- දෙ විධිය. ආශ්‍රය- අනුන් ආශ්‍රය කිරීම. දස රජ දහම් — 36 වන පද්‍යයට ලියූ විසඳුම් බලන්නේ යැ. සිවු සගරා වත් — දාන, ප්‍රිය වචන, අර්ථචර්‍යා, සමානාත්මතා යන සතර සංග්‍රහ වස්තු. පවති — 'පවත්' (පැවැතීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. මෙයින් උක්ත වනුයේ පූර්ව පද්‍යයෙහි පැනෙන 'මෙරජ මිණි' යන්න යි. 'පවත' ධාතුව 'රක්' ආදි ගණ යි. උභයපද යි. අකර්මක යි. පරස්මෛපදයෙහි-පවති-පවතිති-පැවැති. ආත්මනෙපදයෙහි-පැවැතේ-පැවැතෙති-පැවතිණි-පැවැතුණු.

මේ පද්‍යය කාව්‍යශෙඛරයෙහි,-

"සිවුපා සගුණ සො ද
තෙසක් පසගින් මන න ද
රජ දහම පිළිපැ ද
එ රජ සැප සේ රජ කරන ස ද"

යන පද්‍යය ආශ්‍රයයෙන් කැරුණු සේ පෙනේ.

41. එ නිරිඳු ගෙත් මහ රැ
ලත් අනැගි සිවු තනතු රැ
යස දස දිගත පි රැ
අනේපිඩු සිවු තුමා පින් ය රැ

විසඳුම්: පිරූ — 'පූර' (පිරීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'පූර' ධාතුව 'බල' ආදි ගණද 'බස්' ආදි ගණද වෙයි. 'බල' ආදි ගණ 'පූර' ධාතුව පරස්මෛපද යි. සකර්මක යි. (කර්තෘ කාරු)-පුරා-පුරති-පිරී-පිරූ. (කර්ම කාරු)-පිරේ-පිරෙති-පිරිණි-පිරුණු. 'බස්' ආදි ගණ 'පූර' ධාතුව ආත්මනෙපද යි. අකර්මක යි. පිරේ-පිරෙති-පිරිණි, පිරි, පිනි-පිරුණු, පිරි, පුනු- 'පිරූ' යන තන්හි අනන්‍ය ස්වරය හ්‍රස්ව වී යැ.

මෙ ද කාව්‍යශෙඛරයෙහි,—

"එ නිරිඳු ගෙත් මහ ත්
අනැඟි සිටු තනතුරු ල ත්
අනේපිඬු නම් ලු ත්
සුදත් මහ සිටු තුමා පිත්ව ත්"—

යන පද්‍යය බලා කැරුණේ යැ.

42\. සිවු පනස් කොළ ද න'
විසඳුම් කැරැ ගණන් දූ න
කැරැවූ නිසි ලෙසි න
පතර තුඟු පහ පෙළින් බබල න

අන්වය: සිවු පනස් කොළ දන ගණන් දූනැ විසඳුම් කැරැ නිසි ලෙසින කැරැවූ පතර තුඟු පහ පෙළින් බබලන -

විසඳුම්: සිවු පනස් කොළ දන — පනස් හතර කෝටියක් ධනය. මෙහි කියැවුණේ රන් මිල යැ. කැරැවූ— මෙහි කර්තෘ පදය පූර්ව පද්‍යයෙහි වූ 'අනේපිඬු සිටු තුමා' යනු යැ. බබලන — බබළ (බැබැළීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'බබළ' ධාතුව 'බල' ආදි ගණ ද 'රක්' ආදි ගණ ද වෙයි. 'බල' ආදි ගණ 'බබළ' ධාතුව පරස්මෛපද යි. බබළා-බබළති-බැබැළී-බැබැළූ. 'රක්' ආදි ගණ 'බබළ' ධාතුව ආත්මනෙපද යි. බැබැළේ- බැබැළෙති- බැබැළිණි, බැබැළි-බැබැළුණු, බැබැළී.

43\. බිඟු පෙළ මුවින් ග ත්
සුවඳ මල් තුරු පෙළ යු ත්
දෙව්රම් නම් මහ ත්
බිජී වෙහෙරෙක් බඹ ලොවෙ'ක යු ත්

අන්වය: බිගු පෙල මුවින් ගත් සුවද මල් තුරු පෙළ යුත්, බඹ ලොව එක යුත් දෙව්රම් නම් මහත් වෙහෙරෙක් බිජී.

විසඳුම්: ගත්—සුවද යන්නට විශෙෂණ යි. එක යුත්—එකාකාර (සමාන) වූ බිජී — 'බජ' (බිජීමෙහි-බැබැළීමෙහි) ධාතුයෙන් වූ අඛ්‍යාත පද යි. 'බජ' ධාතුව 'බල' ආදි ගණ යි. උභයපද යි. අකර්මක යි. පරසෛමපදයෙහි- බජා- බජති- බිජී-බිජු, බුජු ආත්මනෙපදයෙහි-බෙජේ-බෙජෙති. භජනාර්ථයෙහි 'බජ' ධාතුව සකර්මක යි.

මේ පද්‍යය හා, කාව්‍යශෙඛරයෙහි,—

"සෙවුනා සිවු ව  රම
සුවද මල් තුරු මන  රම්
බඹ ලොව එක ත  රම
බිජී වෙහෙරෙක් නමින් දෙව්  රම්

යන පද්‍යය හා අතර ඇති සාම්‍යය සලකන්නේ යැ.

44. බඹ සුර නර උරි  දු
මුනිඳුට පිදූ පැහැ වි  දූ
නව මිණි කිරුළු බ  දූ
දිළේ රන් මිණි කොත් පහ'ගැ සැදූ

විසඳුම්: උරිඳු — උර + ඉඳු. නාග රාජයන්. 'උර' නම් නාගයෝ යැ. පිදූ — පූද (පිදීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'කිරුළු' යන්නට විශෙෂණ යි. පූද ධාතුව 'බල' ආදි ගණ යි. පරසෛමපද යි. (කතු කරු) පූදෘ-පූදති-පිදී-පිදූ. (කම් කරු)-පිදේ-පිදෙති-පිදුණි-පිදුණු. විදූ — 'විහිදූ' යන්න සලකා දෙඩුණෙකි. නිවරදැ යි නො හැඟේ. නව මිණි — නවවිධ රත්නයන් ගෙන් කරන ලද. නව රත්න නම්, මුතු, මැණික්, වෛඩූර්‍ය, ගොමෙද, වජ්‍ර, පදමරාග, මරකත, නීල, ප්‍රවාල, යන මේ යැ.

දෙව්රම් වෙහෙරැ පහ අග රන් මිණි කොත් දිළේ. කෙසේ දිළේ ද? බ්‍රහ්මසුරනරෝරගයන් මුනිඳුට පිදූවා වූ ප්‍රභාව විහිදිවූ නව මිණි කිරුළු සෙයින් දිළේ.

45. මහ සඟ ගණ ගෙ ඉ ඳු
සතර පිරිසුදු සිල් ක ඳු
විලස සතර'තැ සැ ඳු
දිළෙල් පිළි මිණි සිවු පවුරෙකු ඳු

**අන්වය:** ඉඳු මහ සඟ ගණ ගෙ සතර පිරිසුදු සිල් කඳු විලස, සතර අතැ සැඳු පිළි මිණි සිවු පවුරෙකුඳු දිළෙල්.

**ටිප්පණි:** ඉඳු — සෘජු වූ. මහා සඞ්ඝයා ගේ 'උජුපටිපන්නතා' ගුණය. **සතර පිරිසුදු සිල්** — ප්‍රාතිමොක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, ආජීව පාරිශුද්ධි ශීලය, ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය යන සිල් සතර. **කඳු** — මේ සිල් සමූහ සමූහ වශයෙන් ගැනෙන හෙයින් ස්කන්ධ නම් වේ. **සතර අතැ සිවු පවුරක්** — ප්‍රාකාරයෙහි සතර පැත්ත සලකා මෙසේ කියැවෙයි. **පිළි මිණි** — පළිඟු මැණික්. **පවුරෙකුඳු** — පවුරෙක්+ඳු. සවරාගම යි.

46. රිවි තරිඳු සුවහ ස
එක විටැ පහළ වූ ලෙ ස
පහ'ග කොත් මිණි ර ස
වැදූ එක'ලු වෙ වෙහෙර'ඹර කු ස

**අන්වය:** රිවි තරිඳු සුවහස එක විටැ පහළ වූ ලෙස, පහ අග කොත් මිණි රස වැදූ වෙහෙර අඹර කුස එක අලු වේ.

**ටිප්පණි:** **තරිඳු** — තරු+ඉඳු. තාරකාවනට ඉන්ද්‍ර (අධිපති) හෙයින් චන්ද්‍රයාට මේ නම්. **අඹර** — ආකාශය. 'කුස' යනු විශෙෂ අර්ථයක් නො දෙයි. 'අඹර කුස' නම් අඹර මැ යැ, අලගියවන්නයන් මේ පද්‍යය බැඳීමේ දී කාව්‍යශෙඛරයෙහි—

"වෙහෙර පන මුදු නේ
රන් කොත් දහස් ගණ නේ
නෑගි මිණි කැලුමෙ නේ
තමා රැ දැවලැ යි නො දූ නේ"

යන පද්‍යය සිහි කළ හ යි සිතියැ හැකි.

47. සඳහම් නද වත ළ
නිල් මිණි පහ මුදුනැ දු ළ
රන් දද පවනැ'බ ළ
දුකැ ගනැයි නද දෙති ගෙ සිකි ර ළ

අන්වය : ගෙ සිකි රළ සදහම් නද වතළ දුළ නිල් මිණි පහ මුදුනැ පවන් අඹළ රන් දද දූකැ ගනැ යි නද දෙති.

විපසණි : දුළ — බබළන්නා වූ. අඹළ — අඹර (ඇඹැරුම්හි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. අඹරවන ලද්ද වූ යන අර්ථ යි. 'අඹර' ධාතුව 'බල' ආදි, ගණ ද 'රක්' ආදි ගණ ද වෙයි. 'බල' ආදි ගණ 'අඹර' ධාතුව පරස්මෛපද යි. සකර්මක යි. (කතෘ කරු)-අඹරා-අඹරති-ඇඹැරී-ඇඹැරූ. අසුනි 'අඹල' යනු නිපාතිත රූප යි. (කර්ම කරු) ඇඹැරේ-ඇඹැරෙති-ඇඹැරිණි-ඇඹැරුණු. 'රක්' ආදි ගණ 'අඹර' . ධාතුව ආත්මනෙපද යි. අකර්මක යි. ඇඹැරේ-ඇඹැරෙති-ඇඹැරිණි, ඇඹැරි-ඇඹැරුණු, ඇඹැරි. ගෙ සිකි රළ — ගෘහ මයූර සමූහයා. ගෘහ මයූරයෝ නම් ගෙවලැ ඇති කැරෙන (හීලෑ) මොණරු යැ. ගනැ යි — ගන + යැ + යි මෙඝ (වැසි වලා කුළු) යැ යි සිතා.

ගෙ සිකි රළ නද දෙති. කවර හෙයින් ද සදහම් නද වතළ දුළ නිල් මිණි පහ මුදුනැ පවන් අඹළ රන් දද දූකැ ගන යැ යි (සිතා) නද දෙති. ජේතවනයෙහි ප්‍රාසාදයෝ ඉතා උස් හ. එහි මුදුනැ රන් දද වෙයි. ඒ පවනින් ඇඹැරෙනැ විටැ විදු ලිය මෙන් දිලියේ. විදු ලිය ඇති වනුයේ මෙඝයෙහි යැ. ප්‍රාසාද නිල් මිණියෙන් කරන ලද හෙයින් මෙඝය වැනි වෙයි. මෙඝයෙක් නම් ගජිනා ඇත්තේ යැ. මේ ප්‍රාසාද යන්හි සද්ධර්මනාදය පැතිරැ පවතී. එය මෙඝ ගජිනා බඳු යැ. වර්ෂාකාලය විශෙෂයෙන් ප්‍රිය කරන්නා වූ මොනරු මෙඝය දූකැ නදදීම සිරිත් වන බැවින් මේ හැම දූකැ මෙඝය වනැ යි සිතා කෙකා නඟති.

මෙ මැ කියන ලද, කාව්‍යශෙඛරයෙහි-

" සදහම් නදින් යු තු
ඉඳුනිල් මිණි පහය ම තු
ලෙළෙ රන් දද දිමු තු
බලා මේ හැඟැ මියුරු රඟ ග තු "... යි.

48. වඳින ලෙස සමතැ ස
පැමිණෙනා බඹ අමර රැ ස
වියන් සිතියම් ලෙ ස
දිළෙළ හැම වරැ වෙහෙර'ඹර කු ස

අන්වය: සමතැස වඳින ලෙස බඹ අමර රැස පැමිණෙනා වෙහෙර අඹර කුස වියන් සිතියම් ලෙස හැම වරැ දිළෙළ්.

විසඳුම්: සමතැස–සමන්තචක්ඛුස්. බුදුන්. පැමිණෙනා–'පමුණු' (පැමිණීමෙහි) ධාතුයෙන් වූ අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. 'පමුණු' ධාතුව වර නැගෙනුයේ 'සැපමුණු' 'ධාතුව' මෙනි. 22 වන පද්‍යයේ විසඳුම් බලන්නේ යැ.

49. බඹ අමර නර නා
කිරුළු මිණි රස් තොයි නා
දෙව් සරණැති ම නා
වසනා වරැ ඒ වෙහෙරැ සව නා

අන්වය: බඹ අමර නරනා කිරුළු මිණි රස් තොයිනා දෙව් මනා සරණ ඇති සවනා ඒ වෙහෙරැ වසන වරැ—

විසඳුම්: තොයිනා—තොයයෙන්. ජලයෙන්. දෙව්—'දෙව්' (සේදීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'දෙව්' ධාතුව 'රක්' ආදි ගණ පරස්මෛපද යි. සකර්මක යි. (කතු කරු) දෙව්–දෙව්ති–දෙව්. (කම් කරු)– දෙවේ–දෙවෙති–දෙව්ණි–දෙවුණු. සවනා—සර්වඥයන් වහන්සේ. වසන—'වස' (වාසය කිරීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නිපාත යි. 'වස' ධාතුව 'බම' ආදි ගණ උභය පද යි. අකර්මක යි. පරස්මෛපදයෙහි, වසා–වසති–විසි–විසූ, වුසූ. ආත්මනෙපදයෙහි–වෙසේ–වෙසෙති.

50. එක් දිනෙකැ පියසා රු
සිල් මිණි හද නිදනැ ද රු
පින් කොත් ගුණ ගැබු රු
සුපිළිපන් මහ සඟන පින් ස රු

**අන්වය:** එත් දිනෙතැ, පියකරු සිල් මිණි හද නිදනෑ දූරු පින් කෙත් ගුණ ගැඹුරු පින් සරු සුපිළිපන් මහ සඟනා–

**විසඳුම්:** **සිල් මිණි** — ශීල නමැති මාණික්‍යයන්. **හද නිදනෑ** — හෘදයය නමැති නිධානයෙහි. **දූරූ** — 'දර' (දුරීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'දූරූ' යැ යී. වියැ යුතු තැනැ ඡන්දෝහේතුයෙන් 'දූරූ' යී සිටියේ යැ. 'දර' ධාතුව 'බල' ආදි ගණ ද 'බම' ආදි ගණ ද වෙයි. සකර්මක යි. උභයපද යි. 'බල' ආදි ගණ වූ තන්හි, (කතු කරු– පර පද) දරා–දරති–දූරී–දූරූ. (අත් පද) දෙරේ–දෙරෙති. 'බම' ආදි ගණ, (පර පද) දරා–දරති–දිරී–දුරූ. (අත් පද) දෙරේ–දෙරෙති. දෙ ගණයෙහි මැ (කම් කරු) දූරේ–දූරෙති–දූරිණි – දූරුණු. **ගුණ ගැඹුරු** — ගුණයන් ගම්භීර වූ. **සුපිළිපන්**—'(සු) පිළිපද' (මැනැවින් පිළිපැදීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. '(සු) පිළිපද' ධාතුව 'බස්' ආදි ගණ පරස්මෛපද යි. සකර්මක යි. (කතු කරු) සුපිළිපදී–සුපිළිපදිති – සුපිළිපනි – සුපිළිපනු. (කම් කරු) සුපිළිපැදේ – සුපිළිපැදෙති – සුපිළිපැදිණි – සුපිළිපැදුණු,

51. දිමුත් මිණි කව සි න්
ගද ගජ පෙලක් විල සි න්
එ තම තම නිවෙ සි න්
නික්ම' වුත් හැඳෑ පෙරෙවැ වෙසෙ සි න්

**අන්වය:** මිණි කවසින් දිමුත් ගද ගජ පෙළක් විලසින් වෙසෙසින් හැදෑ පෙරෙවැ එ තම තම නිවෙසින් නික්මැ අවුත් –

**විසඳුම්:** **මිණි කවසින්** – මැණික් ඔබා කළ කවච යෙන්. කවචය නම් සන්නාහය යි. යුද්ධයට ගෙනැ යන හස්තීහු කවචයන් ගෙන් සරසනු ලැබෙති. **ගද ගජ** — ගන්ධ හස්ති. දස ඇත් කුලයෙන් මේ එකකට නමි. දස ඇත් කුලය –

"කාළාවකං ච ගඞ්ගෙය්‍යං පණ්ඩරං තම්බපිඞ්ගලං
ගන්ධමඞ්ගලහෙමං ච උපොසථඡද්දන්තිමෙ දස"

යනුයෙන් දැක්විණ. ගන්ධ හස්ති කුලය සවැන්න බව මෙයින් පෙනේ. යම් ඇතකු ගේ ගඳ ඇසූ පමණින් මැ සතුරු

ඇත්තු පලා යෙත් ද ඒ ගදැත් නම්. මේ සංස්කෘත ග්‍රන්ථයන්හි දක්වුණු පරිදි යි. වෙසෙසින්. **හැඳෑ පෙරෙවෑ**—මෙහි වෙසෙසින් යනු සුපිළිසත් වැ හැදෑ පෙරෙවි බව කියන්නට යෙදිණ. **හැඳෑ**—'හඳ' (හැඳීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි 'හඳ' ධාතුව 'බස්' ආදි ගණ ද 'රක්' ආදි ගණ ද වෙයි. පරස්මෛපද යි. 'බස්' ආදි ගණයෙහි (කතු කරු) හඳී–හඳිති–හැඳී–හැඳූ. 'රක්' ආදි ගණයෙහි (කතු කරු) හඳී–හඳිති–හැඳි. (කම් කරු) හැඳේ–හැඳෙති–හැඳිණි–හැඳුණු. **පෙරෙවෑ**—'පොරෝ' (පෙරෙවීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'පොරෝ' ධාතුව 'බල' ආදි ද 'රක්' ආදි ද වෙයි. පරස්මෛපද යි. 'බල' ආදි ගණයෙහි (කතු කරු), පොරොවා–පොරොවති–පෙරෙවී–පෙරෙවූ. 'රක්' ආදි ගණයෙහි (කතු කරු) පොරොවී–පොරොවිති–පෙරෙවි. දෙ ගණයෙහි මැ (කම් කරු) පෙරෙවේ–පෙරෙවෙති–පෙරෙවිණි–පෙරෙවුණු. **තම තම නිවෙසින්**—එක මැ විහාරය ඇතුළතැ ඔවුනොවුනට වෙන් කළ කුටි සඳහා මෙසේ කියත්. **නික්මැ**—'නිකුම්' ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'නිකුම්' ධාතුව 'බස්' ආදි ගණ යි. ආත්මනෙපද යි. අකර්මක යි. නික්මේ–නික්මෙති–නික්මිණි, නික්මි, නිකිති–නික්මුණු, නික්මි, නිකුතු. **අවුත්**—'එ' (පැමිණීමෙහි) ධාතුව නිසා නිපනිත වූ පූර්ව ක්‍රියා පද යි 'එ' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛපද යි. අකර්මක යි. ඒ–එති–ආ. අතීතයෙහි දෙ බස්හි මැ ධාතුප්‍රත්‍යයයනට 'ආ' යනු ආදෙශ වෙයි.

මේ පද්‍යය හා ඉහතින් කියැවුණු පද්‍යය ද, ගුත්තිලයෙහි–

"රන් මිණි ලෙන් කු සින්
නිකුත් කෙසරුන් විල සින්
දිනෙකැ සිත් සතො සින්
නික්මැ තම තම වසන නිවෙ සින්"

යන්නේ හා, කාව්‍යශෙඛරයෙහි –

"දවසෙකැ නැණ'ග ප ත්
පෙරටු කැරැ ජිම් සැරිසු ත්
මිණි කවසින් දිමු ත්
ගදැත් විලසින් සගහු ගුණව ත්"

යන පද්‍යයේ හා මිශ්‍රණයෙකින් බැඳුණු සේ පෙනේ.

52\. විහිදෙන මිණි ප බා
පල'ගෙහි මුතු දැල් ල බා
ජය ගත් සුර ස බා
දම් සබා අබතුරෙහි සසො බා

අන්වය : මිණි පබා විහිදෙන පල අගෙහි මුතු දැල් ලබා සුර සබා ජය ගත් සසොබා දම් සබා අබතුරෙහි-

විපසණි : පබා — ප්‍රභාව. විහිදෙන — 'විහිදු' (විහිදීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'විහිදු' ධාතුව 'බල'ආදි ගණ ද 'රක්' ආදි ගණ ද වෙයි. 'බල' ආදි ගණ වූ කල්හි එය පරස්මෛපද යි. සකර්මක යි.- (කතු කරු) විහිදූ–විහිදති–විහිදී–විහිදූ –(කම් කරු) –විහිදේ-විහිදෙති–විහිදිණි–විහිදුණු. 'රක්' ආදි ගණ වූ කල්හි අකර්මක යි. පරස්මෛපද යි. විහිදී – විහිදිති – විහිදි. ලබා — 'ලබ' (එල්ලීමෙහි = ලම්බනයෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'ලබ' යි සිටියැ යුතු තන්හි ඡන්දෝහෙතුයෙන් 'ලබා' යැ යි වියැ. 'ලබ' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛපද යි. (කතු කරු) ලබා– ලබති– ලැබී– ලැබූ. (කම් කරු) ලැබේ–ලැබෙති–ලැබිණි–ලැබුණු. මෙහි කෘදන්ත රූපය 'ලැබූ' යි වියැ යුතු නමුත් 'ලබ' යි සිටියේ යැ. 'ලබ' ධාතුව කෘදන්තයෙහි දී ප්‍රකෘති රූපයෙන් මැ ද සිටුනා ගණයට අයත් යැ. 'දුල' ධාතුව ද මේ ගණයට අයිති වෙයි. 'විහිදෙන' යනු ද 'ලබා' යනු ද 'දම් සබා' යන් නට විශෙෂණ යි. සුර සබා — සුධර්මා නම් වූ දිව්‍ය සභා ශාලාව. තව්තිසා දෙව් ලොවැ පිහිටි අතිශයින් විසිතුරු වූ මණ්ඩපයෙකි. ගුත්තිල දායෙහි එය මෙසේ වැනිණ :-

"තුන් සියයක් යොදු නි
එ සුර සබ දිග – පුළුලි නි
පන්සිය යොදුනුයි නි
යොදුන් නව සියයක් යැ අවටි නි

"වැම් ගන කසුන් ම යැ
බිතු දුල පිළි මැණික් ම යැ
බිම නිල් මැණික් ම යැ
යෙහෙක් නම් ලොවැ එ සබ දුක් ම යැ

"සුසැදි රන් වැම් ල ඩ
උදුල පිළිමිණි පේක ඩ
රැස් දිලි දිගත් මැ ඩ
එ සබ දුටු කලැ ගනී නෙත් මැ ඩ"

**ජය ගත්** — ජේතවන විහාරයෙහි වූ ධර්ම සභාව මෙසෙයින් වැනුණු දිව්‍ය සභාවට ද වඩා රමණීය බව මෙයින් කියැවිණ. **අබතුරෙහි** — අභ්‍යන්තරයෙහි. මේ පද්‍යයට ගුරු වූයේ ගුත්තිල යෙහි—

"රිවි රැස් සු බා ව ට
පැතිරෙන මිණි ප බා ව ට
සක් දෙව් ස බා ව ට
නිගා කළ ඒ දම් ස බා ව ට"

න පද්‍යය යැ යි සිතේ.

53. **සන්සුන් වෙමින් න ඳ
මහලු පිළිවෙල නො විහි ඳ
බුදු ගුණෙහි පිළිබ ඳ
මියුරු රස බස් පවසමින් ඉ ඳ**

විපසණ : **සන්සුන් වෙමින්** — ශාන්තදාන්ත වී. 'සන් සුන්' යනු 'සන්සිඳු' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'සන්සිඳු' ධාතුව 'බස්' ආදි ගණ යි. ආත්මනෙපද යි. සන්සිඳේ - සන්සිඳෙති - සන්සිඳිණි, සන්සිඳි, සන්සිඳී - සන් සිඳුණු, සන්සිඳි, සන්සුනු. **මහලු පිළිවෙල** — භික්ෂූන් උප සම්පදාව ලැබූ වස් ගණනින් මහලු පිළිවෙළ සැලැකෙනු යේ. **විහිඳ** — 'විහිඳු' ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'විහිඳැ' යි වියැ යුතු තන්හි 'විහිඳ' යී සිටියේ එළි වැට රක්නා පිණිස යැ. අත්හැරැ-කඩා-යන අර්ථ යි. **පිළිබඳ** — ප්‍රතිබද්ධ වූ. සම්බන්ධ වූ. **ඉඳ** — 'හිඳු' (හිඳිමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'ඇ' ප්‍රත්‍යයය 'අ' වැ සිටියේ එළි හෙතුයෙනි. 'හිඳැ' යන්නෙහි 'හ' කාර ලොප යෙන් 'ඉඳැ' යනු වෙයි. 'හිඳ' ධාතුව 'බස්' ආදි ගණ යි. පරස්මෛපද යි. හිඳි-හිඳිති - හිනී-හුනු. **'වෙමින්'** යනු ද **'විහිඳ'** යනුද **'ඉඳැ'** යන්නට විශෙෂණ යි.

54. කම් රසෙහි පියැ ලී
සස්නෙහි වූ උකට ලී
මහණකු ගෙ තෙප ලී
පහළ වියැ ඒ සෙබෙහි එ කා ලී

අන්වය: කම් රසෙහි පියැලී සස්නෙහි උකටලී වූ මහණකු ගෙ තෙපල ඒ සෙබෙහි එ කලැ පහළ වියැ.

විසඳුම්: පියැලි — 'පියැල්' (ප්‍රගල්භ වීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'පියැල්' ධාතුව 'රක්' ආදි ගණ යි. ආත්මනෙපද යි. පියැලේ - පියැලෙති-පියැලිණි, පියැලි- පියැලුණු, පියැලි. 'පියැලී' යනු 'ප්‍රගල්භ වැ' යන අර්ථ යි. උකටලි වූ—කලකිරුණු. මහණකු ගෙ—මහණකු ගැනැ-මහණකු පිළිබඳ-යන අර්ථයෙහි යැ මේ යෙදුණේ. එහෙත් අසාධු යැ. මහණකු ගෙ තෙපල නම් ඔහු ගේ බසී.

55. බඹ විමනෙ'ව උදු ළ
මහ ගඳ කිළියැ තිලි තු ළ
යහනතෙහි නිකස ළ
මුනිඳු වැඩැ හිඳැ ලොවට සෙත් කා ළ

අන්වය: බඹ විමන එව් උදුළ මහ ගඳ කිළියැ තිලි අතුළ නිකසළ යහනතෙහි, ලොවට සෙත් කළ මුනිඳු වැඩැ හිඳැ–

විසඳුම්: මහ ගඳ කිළියැ—උතුම් ගඳකුටියෙහි. 'මහ' යනු උත්තමාර්ථය දෙයි. බුදුන් සැතැපෙන කුටිය ගඳකුටි නමැ. තිලි—මෙට්ට. අතුළ—'අතුරු' (ඇතිරීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'යහනතෙහි' යන්නට විශෙෂණ යි. 'අතුරු' ධාතුව 'බල' ආදි ගණ පරස්මෛපද යි. (කතු කරු) අතුරා-අතුරති-ඇතිරී-ඇතුරූ. අශුහි 'අතුළ' යනු නිපතිත රූප යි. (කම් කරු) ඇතිරේ-ඇතිරෙති-ඇතිරිණි-ඇතුරුණු. නිකසළ—කසළින් තොර වූයේ නිකසළ්. පිරිසුදු-නිර්මල-යන අර්ථ යි. යහනතෙහි—මෙහි 'අත' ශබ්දයෙන් විශෙෂ අර්ථයෙක් නො ලැබෙයි.

56. එ පවත් නතු ලෙසි. න
දිව සවනතින් අසමි න
නැගැ සිටැ සමවති න
සරණ දෙරණතැ තබන වෙසෙසි න

**විසඳුම්:** **එ පවත්** — කම් රසෙහි පිහැලි සස්නෙහි උකටලී වූ මහණකු ගැනැ දම් සබායෙහි රැස් වූ භික්ෂූන් අතරැ ඇති වූ කථා ප්‍රවෘත්තිය. **දිව සවනතින්**—දිව්‍ය ශොත්‍ර යෙන්. අනන්තාපරිමාණ වූ ලොක ධාතුයෙහි කවර පුද්ගල යකු කවර තැනෙකැ සිටැ කවර කථාවක් කළ ද එය ඇසියැ හි වූ නම් බුදුහු එයට සමර්ථ හ. එය ඇසෙනුයේ දිව සවන තිනි. 'සවනත්' යන තන්හි වූ 'අත්' යන්න විශෙෂ අර්ථයක් දෙන්නේ නො වේ. **අසමින** — පූර්ව ක්‍රියාර්ථයෙහි මිශ්‍ර ක්‍රියා නිපාත යි. **සමවතින** — සමාපත්තියෙන්. සිත කරුණාදි එක් අරමුණෙකැ යොදා බැහැර යා නො දී එකඟ කිරීම සමාපත්තිය යි. **සරණ** — චරණය. පාදය. **දෙරණතැ**— ධරණියෙහි පොළොවෙහි. **තබන**—'තබ' (තිබුම්හි) දයින් වූ කාලාර්ථයෙහි අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. 'තබ' ධාතුව 'බම' ආදි ගණ යි. පරස්මෛපද යි. (කතු කරු)- තබා–තබති තිබී–තුබූ. (කම් කරු)- තිබේ–තිබෙති–තිබිණි–තිබුණු.

57. පලා නැගි දෙරණ න
සත්බුමු පියුම් මුඳුන න
තබා යුග සරණ න
මුනිඳු වැඩැ සිටැ පින් සිරින් යු න

**අන්වය:** දෙරණත පලා නැගි සත්බුමු පියුම් මුඳුනතැ යුග සරණත තබා, පින් සිරින් යුත මුනිඳු, වැඩැ සිටැ–

**විසඳුම්:** **පලා** — 'පල' (පැළීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'පල' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛ පද යි. සකර්මක යි. (කතු කරු) පලා–පලති–පැලී–පැළු. (කම් කරු)-පැළේ–පැළෙති–පැළිණි – පැළුණු. **සත්බුමු** — සප්ත භූමක. පෙති තට්ටු හතක් ඇති. **මුනිඳු** — කර්තෘර්ථයෙහි ද්විතීයා විභක්ති යි. 60 වන පද්‍යයෙහි 'වසත' යන්නට අනුගත කර්තෘ යි. 55 වන පද්‍යයෙහි 'මුනිඳු' යනුද මේ 'වසත යන්නට මැ අනුගත කර්තෘ යි.

මේ පද්‍යය ගුත්තිල දායෙහි—

"නැඟි දෙරණත ප ලා
විහිදෙන සුවඳ නො ව් ලා
උදහන රොන් ස ලා
පිපුම් පිටැ සිටැ සරණ සහ ලා"

යන්නට සමාන යැ.

58. රැඳු තෙත ලා ර ස
බඳු වද කුසුම් පට ලෙ ස
දෙපට අඳනය තො ස
වඩා තෙ මඬුලු වසා නිසි ලෙ ස

**අන්වය :** ලා රස තෙත රැඳු බඳු වද කුසුම් පට ලෙස දෙ පට අදනය තොස තෙ මඬුලු වසා නිසි ලෙස වඩා –

**විසඳුම්:** **ලා රස තෙත රැඳු**—ලාක්‍ෂා රසයෙන් තෙමුණු බව රැඳුවා වූ. ලා නම් ව්‍යවහාරයෙහි ලා කිරි–ලා කඩ–යනු යෙන් ලැබෙන ද්‍රව්‍යය යි. එය රතු පැහැ ඇත්තේ යැ. රස නම් දිය යි. **රැඳු** — දුරුවා වූ. 'රැඳු' යනු 'රද' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. **ලෙස** — ආකාර වූ. වැනි වූ. **දෙපට අඳනය** — අදනය නම් සිවුර පෙරවීමට මත්තෙන් ඊට යටින් අඳින්නා වූ අන්තර වාසකය යි. එය තනි පට සිවුරක් මෙන් තනි පටින් සකස් නො කැරුණු බව 'දෙපට' යනු යෙදීමෙන් පෙනේ. **තොස** — සන්තොෂයෙන්. පාද පූරණය සඳහා යෙදිණ. පද්‍යයෙහි රස භාවය දූෂණය කෙරෙයි. **තෙ මඬුලු**— ත්‍රිමණ්ඩලය. නාභිය සහ දෙ දණ. **වඩා** — හැද. 'සළු වඩ නවා' යන ආදි තන්හි මේ අර්ථය ලැබේ.

මේ පද්‍යය, බුදු ගුණ අලංකාරයෙහි, –

"ලා රසිනි රැඳු උ දු
බඳු වද කුසුම් පට බ දු
දෙ පට අඳනය මු දු
වඩා තෙ මඬුලු වසා මුනි ස දු

යන පද්‍යයට සමාන යැ. එ ද ගුත්තිල දායෙහි එන–

රුඳ ලා රසි තේ
වඳු වද කුසුම් ලෙසි තේ
දිලෙන මන නඳ තේ
වසා තුන් මඩුලු ඇඳෑ අද තේ

යනු ද ධර්මප්‍රදීපිකාවෙහි- "ලා රෙසෙන් තෙත් මුරුත මල් කලබක් බඳු දෙපට අඳනා සිවුර ........" යනාදිය ද එක් බඳු යැ.

59. තුඟු කසුන් ගිරි ර ද
වටැ වොරැඳි විදු ලිය ලෙ ද
පෑ ද, මන න ද
දෙ පට සරි කොට එ මතු පිට බැ ද

**විසඳුම්:** කසුන් ගිරි රද — කාඤ්චන (=රන්) පර්වත රාජයා. මහාමේරුව. වොරැඳි — 'වොරද' (විරාජමාන වීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'විරාජ මාන වූ' යන අර්ථ යි. 'වොරද' ධාතුව 'රක්' ආදී උභය පද යි. පරස්මෛපදයෙහි. වොරදී – වොරදති – වොරැඳී. ආත්මනෛපදයෙහි – වෙැරැඳේ – වොරැදෙති – වොරැඳිණි – වොරැඳුණු. දෙ පට සරි කොට — සරියේ දෙ පටක් කොට නමා ගෙනැ. එ මතු පිටැ — ඒ අඳනය මතු පිටැ.

60. සැඳෑ වෙලෙකින් සුර ත්
වසනෙව තරිඳු පැහැ ප ත්
නුග පල වන් දිමු ත්
සුගත් සිවුරින් වසන බුදු ග ත්

**අන්වය:** සුරත් සැඳෑ වෙලෙකින් පැහැ පත් තරිඳු වසන එව් නුග පල වන් දිමුත් සුගත් සිවුරින් බුදු ගත් වසන –

**විසඳුම්:** සුරත් සැඳෑ වෙලෙකින් — ඉතා රතු වූ සන්ධ්‍යා වලාහකයෙකින්. සන්ධ්‍යා කාලයෙහි හිරු බැසැ යන විට අවර දිගැ ආකාශයෙහි වලා කුළු රතු පැහැයට හැරේ. නුග පල වන් — න්‍යග්‍රොධ ඵල වණි වූ. බුද්ධ චීවරය

දුදුණු නුග ගෙඩියේ පාටින් යුක්ත යැ. **වසන** — 'වස' (වැසීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'වස' ධාතුව 'බල' ආදී ගණ යි. පරස්මෛපද යි. (කතු කරු),- වසා-වසති-වැසී-වැසූ. (කම් කරු) වැසේ-වැසෙති-වැසිණි- වැසුණු **සුගත් සිවුර** — සුගත චීවරය. සර්වඥයන් වහන් සේ ඉතා බොහෝ කාලයක් මුළුල්ලෙහි පෙරවියේ මේ සිවුර යැ. මේ මහ සිවුර, පුණ්ණා නම් දැසිය ගේ මළ සිරුර වසා අමු සොහොන්හි දමා ගිය පිළියෙන් සකස් කැරුණේ යැ. බුදුන් සවකීය හස්තයෙන් මැ එය ගත් බව ද එ සේ ගැනීමේ දී තිඹක් (නැළි සතරක්) පමණ පණුවන් ගසා දැමූ බව ද එ වේලෙහි මහ පොළොව කම්පිත වූ බව ද කියති. තමන් ගේ පිරිනිවීමෙන් පසු ශාසන භාරය උසුලන්නට වනු මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ව බව සැලැකූ බුදුහු පසු කාලයෙකැ එය කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට පිළිගැන්වූ හ. **බුදු ගත්** — බුද්ධ ශරීරය. **වසන** — මේ අසම්භාව්‍ය කෘදන්ත නිපාතයා ගේ කර්තෘ පදය 55 වන පද්‍යයෙහි ද 57 වන පද්‍යයෙහි ද එන 'මුනිදු' යනු යි.

'පැහැ පත් නරිඳු සුරත් සැදැ වෙළෙකින් වසන එව්' යැ යී කීමෙන් බුද්ධ ශරීරයා ගේ ශුභ්‍ර වර්ණත්වය (සුදු පාට) හැඟැවිණ.

**61.** **සතොස කැරැ සුර න ර**
**මුනිදු සිරුරින් පැහැ ස. ර**
**ස වනක් රස් පත ර**
**මෙ සේ නික්මිණ දිග'ත අලු කැ ර**

**අන්වය:** සුර නර සතොස කර පැහැ සර මුනිදු සිරුරින් ස වනක් රස් පතර දිගත අලු කැරැ මෙසේ නික්මිණි.

**විසඳුම්:** **ස වනක් රස්** — ෂඩ්වර්ණ රශ්මිය. මේ ස වනක් රස් කි නම් දැයි අනතුරු පද්‍යයත් ගෙන් කියැවෙයි. **පතර** — සමූහය. **අලු** — ආලොක. **මෙ සේ** — මේ මතු කියැවෙන අයුරින්.

62\. විලසින් කලිඳු ග ඟ
ඉඳු නිල් ඉඳුවරන් ර ඟ
සුනිල් රස් දස් දි ඟ
පැතිර නික්මිණි වසා සුර ම ඟ

අන්වය: කලිඳු ගඟ විලසින් ඉඳු නිල් ඉඳුවරන් රඟ සුනිල් රස් සුර මඟ වසා දස දිගැ පැතිර නික්මිණි.

විසඳුම්: කලිඳු ගඟ — කාලින්දී නදිය. යමුනා ගඟ. කලින්ද නම් පර්වතයෙන් ගලා එන හෙයින් කාලින්දී නම් වී ල. මෙහි ජලය අතිනීල වර්ණයෙන් යුක්ත යැ. ඉඳු නිල් — ඉන්ද්‍රනීල මාණික්‍යය. ඉඳුවරන් — ඉන්දීවරයන්. නිල් මානෙල්. සුර මඟ — ආකාශය. සුරන් යන එන මඟ හෙයින් ආකාශයට මේ නම්.

මේ කියැවිණ, ගුත්තිල දෑයෙහි දු—

"නිල් මිණි පැහැ ස රා
කලිඳු ගඟ පැහැ පැහැ රා
සුනිල් රැස් දහ රා
දිවි මුළු ලොවැ තවරතව— රා"

යන පද්‍යයෙන්.

63\. උතුරැ සිඳු 'තුල පැ න
මෙර විලින වැ ගියා මෙ න
රන් වන් රස් සොබ න
දිවි සක්වල ගිරි ගිසින් පැ න

අන්වය: උතුරු සිඳු පැන උතුල (මෙන) මෙර විලින වැ ගියා මෙන සොබන රන් වන් රස් සක්වළ ගිරි ගිසින් පැනැ දිවි.

අර්ථ: උත්තර සාගරයෙහි ජලය උතුලාක් මෙන් ද මෙරු පර්වතය දිය වී ගියා මෙන් ද – යන ආදි විසින් ගත යුතු

විසඳුම්: මෙර — මහාමෙරුව. මෙය සුවර්ණමය යැ යෙති. උතුරු සිඳු — උත්තර සමුද්‍රය. මහ මෙරට උතුරින් පිහිටියේ යැ යි කියන සාගරය. මෙ ද රන් වන්

යැ. සවණි සාගර යනු නම ද වෙයි. විලින—සංස්කෘත 'විලීන' යන්නට සමාන යැ. 'දිය වූණු' යන අරු ඇත්තේ යැ. සක්වළ ගිරි හිසින් පැනැ — සක්වළ පිරි පිටතට ද ඉතිරී ගිය බව යැ මෙයින් කියැවෙනුයේ. දිව් — 'දුව' (දිවීමෙහි) ධාතුයෙන් වූ අඛ්‍යාත පද යි. 'දුව' ධාතුව 'බම' ආදි ගණ උභයපද යි. අකර්මක යි. (පර පද) දුවා–දුවති–දිවී–දිවූ (අත් පද) දිවේ–දිවෙතී. දිවීමෙහි 'දව' ධාතුවෙක් ද වෙයි.

මෙ මැ කියන ලද, ගුත්තිල දැයෙහි –

"උතුලෙ'වි තුරු සයු ර
විලින වැ ගියා මෙන් මෙ ර
මුළු ලොව එක පැති ර
දිවි රත් වන් කැලුම් මනහ ර" යි.

64. පියුම්රග මිණි ර ග
සැඳැ වෙල පබළ සිඳු ර ග
බඳු වද කුසුම් ර ග
සුරත් බුදු රස් දිව් දස දි ග

විසඳුම්: පියුම්රග මිණි — පද්මරාග මාණික්‍ය. පද්ම යෙහි පැහැ වනුයේ යම් මැණිකෙකැ ද ඒ පද්මරාග මාණික්‍යය යි. රතු මැණික්. පබළ සිඳු — ප්‍රවාල සාග රය. මහ මෙරට බටහිරි දෙසින් පිහිටි සාගරය. මෙහි ජලය අතිරක්ත වර්ණය යැ යි යෙති.

කාව්‍යශෙඛර කාරයෝ ද මෙ මැ කී හ –

"සැඳැ ගන කැන් සැ ටි
සිඳුරු බඳු වද මල් සැ ටි
පියුම්රු මිණි සැ ටි
සුරත් බුදු රස් ලොව වසා සි ටි" යි.

65. දවහත් තරු සිරි න
කිත ළුගෙහි කිරි සිඳු මෙ නි
සුදු බුදු රජ් සොබ න
දිව් මුළු සක්වල තවරමි න

**විපසණී :** **දවහත් තරු** — ඔෂධී තාරකා. මේ ඉතා සුදු පැහැය ඇත්තේ යැ. **කිත යුගෙහි** — කෘත යුගයෙහි. කල්පයක් යුග සතරකට බෙදෙයි, කෘත, ත්‍රෙතා, ද්වාපර කලි යැ යි. එයින් කෘත යුගය කල්පාරම්භයෙහි වන්නා වූ කොටස යි. අවුරුදු ගණනායෙන් 1785000 කැ යි යෙති. **කිරි සිඳු** — කිරි මුහුද. මහ මෙරට පූර්ව දිශායෙන් පිහිටියේ යැ. මෙහි ජලය පිරිසුදු කිරි මෙන් බවල යැ යෙති. කිරි මුහුද හැම කල්හි සුදු නම් මෙහි කවර හෙයින් කෘත යුගයෙහි කිරි සිඳු ගැනිණි ද? වරක් සුරාසුරයන් විසින් අමෘතය සොයනු වස් කිරි මුහුද කලඹන ලද්දේ යැ. මේ කැලැඹීමට පෙරැ කිරි මුහුද විශෙෂයෙන් ප්‍රසන්නා වැ තුබුණු බවට සැක නැති. ඒ කාලයෙහි එහි අමෘතය ද වී යැ. කිත යුගෙහි කිරි මුහුද මැ ගැනුණේ එ හෙයිනි. **තවරමින** — 'තවර' (තැවැරීමෙහි) ධාතුයෙන් වූ මිශ්‍ර ක්‍රියා නිපාත යි. 'තවර' ධාතුව 'බල' ආදි ගණ ද 'රක්' ආද ගණ ද වෙයි. 'බල' ආදි ගණ වූ කල්හි ප්‍රථමෛ පද යි. සකර්මක යි. (කතු කරු) තවරා–තවරති–තැවැරී තැවැරූ. (කම් කරු) තැවැරේ–තැවරෙති–තැවැරිණි–තැවැරුණු. 'රක්' ආදි ගණ වූ කල්හි 'තවර' ධාතුව අතමනෙ පද යි. අකර්මක යි. තැවැරේ – තැවැරෙති – තැවැරිණි, තැවැරි–තැවැරුණු, තැවැරි.

සුදු බුදු රස් දවහත් තරු මෙනැ යි කාව්‍යශෙඛර කාරයෝ ද කියති "දවහත් තරු අයුරු" යි. බුත්සරණ යෙහි ද–"දවහත් තරු සේ......" යන ආදිය පෙනේ.

66. **සැපැමිණි බුදු පුද ට**
**බඹ සුරන'ගෙහි පැහැ කො ට**
**බුදු රස් වන් මද ට**
**දිවි සක්වල ගලින් පිටත ට**

**අන්වය :** බුදු පුදට සැපැමිණි බඹ සුරන් අගෙහි පැහැ කොට මදට වන් බුදු රස් සක්වල ගලින් පිටතට දිවී.

**විපසණී :** **අගෙහි** — අගනියෙහි, ගින්නෙහි. **මදට වන්** — මඤ්ජිෂ්ඨා වණිය. වැල් මදවෙහි පැහැය. මද රත් පැහැය.

මෙ මැ කියැවිණි, ගුත්තිල දායෙහි ද -

"මුනි රද සඳ ට වන්
සුර බඹ ගිනි මැද ට වන්
විලසින් රතැ ට වන්
කෙරෙමි නැඹැරිණි රස් මද ට වන්"—යැ යි.

67. ලොවැනි හැම පැහැයෙ න
සල සිතුවම් පටක් ගෙ න
විදහා පාන මෙ න
දිවි පබසර කැළුම් හැම තැ න

විසඳුම් : විදහා — 'විදහ' (විදූහීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'විදහ' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛපද යි. (කතු කරු) – විදහා – විදහති-විදූහී – විදූහු. (කම් කරු)- විදූහේ – විදූහෙති – විදූහිණි – විදූහුණු. පබසර — ප්‍රභාස්වර. ලොවැ ඇති තාක් වර්ණයන් ගේ මිශ්‍රණයෙකි.

මේ කියැවිණ, ගුත්තිල දායෙහි ද -
"ලොවැති පැහැ එක් කො ට
කළ රුසිරු සිතියම් ප ට
විදහන මෙන් රුව ට
දිවි පබසර කැලුම් එක වි ට"—යි.

කාව්‍යශෙඛරයෙහි -

"ඇති සියලු ලොව' තු ර
පැහැය ගෙනැ අලැවැ සු ර
කැලුම් කඳ පබ ස ර
දිවි තල් කඳ පමණ මනහ ර"

යනු ද, බුත්සරණයෙහි, - "සියලු ලොවැ ඇති තාක් වස්තුන් ගේ නොඑක් පඟු තාක් එක් කොට හනා අලලා පූවාක් වැනි වූ පබසර රස් කදෙක් නැගි.......... .."යනු ආදිය ද දක්නා ලැබේ

68. කිම්දෑ වා පොළොවෙ ගි
උලැගි වැ වැදි බව'ඟෙ ගි
පැතිරී දස දිගෙ ගි
අසිරි බුදු රස් දිවි ස වණෙ ගි

අන්වය: වා පොළොවෙහි කිම්දෑ උලැගි වැ බව අගෙහි වැදී දස දිගෙහි පැතිරී අසිරි ස වණෙහි බුදු රස් දිවි.

ටිප්පණි: වා පොළොවෙහි — ඝන බොල් පොළොව යැ, ජල පොළොව යැ, වා පොළොව යැ යි පොළොව් තුනෙකි. සමුද්‍රාදිය ද ඇතුළත් වූ පසින් යුක්ත වූ ඝන බොල් පොළොව දෙ ලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝන යැ. එයට යටින් පිහිටි ජල පොළොව, සාර ලක්ෂ අසූ දහසක් යොදුන් ඝන යැ. වා පොළොව පිහිටියේ එයට ද යටින් යැ. ඒ නව ලක්ෂ සැට දහසක් යොදුන් ඝන යැ. එ හෙයින් වා පොළොව කිම්දීමට පස් පොළොව මතු පිටැ සිට සොළොස් ලක්ෂ අසූ දහසක් යොදුන් යට යා යුත්තේ යැ. කිම්දෑ — 'කුම්ද' (කිම්දීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'කුම්ද' ධාතුව 'බස්' ආදි ගණ පර පද ද 'රක්' ආදි ගණ අත් පද ද වෙයි, අකර්මක යි. ('බස්' ආ) කුම්දී-කුම්දනී-කිම්පී-කුම්වූ- ('රක්' ආදි) කිම්දේ-කිම්දෙති-කිම්දිණි, කිමදී-කිමදුණු, කිමදී. උලැගි — 'උලග' දසින් වූ අතීත කෘදන්ත නාම යි. උඩට නැඟුණු යනු අර්ථ යි. ('උ' පූර්ව 'ලග'.) 'උලග' ධාතු 'රක්' ආදි අත් පද යි උලැගේ-උලැගෙති-උලැගිණි, උලැගි-උලැගුණු, උලැගි බව අගෙහි — භවාග්‍රයෙහි එක් සත්ව ලෝකැ උපරිම බ්‍රහ්ම ලෝකය එහි භවාග්‍රය යි. අසිරි — ආශ්චර්ය වූ.

මෙ මැ කියැවිණි; කාව්‍යශෙඛරයෙහි දු —

"වා පොළොවෙහි කිම් ද
ගැවැසී ගොසින් බව'ගැ ද
මුළු සක්වළ විහි ද
දිවි රැළි දී මුනිඳු රස් ක ද" — යි.

ගුත්තිල දෑයෙහි ද—

"ගොස් බඹ ලොවැ වැ දී
ඇඹැරැ නා ලොවැ කිමි දී
මැදයෙහි රැළි දී
මේ සේ එ සවන් කැළුම් විහි දී" —

යනු කියනා ලද්දේ යැ.

69. එ සඳකි මුනි දියැ　　　ස
රන් ගිරි ලෙන තුළෙහි වැ　　　ස
නිකුත් සි රජු ලෙ　　　ස
සුවඳ ගඳ කිළි තුළින් එළි බැ　　　ස

විසඳුම් : දියැස — දිය + ඇස = දියැස. දියට ඇසක් වැනි වූයේ දියැස යැ. දිය නම් (ජගත්) ලෝකය යි. සි රජු— සිංහ රාජයා.

100. තරු පිරිවරන ල　　　ද
ශරා සඳ මඬලක් ලෙ　　　ද
දම් දෙසෙයි සඟ මැ　　　ද
සෑදූ අස්නෙයි මුනිඳු වැඩැ හි　　　ද

විසඳුම් : පිරිවරන — 'පිරිවර' (පිරිවැරීමෙහි) ධාතුයෙන් වූ භාව කෘදන්ත නාම යි. 'පිරිවර' ධාතුව 'බල' ආදී ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු) පිරිවරු-පිරිවරති-පිරිවැරී-පිරිවැරූ. (කම් කරු) පිරිවැරේ-පිරිවැරෙති-පිරිවැරිණි-පිරිවැරුණු. ශරා සඳ — ශරත් සෘතුයෙහි අහස අතිශයින් පවිත්‍ර යැ; වලා කුළින් තොර යැ. එ හෙයින් සඳ ද අතිශයින් ප්‍රභාවත් යැ.

ගුත්තිල කාරයෝ ද මේ මැ කියති—

“තුරු වැල සහ　　　ස් නේ
මැදූ නරිඳු සිරි පු　　　ස් නේ
එ සබ මැදූ අ　　　ස් නේ
එ සඳැ වැඩැ හිඳැ සැප පහ　　　ස් නේ” —යැ යි.

කාව්‍යශේඛරයෙහි දු-

“අතුරු මහ සඟ රැ　　　ස
තරු පිරිවැරූ සඳ ලෙ　　　ස
සිහලුන් උදා ගි　　　ස
මුනිඳු වැජැඹිණි තිලෝ පින් රැ　　　ස” —

යනු පෙනේ.

71. මහණෙනි මෙ තැන් ට
අප රමට පළමු කො ට
කො දූවනක් පල කො ට
උන්නු ද සි වදහළේ සඟන ට

විසඳුම්: මහණෙනි — ආලපනයෙහි 'එනි' විභක්ති යි. දීර්ඝ ඡන්දෝභංගභයෙනි. තො මැනැවි. රමට — 'ඵ' (පැමිණීමෙහි) ධාතුයෙන් වූ භාව කෘදන්ත නාමය සතර වන විබත් ගෙනැ සිටි තැනි. කො — 'කවර' යන අර්ථයෙහි වේ. උන්නු — 'හිඳු' (හිඳීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'නු' නිපාත යි. • උන්+නු=(පූර්ව රූපයෙන්) උන්නු. වදහළේ — 'වදහර' (වැදැරීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය ප්‍රථමා එකවචනයෙහි 'ඒ' විබත ගෙනැ සිටි තැනි. 'වදර' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛපද යි. සකර්මක යි. (කතු කරු) වදුරු–වදරති–වැදූරී–වැදූරු. (කම් කරු) වැදූරේ–වැදූරෙති–වැදූරිණ්–වැදූරුණු. මේ ධාතුයෙන් 'වදළ' යි විශේෂ අතීත රූපයක් නිපාතනයෙන් ලැබේ. එය දෙ බස්හි මැ සාධාරණ ද වෙයි. මෙ සේ නිපාතිත අතීත රූපයක් ගන්නා ධාතු කිහිපයකි. හදර–විතාර–වපුර–උපුර යන ආදිය යි.

මේ අර්ථය ගුත්තිල කාරයන් ගේ පදයෙන් මෙ සේ ය:—

“මෙ තැනැ තෙපි මහණෙ නි
අප රටම පලවුයෙ නි
කුම් නම් පූවතකි නි
සුතු වැ උනු ද යි විතාළේ මුනි නි”

72. එ තෙපුල් අම රසී න
තෙන් මග සඟන අතුරි න
සතිදෙක් ගුණ නද න
සෙබන් නැගැ සිට සෙමෙන් අවුදි න

විසඳුම්: අම රසින — අමෘත රසයෙන් දෙහෝ නො හොත් අමෘත ජලයෙන්. තෙන් — 'තෙම' (තෙමීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'තෙම' ධාතුව 'බල' ආදි ගණ වූ තත්ග පර පද ය. සකර්මක යි. (කතු කරු)

තෙමා-තෙමති-තෙමී-තෙමූ. (කම් කරු) තෙමේ-තෙමෙති-තෙමිණි-තෙමුණු. 'බස්' ආදි ගණ වූ තන්හි අත් පද යි. අකර්මක යි. තෙමේ- තෙමෙති- තෙමිණි, තෙම්, තෙති-තෙමුණු, තෙමි, තෙතු. 'තෙතු' යන්නෙහි අන්ත්‍ය ස්වරලෝපයෙන් 'තෙත' යනු ලැබේ. සෙමෙන් — ඉක්මන් නො වී. මෙහි 'සම' ශබ්දය යි. සම + එන් = සමෙන් = සෙමෙන්.

මේ මැ කියැවිණි, කාව්‍යශෙඛරයෙහි දූ-

"එ තෙපුල් අමා ල ත්
මහ සඟ ගණට ඇතුළ ත්
මහණෙක් යුතු විය ත්
සෙමෙන් නැඟැ සිටැ වෙමින් බැති යු ත්" — යි.

73. පස'ඟ ඔබමින් බි ම
මුනි සඳුට වඩමින් පෙ ම
මුහුල'ත් සුග පිසු ම
මුදුන් මල'සුනැ සුදැ මන ර ම

අන්වය : පස් අග බිමැ ඔබමින් මුනි සඳුට පෙම වඩමින් මුහුලු අත් යුග පිසුම මන රම මුදුන් මල් අසුනැ සුදැ-

විසඳුම් : පසඟ — පඤ්චාඞ්ගය. දැන, දෙ දණ හිස යන පස් තැන. ඔබමින් — 'ඔබ' (එබීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියාර්ථයෙහි මිශ්‍ර ක්‍රියා නිපාත පද යි. 'ඔබ' ධාතුව 'බල' ආදි ගණ යි, සකර්මක යි, පරස්මෛපද යි. (කතු කරු) ඔබා-ඔබති-එබී-එබූ (කම් කරු) එබේ-එබෙති-එබිණි-එබුණු. මුනි සඳුව — මෙහි 'සඳ' යනු උත්තමාර්ථ දෙයි. චන්ද්‍ර, සූසී, සිංහ, හස්ති, ව්‍යාඝ්‍ර, වෘෂභ, හංස යනාදීන් හඟවන නාමයෝ අන්‍ය නාමයකට පර වැ විශෙෂ්‍ය වැ යෙදුණාහු උත්තමාර්ථ දෙති. මුහුලත් සුග පිසුම — හැකුළුණු වූ අත් දෙක නමැති නෙළුම් මල. 'මුහුලු' යනු සංස්කෘතයෙහි 'මුකුලිත' යන්න හා සමානාර්ථ යි. වැඳීමට දෙ අත එක් කළ විට එය හැකුළුණු මලකට සමාන යැ. මුදුන් මල් අසුනැ — මුදුන (හිස) නමැති මල් ආසනයෙහි. සුදැ — 'සුද' (පිදීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා

නිපාත යි. 'පූද' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) පුදා–පුදති–පිදී–පිදූ. (කම් කරු) පිදේ–පිදෙති–පිදිණි–පිදුණු.

කාව්‍යශෙඛරයෙහි එන–

"ඔබමින් බිම පස ග
මුනිඳුට නැමැදැ උතුම ග
මුහුලත් තඹර සු ග
පුදා අඩදුණි වැ කී මේ ර ගා"

යනු මෙයට සමාන යැ.

71. කිමි සඳිනි පව නැ සු
නො කියන ලෙස මෙ ඔබ දෙ සූ
දෙ තිසක් කතා මු සු
දෙයක් නො මැ පැවැසූමු තුසුදු සු

**අන්වය :** පව් නැසූ හිමි සඳිනි මෙ ඔබ නො කියන ලෙස දෙසූ දෙ තිසක් කතා මුසු තුසුදුසු දෙයක් නො මැ පැවැසූමු.

**විස්තර :** **පව නැසූ** — (සියලු) පාපයන් (සම්පූර්ණයෙන්) විනාශ කළා වූ බුදුන් ගේ අභිධානය ගැනැ යැ මේ කියනුයේ. **නැසූ** — 'නස' (නැසීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'නැසූ' යී හ්‍රස්ව වූයේ ඡන්දොභඞ්ගභයෙනි. 'නස' ධාතුව 'බල' ආදි ගණ ද 'බස' ආදි ගණ ද වෙයි. පරස්මෛපද යි. බල' ආදි ගණයෙහි– (කතු කරු) නසා–නසති–නැසී–නැසූ. (කම් කරු) නැසේ–නැසෙති–නැසිණි–නැසුණු. 'බස' ආදි ගණයෙහි අකර්මක යි. නසී–නසිති–නැසි–නටු. **නො කියන ලෙස දෙසූ** — 'නො කියව්'යි තහනම් කොට වදාළා වූ. **දෙසූ** — 'දෙස' (දෙසුම්හි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'දෙසූ' යී හ්‍රස්ව වූයේ ඡන්දය රැකීමට යැ. ධාතුව 'බල' ආදි ගණ යි, සකර්මක යි, පරස්මෛපද යි. (කතු කරු) දෙසා–දෙසති–දෙසී–දෙසූ. (කම් කරු) දෙසේ–දෙසෙති–දෙසිණි–දෙසුණු. **දෙ තිසක් කතා** — භික්ෂූන් ගේ සාකච්ඡාවට භාජන නො වියැ යුතු යැ යි බුදුන් විසින් තහනම් කැරැ වදාරන ලද රජ කථා, චොර කථා ආදි

දෙ තිස් කරා. පාවැසුමු —'පවස' (පැවැසීමෙහි) ධාතුයෙන් වූ අව්‍යත පද යි. 'පවස' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛ පද යි, සකර්මක යි. (කතු කරු) පවසා–පවසති–පැවැසී–පැවැසූ. (කම් කරු) පැවැසේ–පැවැසෙති–පැවැසිණි–පැවැසුණු.

ගුත්තිල දා කාරයෝ මෙය මෙ සේ කියති—

"තිලෝගුරු හිමි ස ද
අප කල කතා මෙහි ඉ ද
විසය රස පිළිබ ද
නො වේ දෙ තිසක් කතා පිළිබ ද"—

75. ඔබ සස්නැ පැවි දී
වෙමින් පිළිවෙතැ නො යෙ දී
කම් රසයෙහි බැ දී
තපෝ ගුණයක් සිතේ නො යෙ දී

විසඳුම් : පැවිදී—දිසී වූයේ ජනුස රුකෙන පිණිස යැං 'මහණ' යන අර්ථ යි. පිළිවෙතැ — ප්‍රතිපත්තියෙහි. ප්‍රතිපත්ති නම් පිළිපැද්ම යි. යෙදී — 'යොද' (යෙදීමෙහි) ධාතුයෙන් වූ කර්මකාරක පූර්ව ක්‍රියා නිපාත පද යි. 'යොද' ධාතුව 'බල' ආදි ගණ යි, සකර්මක යි. (කතු කරු) යොදා–යොදති–යෙදී–යෙදූ. (කම් කරු) යෙදේ–යෙදෙති–යෙදිණි–යෙදුණු. තපෝ ගුණයක් — තාපස ගුණයක්. රාගාදි කෙලෙසයන් තැවීම කරන හෙයින් ශීල සංවරයෙහි පිහිටීම තපෝ ගුණය යි. නො යෙදී — නො යෙදීම් කරණ කොට නෙතැ.

"පැ මහිම මහි දී වැ
හිමි ඔබ සස්න පැවි දී වැ
පිළිවෙත්හි නො ලැ දී වැ
වසිර බැදැ ඔබ කෙරේ වැරු දී වැ"—යි

ගුත්තිල කාරයෝ ද කියති.

76. සස්නෙහි වෙමින් ල ස
ගුණ දම් නසා මුල් පි ස
වසන මහණකු දෙ ස
පවසපසා උනුමු සබ කු ස

අන්වය : සස්නෙහි අලස වෙමින් ගුණ දම් මුල් පිසෑ නසා වසන මහණකු දෙස සබ කුසෑ පවසපවසා උනුමූ.

විසඳුම් : වෙමින් — 'වා' (වීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියාර්ථයෙහි මිශ්‍ර ක්‍රියා නිපාත යි. මුල් පිසෑ — මුලින් මැ උපුටා දමා. 'පිස' ධාතුයෙන් වී. මේ ධාතුව 'බණ' ආදී ගණ උභයපද යි. (කතු කරු- පර පද) පිසී- පිසූහි- පිසී- පිසූ. (අත් පද) පිංස්-පිංසෙති. (කම් කරු) පිංසේ-පිංසෙති-පිසිණි- පිසුණු. උනුමු — 'හිඳු' ධාතු යි 'හ' කාර ලෝප යි. මෙයින් කෙළවර වූ වාක්‍යය ඇරැඹුණේ 72 වැන්නෙහි. එහි 'යතිදෙන්' යන ප්‍රථමාන්තය උක්ත කරන්නෙක් නැති. මහ දෙසෙකි.

77. ඉති යති සැල සාර ත්
අසමින් මුනි කුලුණු සි ත්
බෝසත්හු ද පෙරැ _ ත්
ලදුන් වෙනෑ වඩවමින් ලොබ සි ත්.

විසඳුම් : ඉති — ඉහත කී පරිදි. යති — ප්‍රව්‍රජිත භික්ෂූහු. පෙරැත් — පෙරැ + දු = පෙරැද්=පෙරැත්. මෙහි දු නිපාතය අනුමිතාර්ථයක් දෙයි, දනුත් බෝසත්හු එසේ කළ හ යි හඟවන හෙයින්. 'බෝසත්හු ද' යන තන්හි යෙදුණු නිපාතය පමණි. වඩවමින් — 'වඩමින්' යි දුව ද පමණි. 'වඩ' ධාතු අකර්මක වන හෙයින් මේ ද නො වැරැදි යි.

78. නො සාමසුතු මෙසෙ සො ම
දූඩි දුක් විඳෑ නිසරු සො ම
යළි සිතැ'හි සිදු සො ම
පැමිණියෝ යෑ යි මහත් යසස ම

විසඳුම් : නිසරු සොම — නො සලකා. (ද්‍රව්‍ය යි) ගණනකට නො ගෙනැ. සිතැහි — සිත + ඇහි = සිතැහි. සිතේ අභිප්‍රාය. පැමිණියෝ — 'පමුණු' ධාතුයෙන් වූ 'පැමිණි' යන කෘදන්ත නාමය පෙර වබත් බුහු බස ගෙනැ සිටි තැනි. මෙහි 'වූ' යන ආඛ්‍යාතය අධ්‍යාහාර්‍ය යි. 'පැමිණියෝ' යනු උක්ත විකෘති කර්තෘ යි. 77 වන පද්‍යයෙහි 'බෝසත්හු' යනු උක්ත ප්‍රකෘති කර්තෘ යි. යෑ — අර්ථාවසානයෙහි නිපාත යි. යි — වාක්‍ය සම්බන්ධයෙහි නිපාත යි.

79. ඉති මෙ පද පවස ත
අසනු ලොබ සැරැ එ සිරි ත
එ යති සඳ අයැදි ත
මුනිඳු සඳ දුක්වී ඉකුත් ව ත

අන්වය : ඉති මෙ පද පවසත එ සිරිත අසනු ලොබ සැරැ එ යති සඳ අයැදිත මුනිඳු සඳ ඉකුත් වත දුක්වී.

විසඳුම් : **මෙ පද** — මේ පදයන්. මේ උදෙසා පාඨය. **පවසත** — මෙහි කර්තෘ පදය 77 වන පද්‍යයෙහි 'මුනි' යනු යැ. 'මුනි' යනු කර්තෘපදයෙහි ද්විතීයා විභක්ති යි. **අසනු** — 'අස' (ඇසීමෙහි) ධාතුයෙන් වූ භාව කෘදන්ත නාම යි. **අයැදිත** — 'අයැද' (ඇයැදීමෙහි) ධාතුයෙන් වූ අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. 'අයැද' ධාතුව 'රක්' ආදි ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු)– අයැදී–අයදිති–ඇයැදි. (කම් කරු)– ඇයැදේ–ඇයැදෙති–ඇයැදිණි–ඇයැදුණු. **ඉකුත්** — 'ඉකුම්' (ඉක්මීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'ඉකුම්' ධාතුව 'බස්' ආදි ගණ ආත්මනෙපද යි. ඉක්මේ–ඉක්මෙති–ඉක්මිණි, ඉක්මි, ඉකිති–ඉක්මුණු. ඉකුම්, ඉකුත් වත් — වස්තුව. කථාව. ඉකුත් වත = පූර්ව ජන්මයෙහි ප්‍රවෘත්තිය.

80. දඹදිව තලැ උතු ම්
සව් සිරි සපිරි නො වැ හි ම්
මල්ල දෙසැ මන ර ම්
වී යැ නුවරෙක් කුසාවති න ම්

අන්වය ; උතුම් දඹදිව් තලැ සව් සිරි හිමි නො වැ සපිරි මන රම් මල්ල දෙසැ කුසාවති නම් නුවරෙක් වී යැ.

විසඳුම් : **හිම් නො වැ සපිරි** — මෙතෙකැ යි කියන්නට නො හැකි පමණට සපිරුණු. **මල්ල දෙසැ** — මල්ල දේශයෙහි. මෙය පුරාණ උතුරු-ඉන්දියාවෙහි නේපාලයට ආසන්න වැ පිහිටි ප්‍රදේශයෙක් විය. උතුරින් හිමාලය පර්වතය ද බටහිරින් ශාක්‍ය ජනපදය ද දකුණින් වජ්ජිවිදෙහ යන රට ද නැගෙනහිරින් ගඞ්ගා නදියගේ ශාඛාවක් වූ මහී ගඟ ද මෙයට සීමා යැ. **කුසාවත්** — මෙය මල්ල ජනපදයේ අග නුවර යි. බුද්ධ කාලයෙහි මෙය කුසිනාරා යන

නමින් ප්‍රකට වූ පැවැත්තේ ය. සර්වඥයන් වහන්සේ ගේ පිරිනිවීම වූයේ මෙහි දී ය. දැන් මෙය නේපාලයට අයත් ය. කුසිනාගර නමින් දන්නා ලැබේ.

81. පිළි මිණි පවුර ල ග
බබළනා දිය අගළු ර ග
ගත හර බඹුරු ර ග
කෙලෙස වටැ හුණු වැන්න සුර ග ග

අන්වය: පිළි මිණි පවුර ලනැ බබළන දිය අගළු රග හර බඹුරු රග ගත සුර ගඟ කෙලෙස වටැ හුණු වැන්නැ.

විසඳුම්: පිළිමිණි — පළිඟු. රග — ආකාරය. හර— ඊශ්වරයා — බඹුරු රඟ — කෝලම් නැටුම. ඊශ්වර නෘත්‍ය යෙහි ඉතා සමර්ථ ය. නෘත්‍යයෙහි යෙදෙන කල්හි හේ බොහෝ සෙයින් විකාර වේශයක් ගනී. මේ විකාර වේශය බඹුරු නම්. ගත — ගත් කල්හි. රග ගැනීම නම් නෘත්‍යයෙහි යෙදීම යි. සුර ගඟ — ආකාශ ගඞ්ගාව. මෙය ඊශ්වරයා ගේ ජටාවෙන් පටන් ගනී. කෙලෙස — කෛලාස නම් පර්වතය. මේ ඊශ්වරයා ගේ නිවාසය යි. හුණු — 'හෙ' (වැටීමෙහි = පතනයෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. වැටුණු යන අර්ථ යි. 'හෙ' ධාතුව 'බල' ආදි ගණ යි, ආත්මනෙපද යි. හේ-හෙති-හිණි-හුණු.

ඊශ්වරයා කෛලාස මස්තකයෙහි සිටැ ගෙනැ නටමින් හිස කරකවයි එ විටැ ඔහු හිසෙහි වූ අහස් ගඟ කෛලාස පර්වතය වටා පතිත වෙයි. මේ නගරයේ පරිඛාව එය වැන්නැ යි කීමෙන් ප්‍රාකාරයා ගේ උස ද පරිඛාවේ ජලය එ තරම් පිරිසුදු බව ද කියන ලදී. පිළි මිණි පවුර කෙලෙස වැන්නැ හිමයෙන් වැසී සිටුනා හෙයින් කෙලෙස සුදු ය.

82. නෙතු මුව කුසුම්'දු ල
සාර'දර සරණ නව ද ල
දුන් කල අමා ප ල
එ පුර ලිය සාජ් ලියන් එක තු ල

අන්වය: එ පුරි, නෙතු මුව කුසුම් උදුල කර අදර සරණ නව දල (උදුල) පුන් තන අමා පල (උදුල) ලිය කප් ලියන් එක තුල.

විසඳුම්: උදුල — බබළන්නා වූ. 'ලිය' යන්නට විශේෂණ යි. කර — අත්. අදර — අධර. යටි තොල. සරණ — පාද. නව දල — අළුත් පත්‍ර. දළු. කප් ලියන් — කල්ප ලතාවන්. සිතූ පැතූ දෑ දෙන වැල්. එක තුල — එක සමාන යැ.

ඒ නගරයෙහි ස්ත්‍රීහු කප් ලියන් හා සමානය හ. කෙ බඳු කප් ලියන් හා ද? දලු ද අභිනව පත්‍ර ද අමෘත ඵල ද බබළන්නා වූ කප් ලියන් හා යැ. මේ නගරයෙහි වූ ස්ත්‍රීන් ගේ නෙත් ද මුහුණු ද ඒ කප් ලියන්හි කුසුම් යැ. ඔවුන් ගේ හස්තාධරපාදයෝ (රතු හෙයින්) එහි වූ දළු යැ. ඔවුන් ගේ පූර්ණ පයෝධර එහි වූ අමා පල යැ.

මෙ මැ කියන ලදී, පරෙවි සඳෙසයෙහි දු –

"කොමල අදර කර සරණත ල පලු ද ර
උ දු ල දසන් කුසුමැති තන පල පත ර.
සලෙල සලෙළු යදි දන මන නදන ක ර
ල ක ල මෙ පුර ලිය කප් ලිය වැනි පව ර" යි.

කාව්‍යශෙඛරයෙහි ද –

"තොල'තුල් පතුල් ප
හස මල් කැතින් සිත් කා ල
පියොවුරු පල ඉසි ලු
ලියෝ ලිය වැනි පුර සරන සු ලු" යි

යනු කියැවිණි.

83\. සඳුන් පලු ත න වා
හිම වන පෙතින් එ න වා
සලෙළු ගිම් උ න වා
නැවැතැ කෙළි දෙළෙඟි ලොබ ද න වා

විසඳුම්: තනවා — සොලවා. තන (කම්පනයෙහි = චලනයෙහි = සැලීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා නිපාතය යි. 'තන' ධාතුව 'බව' ආදි ගණ යි, උභයපද යි, අකර්මක යි. (පර පද) තනා-තනති-තිනි-තුනු. (අත් පද) තෙමින්-තෙමෙති. අකර්මක ධාතුන් ප්‍රයෝජ්‍යයෙහි යෙදුණු කල්හි සකර්මක වන හෙයින් 'තනවා' යන්නට 'සඳුන් පලු' යනු කර්ම යි. දෙ වන පෙළෙහි 'එන වා' යන තන්හි 'වා' යනු කර්තෘ යි. හිම වන පෙතින් — හිමාලය වන පඞ්ක්තියෙන්. එන වා — එන්නා වූ වාතය. හිමාලය වන පඞ්ක්තියෙන් එන්නා වූ මාරුතය සඳුන් පලු තනමින් එන බව මෙහි කියැවුණේ ද, ඒ කවි සමයය හා ගැළැපෙන්නේ නො වේ. "සඳුන් ගස් ඇත්තේ මලය පර්වතයෙහි පමණෙක් මැ යැ" යනු කවිසමයය යි. උනවා — 'උන' (මිදීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා නිපාත යි. මුදවා යන අර්ථ යි. 'උන' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු) උනා-උනති-ඉනී-ඉනු. (කම් කරු) ඉනෙන්-ඉනෙති-ඉනිණි-ඉනුණු. ගිම් උනන්නෝ සලෙළුවෝ යැ, උනවන්නේ වාතය යැ. කෙළි දෙලෙහි — ක්‍රීඩා ධුරයෙහි. ක්‍රීඩායෙහි ආසක්ත වැ එහි මැ යෙදී සිටීම කෙළි දෙලෙන් කල් යැවීම යි. දනවා — 'දන' (ජනනයෙහි = ඉපැදීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය ආඛ්‍යාත යි. 'දන' ධාතු 'බව' ආදි ගණ යි, උභයපද යි, අකර්මක යි. (පරස්මෛපදයෙහි; දනා-දනති-දිනී-දුනු (ආත්මනෙපදයෙහි) දෙනෙන්-දෙනෙති. අකර්මක 'දන' ධාතුව ප්‍රයෝජ්‍යයෙහි යෙදුණු බැවින් 'ලොබ' යනු කර්මය වී යැ. මෙහින් උක්ත වනුයේ 'වා' යනු යැ.

සුළඟ හිම වන පෙතින් එයි. එ හෙයින් සීත යැ. ඒ සුළඟ ද සඳුන් පලු තනවමින් එන හෙයින් සුවද යැ, මද යැ. සඳුන් සුවද සුළඟට එක් වෙ යි. අතු කොළ ආදිය නො තනවා පලු තනවන්නේ මද හෙයිනි.

මෙ සේ ඒ සුළඟ ගුණ ත්‍රයයෙන් යුක්ත බව හැඟැවිණ. සුළඟට ඇති වියැ යුතු ගුණ ත්‍රයය නම්, මාන්ද්‍ය (මද බව) සෞරභ්‍ය (සුවද) ශෛත්‍ය (සිසිල් බව) යන මේ යැ.

මෙ බඳු සුළඟ සිරුරට වන් කලැ ගිම් නිවෙ යි, ක්‍රීඩායෙන් වූ ශ්‍රාන්ත භාවය දුරු වෙයි, යළි දු ක්‍රීඩා කිරීමට ආශාව උපදී.

සසඳෙහි දු මෙ මැ කියැවිණි-

"දිනී මෙ ද පියන්-සරතසු'යන් සඳන් පලු
තනවමින'දෙ'පුර පවන්-මෙහෙයි හා කෙළි දෙළේ"-යි.

84. ක නා ලිය සිරි නා

පි නා ගෙවුයන් කෙල නා

ම නා පුර ලිය නා

වි නා නතනා විනා කො ව නා

විසඳුම්: කනා ලිය සිරිනා — කනක ලතාවන් ගේ ආකාරයෙන්. 'කන,' යනු 'ලියන්' යන්නට විශෙෂණ යි. 'ලියන' යන තන්හි සම්බන්ධාර්ථයෙහි ද්විතීයා විභක්ති යි. පිනා — 'පින' (ප්‍රීණනෙ = සතුටු වීමෙහි) ධාතුයෙන් වූ මිශ්‍ර ක්‍රියාර්ථයෙහි පූර්ව ක්‍රියා නිපාත යි. 'පින' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි, අකර්මක යි. පිනා-පිනති-පිනී-පිනූ. ගෙවුයන් — ගෙ + උයන් = ගෙවුයන්. 'ව්' කාරාගම යි. 'ගෙ' යනු 'උයන්' යන්නට විශෙෂණ යි. ගෙවුයන් නම් ගෙමල් අසලැ පිහිටි මල් වතු ක්‍රීඩා භූමි ආදිය යි. ලියනා — 'ලියන' යි වියැ යුතු තන්හි එළි වැට ද ඡන්දස ද රැකෙන පිණිස 'ලියනා' යැ යි කරන ලදී. විනා — ගණ දෙවි. ගේ නුවණින් අග්‍ර යැ යෙති. එ හෙයින් ගේ වැනීමට සුදුසු යැ. නතනා — අනන්ත නම් නාගයා ගේ මුව දහසක් ඇත්තේ යැ. එ හෙයින් දැනීමට සමර්ථ යැ. විනා — 'හැර' යන අර්ථයෙහි නිපාත යි කො — කවරෙක්.

නුවණින් අග්‍ර යැ යන ගණ දෙවයා ද මුඛ දහසක් ඇත්තේ යැ යන අනන්තයා ද හැර මෙ පුර ලියන් කවරෙක් නම් වනා ද ?

85. වතිනි සරි ඉ න් දු

රුසිරින් දලනිදු න් දු

සදිසි පුර ල න් දු

සඳලු තලවලැ කෙළිති ප න් දු

විසඳුම්: වතිනි — වක්ත්‍රයෙන්. මුහුණින්. කරණාර්ථයෙහි තුන් වන විභක්ති යි. ඉන්දු — චන්ද්‍රයා. ඡන්දස රැකෙන පිණිස යැ 'ඉන්දූ' යැ යි අන්ත්‍යය දීර්ඝ කැරුණේ. තුන් වන

පාදයෙහි 'ලන්දූ' යනු ද සතර වන පාදයෙහි 'පන්දූ' යනු ද මේ හෙයින් මැ දීර්ඝාන්ත වී. **දලනිදූන් දූ**—ජලනිධිනු ගේ දුහිතෘව. ජලනිධි නම් සාගරය යි. සාගරයා ගේ දූ නම් ලක්ෂ්මී යැ. ඕ අතිශය රූප සෞන්දර්යයෙන් යුක්ත යැ. ලක්ෂ්මිය උද්ගත වූයේ ක්ෂීර සාගරයෙනි. සුරාසුරයන් අමෘතය සොයනු පිණිස කිරි මුහුද කලඹද්දී එයින් අමෘතය පහළ වීමට මත්තෙන් අනෙක් වස්තු තෙළෙසෙක් මතු විය. විෂ්ණු භාර්යාව වූ ලක්ෂ්මිය ඒ වස්තු අතුරින් පළමු වැ අව. ඒ තෙළෙස් වස්තූනු නම්: ලක්ෂ්මී, කෞස්තුභ පාෂාණය, පාරිජාතක දිව්‍ය වෘක්ෂය, සුරා දේවී, ධන්වන්තරි සෘෂි, චන්ද්‍රයා, කාමදුඝක ගවයෝ, ඓරාවණ හස්තියා, රම්භාදී දිව්‍ය ස්ත්‍රීහු, සප්තමුඛ අශ්වයා, කාලකූට විෂය, විෂ්ණුහු ගේ ධනුන, ශඞ්ඛය යන මොහු යැ. අමෘතය පහළ වූයේ මේ සියල්ලට ඉක්බිති යැ. **සඳලූ තල**—චන්ද්‍රිකා තල. ද්විභූමක ආදී ප්‍රාසාදවලැ උපරිම තලයෙහි පිටට නෙරා සිටුනා සේ කැරුණු වරණ්ඩයෝ සඳලූ තල නමින් ගැනෙති.

සඳලූ තලවලැ පුරස්ත්‍රීන් පන්දූ කෙළීම බොහෝ කවීන් විසින් වර්ණිත යැ. කියැවිණී මැ නො, කාව්‍යශෙඛරකාරයන් විසින් ද—

"සඳලූවලැ ප න් දූ
කෙළනා සොඳුරු ල න් දූ"—යනු?

**86. සතර'තැ විහිදි අ තු**
**කුසුම් පලු පල රැස යු තු**
**තුහු තුරු පෙල දිමු තු**
**සැදිණී එ පුරෙහි නෙක උයන් ව තු**

**අන්වය:** කුසුම් පලු පල රැස යුතු අතු සතර අතැ විහිදි, තුහු තුරු පෙල දිමුතු නෙක උයන් වතු එ පුරෙහි සැදිණී.

**අර්ථ:** මල් දළු ගෙඩි රැසි ඇත්තා වූ ශාඛාවන් සතර දිශාවට විහිදී ගිය උස් ගස් පෙළ බබළන්නා වූ නොයෙක් උයන් වතු ඒ පුරයෙහි ඇති වී යැ.

**විසඳුම්:** **විහිදි**—අතීත කෘදන්ත නාම යි. 'විහිදු' ධාතුව මෙහි 'රක්' ආදී අත් පද යි. විහිදේ-විහිදෙති-විහිදිණී' විහිදී-විහිදුණු, විහිදී. 'බල' ආදී පර පද සකර්මක 'විහිදු,

ධාතුවෙක් ද වේ. (කර්තෘ කාර) විඳ-විඳිදැති-විඳිදී-විඳිනු. (කර්ම කාර) විඳිදේ-විඳිදෙති-විඳිදිණි-විඳිදුණු. සැදිණි— අඛණ්ඩ පද යි. 'බස්' ආදී අන් පද 'සද' ධාතු යි 'සැදේ-සැදෙති-සැදිණි, සැදී, සති-සැදුණු, සැදී, සනු. උක්ත වන 'වතු' යනු බහුවචන වුව ද නපුංසක ලිංග වන හෙයින් ආඛ්‍යාතය එකවචන වී.

87. රැදි ඉවුරැ ඉඳු නි ල්
සරන රන හස මිහි ලො ල්
සිහිල'ඹ පිරි නිම ල්
පතස් පොකුණුන් සැදිණි සුවිස ල්

අන්වය: ඉඳු නිල් ඉවුරු රැඳි, රන හස මිහි ලොල් සරන, නිමල් සිහිල් අඹ පිරි, සුවිසල් පතැස් පොකුණුත් සැදිණි.

විසඳුම්: ඉඳු නිල් — ඉන්ද්‍ර නීල මැණික්. මිහිලොල් — මධුලොලුයන්. මී මැස්සන්. පතස් — කුඩා පොකුණු. ව්‍යවහාරයෙහි 'පතහ' යනු ලැබේ. සැදිණි — 'පොකුණු' යනු උක්තය යි.

ඒ නගරයෙහි වූ පතස්වල ද පොකුණුවල ද ඉවුරු ඉඳුනිල් මිණි යැ. එහි සුවණී හංසයෝ ද මධුලෝලයෝ ද හැසිරෙති. නිර්මල වූ ශීතල වූ ජලය වෙයි.

මෙ මැ කියන ලද, කාව්‍යශෙඛරයෙහි දු

"දුල් මහනෙල් පිනු ම්
රැඳි ඉඳු නිල් ඉවුරු බි ම්
රජ හස සුතු උලු ම්
පතස්පොකුණින් සැදිණි මනර ම්" —යි.

88. දවැ හය කුර ග සින්
නුබ වසන නැඟි රද සින්
නො නැවී රිව් රැ සින්
එ පුර සලෙලෙලෝ සරති සනො සින්

අන්වය: දවැ හය කුර ගසින් නැඟි රදසින් නුබ වසන එ පුර සලෙලෙලෝ රව් රැසින් නො තැවී සන්තොසින් සරති.

අර්ථ: දවල් කාලයෙහි අශ්වයන් කුර ගැටීමෙන් නැංගා වූ ධූලියෙන් ආකාශය වසන මැ, ඒ නගරයෙහි කාමුක තරුණයෝ සූර්ය රශ්මියෙන් නො තැවී සන්තොෂයෙන් හැසිරෙත්.

දවැ — දිවාභාගයෙහි. රැ රිෂි රැස් නැති හෙයින් සතොසත් සැරිම නො බැරි යැ. මෙහි දූවිලි ද රිවි රැස නැත. රදසින් තුබ වැසීමෙති. හය — අශ්වයන්. ගසින් — ඝට්ටනයෙන්. නැගි — 'නග' (නැගීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'නග' ධාතුව 'රක්' ආදි ගණ යි, පරස්මෛපද යි, අකර්මක යි. නගී-නගිති-නැගී. රදසින් — රජස් නම් ධූලි යැ. වසන — 'වස' (ඡාදනයෙහි=වැසීමෙහි) ධාතුයෙන් වූ කාලාර්ථයෙහි අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. 'වස' ධාතුව 'බල' ආදි ගණ යි, පර පද යි. (කතු කරු) වසා-වසති-වැස්-වැසූ. (කම් කරු) වැසේ-වැසෙති වැසුණි-වැසුණු. තැවී — 'තව' (තැවීමෙහි) ධාතුයෙන් වූ කර්මකාරක පූර්ව ක්‍රියා නිපාත යි. 'තව්' ධාතුව 'බල' ආදි ගණ යි, සකර්මක යි, පරස්මෛපද යි. (කතු කරු) තවා-තවති-තැවු-තැවූ. (කම් කරු) තැවේ-තැවෙති-තැවිණි-තැවුණු. සරති — 'සර' (සංවරණයෙහි=සැරසීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'සර' ධාතුව 'බදු' ආදි ගණ යි, උභයපද යි, අකර්මක යි. (පරස්මෛපදයෙහි) සරා-සරති-සැරි-සැරූ. (ආත්මනෙපදයෙහි) සෙරේ-සෙරෙති. සකර්මක 'සර' ධාතුව 'බදු' ආදි ගණ යි. (කතු කරු) සරා-සරති-සිරි-සුරූ. (කම් කරු) සැරේ-සැරෙති-සැරුණි-සැරුණු.

ඒ නගරයෙහි මහත් අශ්ව සේනාවෝ යැ. දිවාභාගයෙහි ඔහු ඛුර ඝට්ටනයෙන් ධූලි නංවා අහස වසති. එ හෙයින් හිරු රැස් ද පොළොවට නො එති. එ බැවින් එ නුවරෙහි වූ කාමුක ජනයෝ රවි රැසින් නො තැවී සංතොෂයෙන් හැසිරෙති.

අශ්වයන් ගේ ඛුර ඝට්ටනයෙන් නැඟුණු වූ ධූලියෙන් අහස වැසෙන සේ ප්‍රාතනායෝ ද ක් හු වැ ද.

මයූර සන්දේශයෙහි —

"දූ වැ ගත් හයන් කුර රොන් නැගෙන තුබ ව සා
සිය පත් පොබයවන රජ කැලුම එන ත් සා
මහ වත් අරන මෙන් සෙද අය-පාන් ග සා
පැනැ පත් පහණැ දද එන් කරනා වැනි ල සා".

69. රහස'ග වල'හ ක ර
සතර පය සුපිහිටි ද ර
දකුණු දල තුඟු ක ර
සලණ මහ ගජ සරනී එ නුව ර

අන්වය: රහස් අඟ දිල් අග කර සතර පය දරා සුපිහිටි දකුණු දළ තුඟු තර කලණ මත ගජ එ නුවරැ සැරති.

අර්ථ: රහස්‍ය අඞ්ගය ද වාල්ධි අග්‍රය ද සොඬ ද සතර පය ද භූමියෙහි පිහිටියා වූ දකුණු දළ උස් ද මහත් ද වූ ශොභන වූ මත්තහස්තීහු ඒ නගරයෙහි හැසිරෙති.

ටිප්පණි: වලග — වාලධි අග්‍රය. කර — හස්තය. ඇතු ගේ සොඬ. දරා — භූමියෙහි. සුපිහිටි — '(සු) පිහිටු' (මැනැවින් පිහිටුවීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. '(සු) පිහිටු' ධාතුව 'බල' ආදි ගණ ද 'රක' ආදි ගණ ද වෙයි, අකර්මක යි, පරස්මෛපද යි. ('බල' ආදි) සුපිහිටා-සුපිහිටති-සුපිහිටි-සුපිහිටු. ('රක' ආදි) සුපිහිටි-සුපිහිටිති-සුපිහිටි. තුඟු — උස් වූ. තර — මහත් වූ.

එ නුවරැ කලණ මත ගජ සරති. කෙසේ කලණ වූ මත ගජ ද? රහස්‍යාඞ්ගය යැ, වාලධි අග යැ, ශුණ්ඩාව යැ, සතර පාදය යැ යන (සප්ත) ස්ථානයන් භූමියෙහි පිහිටීමෙන් ද දක්ෂිණ දංෂ්ට්‍රාව උස් වීමෙන් හා මහත් වීමෙන් ද කලණ වූ මත ගජ.

රහස්‍යාඞ්ගාදි සප්ත ස්ථානයන් බිම පිහිටීම ද දකුණු දළය උස් වීම ද හස්තීන් ගේ මඞ්ගල ලක්ෂණ බව නිසරසන්දේශකාරයෝ ද—

"විසි නිය කොපොල් බොල් සත් තැන් බිම පිහි ටි
උස් කුඹු දකුණු දළ දෙ අසුන් සඳවැ සි ටි
මද මත නො මද සුද මේ ගිගුමට නො ගැ ටි
ඔළ මොළ බලග එහි තුඟු මිඟුලැතුන් සැ ටි"

යැ යි කියති.

90. නිය පදුරින් දුව ල
පලමින් ගජන් කුඹු තැ ල
හුරියැ'ගැ තවර කැ ල
කෙසර පෙළ වැනි සරත හස ර ලා

අන්වය: සරත හස රළ පුවළ නිය පදුරින් ගජන් කුඹු තල පලමින් ඇඟැ හුරිරු තවර කල කෙසර පෙළ වැනි.

විස්තර: අශ්වයන් සිංහයන් වැනි බවෙක් මෙහි කියැවිණ. යෙදුණු විශෙෂණයන් සිංහයනට කෙ සේ වුව ද අශ්වයනට නම් සුදුසු වන සේ නො පෙනේ. අශ්වයනට කවර නිය පදුරු ද? අශ්වයන් කුමක් කල නිසා ගජන් කුඹු තල පැළූ අසුරෙක් වී ද?

විපසණි: පූවල — ප්‍රෞඪ. මහත්. පළමින් — 'පල' (පැළීම්හි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියාර්ථයෙහි මිශ්‍ර ක්‍රියා නිපාත යි. 'පල' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු) පළා–පළති–පැළී–පැළූ. (කම් කරු) පැළේ–පැළෙති–පැළිණි–පැළුණු. හුඹිරු — රුධිර. ලේ. තවර— 'තවර' (තැවිරීමෙහි) ධාතුයෙන් වූ භාව කෘදන්ත නාම යි. 'තවර' ධාතුව සකර්මක වූ තන්හි 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) තවරා–තවරති–තැවැරී–තැවැරූ. (කම් කරු) තැවැරේ–තැවැරෙති–තැවැරිණි–තැවැරුණු. අකර්මක වූ කල්හි 'රක්' ආදි ගණ යි, ආත්මනේ පද යි. තැවැරේ–තැවැරෙති–තැවැරිණි, තැවැරී–තැවැරුණු, තැවැරී.

91. රන් දද පල'ඟැ ලෙ ළ
මුදුන රන් කොත් සුලක ළ
යහන් සැදි සුද'තු ළ
පමණ නො කළැකි එ පුර රිය පෙ ළ

අන්වය: රන් දද පල අඟැ ලෙළ, රන් කොත් මුදුන සුලකළ, සුදු අතුළ, එ පුර රිය පෙළ පමණ නො කළ හැකි.

විපසණි: පල අඟැ — පියසි කෙළවර. ලෙළ — ලීලෝපෙත වූ. සුදු අතුළ — මෙහි 'සුදු' යන්නෙන්, සුදු ඇතිරිලි ගැනෙයි. 'ලෙළ' 'සුලකළ' 'අතුළ' යන මොහු 'රිය පෙළ' යන්නට විශෙෂණ වෙති. කළ — 'කර' ධාතුයෙන් වූ අකර්මභාව්‍ය කෘදන්ත නිපාත යි.

92. අතැ ලෙළ'වි නන් ව ග
සවසන් බැහූ සියල' ග
වැර සැර ඉහ සෙන ග
නිතර හැසිරෙති එ පුර වෙ ම ග

**අන්වය:** අතැ නන් වගැ අවි ලෙළ, සියලු අඟැ කවසන් බැඟු, වැර සැර මහ සෙනඟ නිතොර එ පුරැ වේ මඟැ හැසිරෙති.

**විසඳුම්:** **නන් වඟැ අවි** — නොයෙක් වර්ගයෙහි ආයුධයන්. **සියලඟ** — සියලු + අඟ = (පූර්ව ස්වර ලොපයෙන්) සියලඟ. සකල ශරීරයෙහි. 'අඟ' නම් ශරීරය යි. එ හෙයින් සමහරුන් යොදන 'සියොලඟ' යනු වැරැදි වේ. **කවසන්** — කවචයන්. යුද්ධයෙහි දී ඌර්ධ්වකායය වැසෙන සේ ලොහයෙන් කළ සැට්ටය කවච නම් වේ. **මහ සෙනඟ** — මෙයින් ගැනුණේ කුසාවත් නගරයෙහි වූ යුද්ධ භට පිරිස යැ. **වේ** — වීථි. **හැසිරෙති** — 'හසුරු' (හැසිරීමෙහි) ධාතුයෙන් වූ අඛ්‍යාත පද යි. 'හසුරු' ධාතුව 'බස්' ආදි ගණ යි, ආත්මනෙ පද යි. හැසිරේ–හැසිරෙති–හැසිරිණි, හැසිරි, හසිළි–හැසුරුණු, හැස්රි, හසුළු.

**93.** **ගජ හය රිය සෙනා ග**
**ඝොස පැතිරැ ඝොස් දස දි ග**
**පස තුරු ඝොස සම ග**
**එ පුර ගුම් ගනි යුග'නැ සිඳු ර ග .**

**අන්වය:** **ගජ හය රිය සෙනඟ** — මේ චතුරඞ්ගිනී සේනාව සඳහා කියැවිණි. **පස තුරු** — පඤ්ච තූර්‍ය. ආතත, විතත, විතතාතත, ඝන, ශුෂිර, (එක්තල බෙර, දෙතල බෙර, සියලු අතින් වසා බැඳි බෙර, තාළම්, නළා) යන පස. **ඝොස්** — යා (ගමනෙහි) ධාතුව නිසා නිපනනය වූ පූර්ව ක්‍රියා නිපාතයෙකි. **යුගනැ** — යුග + අනැ– යුගයා ගේ අන්තයෙහි. මෙහි යුගය යැ යි ගැනුණේ කෘත, ත්‍රෙතා දි යුග නො වැ ඒ යුග සතරෙකින් යුක්ත වූ කල්පයෙකි. **යුගනැ සිඳු** — යුගාන්තයෙහි සමුද්‍රය. කල්පාන්තයෙහි දී ලොකය විනාශ වෙති යි ද ඒ විනාශ වනුයේ සකල ලොකය වසා මුහුද ගලා යැමෙනැ යි ද සැලැකෙයි. එ හෙයින් එ දිනැ සමුද්‍රය මහත් ඝොෂ ඇති කරනු ආශ්චර්‍ය නො වේ.

හස්ති අශ්ව රථ සේනාවන් ගේ ඝොෂයෙන් ද පංච තූර්‍ය ඝොෂයෙන් ද එකතිනාද වූ ඒ නගරය කල්පාන්ත සාගරය මෙන් ගුම් ගන්නේ යී.

සමහර කෙනකුන් සැල ළිහිණි සන්දේශයෙහි පද්‍යයෙකැයි සලකන -

"දූ ව් න බද කිකිණි හය කුර පහර න ද
ස ව් න තල තිනද ගිජිඳුන් සෙමෙර බ ද
ර ව් න නොයෙක තුරු ජය සක් හඬ නොම ද
දෙව් න මුහුද මෙන් ගුම් ගනී පුර නිබ ද"

යන්නෙන් ද මේ කියැවිණි.

**94.** **සිතැ දුසිරිත පැහැ ර**
**සව් සත කළ පිනින් පෙ ර**
**වැජැඹෙ එ පුර ව ර**
**ඔක්කාවස් නම් රජෙක් පුවත ර**

**අන්වය:** සව් සත පෙරැ සිතැ දුසිරිත පැහැරැ කළ පිනින් එ පුර වරැ ඔක්කාවස් නම් පුවතර රජෙක් වැජැඹෙ.

**විසඳුම්:** **පැහැරැ** — ඉවත් කොට. 'පැහැරැ' යනු 'පහර' (පැහැරුම්හි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'පහර' ධාතුව 'බස්' ආදි ගණ ද 'රක්' ආදි ගණ ද වෙයි, පරස්මෛ පද යි, සකර්මක යි. ('බස්' ආදි — කතු කරු) පහරී-පහරිති-පහළි-පහළු. ('රක්' ආදි කතු කරු) පහරී-පහරිති-පැහැරි. (දෙ ගණයෙහි මැ කම් කරු) පැහැරේ-පැහැරෙති-පැහැරිණි-පැහැරුණු. **සිතැ දුසිරිත පැහැරැ කළ පිනින්** — පින් කිරීමට සිතෙහි දුසිරිත පහ කළ මනා මැ යැ. සිත පිරිසුදු කළ යුතු මැ යැ. යහපත් රජකු ඇති වනුයේ රටැ වැස්සන් ගේ පිනිනි. **ඔක්කාවස්** — (පාලියෙන්) ඔක්කාකවංස. (සංස්කෘතයෙන්) ඉක්ෂ්වාකුවංශ. මේ වනාහි සූර්ය වංශයේ මැ රජ කෙනෙකි. සූර්ය වංශය මෙ නමින් ප්‍රසිද්ධ වූයේ මේ රජු ගෙන් පසු වැ යැ. **වැජැඹෙ** — 'වජඹ' (වැජැඹීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'වජඹ' ධාතුව 'රක්' ආදි ගණ යි, උභයපද යි, අකර්මක යි. (පරස්මෛ පදයෙහි) වජඹී-වජඹිති-වැජැඹි. (ආත්මනෙ පදයෙහි) වැජැඹේ-වැජැඹෙති-වැජැඹිණි-වැජැඹුණු.

**95.** **සිසි කෙමි වලා ද ල**
**උළු රිළු සොසර පෙළ දු ල**
**ඔහු යස සේ කම ල**
**බිජී පුබුදු වැ මෙ මුළු දිය වි ල**

විපසණි: කෙමි — කර්ණිකාව. කර්ණිකාව නම් නෙළුම් ආදි මල්හි වූ බීම්බකොෂය යි. උළු — තාරකා. පිළු — සමූහය. කෙසර — කෙශර. මලෙහි රේණු. දුල — බබලන්නා වූ. ඔහු — සම්බන්ධාර්ථයෙහි ද්විතීයා විභක්ති යි. සේ — ශ්වෙත. සුදු. දිය — ජගත්. ලොකය. පුබුදු — ප්‍රබුද්ධ. පිපුණු. 'පුබුදු' ධාතුව 'රක්' ආදි ගණ යි. උභය පද යි. අකර්මක යි. (පරස්මෛ පදයෙහි) පුබුදී-පුබුදිති-පිබිදී. (ආත්මනෙ පදයෙහි) පිබිදේ-පිබිදෙති-පිබිදුණි-පිබිදුණු. ස්වරූපයෙන් සිටැ අතීත කෘදන්ත නාමයා ගේ අර්ථය දෙන ධාතු කිහිපයෙන් මේ එකෙකි. 'දුල' යනු අනෙකෙකි.

මේ මුළු ලොකය විලෙකි. එහි ප්‍රබුද්ධ වැ බබලන්නා වූ එක මැ සුදු නෙළුම් මලෙකි. එහි කර්ණිකාව චන්ද්‍රයා යැ. වලා කුළු එහි පෙති යැ. එහි රේණු නම් තාරකා පඞ්ක්තිය යි. මේ සේ (සුදු) කමල නම් අනෙකෙක් නො වේ. ඔකාවස් රජු ගේ කීර්තිය යැ. ඔකාවස් රජු ගේ කීර්තිය සකල ලොකයෙහි පැතිරී පවත්නා බව් මේ කී සැටි යැ. කීර්තිය සුදු යැ යනු කවි සමය හෙයින් මෙහි සුදු නෙළුම් මලෙක් ගැනිණ.

96. සැඬකර වෙයි දිනි ඳු
මසින් මසැ අඩු වෙයි ඉ ඳු
නල වැදූ සැලෙයි සි ඳු
එයින් උවමෙක් කො ද මෙ රජ බ ඳු

අන්වය: දිනිඳු සැඬකර වෙයි; ඉඳු මසින් මසැ අඩු වෙයි; සිඳු නල වැදූ සැලෙයි; එයින් මෙ රජ බඳු උවමෙක් කොහු ද?

අර්ථ: මේ රජ සූර්යයා වැනි යැ යි නො කියැ හැකි යැ. කවර හෙයින් ද? සූර්යයා චණ්ඩ යැ. රජ සෞම්‍ය යැ. එ හෙයිනි. එ සේ නම් සෞම්‍ය වූ චන්ද්‍රයා වැනි යැ යි කියැ හැකි ද? නො හැකි යැ. කවර හෙයින් ද? චන්ද්‍රයා මසින් මසැ අඩු වෙයි. මේ රජ දිනෙන් දිනැ යසස් තෙජස් ආදීන් වැඩි වෙයි. එ හෙයිනි. එ සේ නම් නො අඩු වන්නා වූ සමුද්‍රය වැනි යැ යි කියැ හැකි ද? නො හැකි යැ. කවර

හෙයින් ද? සමුද්‍රය සුළඟ වැදී චඤ්චල වෙයි. මේ රජ කිසිවෙකිනුදු චඤ්චල නො වේ. එ හෙයිනි. මෙ සේ බලන කලැ මේ රජුට උපමා වන්නේ කවරෙක් ද?

විපස්ණි: දිනිඳු — සූර්යයා. දිනට ඉඳු=(දින+ඉඳු) දිනිඳු. සැඬකර — සැඩ (චණ්ඩ) වූ කර (රශ්මි) යමක්හු හට ද හේ සැඬකර. ඉඳු — ඉන්දු. චන්ද්‍රයා. මසින් මසැ අඩු වෙයි — පසළොස් වක වූ දා සිටැ අමා වක දක්වා අනුක්‍රමයෙන් ක්‍ෂය වන්නා සේ වන පෙනීම සලකා මෙ සේ කියැ වෙයි. නල — මාරුතය. සුළඟ. වැදූ — වැදී. සිඳු — සාගරය. සැලෙයි — (සැලේ+යි) සෙලැවෙයි. 'සල' (සැලුම්හි) ධාතුයෙන් වූ කම් කාරක ආඛ්‍යාත පද යි. සකර්මක 'සල' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) සලා-සලති-සැලී-සැලූ. (කම් කරු) සැලේ-සැලෙති-සැලිණි-සැලුණු.

97. මොහු තෙද'ග රුපුන' ද
වැදූ පෙනිණි සිළු මිණි ලෙ ද
මතු ද රුප'ඹුන් හ ද
පිවිසැ දිසි නෙතැ රතෙ'ව විනිවි ද

අන්වය: මොහු තෙද අග රුපුන් අද වැදූ නල සිළු ලෙද පෙනිණි මතු ද? රුපු අඹුන් හද පිවිසැ විනිවිදූ නෙතැ රත එව් දිසි.

විපසණි: මොහු — මේ ඔකාවස් රජු ගේ. සම්බන්ධාර්ථයෙහි ද්විතීයා යි. අග — අග්නිය. අද — හෘදයයට. වැදූ — ඇතුළු වැ. සිළු මිණි — ශිඛා' මාණික්‍ය. මුදුනෙහි පැලැඳෙන මාණික්‍ය. මතු ද? එ පමණෙක් ද? (නො වේ.) රුප'ඹුන්— රුපු+අඹුන්=(පූර්ව ස්වර ලොපයෙන්) රුප'ඹුන්. විනිවිදූ — 'විනිවිදු' (විනිවිදීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'විනිවිදු' ධාතුව 'රක්' ආදි ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු) විනිවිදී-විනිවිදිති-විනිවිදී. (කම් කරු) විනිවිදේ-විනිවිදෙති-විනිවිදිණි-විනිවිදුණු. දිසි — පෙනුණේ යැ. උක්තය 'අග' යනු යි.

මේ රජයා ගේ තෙජස් නමැති ගින්න ශත්‍රු රජයන් ගේ හෘදයයට ප්‍රවිෂ්ට වැ මුදුනින් මතු වී ශිඛා මාණික්‍ය මෙන් පෙනිණි. එ පමණෙක් මැ නො වේ. ඒ ශත්‍රු රජයන් ගේ

භාසිාවන් ගේ හෘදයයට ද ප්‍රවෙශ වැ එය විනිවිදු ගෙනැ ගොස් ඔවුන් ගේ නෙත්‍රයන්හි රක්ත වර්‍ණය මෙන් ද පෙනුණේ යැ.

මේ රජු ගේ තෙජස ඉතා දුඩි යැ. එය සතුරු රජුන් විසින් ඉසිලියැ හැකි නො වේ. එ හෙයින් රජු කොප වී නම් ඔවුන් ගේ විනාශය එකාන්ත බව ද දනිති. මේ භීතියෙන් ඔවුන් ගේ හෘදයය ගිනි ගත් කලක් මෙන් දැවෙයි. ඒ ගින්න හිස් මුදුනින් මතු වැ මුදුන් මැණිකේ ආකාරයෙන් පෙනෙයි. ඒ පෙනෙනුයේ මැණිකෙක් නො වේ. ගින්න යැ. තෙජස නමැති ගින්නෙන් වූයේ එ පමණෙක් ද? නැත. රජ කෝප වී නම් ස්වකීය ස්වාමි පුරුෂයන් ගේ විනාශය එකාන්ත බව දත් ශත්‍රු වනිතාවන් ඒ භීතියෙන් නිතර අඩා ඔවුන් ගේ ඇස් රතු වෙයි. මේ ඇස් රතු වීම කෙ බඳු ද? රජු ගේ තෙජස නමැති ගින්න සතුරු අඹුවන් හද තුළට වැදූ විනිවිදු රතු ඇස් විලසින් පෙනෙන්නා වැන්නැ.

අලගියවන්න මුකවෙටි තුමෝ මේ පද්‍යය තිසර සන්දෙශයෙහි–

"මෙ රජ තෙද'ග රුපු රද හද තුළේ වැ ද
දිලි සිළුමිණි සේ සෙද පෙනුණේ මතු ද
ඇවිළැ ගොසින් උන'ඹුන් ගේ හද තුළ ද
පෙනිණි නුවන් රත තර ලෙසිනි විනිවි ද"

යන පද්‍යයෙන් ගත් හ.

මෙ මැ කියැවිණි, කව්සිළුමිණෙහි ද,–

"කරන රුපිඳු'එ හළු – නරවිරු තෙද'ග මඬලින්
විපුල ගිනි රෙන් වන් වි – රුපුන'ඹුවන් නුවන් රත්"

යැ යි.

98. මොහු බුජ'ගැ සිරිම ත්
රුඳි කග රඟු බලව ත්
රුපුන් තෙද රිවිග ත්
මතු ද ගති උන් යසස් තරිඳු ත්

අන්වය : මොහු සිරිමත් බුජ අගැ රුඳි බලවත් කග රඟු රුපුන් තෙද රිවි ගත්. මතු ද? උන් යසස් තරිඳුත් ගති.

**විසඳුම් :** **බුජ අගැ** — හස්තාග්‍රයෙහි.

මේ රජු ගේ ශ්‍රීමත් වූ හස්තයා ගේ අග්‍රයෙහි වූ ඛඩ්ගය බලවත් වූ රාහු යැ. ඒ රාහු විසින් කුමක් ගන්නා ලද්දේ ද? සතුරු රජුන් ගේ තේජස නමැති සූර්යයා ගන්නා ලද්දේ යැ. එ පමණෙක් ද ? නැත. ඔවුන් ගේ කීර්තිය නමැති චන්ද්‍රයා ද ගන්නා ලදී.

මේ රජු විසින් යුද්ධයෙන් පරාජය කරනු ලැබූ සියලු සතුරු රජුන් ගේ තේජසත් කීර්තියත් අතුරුදන් වූ බව මේ කී සැටි යැ. තේජස රතු යැ යනු ද කීර්තිය සුදු යැ යනු ද කවි සමය වන හෙයින් ඒ දෙකට උපමාන වශයෙන් සූර්ය චන්ද්‍රයෝ ගැනුණු හ.

99. රජ යුව රජ ඇමැ ති
දනන් සමඟින් නුවණැ' ති
විමසා ලොව රකි ති
එසින් එ නිරිඳු සරි කෙනෙක් නැ ති

**අන්වය :** නුවණ ඇති රජ යුව රජ ඇමැති දනන් සමඟින් විමසා ලොව රකිති. එසින් එ නිරිඳු සරි කෙනෙක් නැති.

**විසඳුම් :** **සමඟින්** — 'එක් වැ' යන අර්ථයෙහි නිපාත යි. 'සමග' යි කිව ද 'සමඟින්' යි කිව ද අර්ථයෙහි වෙනසෙක් නැති. **විමසා** — 'විමස' (විමර්ශනයෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'විමස' ධාතුව' 'බල' ආදී ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු) විමසා–විමසති–විමැසී–විමැසූ. (කම් කරු) විමැසේ–විමැසෙති–විමැසිණි–විමැසුණු. **රකිති** — 'රක්' ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'රක්' ධාතුව පරස්මෛපද යි. (කතු කරු) රකී–රකිති–රැකි. (කම් කරු) රැකේ–රැකෙති–රැකිණි–රැකුණු. මේ ධාතුව මෙන් වර නැගෙන ධාතු 'රක්' ආදි ගණයට අයත් යැ.. 'රකිති' යන ආඛ්‍යාතයෙන් උක්ත වන්නයේ 'මොහු' යන්න යැ. එය මෙ තන්හි අධ්‍යාහාර වැ සිටියේ යැ.

මේ රාජයෝ ස්වච්ඡන්දයෙන් මැ රට නො රකිති. නුවණ ඇත්තා වූ (යටත්) රජුන් ගෙන් ද යුව රජුන් ගෙන් ද අමාත්‍ය ජනයා ගෙන් ද කරුණු විමසා මැ රට රකිති.

100. විහිදෙන මිණි කිර ණ
පැලැඳි මාඇඟි අබර ණ
සිටි වයසෙහි තරු ණ
සුර'ඟනන් ලෙස දිලෙන සකල ණ

අන්වය: මිණි කිරණ විහිදෙන මාඇඟි අබරණ පැලැඳි තරුණ වයසෙහි සිටි සුරඟනන් ලෙස දිලෙන සකලණ– (මතු සම්බන්ධ යි.)

විසඳුම්: පැලැඳි — 'පලඳ' (පැලැඳීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'පලඳ' ධාතුව 'බස්' ආදි ගණ ද 'රක්' ආදි ගණ ද වෙයි, පරස්මෛපද යි, සකර්මක යි. ('බස්' ආදි ගණයෙහි–කතු කරු) පලඳී–පලඳිති–පලනී–පලනු. ('රක්' ආදි ගණයෙහි–කතු කරු) පලඳී–පලඳිති–පැලැඳි. (දෙ ගණයෙහි මැ–කම් කරු) පැලැඳේ–පැලැඳෙති–පැලැඳිණි–පැලැඳුණු. සකලණ — කල්‍යාණවත් වූ. මෙයින් කියැවෙනුයේ ස්ත්‍රීන් ගේ පඤ්ච කල්‍යාණය යි. ඒ නම්, කෙශ, මාංශ, දන්ත, ඡවි, වයඃ යන මේ යැ. මේ එක එක සමෘද්ධ වැ සිටි කල්හි කල්‍යාණ නම්.

101. සුර'ඟන රුසිරු ස රු
සොලොස් දහසක් පිරිවැ රු
සිලවති නම් දූ — රු
බිසොව කැරැ අග බිසෝ තනතු රු

අන්වය: රුසිරු සරු සුර අඟන සොලොස් දහසක් පිරිවැරු සිලවති නම් දූරු බිසොව අග බිසෝ තනතුරු කැර— (මතු සම්බන්ධ යි.)

විසඳුම්: සුරඟන — මෙහි සුරාඞ්ගනාවනැ යි ගැනුණේ අග බිසොව ගේ පරිවාර ස්ත්‍රීහු යැ. පිරිවැරු — 'පිරිවර' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'බිසොව' යන්නට විශෙෂණ යි. 'පිරිවර' ධාතුව 'බල' ආදි ගණ පරස්මෛපද ද, සකර්මක යි. (කතු කරු) පිරිවරා–පිරිවරති–පිරිවැරී–පිරිවැරූ. (කම් කරු) පිරිවැරේ–පිරිවැරෙති–පිරිවැරිණි–පිරිවැරුණු. කැරැ — මෙහි කර්තෘ පදය අනතුරු පද්‍යයෙහි 'රජ' යන්න යැ.

102. කුලුණු ගුණයෙන් හු ද
සත රැකැ මවුපියන් ලෙ ද
රජ දහම පිළිපැ ද
එ රජ එ නුවරැ රජ කරන ස ද

අන්වය: හදු කුලුණු ගුණයෙන් මවු පියන් ලෙද සත රැකැ රජ දහම පිළිපැදූ එ රජ එ නුවරැ රජ කරන සදැ— (මතු සම්බන්ධ යි.)

විපසණි: මවුපියන් ලෙද— දරුවන් කෙරෙහි පවත්වන කරුණායෙන් මව්පියන් හා සමයෝ නැති. මේ රජ ස්වකීය රට වැසියන් රකිනුයේ එ බඳු කරුණා ගුණයෙනි. ලෙද— එළි සමයේ පිහිටෙන් මේ 'ලෙස' යන්නට වූ අවුල යි. රජ දහම— දශ රාජ ධර්මය.

103. පින් සිරි සුතු නොම ද
එ බිසෝ ළඳුන් හට සො ද
මතු සත රකින ලෙ ද
නැති බැවින් දරු කෙනකු මන න ද

අන්වය: නො මද පින් සිරි සුතු සොද එ බිසෝ ළඳුන් හට මතු සත රකින ලෙද, මන නද දරු කෙනකු නැති බැවින්— (මතු සම්බන්ධ යි.)

විපසණි: මතු සත රකින ලෙද— දූත් සත රකිනුයේ ඔකාවස් රජ යැ. ඒ රජහු ගේ ඇවෑමෙන් ඒ පදවිය උසුලා සිටීමට කෙනකු අවශ්‍ය හෙයින් යැ මෙ සේ කියැවෙනුයේ.

104. හිතාහිත සත වෙ ත
පතල කරුණා මෙන් සි ත
දූනැ ගත් ලොව සිරි ත
සිසල් සතරෙහි හසල නැණ සු ත

විපසණි: හිතාහිත— හිත+අහිත. හිතවත් වූ ත් නො වූත්. සිරිත— චාරිත්‍රය. පැවැතුණ මනා සැපි. හසල— හැසුරුණා වූ. පුරුදු වූ.

105. සිත් සත් ගුණ සපි රෑ
රජ යුවරජ ඇමතිව රෑ
නුවරුන් සමග ස රෑ
ඇතුළු නුවරට පිවිසෑ නොවතු රෑ

**විසඳුම් :** **සිත්** — ආධාරාර්ථයෙහි දෙවැනි විභක්ති යි. විභක්ති ලොපයෙන් ප්‍රකෘති රූපය ගෙනැ සිටියේ යැ. **සත් ගුණ** — සාධු ගුණය. **සරෑ** — 'නුවරුන්' යන්නට විශෙෂණ යි. යුත ගුණ ධනාදියෙන් ප්‍රභූත්වයට පැමිණැ සිටින නුවරුන් විශෙෂ කොට ගැන්ම පිණිස මේ යෙදිණ. **නොවතුරෑ** — නො + අතුරු =('ව' කාරාගමයෙන්) නොවතුරු. අතරක් නැති වැ. **ඇතුළු නුවරට** — අන්තර නගරයට. පුරාතනයෙහි අන්තර් නගරය, බාහ්‍ය නගරයැ යි කොටස් දෙකකට බෙදිණ. අන්තර්නගරය නගර මධ්‍යයෙහි යැ. රජ මාළිගය ද රාජ්‍ය කාර්‍ය භාරය උසුලා සිටින්නවුන් ගේ කාර්‍යාලයාදිය ද අන්තර් නගරයෙහි වූයේ යැ. මහාජනයා ගේ ද අමාත්‍යාදීන් ගේ ද වාසය වූයේ බහිර්නගරයෙහි යැ. ඇතුළු නුවර නම් අන්තඃපුරය යැ යි සමහරෙක් සිතත්. අන්තඃපුරය නම් රජු ගේ අග්‍ර මහිෂිකාව ප්‍රධාන කොට ඇති බිසෝවරුන් ගේ වාසය සඳහා වෙන් කැරුණු, රජ මාළිගයෙහි මැ විශෙෂ කොටසෙකි. **පිවිසෑ** — ප්‍රවිෂ්ට වැ. ඇතුළු වැ. මේ 'පිවිස්' (පිවිසිමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'පිවිස්' ධාතුව 'බස්' ආදි ගණ යි, අතම්නෙපද යි. පිවිසේ-පිවිසෙති-පිවිසිණි, පිවිසි, පිවිටි,-පිවිසුණු, පිවිසි, පුවුටු.

106. සිටෑ හල දොර ල ගා
සුග කෙළෑ සිඳු ගොස ර ගා
සියලු දන සම ගා
මෙ පුර නසිති සි කිවු යෑ මුර ගා

**අන්වය :** හල දොර ලගා සිටෑ සුග කෙළෑ සිඳු ගොස රගා, සියලු දන සමගා, මෙ පුර නසිති සි මුර ගා කිවු යැ.

**විසඳුම් :** **කෙළෑ** — අනන්තයෙහි. **රගා** — ආකාරයෙන්. **සමගා** — එක් වැ. **පුර** — කර්තෲර්ථයෙහි ද්විතීයා විභක්ති යි. **නසිති** — මෙයින් උක්ත වන 'පුර' යනු එකවචන වැ තිබියදී මේ කවර හෙයින් බහුවචන වැ සිටියේ ද? 'යි' යන වාක්‍ය

සම්බන්ධාර්ථයෙහි නිපාතය හා යෙදුණු අනතර්ථාඛ්‍යාතයෙකැ ආඛ්‍යාතයෙන් සංශයෙක් හෝ වාර්තාවෙක් හෝ ප්‍රකාශ කැරේ නම්. එයින් උක්ත වන පදය එකවචන වුව ද බහුවචන වුව ද ආඛ්‍යාතය බහුවචන වැ මැ සිටීම සිංහල රීති සි තව ද ඒ ආඛ්‍යාතයෙන් උක්ත වන පදය කවර පුරුෂ වැ සිටිය ද ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ වැ සිටීම ද උක්ත පදය ද්විතීයා විභක්ති ගෙනැ සිටීම ද මෙහි විශෙෂ ලක්‍ෂණ වෙයි. **මුර** — මහත් ශබ්දය යන අර්ථයෙහි නාම පද යි. **ගා**— 'ගස' (පැවැත්වීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. ගස + අ = ගසා = ('හ' කාරාදෙශයෙන්) ගහා = ('හ' කාරා ලොපයෙන්) ගආ = (සවර්ණ දීර්ඝයෙන්) ගා. 'ගස' ධාතුව 'බල' ආදි ගණ පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු) ගසා– ගසති– ගැසී– ගැසූ. (කම් කරු) ගැසේ– ගැසෙති– ගැසිණි– ගැසුණු. ආදෙශ ලොපාදිය වැ 'ගා' යි සිටි පසු (කතු කරු) ගා–ගාති–ගෑ–යී ද සිටී. **කිවු** — කී හු. මෙහි බහුවචන ආඛ්‍යාත රූපය 'කී' යනු යැ. 'හු' යනු බහවර්ථයෙහි නිපාත යි. 'හු' යන්නෙහි 'හ' කාරයට 'ව' කාරාදෙශයෙන් කීවු = (හ්‍රස්වයෙන්) කිවු. මෙ බඳු තන්හි 'හ' යන්නට 'ව' කාරා දෙශ වූ විටැ පූර්ව ස්වරය හ්‍රස්ව වීම නියත යැ. මේ ආඛ්‍යාතයෙන් උක්ත වනුයේ පූර්ව පද්‍යයෙහි වන "රජ යුවරජ ඇමතිවරු" යන්න යැ. ශැ — අර්ථාවසානයෙහි නිපාත යි.

**107.** **එයසා නර පව ර**
**සිමැඳුරු කවුළුව හැ ර**
**බලමින් සිටැ එ ව ර**
**මෙ සේ පැවැසි තෙපුල් පැන ස ර**

අන්වය: නර පවර ඒ අසා සිමැඳුරු කවුළුව හැරැ බලමින් සිටැ එ වරැ මෙ සේ පැන සර තෙපුල් පැවැසි.

**විසසණි:** **එයසා** — ඒ + අසා = ('ය' කාරාගමයෙන්) ඒයසා = (හ්‍රස්වයෙන්) එයසා. **පැන සර** — ප්‍රඥාසාර වූ.

**108.** **රජ දහමට වෙන ස**
**නැති වැ අප අතැ කිසි දෙ ස**
**රට නැසෙයි යන බ ස**
**කිමෙකැ පවසනු මෙ අප අබියෙ ස**

අන්වය: රජ දහමට වෙනස කිසි දෙස අප අතැ නැති වැ "රට නැසෙයි" යන බස මෙ අප අබියෙසැ පවසනු කිමෙකැ ?

විපසණී: වෙනස — වෙනස් වූ. අබියෙසැ — අභිමුඛයෙහි. කිමෙකැ — කිමෙක් + යැ = කිමෙක් + ඇ = කිමෙකැ. 'කිමෙක් ද' යනු අර්ථ යි.

109. රජ මෙ ලෙස පවස ත
මැතිවරු කිවු යැ මෙ පුව ත
මතු රකිනට දිය ත
ඔබට තිසි දූ දරු කොනෙක් නැ ත

අන්වය: රජ මෙ ලෙස පවසත මැතිවරු මෙ පුවත කිවු යැ. මතු දියත රකිනට තිසි දූ දරු කෙනෙක් ඔබට නැත.

විපසණී: රජ — කර්තෘර්ථයෙහි ද්විතීයා යි. මතු — අනාගතයෙහි. ඔබ ගේ ඇවෑමෙන්. දියත — ලෝකය. මෙහි 'දියත්' ශබ්දය යි. කෙනෙක් — ප්‍රථමා බහුවචන යි. ආඛ්‍යාතය 'වෙත්' යනු යැ. ආඛ්‍යාහාසි යි.

110. එ බැවින් මෙ නුවර ට
අන් නිරිඳුන් පැමිණී වි ට
නසිනු යැ මතු මෙ ර ට
එයින් මුර ගෝ කිමු ඔබ හ ට

අන්වය: එ බැවින් මෙ නුවරට අන් නිරිඳුන් පැමිණි විටැ මතු මෙ රට නසිනු යැ; එයින් ඔබ හට මුර ගා කිමු.

විපසණී: එ බැවින් — ඉහතැ කී කාරණය නිසා. නසිනු යැ — නැසීම වේ යැ. නසිනු — 'නස්' ධාතුයෙන් වූ භාවකෘදන්ත නාම යි. 'බස්' ආදි පරපද 'නස්' ධාතු යි. නසී–නාසිති–නටි–නට්ඨ.

111. රජ එ පවත් අ සා
දරු ලබන කතු විම සා
කියව යි කී කි සා
ඇමැති ගණ සැල කළෝ මෙලෙ සා

විසඳුම් : එ පවත් — අමාත්‍යයන් කී ඒ ප්‍රවෘත්තිය. කියව — විධි ක්‍රියා රූප යි. විධි ක්‍රියායෙහි - කියනු, කියවු, කියව, කියයා, කියා යන මේ සියලු රූපයෝ මැ ලැබෙති. කැළෝ — උක්තය වූ 'ගණ' යනු සමූහාර්‍ථ යැ, ප්‍රාණිවාචී යැ. සමූහාර්‍ථ වුව ද අප්‍රාණීවාචී නම් ආඛ්‍යාතය එකවචන වැ මැ සිටී.

112. ගිම් සඳිනි පුවත ර
රඳනා ඔබ ඇතුළු පු ර
සුළු නළ'ගනන් ව ර
හල මැනැවි රකවලින් පිට කැ ර

අන්වය : පුවතර ගිම් සඳිනි, ඔබ ඇතුළු පුරැ රඳනා වර සුළු නළ අගනන් රකවලින් පිට කැරැ හල මැනැවි.

විසඳුම් : ඔබ — සම්බන්ධාර්‍ථයෙහි ද්විතීයා විභක්ති යැ. ඇතුළු පුරැ — අන්තඃපුරයෙහි. වර — උත්තම වූ. සුළු නළ'ගනන් — අන්තඃපුර ස්ත්‍රීන් අතුරින් සුළු අය,

113. උන් හැම අතුරිනු ත්
දරු උපතක් නො ලද හො ත්
අග මෙහෙසිනිය මු ත්
හල මැනැවි පුර'ගනන් අනෙකු ත්

විසඳුම් : උන් — ඒ සුළු නළඟනන්. මුත් — විනා 'ඉතිරි කොට' යනු අර්‍ථ යි. 'මුත්' යනු 'මුස්' (මිදීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'මුස්' ධාතුව 'බස්' ආදි පර පද යි. (කතු කරු) මුසී-මුසිති-මිති-මුතු. (කම් කරු) මිසේ-මිසෙති-මිසිණි-මිසුණු. 'මුතු' යන්නෙහි අන්ත්‍ය ස්වර ලොපයෙන් 'මුත්' යනු වී.

114. ඔවුන් හැම අතුරි න
පිනැති කෙනකුන් කුසසෙ න
උපන් කෙනකුන් සෙ න
රට රකිමු කිවු නැණැති හැම දෙන

විසඳුම් : කුසසෙන — ප්‍රකෘතිය 'කුස්' යනු යැ. එයින් පර වැ 'ඉන්' විබත යෙදූ කල්හි ලැබෙනුයේ 'කුසින්' යනු යැ. මෙහි 'එන්' විබත ගත ද 'ය' කාරාගමයකට ඉඩක් නැති. එ හෙයින් 'කුසයෙන්' යනු අසාධු යැ. උපන් — 'උපද'

(ඉපැදීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'උපද්' ධාතුව 'බස්, ආදි ගණ යි, උභය පද යි, අකර්මක යි. (පරස්මෛ පදයෙහි) උපදී-උපදිති-උපනී-උපනු. (ආත්මනෛපදයෙහි) ඉපැදේ-ඉපැදෙති-ඉපැදිණි-ඉපැදුණු. ගෙනැ — 'ගන්' ධාතු යෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි.

115. එ බස සිතැ ර ඳ වා
නො මඳ දරු පෙම් බ ඳ වා
පුර'ගන නො ම ඳ වා
හළේ රජ රකවලින් මු ඳ වා

**අන්වය :** රජ එ බස සිතැ රඳවා නො මඳ දරු පෙම් බඳවා නො මඳවා පුර අගන රකවලින් මුදවා හළේ.

**විස්තර :** **එ බස** — (පූර්ව පද්‍යයෙන් කියැවුණු සේ) නුවණැති හැම දෙන කී බස. **රඳවා** — අකර්මක 'රඳ' ධාතුව ප්‍රයෝජ්‍යයෙහි යෙදීමෙන් සකර්මක වූ තැනි. රඳන්නේ බස යැ. රඳවන්නේ රජ යැ. **දරු පෙම් බඳවා** — දරු පෙම් බඳවන්නේ පුරඟනන් ගේ සිත්වලැ යැ. දරුවකු ලැබීමේ අවශ්‍යතාවය ද අනුසස් ද පුරාඞ්ගනාවනට රජු විසින් මැනැවින් කියන ලද බව මෙයින් පෙනේ. **මුදවා** — 'මුද' (මිදීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා නිපාත යි යැ. 'මුද' ධාතුව 'බල' ආදි ගණ පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු) මුදා-මුදති-මිදී-මිදූ. (කම් කරු) මිදේ-මිදෙති-මිදිණි-මිදුණු.

116. මැතින් කී විලසි න
සොළොස් දහසක් වර'ඟ න
උනුන් දෙසැ සන මෙ න
දෙවා අවසර නිරිඳු නො ලසි න

**විස්තර :** **නො ලසින** — වහා. අනලස වැ. **දෙවා** — මෙහි 'ව' යනු අධිකයෙකි. ප්‍රයෝජ්‍යාර්ථයක් අනභිමත යැ. අවසර දෙන්නේ රජු යැ. අනෙකකු ලවා අවසර දෙවන්නේ නො වේ.

117. මෙ ලෙස කැරැ නෙක තැ ත්
ඔවුන'තුරින් එකකට ත්
නො ලදින් දරු උප ත්
මැතින් සහ ඒ නුවර අනෙකු ත්

අන්වය : මෙ ලෙස නෙක නෑත් කැරැ ඔවුන් අතුරින් එකකටත් දරු උපතක් නො ලදින් ඒ නුවරැ මැතින් සහ අනෙකුත්-('පුර වැසියෝ' යනු හා සබඳි.)

විසඳුම් : ඔවුන් — ඒ පුර සතින්. පුර සතිනු බැහැරැ ගිය හ. එ හෙත් දරු උපතෙක් නො වී යැ.

118. පුර වැසියෝ එ කා ල
රුස් වැ අවුදින් නො පැකි ල
සිටැ නිරිඳු වාස ල
කළෝ පෙරැ සේ මහත් කොලහ ල

අන්වය : පුර වැසියෝ එ කලැ නො පැකිලැ රැස් වැ අවුදින් නිරිඳු වාසලැ සිටැ පෙරැ සේ මහත් කොලහල කළෝ.

විසඳුම් : නො පැකිලැ — රජු ගේ වාසලට ගොස් කලබල කිරීම රජු කෙරෙහි ගෞරවාදරය ඇති ශිෂ්ට නාගරිකයනට රුස්නේ නො වේ. අනෙක් අතින් එය අනතුරුයකර වියැ නො හැක්කේ ද නො වේ. එ හෙයින් එ බන්දක් සඳහා ගිය ද පැකිලෙමින් මැ යෙති. මෙහි දී වනාහි කො තරම් අප්‍රියකර වුව ද යුතු කම කළ මනා මැ හෙයින් පුරවැසියෝ නො පැකිලැ ගිය හ. පැකිලැ — 'පකුලු' (පැකිලීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'පකුලු' ධාතුව 'රක්' ආදි ගණ යි, අනාමනෙපද යි. පැකිලේ-පැකිලෙති-පැකිලිණි, පැකිලි-පැකුලුණු, පැකිලි. රැස් වැ — රැශි වැ. පෙරැ සේ — මිට ප්‍රථම වරක් මෙ සේ මැ කොලාහල කරන ලද හෙයින් මෙ සේ කියැවෙයි. කොලහල — මහත් ඝොෂය. කලබලය.

119 එයසා රජ එ වි ට
මෙ තොප හැම කී විලස ට
පුර'ගනන් පිටත ට
හැරැත් නෙක රකවලින් පහ කො ට

අන්වය : එ විටැ රජ ඒ අසා, "මෙ තොප හැම කී විලසට පුරගනන් නෙක රකවලින් පහ කොට පිටතට හැරැත්—(මතු සම්බන්ධ යි.)

විසඳුම්: පහ කොට — අහක් කොට. හැරත් — හැර + දු - හැර + ද = හැරත්.

120. ඔවුන් ගෙන් එකක ට
පමණ වත් දරු උපන ට
කරුණක් නූ කල ට
ඉතින් කටයුතු දේ කියවු ම ට

විසඳුම්: දරු උපනට කරුණක් — දරුවකු ඉපදීමට කාරණයක් (හේතුවක්.) නූ — නො + වූ = (ස්වර පර රූපයෙන්) නු + වූ = ('ව' කාර ලොපයෙන්) = නු + උ = (සවර්ණ දීර්ඝයෙන්) නූ. කලට — ආධාරාර්ථයෙහි සතර වන විභක්ති යි.

121. මෙ සේ රජු පවස ත
අසමින් එ පුර වැසි ස ත
පුරඟන ගෙන් සම ත
මදක් වත් පින් කල කෙනෙක් නැ ත

අර්ථ: රජු මෙ සේ කියත් මැ. එ පුර වැසි මනුෂ්‍යයෝ අසමින්, (මෙසේ කී හ. කෙසේ ද?) "සමස්ත (සියලු) පුරාඞ්ගනාවන් ගෙන් ස්වල්පයක් වත් පින් කළා වූ කෙනෙක් නැත්තා හ.

විසඳුම්: පවසත — කාලාර්ථයෙහි අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. මේ පද්‍යයෙහි 'රජු' යනු ද 123 වන පද්‍යයෙහි 'රජ' යනු ද මෙයට අනුක්ත කර්තෘ යි. කෙනෙක් — බහු වචන යි. (නැති) 'වෙති' යන අධ්‍යාහාර්ය ආඛ්‍යාතයෙන් උක්ත යි.

122. එ බැවින් දරු උප ත
මොවුන් කුසැ විංමක් නැ ත
මතු රකින ලෙස ස ත
දරු ලබන සෙන උපදෙසෙක් ඇ ත

විසඳුම්: සත — සත්ත්වයන්. ඇත — ඇත්තේ යැ. උපදෙසෙක් — උපදේශයෙක්. ගුරු කමෙක්.

123. පිරිසුදු කුලෙනි සු ත්
සිතැ තුල පිරි කුදුණු මෙ ත්
දස දෙසැ පතල කි ත්
මහරු මෙහෙසුන් තනතුරට ප ත්

අන්වය : පිරිසුදු කුලෙන් යුත්, සිතු තුල කුලුණු මෙත් පිරි, දස දෙසැ කිත් පතළ, මහරු මෙහෙසුන් තනතුරට පත්-(මතු සම්බන්ධ යි )

විසඳුම් : කිත් — මේ කීර්තිය නම් ශීලාදි ගුණ කථාව යැ. පත් — 'පමුණු' (පැමිණීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. මුළු පද්‍යය මැ 129 වන පද්‍යයෙහි එන 'බිසෝ ලද' යන්නට විශෙෂණ යි.

124\. කොඳ කැකුළු වන් ද ත්
රත ලවනත පබළ ප ත්
මඳ මඳ හසිනි යු ත්
වුවනතින් දන මන නුවන් ග ත්

පදවි : කොඳ කැකුළු වන් දතින් ද පබළ පත් වන් රත ලවනතින් ද මඳ මඳ හසින් යුත් වුවනතින් ද දන මන නුවන් ගත්- ('අග බිසෝ ලද' යන්නට විශෙෂණ යි.)

විසඳුම් : කොඳ — සමන් මල්. කැකුළු — කුඩමල. මල පිපීමට පෙර කැකුළු යැ. පබළ පත්—ප්‍රවාල පත්‍ර. පබළු අති රක්ත වර්ණයෙන් යුක්ත යැ. ලවනත — තොල්. ප්‍රකෘතිය 'ලවන්' යනු යැ. 'අත්' යන්නෙන් විශෙෂ අර්ථයෙක් නො ලැබේ. හසින් — සිනායෙන්. වුවනතින් — වක්ත්‍රයෙන්. මුහුණින්. දන මන නුවන් — ජනයන් ගේ සිත් ද ඇස් ද. මැය ගේ දත් කොඳ කැකුළු මෙන් සුදු යැ, සිනිඳු යැ. තොල් ප්‍රවාල පත්‍ර මෙන් රතු යැ. මුහුණ මඳ සිනායෙන් යුක්ත යැ. එ හෙයින් මැය දුටුවන් සිත් ද ඇස් ද වෙන අනෙකැ නො යයි.

125\. සීලවතී නම් යු ත්
අග බිසෝ ලද සිරිම ත්
කල හොත් මින් පිට ත්
දරු ලැබෙති කිවු දනෝ නැණව ත්

අන්වය : සීලවතී නම් යුත් සිරිමත් අග බිසෝ ලද මින් පිටත් කලහොත් දරු ලැබෙති යි නැණවත් දනෝ කිවූ.

විස්තර : මින් — මේ රජ වාසලින්. ලැබෙති — මෙය 'ලැබෙතී' යි වියැ යුතු යැ. ඡන්දෝහෙතුයෙන් හ්‍රස්ව වි යැ. 'ලැබෙති' යනු ලැබෙති + යි = ලැබෙති + ඉ = ලැබෙතී යන විසින් නිපදී. මෙහි 'යි' යනු වාක්‍ය සම්බන්ධයෙහි නිපාත යි. නැණවත් — නැණ ඇතියේ නැණවත්. 'වත්' යනු තද්ධිත ප්‍රත්‍යය යි.

126. ඔවුන් කී බස — සා
නරනිඳු සඳ එ විග — සා
ලොවට වැඩ පිණි — සා
බිසෝ මිණි අබරණින් සර — සා

අන්වය : නරනිඳු සඳ ඔවුන් කී බස් අසා, එ විගසා, බිසෝ මිණි අබරණින් සරසා, ලොවට වැඩ පිණිසා, (මතු සම්බන්ධ යි.)

විස්තර : වැඩ — අභිවෘද්ධිය. යහපත. ලොවට වැඩ පිණිසා — බිසොව දරු කෙනකුන් ලද හොත් රජු ඇවෑමෙන් ඔහු රජ බවට පැමිණැ ලෝ සතුන් රකිති. එයින් ලොවට මහත් වැඩ වෙයි. බිසෝ මිණි අබරණින් — මහිෂියට අයත් මාණික්‍ය ආභරණයන් ගෙන්. රජ ගෙන් නික්මැ යන හෙයින් කල යුත්තේ සාමාන්‍ය ආභරණයෙන් සැරැසීම යි. එ හෙත් එ සේ නො කැරිණ. බිසෝ මිණි අබරණින් මැ සරසන ලදු. සරසා — 'සරස' (සැරැසීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. සකර්මක 'සරස' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතෘ කාරැ) සරසා-සරසති-සැරැසි-සැරැසූ, (කර්ම කාරැ) සැරැසේ-සැරැසෙති-සැරැසිණි-සැරැසුණු.

•127. වෙන් වැ සුරනිඳු — ගෙන්
බසිනා ලියෙ'ව සව — ගෙන්
දරු ලබනුව ඇ — ගෙන්
පිටත් කොළෙ රජ බිසොව රජ — ගෙන්

අන්වය : සුරනිඳු ගෙන් වෙන් වැ සවගෙන් බසිනා ලිය එව් රජ බිසොව, ඇගෙන් දරු ලබනුව රජ ගෙන් පිටත් කෙළෙ.

**විසඳුම්:** **සුරනිඳු ගෙන්** — ශක්‍රයා ගෙන්. දේවියනට ඉන්ද්‍ර (අධිපති) වෙයි. **සවගෙන්**—ස්වර්ගයෙන්. **දිය එව**—(දිව්‍ය) ස්ත්‍රියක වැනි වූ. **රජ බිසොව** — රාජ මහිෂිය. **ලබනුව** — ලැබීමු පිණිස, 'ලබ' (ලැබීමෙහි) ධාතුයෙන් වූ අපර ක්‍රියා නිපාත යි. 'නුව' ප්‍රත්‍යයය යි. **රජ ගෙන්**—රජ මාළිගයෙන්. **කොලෙ** — මෙහි උක්තය පූර්ව පද්‍යයෙහි ආ 'නරනිඳු සඳ' යනු යි. මේ පද්‍යයෙහි 'බිසොව' යනු කර්ම යි.

128\. සො ව ගි න් තැවෙමින් සිටි සඳැ එ දිගැ'ස
ඇ ය න න් සිල් ගුණ මහිමෙන් එ විග ස
සු රි ඳු න් පඬු'පුල් සල'සුන් සිසිල ස
නො ම ඳි න් හුණු වියැ රත් යවටක් ලෙ ස

**අන්වය:** එ දිගැස සෝ අගින් තැවෙමින් සිටි සදැ, ඇය නන් සිල් ගුණ මහිමෙන්, එ විගසැ, සුරිඳුන් සිසිලස පඬුපුල් සල අසුන් රත් යවටක් ලෙස නො මඳින් හුණු වී යැ.

**විසඳුම්:** **එ දිගැස** — ශීලවතී බිසොව. **සොවගින්** — සෝ + අගින් = ('ව්' කාරාගමයෙන් හා හ්‍රස්ව වීමෙන් හා) සොවගින්. ශෝක ගින්නෙන්. **සිසිලස**— සිසිල් + අස. මෙහි 'අස' යනු විශෙෂාර්ථයක් නො දෙයි. **පඬුපුල් සලසුන්**— පාණ්ඩු උපල ශෛලාසනය. සුදු ගල් අස්න. 'පඬු උපුල් සල් අස්න' යන තන්හි 'උපුල්' යනු ද 'සල්' යනු ද 'ගල්' අරුත දෙයි. එ හෙයින් 'පඬුපුල්' යනු විමැසියැ යුතු යැ. 'පඬු + ඇඹුල්' යන තන්හි 'ඇඹුල්' යනු කම්බලාර්ථ යි. 'ඇ' ලොපයෙන් වූ 'පඬුඹුල්' යන්නෙහි 'ඹු' යන්න කිමේ පහසුව පිණිස 'පු' යන්නට පෙරළිණි ද? 'පඬු + ඇඹුල්' යනු සන්ධි නො වන තැනක් බව සිදත් සඟරා කාරයෝ හඟවති. මේ ආසනය තව්තිසා දෙව් ලොවැ ශක්‍රයන් ගේ නන්දනොද්‍යානයෙහි පරසතු ගස මුල පිහිටියේ යැ. සුදු පැහැයෙන් යුක්ත යැ. එය සුදු කම්බිලියක් මෙනැ යි ශෙති. එ හෙයින් පාණ්ඩුකම්බල යන නමින් ද හැඳින්වෙයි. ගලක් වුව ද ඉතා මෘදු යැ. "ගලෙකැ මොලොක උන් සක්. නැබ වැසේ යා'' යනුයෙන් ගුත්තිල කාරයන් කීයේ මේ ශෛලාසනය යැ. මනුෂ්‍ය ලොකයෙහි යම් කිසි සත්පුරුෂයකුට කිසි යම් විපත්තියක් වන් විටැ මේ ආසනය උෂ්ණ වේ ල. එ කල්හි එ සේ වීමට හේතු

කාවරේ දූ යි බලා දැනැ ශක්‍රයෝ ඒ සත්පුරුෂයාට පිහිටා වෙත් ල. අවාසනාවකට මෙන් දූත් එබන්දෙක් නො වේ. **රන් යවටක්** — රත් කල යකඩ මිටයක්. 'යවටක්' යන තන්හි 'ය' යන්නෙහි ප්‍රකෘතිය 'යා' යනු යි. මේ ග්‍රන්ථයෙහි මැ එන "යා දෙක නො රත රත" යන්නෙන් එය පෙනේ. සන්ධි වීමෙහි දී හ්‍රස්ව වී යැ.

**129.** **සහස් නෙතින් සක් මුළු ලොව බලමි නා**
**කුකුස් සිතින් සිටි එ බිසොව දකිමි නා**
**තිදස් පුරෙන් මතු ඇගෙ කුසැ උපදි නා**
**වෙසෙස් සුරන් දෙ දෙනකු දූසැ දිවැ'සි නා**

**අන්වය :** සක්, සහස් නෙතින් මුළු ලොව බලමින, කුකුස් සිතින් සිටි එ බිසොව දකිමින, තිදස් පුරෙන් මතු ඇගෙ කුසැ උපදින වෙසෙස් සුරන් දෙ දෙනකු දිව ඇසින දූසැ-(මතු සම්බන්ධ යි.)

**විසඳුම් :** **සහස් නෙතින්** — දහසක් නෙත්‍රයන් ගෙන්. ශක්‍රයනට නෙත් දහසක් ඇතැ යි යෙති. දහස් ගණන් කරුණු එක් විටැ වටහා ගත හැකි නුවණ ඇති හෙයින් ල. බලමින — පූර්ව ක්‍රියාව යි. **කුකුස් සිතින්** — සැක සිතින්. කිමෙකින් කිමෙක් වේ දෝ යි නො දන්මෙන් උපන් බලවත් සැකයෙක්. **තිදස් පුරෙන්** — ත්‍රිදශ පුරයෙන්. තව්තිසා දෙව් ලොවින්. 'තිදස්' යනු ති + ති + දස යන්නෙන් නිපන 'තිස් තුන' යන අර්ථ යි. මේ දිව්‍ය ලොකයට පළමු යෙන් ගියෝ තිස් තුන් දෙනෙකි. එ හෙයින් මෙ නම් වී. විස්තර කථා මඝමාණවක ජාතකයෙන් දත්තේ යි. දකිමින— පූර්ව ක්‍රියාව යි. **මතු**:— අනාගතයෙහි. 'තිදස් පුර හැරැ ගිය පසු යන අර්ථ යි. **දිවැසින්** — දිව + ඇසින්. සියලු දෙවියෝ දිව ඇස් ඇත්තාහු වෙති.

**130.** **පළමු ව වැදූ බෝසත් සුර විම නා**
**දෙව නු ව වෙන දෙවියකු ගෙත් සොබ නා**
**නර ලොව එ බිසොව කුසැ මන නඳ නා**
**උපදූ ව වදහලෙ පියකරු බසි නා**

**අන්වය :** පළමු වැ බෝසත් සුර විමනා වැදූ දෙවනු වැ සොබනා වෙන දෙවියකු ගෙත් (විමනා වැදූ) "නර ලෙවැ මනානදනා එ බිසොව කුසැ උපදුව" (යි) පියකරු බසිනා වදහලෙ.

විසඳුම් : බෝසත් සුර — බෝධිසත්ත්ව වූ දෙවියා ගේ. විමනා — විමානයට. 'විමන' යි සිටියැ යුතු තන්හි 'විමනා' යැ යි වූයේ ඡන්දෝහේතුයෙනි. නඳනා-බසිනා-යන දෙ තන්හි දු මෙමැ නය යි. වෙන දෙවියකු ගෙන් — අන්‍ය දෙවියකු ගේ ද. "විමන වැද්ද" යනු ප්‍රථම පාදයෙන් ගෙනැ මෙ තැනට ද සම්බන්ධ කළ යුතු. මෙහි 'දෙවියකු'යි අතීයම්න් තුබූ සේ නො මැනැවි, පූර්ව පද්‍යයෙහි "සුරන් දෙ දෙනකු" යනු කියැවිණ. ඉන් එකකු ගත් කලැ ඉතිරි වනුයේ අනෙක් දෙවියා යැ. අනෙක් දෙවියෙක් නො වේ. "දෙවියා ගෙන්" යනු නම් යෙදෙයි. එහෙත් එය හා 'වෙන' යනු නො ගැළැපේ. "දෙවනු ව 'නෙක් දෙවියා ගෙන්" යැ යි ගත නිවැරැදි යැ. සොබනා — 'සොබ' ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'සොබ' ධාතු 'රක්' ආදි උභය පද යි. (පර පද) සොබි-සොබිති-සෙබි. (අත් පත්) සෙබේ-සෙබෙති-සෙබිණි-සෙබුණු. බෙහෙවින් යෙදෙනු 'හ'කාර යුක්ත රූප යි. උපදුව-විධාන යි. උපද + හු = උපදු + හු = උපදු + හ = උපදු + ව = මේ 'උපදුව' යන්නට අනතුරැ වැ වාක්‍ය සම්බන්ධාර්ථයෙහි 'යි' නිපාතය අධ්‍යාහාර්‍ය යි. වදහලෙ — උක්තය පූර්ව පද්‍යයෙහි ආ 'සක්' යනු යි. ඒ පද්‍යයෙහි මැ වූ 'බලමින,' 'දකිමින,' 'දැකැ,' යන කෘදන්තයනට ද මේ පද්‍යයෙහි වූ 'වැද්ද' යන්නට ද කර්තෘ වූයේ ද ඒ 'සක්' යන්න මැ යැ. 'උපදුව' යන්නෙහි 'තෙපි' යන උක්තය අධ්‍යාහාර්‍ය යි. වදහලෙ — 'වදහර' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය වන 'වදහල' යනු පෙර විබත් එක බස ගෙනැ සිටි තැනි, ධාතු රූපය බෙහෙවින් යෙදෙනුයේ 'වදරු' යන විසිනි.

131\. සුරරද බස සිය මුඳුනින් පිළිගෙ න
බගු පද නිය රස් ගඟ තුළැ ගිලෙමි න
හිමි සඳ වදහල ලෙස කුසැ බිසොවු න
පිළිසිඳ ගනිමු යැ කිවු සුර එ දෙදෙ න

අන්වය : (අපරාර්ථයෙහි) හිමි සඳ වදහල ලෙස බිසොවුන කුසැ පිළිසිඳැ ගනිමු යැ එ සුර දෙ දෙන කිවු.

**විසඳුම්:** **සුර රද** — සුර රාජයා. ශක්‍රයා. මෙහි සම්බන්ධයෙහි දවිතියා යි. **සිය මුඳුනින් පිළිගෙනැ** — ස්වකීය මස්තකයෙන් පිළිගැනීම නම් ගෞරවාදරයෙන් කැරෙන පිළිගැනීම යැ. 'පිළිගෙනැ' යන පූර්ව ක්‍රියාවට කර්තෘ වූයේ 'දෙ දෙන' යන්න යැ. **පද නිය රස් ගඟ** — පාද නඛ රශ්මි නමැති ගඞ්ගාව. පාද නඛ රශ්මියට ජලයක් හෝ ගඞ්ගාවක් හෝ උපමාන කිරීම බොහෝ කවීන් විසින් සම්භාවිත යැ. ගුත්තිල දායෙහි දු–

"නි රි දු පද නිය ර ස්
පි රි සු දු දියෙන් සිහිල ස්" —යි

පෙනේ. පාද නඛ රශ්මි නමැති ගඟ තුළැ ගිලීම නම් පා වැදීම යැ. **ගිලෙමින** — 'ගිල' (ගිලීමෙහි) ධාතුයෙන් වූ මිශ්‍ර ක්‍රියා නිපාත යි. 'ගිල' ධාතුව 'රක්' ආදි ගණ පරස්මෛපද යි. (කතු කරු) ගිලී–ගිලිති–ගිලි. (කම් කරු) ගිලේ–ගිලෙති–ගිලිණි–ගිලුණු. **හිමි සඳ** — ආමන්ත්‍රණය යි. එ හෙයින් 'ඔබ' යනු වැන්නක් අධ්‍යාහාර යි. **පිළිසිඳැ** — 'පිළිසිඳු' (ප්‍රතිසන්ධියෙහි = පිළිසිඳීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'පිළිසිඳු' ධාතුව "බස්" ආදි ගණ ආත්මනෙපද යි. පිළිසිඳේ – පිළිසිඳෙති – පිළිසිඳිණි – පිළිසිඳි– පිළිසිනි–පිළිසිඳුණු–පිළිසිඳි–පිළිසුනු. **කිවු** — 'කී' යනු 'කිය' (කීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'කිය' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු) කියා–කියති–කියී, කී–කියූ, කී. (කම් කරු) කියැවේ– කියැවෙති–කියැවිණි–කියැවුණු. ධාතු ප්‍රත්‍යය දෙ දෙනා මධ්‍යයෙහි 'ව' වෙයි. 'කිවූ' යනු කී + හු = කී + වූ = කිවූ යනු විසින් නිපදී. 'හු' යනු ආඛ්‍යාතයේ කොටසෙක් නො වෙ. බහුවචනය ප්‍රකාශ කරන්නා වූ අවසාන නිපාතයෙකි.

132\. එ ප වත් අසමින් වඩමින් සිතැ තො ස
දි ව ගත් අතුරුදහන් කැරැ එ විග ස
දූ මූ සත් නෙත් සිත් පිළිකුල් වන ලෙ ස
වි දු ර ත් ගති මෙ ලෙසින් ඔබලත් වෙ ස

**අන්වය:** විදුරත්, එ පවත් අසමින් සිතැ තොස වඩමින් එ විගසැ දිව ගත් අතුරු දහන් කරමින්, දුටු සත් නෙත් සිත් පිළිකුල් වන ලෙස, මෙ ලෙසින් ඔබලත් වෙස ගති.

විසඳුම් : එ පවත් — "බිසොවුන් කුසැ පිළිසිඳැ ගතිවූ" යි එ සුර දෙ දෙනා කී පවත්. අසමින් — පූර්ව ක්‍රියාවි යි. 'වඩමින්' යනු ද 'කරමින්' යනු ද මෙ සේ මැ පූර්ව ක්‍රියාවිය දෙයි. දිව ගත් — දිව්‍ය ශරීරය. අතුරු දහන් කරමින් — අන්තර්ධාන කිරීම නම්, එක වරට, සිටි වන මැ, නො පෙනෙන්නට සැලැස්වීම යැ. විදුරත් — ශක්‍ර. විදුර (වජ්‍රය= සෙණ පහර) අත්හි වූයෙන් හේ 'විදුරත්' නම්. මෙ ලෙසින් — මේ මතු කියැවෙන ආකාරයෙන්. ඔබලත් — දුර්වල. ඔබල+ අත් මෙහි 'අත්' යනු විශෙෂ අර්ථයක් නො දේ. ඔබල=අව+ බල. බලයෙන් තොර (ඉකුත්) වූයේ අවබල යැ. ගති — 'ගත්' (ගැනීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි.

183\. යුග නෙ ත් සපිරි කබ සහ කඳුළ ත්
කොඳුලු ත් ඇකිළි වැගිරි කවැ ද ත්
ජ ර ප ත් බමුණකු විලසින් දුප්ප ත්
එ ම හ ත් සුර රද සබයට විය ප ත්

අන්වය : කබ සහ කඳුළුත් යුග නෙත් සපිරී, කොඳුලුත් ඇකිළී, කවැ දත් වැගිරී, ජර පත් දුප්පත් බමුණකු විලසින්, එ මහත් සුර රද සබයට පත් වී යැ.

විසඳුම් : යුග නෙත් — නෙත් දෙකෙහි. සපිරි — 'සපුර' ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. කොඳුලුත් — කොඳුල+ දු=(ස්වරාගමයෙන්) කොඳුලු දු=('දු' නිපාතයා ගේ ස්වර ලොපයෙන්) කොඳුලු+ද්=(අඝොෂාදෙශයෙන්) කොඳුලුත්. කොඳුල් නම් කම්මුල් යැ. ඇකිළි — හැකිළීමෙහි 'හකුළු' ('හ' කාර ලොපයෙන් 'අකුළු' යී ද සිටී.) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. සකර්මක 'හකුළු' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) හකුළා–හකුළති–හැකිළි– හැකුළූ. (කම් කරු) හැකිළේ–හැකිළෙති–හැකිළිණි– හැකුළුණු. අකර්මක 'හකුළු' ධාතුව 'රක්' ආදි ගණ යි, ආත්මනෙපද යි. හැකිළේ–හැකිළෙති–හැකිළිණි, හැකිළි– හැකුළුණු, හැකිළි. වැගිරි — ගැලැවී. මේ 'වැගුරු' (වැගිරීමෙහි – ගිලිහී යැමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'වගුරු' ධාතුව 'බස්' ආදි ගණ යි, ආත්මනෙපද යි. වැගිරේ–වැගිරෙති–වැගිරිණි, වැගිරි, වගිළි–වැගුරුණු, වැගිරි, වගුළු. සකර්මක 'වගුරු' ධාතුව 'බල' ආදි ගණ පරස්මෛපද

යි. (කතෘ කරු) වගුරා-වගුරති-වැගිරී-වැගුරු. (කර්ම කරු) වැගිරේ-වැගිරෙති-වැගිරිණි-වැගුරුණු. **ජර පත්** — ජරාවට පත් වූයේ කබ සහ කඳුළු ගුඟ නෙතෙහි සපිරීමෙනි, කොඳුල් ඇඟිලිමෙනි, කටැ දත් වැගිරීමෙනි. 'සපිරි'-'ඇඟිලි'-'වැගිරි' යන පූර්ව ක්‍රියාවෝ හේතුවාචය ප්‍රකාශ කෙරෙත්. **එ මහත් සුර රද** — ඒ මහත් වූ දිව්‍ය රාජ තෙමේ. **සබසට** — අග්‍ර මහිෂිය රාජ මාළිගයෙන් පිටත් කැරැවූව මැනැවැ යි රජු ගෙන් ඉල්ලා සිටිමට මන්ත්‍රීන් හා පුරවැසියෝ මහත් ගණනක් රජ වාසලට රැස් වැ සිටිය හ. ඔවුන් ගේ ඉල්ලීමව රජ තුමා එකඟ වූ හෙයින් "අග බිසොව රාජ මාළිගයෙන් නික්මුණ හ" යි අසා විස්මිත වැ එය බැලීමට ද බොහෝ දෙන එහි රැස් වූ හ. මෙහි ගැනුණේ ඒ සභාව යැ. **වියැ** — වී + යැ. (අතීත ආඛ්‍යාත රූපය හා 'යැ' (අවාවසාන සූචක නිපාතනය හා සන්ධි වීමෙන්) වියැ.

**134.** ඝෝතනා ම බැඳි පබයකු සේ වැනෙමි න
සබස ම ආ සක් බමුණා දකිමි න
කුමක ම මෙ තැනට අවු දූ සි කියමි න
එම ගොම සිවි සෙන් රවටති නො මදි න

**විසඳුම්** : **ආ** — 'එ' (පැමිණීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'සක් බමුණා' යන්නට විශෙෂණ යි. 'වැනෙමින්' යනු 'ආ' යන්නට විශෙෂණ යි. **සක් බමුණා** — දූත් බමුණු වෙසක් ගෙනැ සිටින ශක්‍රයා. **රවටති** — 'රවට' (රැවැටීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'රවට' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතෘ කරු) රවටා-රවටති-රැවැටී-රැවැටූ. (කර්ම කරු) රැවැටේ-රැවැටෙති-රැවැටිණි-රැවැටුණු.

**135.** නො මඳි න් මහ සෙ න් සිටි ඒ සබ මැ ද
අ වු දි න් පෙරවූ වැ මහිමෙන් දිව තෙ ද
බි සො වු න් අත අල්ලා ගෙනැ සුර ර ද
සැ ණෙකි න් පුර වාසල පිටතට වැ ද

**අන්වය** — සුර රද, නො මඳින් මහ සෙන් සිටි ඒ සබ මැද අවුදින්, දිව තෙද මහිමෙන් පෙරවූ වැ, බිසොවුන් අත අල්ලා ගෙනැ, සැණෙකින් පුර වාසල පිටතට වැදූ—(මතු සම්බන්ධ යි.)

විපසණි: දිව තෙද මහිමෙන් — දිව්‍ය තේජසෙහි අනුභාවයෙන්. ශක්‍රයෝ මහත් අනුභාව ඇත්තෝ යැ. අවුදින් — 'අවුදු' යනු 'එ' (පැමිණීමෙහි) ධාතුව නිසා නිපනිත වූ පූර්ව ක්‍රියා නිපාතයෙකි. මෙහි 'ඉන්' පස ගෙනැ සිටියේ යැ. අල්ලා — අත්+ලා=(පර රූපයෙන්) අල්ලා. මෙහි 'ලා' යනු 'ල' (ලීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. වාසල — අනතර් නගරයේ ප්‍රාකාර ද්වාරය.

136. දොර 'ගුළු නො මැ ලූ නො මැ ඇවුරූ ව ට
ස ර කිසි වතකුත් නො මැ ඇති වැඩක ට
ත ර නූ සුළු පැල් පත්තක් බිසොව ට
පෙර' අප උන් ගෙය මේ යැ සි පළ කො ට

අන්වය: දොර අගුළු නො මැ ලූ, වට නො මැ ඇවුරූ, වැඩකට කිසි සර වතකුත් නො මැ ඇති, තර නුවූ සුළු පැල් පත්තක්, "පෙරැ අප උන් ගෙය මේ යැ"යි බිසොවට පළ කොට — (මතු සම්බන්ධ යි.)

විපසණි: ඇවුරූ — 'අවුර' (ඇවිරීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'අවුර' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) අවුරා-අවුරති-ඇවිරී-ඇවිරූ. හෝ ඇවුරූ. (කම් කරු) ඇවිරේ-ඇවිරෙති-ඇවිරිණි-ඇවිරුණු හෝ ඇවුරුණු. සර — සාර වූ. වතකුත් — වස්තුවකුත්. තර — ස්ථිර. නූ — නො+වූ=නු+වූ=නු+ඌ=නූ. 'තර නූ' යැ යි කීමෙන් ඉතා දුර්වල බව හැඟැවෙයි. සි — කියා. පළ කොට — පෙන්නා. 'පළ' යනු ප්‍රකාශ යන අර්ථයෙහි වේ.

137. හැ ම තැනැ ගොස් බත බුලත ද රැගෙ නේ
ම ම එන තුරු ඉඳුව සි පවසමි නේ
එ ම තුළ මැස්සෙකැ නිදි ගන්වමි නේ
පෙ ම කැරැ තුනු පිරිමැද කොමල'ති නේ

අන්වය: "හැම තැනැ ගොස් බත බුලත ද ඇරැ ගෙනැ මා මැ එන තුරු සිටුව"යි පවසමින්, එ මැ තුළු මැස්සෙකැ නිදි ගන්වමින්, පෙම් කැරැ කොමළ අතින් තුනු පිරිමැදූ — (මතු සම්බන්ධ යි.)

විපසණි: හැමැ තැනැ ගොස් — සිඟා යන බව මේ කී පරිදි යි. සිඟන්නෝ එක තැනෙකට මැ යන්නෝ නො වෙති. රැගෙනේ — 'රැගෙනැ' යනු එළි වැට සඳහා ද ජනස සඳහා ද

මෙ සේ යෙදිණ. **මම** — මා මැ. අන් කවරකු අව ද, අවුත් කවරක් කිව ද, ඒ නො ඇදැහියැ යුතු බව ඇඟැවීමට මෙ සේ කියැවිණ. **එ මැ තුළැ** — ඒ පැල් පත්ත තුළැ මැ. **නිදි** — 'නිද්‍රා' යන අර්ථයෙහි නාම පද යි. **ගන්වමින්** — 'ගත්' (ගැනීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය මිශ්‍ර ක්‍රියා නිපාත යි. නිදි ගන්නේ බිසොව යැ. ගන්වන්නේ සුර රද යැ. **පෙම** — ප්‍රේම. **කොමල** — ශත්‍රුයන් ගේ සකල ශරීරය ඉතා සිවුමැලි යැ, දිව්‍ය වූ කොමලත්වයෙන් යුක්ත යැ. **පිරිමැද** — 'පිරිමද' (පරිමාර්ජනයෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'පිරිමද' ධාතුව 'බස්' ආදි ගණ ද 'රක්' ආදි ගණ ද වෙයි. පරස්සෙපද යි, සකර්මක යි. 'බස්' ආදි ගණයෙහි (කතු කරු) පිරිමදි–පිරිමදිති–පිරිමළි–පිරිමටු. 'රක්' ආදි ගණයෙහි (කම් කරු) පිරිමදි–පිරිමදිති–පිරිමැදි. දෙ ගණයෙහි මැ — (කම් කරු) පිරිමැදේ–පිරිමැදෙති–පිරිමැදිණි–පිරිමැදුණු.

**138.** **සැණෙකි න් සුර පුරයට වැදූ අන තු රු**
**එ ත ම න් ඉදු බල මහිමෙන් විසි තු රු**
**නි සි ර න් විමනෙකැ තිලි'තුල පිවි තු රු**
**බි සො වු න් දිව යහනෙකැ සැතැපැවි තු රු**

**අන්වය :** අනතුරු, සැණෙකින් සුර පුරයට වැදූ, එ තමන් ඉදු බල මහිමෙන්, විසිතුරු නිසි රන් විමනෙකැ, පිවිතුරු තිලි අතුළ උතුරු දිව යහනෙකැ, බිසොවුන් සැතැපැවී.

**විසඳුම් :** **අනතුරු** — අනන්තර වැ. ඒ සමග මැ. ඉක්බිත්තෙන්. **ඉදු** — සෘද්ධි. **නිසි** — බිසොවුන් ගේ පරිහරණයට සුදුසු. **තිලි** — මෙට්ට. **අතුළ** — 'අතුරු' (ඇතිරීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'අතුරු' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්සෙපද යි, සකර්මක යි. (කතු කරු) අතුරා–අතුරති–ඇතිරී–ඇතුරු. 'අතුළ' යනු නිපාතයෙන් වේ. (කම් කරු) ඇතිරේ–ඇතිරෙති–ඇතිරිණි–ඇතුරුණු. **සැතැපැවී** — 'සතප' (සැතැපීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය අතීත ආඛ්‍යාත පද යි. සකර්මක 'සතප' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්සෙපද යි. (කතු කරු) සතපා–සතපති–සැතැපී–සැතැපූ. (කම් කරු) සැතැපේ–සැතැපෙති–සැතැපිණි–සැතැපුණු. අකර්මක 'සතප' ධාතුව 'රක්' ආදි ගණ යි, උභයපද යි. (පරස්සෙපදයෙහි) සතපී–සතපිති–

සැතැපි. (ආත්මනෙ පදයෙහි) සැතැපේ-සැතැපෙති-සැතැපිණි, සැතැපුණු. සැතැපැවි යනු අකර්මක 'සතප' ධාතුයෙන් නිපන. සැතැපුණේ බිසොව යැ. සැතැපැවූයේ ශක්‍රයා යැ. මේ ආඛ්‍යාතයෙන් උක්ත වනුයේ 139 වන පද්‍යයෙහි එන 'සුර රද' යනු යි.

**139.** ස ති ය ක් නිදි ගෙනැ එකි එ බිසෝ ළ ද
එ සි නි'ක් බිනි නැඟැ සිටැ වුන් සබ මැ ද
දෙ තිසක් සුරිඳුන් සහ සුර සෙන් මැ ද
දිසි ස ක් සුරිඳු ගෙ පද වැඳැ සිටි ස ද

අන්වය: එ බිසෝ ළද එකි සතියක් නිඳි ගෙනැ, එසින් ඉක්බිති නැගැ සිටැ, සබ මැද අවුත්, දෙ තිසක් සුරිඳුන් සහ සුර සෙන් මැදූ දිසි සක් සුරිඳු ගෙ පද වැදැ සිටි සදැ—(මතු සම්බන්ධ යි.)

විසඳුම්: එකි — ඒ දිව යහනෙහි. සතියක් — මේ මනුෂ්‍ය ගණනායෙනි. මෙ දිව්‍ය ලොකයෙහි දිවාරාත්‍රි ප්‍රමාණය දක්වන්නාහු— "මෙ ලොවැ සියක් හවුරුදු එහි එක දවස" යී කියති. සබ මැද — සුධර්මා නම් දිව්‍ය සභා මධ්‍යයට. දෙ තිසක් සුරිඳුන් — මේ දිව්‍ය ලොකයෙහි ප්‍රධානයෝ ශක්‍රයෝ යැ. ශක්‍රයනට පමණක් දෙ වැනි වැ අන් සියලු දෙවියනට ප්‍රධාන වූ දෙව් වරු දෙ තිස් දෙනෙක් මෙහි වෙති. ශක්‍රයන් ද සමග මේ දෙතිස් දෙවියන් ගැනැ සලකා මෙයට ත්‍රයස්ත්‍රිංශත් යන නම කියත්. දිසි — දෘශ්‍යමාන වූ. සදැ — සන්ධියෙහි. කාලයෙහි,

**140.** පැහැ ප ත් ඇගෙ වත් පිපි සිය පත වා
වි දු ර ත් තම නෙත් කැන් බිඟු විගි වා
ය හ ප ත් වරයක් දෙමි නිසි තොප වා
ගත හො ත් යෙහෙකැ යි කී එ බිසොව වා

අන්වය: විදුරත් තම නෙත් කැන් බිඟු පැහැපත් ඇගෙ වත් පිපි සියපතට විගිට. "තොපට නිසි යහපත් වරයක් දෙමි, ගත හොත් යෙහෙකැ"යි එ බිසොවට කී.

විසඳුම්: වත් — වක්ත්‍රය. මුහුණ. පිපි — 'පුප්' (පිපිමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'පුප්' ධාතුව 'රස්' ආදි ගණ උභයපද යි. (පර පද) පුපි-පුපිති-පිපි. (අත් පද)

පිජේ-පිපෙති-පිපිණි, පිපි-පිපුණු, පිපි. සියපතවා — පත් සියයක් (බොහෝ ගණනක්) ඇත්තේ යමෙකැ ද ඒ සියපත්. මේ නෙළුම් මලට නම්. 'වා' යි දීඝ වූයේ ඡන්දස රැකනු පිණිස යැ. ඉතර තුන් පාදයන්හි ද මෙය මෙ සේ මැ යැ. කැන් — කාන්ති. විගිව — හැරියේ යැ. 'විගිදු' (විගිදීමෙහි) ධාතුයෙන් වූ අව්‍යය යි. 'විගිදු' ධාතුව 'බස්' ආදි වූ තන්හි (කතු කරු) විගිදී-විගිදිති-විගිපි-වුහුවු. (කම් කරු) විගිදේ-විගිදෙති-විගිදිණි-විගිදුණු. 'බල' ආදි වූ තන්හි (කතු කරු) විගිදූ-විගිදති-විගිදිණි-විගිදුණු. (කම් කරු) පෙර මෙනි. 'රක්' ආදි වූ තන්හි, අකර්මක යි. අත් පද යි. විගිදේ-විගිදෙති-විගිදිණි, විගිදි-විගිදුණු, විගිදි. යෙහෙකැ — යෙහෙක් + යැ = යෙහෙක් + ඇ = යෙහෙකැ.

සිලවතී බිසොව ගේ පැහැපත් මුහුණ පිපුණු නෙළුම් මලෙකි. ශක්‍රයන් ගේ නෙත්‍ර කාන්තිය භෘඞ්ග පඞ්ක්තියෙකි. එ හෙයින් ශක්‍රයන් බිසොව ගේ මුහුණ දෙස බලනා විට පිපුණු නෙළුම් මලකට මී මැස්සන් පෙළක් යන්නාක් වැන්නැ.

මුහුණ පද්මයකට ද ඒ දෙස ලන බැල්ම භෘඞ්ගයනට සමාන කිරීම අන්‍ය කවීන් විසිනුදු සම්භාවිත යැ. කියැවිණි මැ නො, ගුත්තිල දායෙහි -

"නිරිඳු සඳ එ බස ව
බෝසත්හු මුව තඹර ට
සිය නෙත් බිඟු විකි ම
එ සඳ පැවැසී තෙපුල් මෙ ලෙස ට"...යි?

141\. එ පවත් අසමින් එ බිසෝ සතො සා
සිරිමත් නිසි පුත් රුවනක් වෙසෙ සා
දූන හොත් යෙහෙකැ යි පැවැසූ බස' සා
ඇගෙ සිත් ලෙස සක් මෙ ලෙසට පව සා

අන්වය: එ බිසෝ එ පවත් සතොසා අසමින්, "සිරිමත් නිසි පුත් රුවනක් වෙසෙසා දූන හොත් යෙහෙකැ" යි පැවැසූ බස් අසා, සක් ඇගෙ සිත් ලෙස මෙ ලෙසට පවසා.

විසඳුම්: බිසෝ — කර්තෘ විභක්තියෙහි ද්විතීයා යි. 'පැවැසූ' යන්නෙහි කර්තෘ යි. සතොසා — සන්තොෂයෙන්. අසමින් —

පූර්ව ක්‍රියාව යි. **සක්** — ශක්‍ර තෙමේ. **පවසා** — ප්‍රකාශ කෙරෙයි. 'පවසා' යනු 'පවස' (පැවැසීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'සක්' යනු මෙයින් උක්ත වෙයි.

**142.** සු ත න් දෙ දෙනකු මැ දෙමි මෙ තොපට ළ ඳ
එ යි න් එකෙක් නුවණැ'ති වෙයි රුව ම ඳ
රු වි න් යුතු යැ අනෙකා වෙයි නැණ ම ඳ
මෙයින් පලමු කොට ඕනැ කවරෙ ද .

**අන්වය :** ළඳ, මෙ තොපට සුතන් දෙ දෙනකු මැ දෙමි. එයින් එකෙක් නුවණ ඇති වෙයි, රුව මඳැ; අනෙකා රුවින් යුතු යැ, නැණ මඳ වෙයි. මෙයින් පලමු කොට ඕනැ කවරේ ද?

**විසඳුම් :** **ළඳ** — මේ ආමන්ත්‍රණය යි. **දෙ දෙනකු මැ** — බිසොවුන් ඉල්වූයේ එකකු පමණෙකි. එ හෙයිනි මෙ සේ කියැවෙනුයේ. **මඳැ** — මඳ + යැ = මඳ + ඇ = මඳැ. **මෙයින්** — මේ කියැවුණු දෙ දෙනා ගෙන්.

**143.** මෙ ලෙස ව දන් සක් දෙව් රද කි ස ඳ
මු ළු ලො ව නුවණට සදිසි වතෙක් කො ද
ප ළ මු ව ඉන් නුවණැති පුතු දි සො ඳ
දෙ ව නු ව රුසිරැ'ති පුතු දෙව කි ළ ඳ

**අන්වය :** සක් දෙව් රද මෙ ලෙස වදන් කී සඳැ, ළඳ, "මුළු ලොවැ නුවණට සදිසි වතෙක් කො ද? ඉන් සොඳ නුවණැති පුතු පළමු වැ දී රුසිරැ'ති පුතු දෙ වනු වැ දෙව" කී.

**විසඳුම් :** **මෙ ලෙස** — ඉහත කී ආකාරයට. **ළඳ** — සීලවතී බිසොව. **වතෙක්** — වස්තුවෙක්. **කො ද** — කවරේ ද. 'කො' යනු 'කවර' යන අර්ථයෙහි සර්ව නාම පද යි. එකවචන යි. බහුවචනයෙහි වනුයේ 'කෙ' යන රූපය යැ. 'ද' යනු ප්‍රශ්නාර්ථයෙහි නිපාත යි. **ඉන්** — ඒ හෙයින්. **දෙව** — 'දෙ' (දීමෙහි) ධාතුයෙන් වූයේ යැ. විධාන යි. 'තෝ' යන උක්ත පදය අධ්‍යාහාර්‍ය යි. **කී** — 'කිය' ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'කිය' ධාතුව 'බල' ආදි ගණ හෙයින් පරස්මෛපදයෙහි අතීත බහුවචන විභක්තිය වූ 'උඉ' යනු අවිකෘත වැ මැ ධාතුවට එක් වේ. කිය + උඉ = කියූ = ('ය' කාරයෙහි 'උ' කාර

පර නිමිත්තෙන් 'ව' ආදෙශ වැ) කිවූ=('වූ' හා 'වි' යන්නෙහි සාම්‍යය හෙයින්)=කිවි=('ව' කාර ලොපයෙන් හා පූර්ව ස්වර දීර්ඝ වීමෙන්) කී. 'ය' හට 'ව' ආදෙශ විම 'සොය' (සෙවීමෙහි) ධාතුයෙන් වන සෙවී-සෙවූ, 'විය' (වියීමෙහි) ධාතුයෙන් වන විවී-විවූ, 'ලිය' (ලීමෙහි) ධාතුයෙන් වන ලිවී-ලිවූ යන ආදීන් ගෙන් ස්ඵුට වේ. 'වි' 'වූ' දෙකෙහි සාම්‍යය ඉතා ප්‍රකට යැ. 'වි' හෝ 'වූ' ලොප වූ කලැ පූර්ව ස්වරය දීර්ඝ වීම දෙවි+දූනු= දේදුනු යන ආදියෙන් පෙනෙ.

මෙහි 'කී' යනු බහුවචන රූප බව කෙ සේ පෙනේ ද? ආඛ්‍යාතය අතීත හෙයින් ද උක්තය ස්ත්‍රීලිඞ්ගික වන හෙයින් ද ඒ පෙනේ. මේ විශෙෂ සිංහල රීතියෙකි.

144\. මන න ද කුස තණ නිසි දිව වතකු ත්
දිව ග ද විහිදෙන එ සඳුන් හරකු ත්
කොකන ද වෙණ සහ පරසතු කුසුමු ත්
සුර ර ද බිසොවට දි තොස කැරැ සි ත්

අන්වය: (සතර වන පාදයෙහි) සුර රද බිසොවට දී සිත් තොස කැරැ-(මතු සම්බන්ධ යි)

විශ්‍රණ: කුස තණ — 'කුශ' නම් වූ තෘණ විශෙෂය, පිරිසුදු බැවෙහි ලකුණක් වශයෙන් ද යාග හෝමාදියෙහි දී පිදිය යුත්තක් වශයෙන් ද බ්‍රාහමණයන් විසින් මහත් අගේ කොට සලකනු ලැබේ. සිදුහත් කුමරුන් බුදු වනු වස් බෝ මැඩ කරා යන ගමනේ සොත්ථිය නම් බමුණ ගෙන් ලද්දේ කුස තණ යැ. දිව වතකුත් — දිව්‍ය වස්ත්‍රය කුත්. දිව ගඳ — දිව්‍ය සුගන්ධය. 'ගඳ' යනු වර්තමානයෙහි අවිශෙෂයෙන් දුර්ගන්ධයට යෙදෙතුදු පුරාණයෙහි සුගන්ධය සඳහා යෙදිණ. එ සඳුන් — ඒ සඳුන්. දෙව් ලොවැ. සඳුන් හරකුත්- සාරයක්. අරටුවක්. හරක්+දු=හරකු+දු=හරකු+ ද් = හරකුත්. කොකණද වෙණ — 'කොකනද' යනු කුස රජු ගේ වීණයේ නාමය යි. පරසතු — දිව්‍ය ලොකයෙහි ඇතැ යි යන ඉතා සුගන්ධවත් කුසුම විශෙෂයෙකි. ගුත්තිල ද කාරයෝ පරසතු රුක ද පරසතු කුසුම් ද ගැනැ මෙ සේ කියති:-

"ගසෙකැ පැහැය ගවු දෙසියෙකැ දි සේ යා
මලෙකැ සුවඳ සිවු සිය ගවු ඇ සේ යා"

145. තෙද මහිමෙන් මෙ ලොවට ගෙනැ'වුත් ළ ඳ
ර ද සහ එක ගහනතැ පත් කැරැ සො ඳ
•ප ද මහ පටැ'ගිල්ලෙන් නැබ පිරිමැ ද
'න ඳ දරැ'පත දී ගිය සග එ මැ ස ඳ

**අන්වය:** තෙද මහිමෙන් ළඳ මෙ ලොවට ගෙනැ අවුත්, රඳ සහ සොඳ එක ගහනතැ පත් කැරැ, පඳු මහපට ඇඟිල්ලෙන් නැබ පිරිමැඳු, නඳ දරැ උපත දී එ මැ සඳැ සග ගිය.

**විසපණි:** **තෙද මහිමෙන්** — සුර රදු ගේ තෙජො මහිමයෙන්. තෙජොනුභාවයෙන්. **ළඳ** — සිලවතී බිසොව. **රඳ** — ඔකාවස් රජ. **පඳු** — පාදයෙහි. **නැබ පිරිමැඳු** — පෙකණිය ස්පර්ශ කොට. නාභි පරාමර්ශනය දරුකොත්පත්තියට එක් හේතුවෙක් ල. **නඳ** — ආනන්දකර වූ, රජයාට ද බිසොවට ද රාජ්‍ය වාසීනට ආනන්දකර. හෙයින් මෙ සේ කියත්. **දී** — කතෘ පද ය පූර්ව පද්‍යයෙහි එන 'සුර රඳ' යනු යි. ආඛ්‍යාතය 'ගිය' යනු යැ.

146. යුත් බුදුකුරු සිරි ත්
එ කලැ අප මහ බෝස ත්
සුර පුරයෙන් අවු ත්
එ බිසොවුන් කුසැ දිනි සිරිම ත්

**අන්වය:** එ කලැ බුදුකුරු සිරිත් යුත් අප මහ බෝසත් සුර පුරයෙන් අවුත් සිරිමත් එ බිසොවුන් කුසැ දිනි.

**විසපණි:** **එ කලැ**–ඒ නාභි පරාමර්ශය කළ වේලායෙහි. මෙය මෙහි ආඛ්‍යාතය වූ 'දිනි' යන්නට විශෙෂණ යි. **බුදුකුරු සිරිත්** — බුද්ධාඞ්කුර චරිත. බුදු+අකුරු = බුදුකුරු. අඞ්කුරය නම් පැළය යි. නියත විවරණ ලත් තැන් සිටැ බුදු බව ලබන තැන් දක්වා මේ දැතුරේ බොධිසත්ත්ව වරයෝ බුද්ධාඞ්කුර නම් හ. මතු සර්වාඞ්ග සම්පූර්ණ වැ වැඩී අමෘත ඵල දෙයක වන්නා වූ බුද්ධ රාජ නමැති මහා වෘක්ෂයෙහි අඞ්කුරය වන හෙයින් මෙ සේ කියත්, 'බුදුකුරු සිරිත්' නම් බුද්ධ කාරක චරිත යැ යි, අරුත් පැවැසිම ද කළ හැකි යැ. බුදු බව ලැබීමට උපකාරවන–බුදු බව ලබා දෙන–

ධර්මයෝ බුද්ධ කාරක ධර්ම නම් හ. ඔහු නම් පාරමිතාදීහු යි. **බෝසත්** — බෝධිසත්ත්ව. 'බොධි' නම් සෝවාන් ආදී සතර මග සතර ඵලය හා නිවණ යි. මේ ලැබීමට ඉවහල් වන්නා වූ සම්‍යක් සම්බුද්ධ, ප්‍රත්‍යෙක බුද්ධ, අර්හත් බුද්ධ යන අවස්ථා තුන ද බොධි නමින් ගැනෙයි. නියත විවරණ ලත් තැන් සිටැ සම්‍යක් සම්බුද්ධත්වයෙන් නිවන් ලැබීම කෙරෙහි මැ නැමී සිටින පුද්ගල තෙමේ බොධිසත්ත්ව නම්. මහා සත්ත්ව නමුදු වේ. **දිනි** — 'දන' (ඉපැදීමෙහි) ධාතුයෙන් වූ ආඛ්‍යාත යි. 'දන' ධාතුව 'බම' ආදී ගණ යි, උභය පද යි, අකර්මක යි. (පර පද) දනා–දනති–දිනි–දුනු. (අත් පද) දෙනේ–දෙනෙති.

**147.** එ කෙණෙහි පිබිදූ ර ද
යහනතැ උත් බිසෝ ස ද
දකිමින් පෙමින් අ ද
කරුණු පිළිවිසියේ යැ නතු ලෙ ද

**අන්වය :** රද, එ කෙණෙහි පිබිදූ, යහනතැ උත් බිසෝ සද දකිමින්, අද පෙමින් නතු ලෙද කරුණු පිළිවිසියේ යැ.

**විසඳුම් : රද** — ඔකාවස් රාජයා. **පිබිදූ** — 'පුබුදු' (පිබිදීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි 'පුබුදු' ධාතුව 'රක්' ආදී ගණ යි, උභය පද යි, අකර්මක යි. (පර පද) පුබුදී–පුබුදිති–පිබිදි. (අත් පද) පිබිදේ–පිබිදෙති–පිබිදිණ්–පිබිදුණු. **දකිමින්** — පූර්ව ක්‍රියාව යි. **අද**— හෘදයයෙහි. **පිළිවිසියේ**— 'පුළුවුස්' (පිළිවිසීමෙහි) ධාතුයෙන් වූ 'පිළිවිසි' යන අතීත කෘදන්ත නාමය පෙර විබත් එක බසැ ගෙනැ සිටි තැනි. පිළිවිසි + ඒ = පිළිවිසියේ, 'ය' කාරාගම යි. 'පුළුවුස්' ධාතුව 'බස්' ආදී ගණ ද 'රක්' ආදී ගණ ද වෙයි, පරස්මෛපද යි, සකර්මක යි. 'බස්' ආදී ගණයෙහි (කතු කරු) පුළුවුසී–පුළුවුසිති–පිළිවිති–පුළුවුතු. රක් ආදී ගණයෙහි (කතු කරු) පුළුවුසි–පුළුවුසිති–පිළිවිසී. දෙ ගණයෙහි මැ (කම් කරු)–පිළිවිසේ–පිළිවිසෙති–පිළිවිසිණි–පිළිවිසුණු.

**148.** දරු ලැබැ එන ලෙස ට
රජ ගෙන් නිකුත් තැන් හි ට:
එන තෙක් මැ එ තැන ට
පැවැති නතු පවසමිනි නම හ ට

**අන්වය :** (අපරාධීයෙහි) එ තැනට එන තෙස් මැ තම හට පැවැති නතු පවසමිනි-(මතු සබඳ.)

**විසඳුම් :** **රජ නෙන් —** රජ ගෙදරින්. **එ තැනට —** ඒ රජු නිඳා උන් යහනට. **තම හට පැවැති —** තමාට සිදු වූ. **පැවැති —** 'පවත්' (පැවැතීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. **පවසමින් —** පූර්ව ක්‍රියාව යි. කර්තෘ පදය අනතුරු පද්‍යයෙහි එන 'බිසොව' යනු යි.

159. **සක් දෙවිඳු ගෙන් ල ත්**
**පැ කුස තණ ආදිය ත්**
**දරු ගබ වූ බව ත්**
**රජුට කී සඳැ බිසොව සිරිම ත්**

**අන්වය :** සක් දෙවිදු ගෙන් ලත් කුස තණ ආදියත් පැ දරු ගබ වූ බවත්, සිරිමත් බිසොව රජුට කී සඳැ-(මතු සම්බන්ධ යි.)

**විසඳුම් :** **ලත් —** 'ලබ' (ලැබීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'ලබ' ධාතුව 'බල' ආදි ගණ වූ කල්හි පරස්මෛපද යි. කතු කරු,– ලබා–ලබති–ලැබි–ලැබූ, (කම් කරු)–ලැබේ–ලැබෙති–ලැබිණි–ලැබුණු. 'බස්' ආදි ගණ වූ කල්හි ආත්මනෙපද යි. ලැබේ–ලැබෙති–ලැබිණ, ලැබී, ලදී–ලැබුණු, ලැබි, ලදු. 'ලැබි' යන රූපය අප්‍රයුක්ත යැ. **පැ —** 'පා' (ප්‍රකාශනයෙහි = ඉදිරියට ගෙනැ පෙන්නීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'පා' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු) පා–පාති–පැ–පැ. (කම් කරු) පැවේ–පැවෙති–පැවිණි–පැවුණු ස්වරය හ්‍රස්ව නො වේ. අතීතයෙහි දී දෙබස්හි මැ 'පැ' යනු ලැබෙනුයේ මෙ සේ යැ. (එක බසැ) පා+ඊ=(ධාතු ස්වරය අනමය්‍යයට යැමෙන්)පැ+ඊ=(පූර්ව රූපයෙන්)පැ+ඇ= (සවර්ණ දීර්ඝයෙන්) පැ. (බුහු බසැ) පා+උ=පැ+උ= පැ+ඇ=පැ. 'පා' ධාතුයේ නියම පූර්ව ක්‍රියා රූපය 'පා' යනු විය යුතු යැ. එ හෙත් 'පැ' යන විශෙෂ රූපයෙක් ද ලැබේ.

160. **අසා තුමූ නරව ර**
**මහණබමුණන් රැස් කැ ර**
**දන් දෙමිනි නො විත ර**
**කැරැවි නිසි ලෙසට ගබ පෙරහ ර**

අන්වය: අසා තුටු නරවර මහණබමුණන් රුස් කැරැ නො විතර දන් දෙමිනි ගබ පෙරහර නිසි ලෙසට කැරැවී.

විසඳුම්: අසා — බිසොව කී ඒ තොරතුරු අසා. තුටු — තුෂ්ට වූ. 'තුටු' යනු 'තුස්' (තොෂයෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'තුස්' ධාතුව 'බස්' ආදි ගණ යි. පරස්මෛ පද යි, අකර්මක යි. තුසි–තුසිති–තිට්–තුටු. නො විතර — ප්‍රමාණයක් නැති. ඉතා බොහෝ යන අර්ථ යි ගබ පෙරහර — ගර්භ පරිහාරය. ගර්භය ආරක්ෂා වීම සඳහා ද ගර්භයෙහි ඉන්නා දරුවා ගේ සංවර්ධනය සඳහා ද ගර්භිණියට කැරෙන ශාන්ති ආදිය. සේනක කුමාරයන් ගේ මෑණියන් ගප් ගත් අවස්ථායෙහි පිතෘ බ්‍රාහ්මණයන් ගබ පෙරහර කැරැවූ බව ප්‍රකාශ කරන කාව්‍යශේඛර කාරයෝ–

"සතුටු එ බමුණු ව ර
තම පුතුණු වේ සත තු ර
කී විදි අඩු නො කැ ර
කෙළේ නිසි ලෙසට ගබ පෙරහ ර" —යි

කී හ.

151. කිමි පෙම් කිරි මුහු ද
බඳ වඩන සොමි පුන් ස ඳ
කිරණෙ'ව් දිසි එ ළ ඳ
දූරු දෙළ දුක් ලකුණු මන න ඳ

අන්වය: එ ළඳ, කිමි පෙම් කිරි මුහුද බඳ වඩන සොමි පුන් සඳ කිරණ එව් දිසි, මන නඳ දෙළු දුක් ලකුණු දූරු.

විසඳුම්: එ ළඳ — ඒ ශීලවතී බිසොව. කිමි—සම්බන්ධාර්ථයෙහි ද්විතීයා යි. මේ කිමි නම් ඔකාවස් රජු යැ. පෙම් කිරි මුහුද බඳ වඩන සොමි පුන් සඳ කිරණ එව් දිසි දෙළ දුක් ලකුණු — ස්වාමියා ගේ ප්‍රේමය නමැති කිරි මුහුද ඔද වඩන්නා වූ සෞම්‍ය වූ පූර්ණ චන්ද්‍ර රශ්මිය මෙන් පෙනුණා වූ දෙළු දුක් ලකුණු. ස්වාමියා ගේ ප්‍රේමය කිරි මුහුද යි. දෙළු දුක් ලකුණු සෞම්‍ය පූර්ණ චන්ද්‍ර රශ්මිය යි. යම් සේ කිරි මුහුදෙහි ඔද චන්ද්‍ර රශ්මියෙන් වැඩේ ද, එ මෙන් මැ ස්වාමියා ගේ ප්‍රේමය දෙළු දුක් ලකුණෙන් (දෙළු දුක් ලකුණු දුටු මෙන්) වැඩේ. දරුවන් නො ලැබැ සිටියකු බිරින්දෑ ගේ දෙළු

දුක් ලකුණු දුටු කලැ, ඇයට ඇති ප්‍රේමය කෙසේ නම් මහත් නො වේ ද? සඳ නිසා වඩ දිය ඇති වන හෙයින්, සඳ මුහුද ඔද වඩති යි යනු යෙදේ. වැඩියක් මැ ඔද වැඩෙන බව හැඟැවීමට 'සොම්-පුන්' යන විශෙෂණ යෙදිණ. දෙල දුක්— ගර්භිණී වූ තැන් සිටැ යම් යම් විශෙෂ දෘයට රුචි උපදී. ඒ දෙළු දුක් නම්. 'දෙළු' යන්නෙහි අර්ථ නම් 'ළ දෙක යැ' (හෘදය දෙක යැ) යනු යි. මව ගේ එක් ළයෙකි. ගබ්සර් දරුවා ගේ එක් ළයෙකි. මෙ සේ දෙ ළයෙකින් උපදනා ආශාව දෙළු යැ. ඇඟ සුදුමැලි වීම් ආදිය දෙළු දුක් ලකුණු යි. දූරැ — 'දර' (දැරීමෙහි) ධාතුයෙන් වූ අඛ්‍යාත පද යි. 'දර' ධාතුව 'බල' ආදි ගණ යි, උභය පද යි. පරස්මෛපදයෙහි (කතු කරු) දරා-දරති-දැරී-දූරු. (කම් කරු) දැරේ-දැරෙති- දැරිණී-දැරුණු. ආත්මනෙපදයෙහි-දෙරේ-දෙරෙති.

කාව්‍යශෙඛර කාරයන් ගේ-

"යෙහෙළි මන කුමු දු
පුබුදු කරවන සිති දු
මෙරජ බඳු තරි දු
දූරු දෙළු දුක් ලකුණු දද දු"—

යනු මෙයට ළඟ අරුතක් පවසයි.

152. සුදුමැලි වැ සියල ඟ
දිනෙන් දිනැ වැඩෙමින් ඉ ඟ
නිල් පැහැ වැ තන අ ඟ
මැලැයි මුවනත සමඟ නෙතු යු ඟ

අන්වය : සියල් අඟ සුදුමැලි වැ ඉඟ දිනෙන් දිනැ වැඩෙමින් තන අඟ නිල් පැහැ වැ මුවනත සමඟ නෙතු යුග මැලැ යි.

අර්ථ : සකල ශරීරය සුදුමැලි වී, දවසින් දවස ඉඟ (මධ්‍ය ප්‍රදෙශය) මහත් වී, පයොධරාග්‍රය (තන පුඩු) නිල් පැහැය ඇති වී, මුහුණ හා සමඟ ඇස් දෙක මලානික වී යැ.

විසඳුම් : සියලඟ — සියල් + අඟ. 'අඟ' නම් ශරීරය යි. මැලැයි — මලානික වී යැ. මැලැ + යි. 'මැලැ' යනු අඛ්‍යාත පද යි. 'මලා' ධාතුව 'බල' ආදි පරපද යි. මලා-මලති-මැලැ-

මැලෑ. ගන්ථියක ගේ ලක්‍ෂණ මෙයින් කී හ. කාව්‍යශෙඛර කාරයෝ ද–

"සහ දදනිදු සතො ස ෆ
දිනැ දිනැ වැඩිණි මැද දෙ ස ෆ
සමග වැ ඔනු ගස ස
ඇග ද සුදුමැලි වී යැ මිහුලැ ස"—යි

කියති.

153. මෙ ලෙසින් වැසැ එ ල ද
දස එකඩ මස පිරි ස ද
මුවනතැ රුසිරැ ම ද
පුතකු වැදුවා මහ පිනැ'ති සො ද

අන්වය: එ ළද මෙ ලෙසින් වැසැ, එකඩ දස මස පිරි සදැ, මුවනතැ රුසිරු මද මහ පින් ඇති සොද පුතකු වැදුවා.

විසඳුම්: එකඩ දස මස — නව මාසයක් ඉකුත් වැ පසළොස් දිනක් ගත වූ කාලය හෙවත් එක් මසක් අඩ වූ දස මාසය එකඩ දස මස යි. "දශමෙ මාසි ජායතෙ" (දස වැනි මස්හි උපදී) යනු වෛද්‍ය වචන යි. මුවනතැ රුසිරු මද — මුහුණෙහි රුචිර භාවය (සිත් කලු බව) අල්ප වූ. 'විසුළු මුහුණින් යුත්' යනු අර්ථ යි. වැදුවා — 'වද' (ප්‍රසවයෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය සත්‍යර්ථයෙහි 'ආ' ප්‍රත්‍යය ගෙනැ සිටි තැනි. වැදූ + ආ =('ව' කාරාගමයෙන් හා ග්‍රස්ව වීමෙන් හා) වැදුවා. 'වද' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතෘ කරු) වදූ–වදති–වැදී–වැදූ. (කම් කරු) වැදේ–වැදෙති–වැදිණි–වැදුණු.

154. එ කුමරුට මහ බා
කුස කුමරු යැ නම් තා බා
සව සිරිනි සුල බා
වැඩූ සුත පෙම් වඩා පොල ඹා

අන්වය: මහබා එ කුමරුට කුස කුමරු යැ නම් තබා සුලබා සව් සිරිනි සුත පෙම් වඩා පොලඹා වැඩූ.

විසඳුම්: මහබා — මහාභාග්‍ය වූ. මහ පින් ඇති. සුලබා — සුලභ වූ. මෙහි දීඝය ඡන්දස සඳහා යැ. සිරිනි — සම්පත්තියෙන්. පොලඹා — ප්‍රලොභ කොට 'පොලඹ' (පෙලැඹීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි: 'පොලඹ'

ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) පොලඹා-පොලඹති-පෙලැඹී-පෙලැඹූ. (කම් කරු) පෙලැඹේ-පෙලැඹෙති-පෙලැඹිණි-පෙලැඹුණු. වැඩූ — මෙහි උක්තය අප්‍රකට යැ. ඔහු දෙදෙනා යී පියැ හැකි යැ. ඒ දෙදෙනා නම් රජ සහ බිසොව යැ.

155. එ කුමරු නැණ පබ  ඳ
පිය නගා ඇවිදින ස  ඳ
සුරෙක් සුර පුරින  ද
එ බිසොවුන් කුසැ උපනි මන න  ද

අන්වය : නැණ පබද එ කුමරු පිය නගා ඇවිදින සඳැ, සුරෙක් සුර පුරින් අද, මන නද එ බිසොවුන් කුසැ උපනි.

විසඳුම් : නැණ පබඳ — ඥානය ප්‍රබන්ධ වූ. නො කඩ නුවණ ඇති. ශක්‍රයන්, "එයින් එකෙක් නුවණැති වෙයි රුව මද" යි කියන ලද බව සලකනනේ යැ. ඇවිදින — 'ඇවිදු' (ඇවිදීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'ඇවිදු' ධාතුව 'රක්' ආදි ගණ යි, පරස්මෛපද යි, අකර්මක යි. ඇවිදී-ඇවිදිති-ඇවිදි. සුරෙක් — මේ කියැවෙනුයේ ශක්‍රයන්, 'දෙමි' යි කී 'රුවින් යුතු නැණ මද අනෙකා' යැ. 'සුරෙක්' යැ යි අනියමින් තබන්නට හෙතු නැති. ඒ කවරේ ද යනු දත් කවුරුත් දනිති. අද — 'එ' (පැමිණීමෙහි) ධාතුව නිසා නිපනිත වූ පූර්ව ක්‍රියා පද යි. උපනි — 'උපද' ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. 'උපද' ධාතු 'බස්' ආදි උභයපද යි. (පර පද) උපදී-උපදිති-උපනී-උපනු. (අත් පද) ඉපැදේ-ඉපැදෙති-ඉපැදිණි-ඉපැදුණු.

156. මේ ගබෙකින් පබ  ඳ
නිකුත් සඳ මඬලක් ලෙ  ද
මවු කුසයෙන් පැහැ  ද
පහන් ලොව දිවි කුමරු මන න  ඳ

අන්වය : මන නද කුමරු, පබද මේ ගබෙකින් නිකුත් සඳ මඬලක් ලෙද, මවු කුසයෙන් පැහැදූ, පහන් ලොවැ දිවි.

විසඳුම් : පබඳ—ප්‍රබන්ධ. ඝන වූ. මේ ගබෙකින්—මෙඝ ගර්භයෙකින්. වැසි වලා කුලෙකින්. කුසයෙන් — මෙහි 'ය'

කාරය අසාධු යි. සාධු රූපය නම් 'කුසින්' යන්න මැ යැ. **පැහැදු** — ප්‍රකාශ වැ. 'බිහි වැ' යනු අරු යි. මෙහි ප්‍රකාශ වීමෙහි 'පහද' ධාතු 'රක්' ආදි අත්පද යි. පැහැදේ–පැහැද්දෙති–පැහැදිණි, පැහැදී– පැහැදුණු, පැහැදී. 'පෑදෙනවා' යනාදිය ව්‍යවහාරයෙහිදු එයි. **පහන් ලොව** — ආලොකවත් වූ ලොකය. ගර්භය අඳුරු ලොව යැ. බිහි වූ කලැ පහන් ලොව යැ. දූතාදූ "පහන් ලොවැ එළිය දුටු කුමරු" යනාදිය කියැවෙයි. දිටි — 'දිස්' ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි.

**157.** එ කුමරු හට සොබ න
ජයම්පති කුමරු යැ ය න
නම් තබා සතොසි න
වැඩූ සුත පෙම් යුතු වැ නො මදි න

**අන්වය :** සොබන එ කුමරු හට ජයම්පති කුමරු යැ යන නම් තබා, නො මදින සුත පෙම් යුතු වැ, සතොසින වැඩූ

**විසඳුම් :** සුත පෙම් — පුත්‍ර ප්‍රෙමය. වැඩූ — මෙහි ද උක්තය 'ඔහු දෙදෙනා' යි අධ්‍යාහාර්‍ය යැ.

**158.** රිවි සඳ මෙන් අහ ස
එ දෙ දෙන වැඩුණු නිසි ලෙ ස
සැපැමිණැ සොළොස් ව ස
කුස කුමරු වැජැඹිණි තිලෝ ඇ ස

**අන්වය :** එ දෙදෙන අහසැ රිවි සඳ මෙන් නිසි ලෙස වැඩුණු තිලෝ ඇස කුස කුමරු සොළොස් වස සැපැමිණැ වැජැඹිණි.

**අරු :** ඒ දෙදෙනා, අහසෙහි හිරද සඳ ද මෙන් නිසි සේ වැඩුණාහු යැ. තුන් ලොවට ඇසක් වූ කුශ කුමාර තෙමේ සොළොස් වයසට පැමිණ විජෘම්භමාණ වී යැ.

**විසඳුම් :** එ දෙ දෙන — ඒ (කුමාරවරු) දෙ දෙනා. තිලෝ ඇස — තුන් ලොවට ඇසක් වූ. මතු සම්‍යක් සම්බුද්ධත්වයට පැමිණැ තුන් ලොවට අසහාය නෙත්‍ර වන්නට සිටි හෙයින් කුස කුමරු මෙ නමින් ගැනිණ. වස — වර්‍ෂයට.

**159.** සිජ් සතර සමුදු ර
තිසුණු නැණැ'සින් දැකැ තෙ ර
විය පැමිණි එ කුම ර
දැකැ සතුටු පිය නිරිඳු මනහ ර

අන්වය : සිප් සතර සමුදුර තෙර නිපුණු නැණ ඇසින් දුකා විය පැමිණි එ කුමර දුකා සතුටු මනහර පිය තිරිදු— (මතුංසම්බන්ධ යි.)

විසඳුම් : සිප් සතර සමුදුර—ශිල්ප ශාස්ත්‍රය ඉතා නැඹුරු යැ, ඉතා විස්තෘත යැ, තරණය අතිදුෂ්කර යැ. එ හෙයින් එයට සමුද්‍රය උපමිත යි. නැණ ඇසින්— සමුදුරෙහි තෙර දකිනුයේ ඇසින් නො වේ. නෞකාවෙකින් හෝ එ බඳු වූ මැ අනෙකෙකිනි. එ හෙයින් මේ මනාහර යෙදුමෙක් නො වේ. විය—වයසට. බාල කාලය ඉක්මවා සිටියේ විය පැමිණියේ නම් වෙයි. තිරිඳු—ප්‍රථමා එකවචන යි. ආඛ්‍යාතය අනතුරු පද්‍යයෙහි 'පවසා' යැ යි එයි.

160. තුනු රුවිනි න න්දූ
අඟ බිසොව වෙතැ කැ න්දූ
බසින් අම බ න්දූ
මෙ සේ පවසා යැ මන න න්දූ

අන්වය : තුනු රුවිනි නන්දූ අග බිසොව වෙතැ කැන්දූ අම බන්දූ මන නන්දූ බසින් මෙසේ පවසා යැ.

විසඳුම් : තුනු රුවිනි — ශරීරයෙහි රූප ශොභායෙන්. නන්දූ—සන්තොෂ දායක වූ. නන්‍දා නම් දිව්‍යඩඟනාව වැනි වූ යැ යි ද අරුත් කියැ හැකි යැ. වෙත — තමා ගේ සමීපයට. කැන්දූ— කැඳවා. 'කැද' (කැඳීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය පූර්ව ක්‍රියා නිපාත යි. 'කැඳ' ධාතුව 'රක්' ආදී ගණ යි, පරශෛමපද යි. (කතු කරු) කැඳී–කැඳිති–කැඳි. (කම් කරු) කැඳේ–කැදෙති–කැඳිණි–කැදුණු, කැදවා–කැදවති–යනාදිය ප්‍රයොජ්‍ය රූප යි. දුන් යෙදෙනුයේ ඒ මැ යැ. අම බන්දූ— අමෘතය බඳු වූ. අමෘතය රසවත් යැ. වචනය ද රසවත් යැ.

161. මෙ කොප දෙවු කුමරු ට
දිසි දෙව්ඟනක විලස ට
රජ දුවක මන තු ට
රැගෙනැ අඟ මෙහෙසුන් බිසෝ කො ට

විසඳුම් : දෙවු—ජ්‍යෙෂ්ඨ. වැඩි මහලු. දිසි—ප්‍රත්‍යක්ෂ වශයෙන් පෙනෙන්නා වූ. 'දෙවගනක' යන්නට විශෙෂණ යි. රැගෙනැ—පාණි ග්‍රහණයෙන් ගෙනැ. ආවාහ කොට දී.

162\. රජ සිරි විඳිනා මෙ — නා
එ කුමරු හට පවසමි — නා
ගිවිසූ ගෙනැ නො ලසි — නා
එව සි වදහලෙ නිඹිඳු සකොසි — නා

**විසඳුම්:** **පවසමිනා** — පූර්ව ක්‍රියාව යි. **ගිවිසූ** — 'ගිවිස්' (ගිවිසිමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'ගිවිස්' ධාතුව 'රක්' ආදී ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතෘ කරු) ගිවිසි-ගිවිසිති-ගිවිසි. (කර්ම කරු) ගිවිසේ-ගිවිසෙති-ගිවිසිණි-ගිවිසුණු. **එව** — 'එ' (පැමිණීමෙහි) ධාතුයෙන් වී. විධාන යි. 'නෝ' යනු අධ්‍යාහාරයි උක්තාය යි.

163\. එසසා බිසෝ ස — ඳ
අමුතු වැ පණක් මෙන් ල — ද
වෙතැ සිටිනා නිබ — ඳ
මියුරු තන්වැසි බස් කියන සො — ඳ

**අන්වය:** බිසෝ සඳ ඒ අසා අමුතු වැ පණක් ලද මෙන්, නිබඳ වෙතැ සිටිනා මියුරු සොඳ තන්වැසි බස් කියනා — (මතු සම්බන්ධ යි.)

**විසඳුම්:** ඒ අසා — රජු කී කරුණු අසා. **අමුතු වැ පණක් ලද මෙන්** — යමකුට ඉතා මහත් සතුටක් ඇති වූ විටැ "අමුතුවෙන් පණක් ලැබුණාක් වැනි යැ" යී කීම දැනුදු පවතී. කාව්‍යශේඛර කාරයෝ ද කියති —

"එ බසසා දිගුනෙ — ත්
අමුතු වැ පණක් මෙන් ල — ත්
සිතැ සැපයෙන් සර — ත්
තනා පිළියෙළ ලෙසින් බැති යු — ත්" — යි.

**වෙතැ** — සමීපයෙහි. **තන්වැසි බස්** — ස්ථානවාසි වචනයන්. විදග්ධ වූ, නො පිටිසර වූ, තැනට සුදුසු වූ බස් තන්වැසි බස් යැ. සැල ළිහිණි සන්දෙශ කාරයන් ගෙ — "මිහිරි තෙපලැ තන් වැසි තිවි කම් පුරුදු" යනු සලකන්නේ යැ. "නිබඳ වෙතැ සිටිනා, මියුරු සොඳ තන් වැසි බස් කියන" — අනතුරු පද්‍යයෙහි එන "කම්මිත්තකට" යන්නට විශෙෂණ යි.

164\. කම්මින්තකට තො ස
නිරිඳු වදහළ ඒ බ ස
උගන්වා තතු ලෙ ස
හළුව තම කුමරිඳුන් අබි ය ස

**අන්වය:** තොස කම්මින්තකට නිරිඳු වදහළ ඒ බස තතු ලෙස උගන්වා තම කුමරිඳුන් අබියස හළුව.

**විසඳුම්:** **තොස** — පාද පූරණය පිණිස අර්ථ ශූන්‍ය වැ යෙදී තිබේ. **කම්මින්තකට** — කම්කාර වෘද්ධ ස්ත්‍රියකට. කමෙහි යෙදෙන මිත්ත කම්මිත්ත යි. 'මුතු' යන්න ස්ත්‍රී ප්‍රත්‍යයවත් වූ කලැ 'මිනි' යනු වේ. **උගන්වා** — 'උගත්' (ඉගැන්මෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා නිපාත යි. 'උගත්' ධාතුව 'බස්' ආදි ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු) උගති-උගතිති-උගති-උගතු (කම් කරු) ඉගැනේ-ඉගැනෙති-ඉගැනිණි-ඉගැනුණු. **තම කුමරිඳුන්**— මේ කියැවෙන්නේ කුස කුමාරයන් ගැනැ යැ. **අබියස** — සමීපයට. සංස්කෘතයෙහි 'අභ්‍යාස' යනු ද මේ අර්ථය දෙයි. **හළුව** — 'හර' හැරීමෙහි ධාතුයෙන් වූ අතීත බහුවචන ආඛ්‍යාත පදය වූ 'හළු' යන්නට අර්ථාවසානයෙහි 'හ' වැ 'හ' කාරයට 'ව' කාර වූ තැනි.

165\. ඈ ගොස් කුමරු දු ක
නම කැරැ සිරි පතුල් දෙ ක
සිටැ ගෙනැ එක් පසෙ ක
සැල කළා තතු විලස නො වැළැ ක

**අන්වය:** ඈ ගොස් කුමරු දැකැ සිරි පතුල් දෙක නම කැරැ එක් පසෙකැ සිටැ ගෙනැ තතු විලස නො වැළැකැ සැල කළා.

**විසඳුම්:** **සිරි පතුල් දෙක** — කුස කුමරු ගේ. **එක් පසෙකැ සිටැ ගෙනැ** — ගෞරවාර්හ කෙනකු වෙතැ එළැඹුණු කල එක් පසෙකට වී සිටීම පුරාණයෙහි පැවැති චාරිත්‍රය යි. **තතු විලස** — තත්ත්වාකාරය. කරුණු ඇති සැටිය. 'සැල කළා' යන්නට කර්ම යි. **නො වැළැකැ** — අඩු නො කොට. **සැල** — දැන්වීම. **කළා** — 'කර' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය ස්ත්‍රීලිංගයෙහි 'ආ' ප්‍රත්‍යය ගෙනැ සිටියේ යැ.

166. අසමින් ඒ පුවත
විසුළ මුව සුනු මා වෙත
බිසොවක ඉඳිනු නෑ ත
එසින් ගිහි ගෙන් මෙ මට කම් නෑ ත

**විසඳුම් :** ඒ පුවත — මවු බිසොව ගේ නියමයෙන් කම්මිත්ත ගොස් කී ප්‍රවෘත්තිය. අසමින් — පූර්ව ක්‍රියාව යි. ඉඳිනු — භාව කෘදන්ත නාම යි.

167. මවු පිය දෙ දෙනා සොඳ
පවතින තෙක් මැ මෙහි ඉඳ
පැසුළ වැ ලොව පැසි ඳ
තවට යෙම් කී කුමරු මන නද

**අන්වය :** සොඳ මවු පිය දෙ දෙනා පවතින තෙක් මැ මෙහි ඉඳැ පැසුළ වැ ලොව පැසිඳැ තවට යෙම් මන නද කුමරු කී.

**විසඳුම් :** පවතින තෙක් — 'ජීවත් වැ සිටුනා තෙක්' යනු මෙ හි සැටි යැ. මෙහි — මේ නගරයෙහි නොහොත් මේ ගිහි ගෙයි. පැසුළ — 'පසු වැ' යන අර්ථයෙහි නිපාත පද යි. එ හෙයින් ඉන් පර වැ 'වැ' යනු අධිකයෙකැ යි සැලැකේ. 'වැ' යනු නැති වැ ද 'පැසුළ' යන්නෙන් 'පසු වැ' යන අර්ථය ඉඳුරා ලැබෙන පරිදි, සැලලිහිණි සන්දෙශයෙහි — "එ හසුන් පැසුළ පවසම් රස තුසුන් කොට" යන තන්හි පැහැදිලි වැ පෙනේ. ලොව — මෙ ලොව පිළිබඳ කට යුතු. කම් සැප. පැසිඳැ — 'පසිදු' (ප්‍රව්‍රජිතන කිරීමෙහි = විශෙෂයෙන් කපා හැරීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'පසිදු' ධාතුව 'බස්' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) පසිඳි–පසිඳති–පසිති–පසුනු. (කම් කරු) පැසිඳේ–පැසිඳෙති–පැසිඳිණි–පැසිඳුණු. 'රක්' ආදි වූයෙහි 'පැසිඳි' යනු අතීත රූප යි. ලොව පැසිඳිම නම් (කාම) ලොකය කපා හැරීම යි හෙවත් ගිහි ගෙන් නික්මැ පැවිදි වීම යි. තවට — තපසට. යෙම් — මේ 'යෙමි' යි විය යුතු යැ. ඡන්දොහෙතුයෙන් හ්‍රස්ව වී යැ. 'යෙමි' යනු යෙමි + යි = යෙමි + ඉ = යෙමි' යන විසින් ලැබේ. මෙහි 'යි' යනු වාක්‍ය සම්බන්ධයෙහි නිපාත යි.

168. කුමරු කී එ පව   ත
එ කත බිසොවට පවස   ත
බිසොව ගොස් නො නැවැ   ත
රජුට කී සඳැ නො සතුටු වි සි   ත

**අන්වය:** කුමරු කී එ පවත එ කත බිසොවට පවසත බිසොව නො නැවැතැ ගොස් රජුට කී සඳැ සිත නො සතුටු වී.

**විසඳුම්:** **කුමරු** — කුශ කුමාරයා. **එ පවත** — "තිනි ගෙයි නො වැසැ තපසට යෙමි"යි කුමරු කී ඒ ප්‍රවෘත්තිය. **එ කත** — ඒ පරිවාර ස්ත්‍රිය. **පවසත** — ප්‍රකාශ කළ කල්හි. කාලාර්ථයෙහි අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. **නො නැවැතැ**– නො නැවැතී. වහා. 'නැවැතැ' යනු 'නවත' (නැවැතීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'නවත' ධාතුව 'රක්' ආදී ගණ යි, පරස්මෛපද යි, අකර්මක යි. නවති-නවතිති-නැවැති. සකර්ම 'නවත' ධාතුව 'බල' ආදි පර පද යි. (කතු කරු) නවතා – නවතති – නැවැති – නැවැතු. (කම් කරු) නැවැතේ–නැවැතෙති–නැවැතිණි–නැවැතුණු. **සිත** — රජු ගේ සිත. **වි** — මෙය 'වී' යැ යි කියැ යුතු යැ. හ්‍රස්වය ඡන්දොහෙතුයෙනි.

169. මෙ ලෙසට වරින් ව   ර
පිය රජු කියන මෙහෙව   ර
නො කල හොත් අනද   ර
වෙති සලකා පවර එ කුම   ර

**අන්වය:** මෙ ලෙසට වරින් වර පිය රජු කියන මෙහෙවර නො කළ හොත් අනදර වෙති පවර එ කුමර සලකා-(මතු සම්බන්ධ යි.)

**විසඳුම්:** **මෙහෙවර**—නියෝගය නොහොත් කටයුත්ත. **අනදර** — අනාදරයක්. අගෞරවයක්. **වෙති** — වෙති + යි=වෙති+ඉ=වෙතී. මෙහි 'යි' යනු වාක්‍ය සම්බන්ධයෙහි නිපාත යි. **වෙති** — මෙයින් උක්ත වන 'අනදර' යනු එක වචනයෙහි සිටියේ යැ. මේ ආඛ්‍යාතය සංශයාර්ථ සූචක යැ. අනාගතාර්ථයෙහි ආඛ්‍යාතය සඳෙහ වාතීාදියක් ප්‍රකාශ කරන කලැ, 'යි' නිපාතය පර කලැ, එය වර්තමාන ප්‍රථම පුරුෂ බහු වචන රූපයෙන් මැ සිටීම ද උක්තය ද්විතීයා විභක්ති ගෙනැ මැ සිටීම ද සිංහල රීති යි. ගුත්තිල දෑයෙහි–

"ඇඳුර තුටු නො වෙ ති
නො සිත'ප සිප් නො දනී ති
උනුමු වෙණ සද ති
නො දත්තමු ගායනා කෙරෙ ති"

යන ආදී අනෙක ස්ථානයන් ගෙන් ඒ බව පැහැදිලි වෙයි. **සලකා** — 'සලක' (සැලැකුම්හි) ධතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'සලක' ධාතුව 'බල' ආදී ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) සලකා-සලකති-සැලැකී-සැලැකූ. (කම් කරු) සැලැකේ-සැලැකෙති-සැලැකිණි-සැලැකුණු. 'සලකා' යන් නෙහි අනුක්ත කර්තෘ පදය පූර්ව පද්‍යයෙහි ආ 'එ කුමර' යන්න යැ.

මේ පද්‍යයෙහි ද, ගුත්තිල දැයෙහි-

"මෙ ලෙසින් නොයෙක ව ර
දෙ මව් පිය කී මෙහෙව ර
නො කළහොත් අනද ර
වෙනි ඔහු ගේ දූගුණ නො සැමැ ර"

යන පද්‍යයෙහි ද සාම්‍යය සලකාන්නේ යැ.

**170. උපදෙසෙකින් මෙ දි නා**
**ම අනැ දෙස නැති කෙරෙමි නා**
**මවුපියන් සිත් ගෙ නා**
**පසු වැ තැසට යෙමි සිතා ගෙ නා**

**විසඳුම් : මෙ දිනැ** — මේ අවස්ථායෙහි. 'දින' යනු කාලාර්ථයෙහි අවිශෙෂයෙන් යෙදේ. **යෙමි** — මෙ ද ඡන්ද හෙතුයෙන් හ්‍රස්ව වූ තැනි. යෙමි + යි = යෙමි + ඉ = යෙමි. 'යි' යනු මෙ තන්හි ද වාක්‍ය සම්බන්ධයෙහි නිපාත යි. **සිතා**— 'සිත' (සිතුම්හි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාතපද යි. 'සිත' ධාතුව 'බල' ආදී ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) සිතා-සිතති-සිතී-සිතූ. (කම් කරු) සිතේ-සිතෙති-සිතිණි-සිතුණු. **ගෙනැ** — මේ 'ගෙනැ' යනු මෙ තන්හි මෙන් පූර්ව ක්‍රියාවකට පර වැ සිටි කල්හි විශෙෂ අර්ථයක් නො දෙයි. මේ සම්බන්ධයෙන් විස්තර දැනැ ගනු කැමැත්තෝ මූව දෙව්දා විවරණය බලත්වා.

171\. දනෑ රන් කම් හස ර
පසිඳු වැ වසන දිය තු ර
තරහල් දෙවු එ පු ර
වෙතට කැඳවා ලමින් එ මැ ව ර

අන්වය : රන් කම් හසර දනෑ දිය අතුරැ පසිඳු වැ වසන එ පුරැ තරහල් දෙවු එ මැ වරැ වෙතට කැඳවා ලමින්-(මතු සම්බන්ධ යි.)

විසඳුම් : හසර — මාර්ගය. රන් කම් හසර නම් රන් කම් කරන පිළිවෙළ යැ. දියතුරැ — ජගදන්තරයෙහි. ලෝකයෙහි. තරහල් දෙවු — ස්වර්ණකාර ජ්‍යෙෂ්ඨයා. 'තරහල්' යනු රන් කරු යන්හෙහි මැ පර්‍යායයෙකි. වෙතට — තමා වෙතට. ලමින් — 'ල' (ලීමෙහි) ධාතුයෙන් වූ මිශ්‍ර ක්‍රියා නිපාත පද යි. මෙහි පූර්ව ක්‍රියාර්ථය යැ. 'ල' ධාතුව බල ආදි ගණ යි, පරස්මෛපද යි. (කතෘ කරු) ලා-ලති-ලී-ලූ. (කම් කරු) ලැවේ-ලැවෙති-ලැවිණි-ලැවුණු. පූර්ව ක්‍රියාවකට පර වැ සිටි කල්හි විශේෂ අර්ථයක් ප්‍රකාශ නො කරන්නා වූ ධාතු පඞ්ක්තියට මෙ ද අයත් යැ.

172\. මේ දුන් කඳුන් ගෙ න
සුර කුමරියක විලසි න
රන් රුවක් කැරැ ගෙ න
එව යි පවසා සිටෝහු සවමි න

විසඳුම් : සිටෝහු — සිටැ + ඔහු = සිටෝහු. සවමින — පූර්ව ක්‍රියාර්ථ යි.

173\. බෝ සත් ද එ මැ දි න
තමා අනුහස් බලයෙ න
දෙව්'ගන පරදව න
සොඳුරු ගන රන් රුවක් කෙරෙමි න

විසඳුම් : බෝ සත් — කුස කුමරු. හේ පුරනු ලබන බුදුකුරු දම් ඇත්තේ යැ. එ හෙයින් බෝ සත් යැ. තමා — සම්බන්ධාර්ථයෙහි ද්විතියා යි. අනුහස් — අනුභාව. පරදවන — 'පරද' (පැරැදීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය වර්තමාන කෘදන්ත

නාම යි. 'පරද' ධාතුව 'රක්' ආදී ගණ යි, උභයපද යි. (පර පද) පරදී-පරදිති-පැරැදී. (අත් පද) පැරැදේ-පැරැදෙති-පැරැදිණි-පැරැදුණු.

**174.** වත් අඳවා පව ර
අබරණ ලමින් අතැ කා ර
සිරි යහන් ගෙය තු ර
සිටුවමිනෙ'රන් රුව වසන ව ර

අන්වය: පවර වත් අඳවා, අතැ කරැ අබරණ ලමින්, එ රන් රුව සිරි යහන් ගෙය අතුරැ සිටුවමින් වසන වරැ- (මතු සම්බන්ධ යි)

විසඳුම්: වත් — වස්ත්‍ර. අඳවා — 'අඳ' (ඇඳීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා නිපාත යි. 'අඳ' ධාතුව 'රක්' ආදී ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) අඳී-අඳිති-ඇඳී. (කම් කරු) ඇඳේ-ඇඳෙති-ඇඳිණි-ඇඳුණු. 'බස්' ආදී වූව අඳුයි, අඳී-අඳු-යන රූපයෝ වෙති. අතැ කරැ — අතෙහි ද කරෙහි ද. 'කර' යනු මෙහි ග්‍රීවාව යි. අබරණ — අතෙහි වළලු ආදිය ද කරෙහි (ගෙලෙහි) මාල ආදිය ද. සිරි යහන් ගෙය — දූත් මෙන් මැ පුරාණයෙහි ද නිවාසයන්හි ඉතා මැනැවින් සැරැසුණේ නිදන ගබ යි ගෙයෙකැ ඇති විසිතුරු බවෙහි ප්‍රමාණය ද යහන් ගැබින් මැනැ ගත හැකි යැ. ගෙයෙකැ සිරි (ලක්ෂ්මිය) වෙතොත් යහන් ගැබෙහි මැ යැ. එ හෙයිනි 'සිරි' යන්නක් 'යහන් ගෙය' යන්නට විශේෂණ වනුයේ. අතුරැ — අනතරයෙහි. ඇතුළෙහි.

**175.** තරහල් ද එ දි නා
නිමැවූ තමා විසි නා
කසුන් රුව සොබ නා
රැගෙනැ'විත් දක්වී යැ තොසි නා

අන්වය: තරහල් ද එ දිනා තමා විසිනා නිමැවූ සොබනා කසුන් රුව ඇරැ ගෙනැ ඇවිත් තොසිනා දක්වී යැ.

විසඳුම්: දිනා, විසිනා, සොබනා, තොසිනා — සිව්තන්හි මැ දීර්ඝය ඡන්දස රැකෙනු පිණිස යැ. නිමැවූ — 'නිම' (නිමීමෙහි = සමාප්තියෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය අතීත

කෘදන්ත නාම යි. 'නිම' ධාතුව 'බල' ආදි ගණ ද; 'රක්' ආදි ගණ ද වෙයි, අකර්මක යි. 'බල' ආදි ගණ වූ කල්හි පරස්මෛපද යි. නිමා–නිමති–නිමි–නිමූ. 'රක්' ආදි ගණ වූ කල්හි ආත්මනෙපද යි. නිමේ–නිමෙති–නිමිණි, නිමි–නිමුණු, නිමි. කසුන් — කාඤ්චන. 'රන්' යනු ද පර්‍යාය නාමයෙකි. දක්වී — කුස කුමරුට දක්වී. 'තරහල්' යනු මෙහි උක්ත කර්තෘ යි.

176. රන් රුව දකා දිමු නා
ම විසින් කළ රුවෙක් ඇ නා
සිරි යහන් විමන නා
බලා ගෙනෙව යි කිවෙන් මහ ස නා

අන්වය: දිමුත රන් රුව දකැ "ම විසින් කළ රුවෙක් සිරි යහන් විමනතැ ඇතැ. බලා ගෙනැ එව" යි මහ සත කිවෙන් — (මතු සම්බන්ධ යි.)

විසසණි: දිමුත — බබළන්නා වූ. රන් රුව — රන් කරු තනා ගෙනා රන් රුව. ඇත — ඇති. බලා — ඒ සිරි යහන් විමනතැ බලා. ගෙනෙව — ඒ රන් රුව ගෙනැ එව. මහ සත — 'බෝ සත්' යන අර්ථයෙහි මැ නාම යි. කර්තෘාර්ථයෙහි ද්විතියා යි. 'කිවෙන්' යන්නෙහි කර්තෘ පද යි. කිවෙන් — කී නිසා. 'කිය' (කීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය 'එන්' විබත් ගෙනැ සිටි තැනි. මෙහි, කීවෙන්–කීයෙන්–කිවෙන්–යන රූප තුන මැ සාධු යි.

177. තරහල් දෙවූ ගොසි නා
කසුන් රුව දකා බබළ නා
මහ සතු පින් බෙලෙ නා
පහළ වූ දෙවඟනකැ සිතමි නා

අන්වය: තරහල් දෙවූ ගොසින බබළන කසුන් රුව දකැ, "මහ සතු පින් බෙලෙන පහළ වූ දෙවඟනක් යැ" සිතමින — (මතු සම්බන්ධ යි.)

විසසණි: ගොසින — කුස කුමරුන් තියම කළ ලෙස සිරි යහන් විමනතට ගොස්. පහළ — 'ප්‍රකාශ' යන සංස්කෘත ශබ්දය ද මේ අර්ථය දෙයි. දෙවඟනකැ — දෙවඟනක් + යැ = දෙවඟනක් + ඇ = දෙවඟනකැ. 'යැ' යනු අර්ථාවසානයෙහි නිපාත යි.

178. අවුන් මහ සතු වෙ ත
අග බිසෝ සඳ සිරිම ත
තනි වැ මැ වැඩැ සිටු ත
බිසෙන් ආයෙමි නො වැද්‍ද විමන ත

අන්වය: මහ සතු වෙතැ අවුත්, "සිරිමත අග බිසෝ සඳ තනි වැ මැ වැඩැ සිටුත, බිසෙන් විමනත නො වැද්‍ද ආයෙමි"– (මෙහි වාක්‍ය සම්බන්ධයෙහි 'සි' නිපාතයෙක් ආධ්‍යාහාර්‍ය යි.)

විසඳුම් : සිරිමත — 'සිරිමත' යනු එළිය සඳහා 'අ' කාරවත් කැරැ ගත් තැනි. සිටුත — සිට + තු = සිටුත. අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. "සිටුනා හෙයින්" යනු අර් යි. හෙළවෙයෙහි දු මේ අසම්භාව්‍ය කෘදන්ත නිපාතය යෙදෙන බව මෙයින් පෙනේ. ආයෙමි — 'එ' (පැමිණීමෙහි) ධාතුයෙන් වූ 'ආ' යන කෘදන්ත නාමය පෙර විබත් ගෙනැ 'ආයේ, යනු වෙයි. උත්තම පුරුෂයෙහි 'මි' ප්‍රත්‍යයය වැ 'ආයෙමි' යනු නිපදී.

179. මෙ ලෙසට එ තරහ ල
සැල කරත වැඳැ පද ත ල
බිසොවක් නො වෙයි බ ල
කනා රුව මැ යැ ගෙනෙව නො පැකි ල

අන්වය: එ තරහල පද තල වැදැ මෙ ලෙසට සැල කරත, "බල, බිසොවක් නො වෙයි, කනා රුව මැ යැ. නො පැකිලැ ගෙනෙව."

විසඳුම් : පද තල— පාද තලයන්. කුස කුමරු ගේ පා. මෙ ලෙසට — "සිරිමත් අගබිසෝ සඳ තනි වැ මැ වැඩ සිටුත බිසෙන් විමනත නො වැද්‍ද ආයෙමි" යන ලෙසට. බල — අවලොකනය කරව. 'බල' ධාතුයෙන් විධාන යි. ග්‍රාමීණ ව්‍යවහාරයෙහි 'බොල' යි සිටි. බිසොවක් නො වෙයි — රන් රුව ගැනැ සදහන් කොට යැ මේ සේ කියැවෙනුයේ. කනා—කනක. රන්. ගෙනෙව — ගෙනැ + එව.

180. මේ ලෙස පවසමි න
එ රන් රුව නෙන්වා ගෙ න
නිසි රතැසතැ යොබ න
සිවුවමින් සළු බරණ සදමි න

**අන්වය :** මේ ලෙස පවසමිනා, එ රන් රුව ගෙන්වා ගෙනැ, නිසි සොබන රථයෙකැ සිටුවමින්, සළු බරණ සදමින- (මතු සම්බන්ධ යි.)

**විසඳුම් :** පවසමින—පූර්ව ක්‍රියා පදයි. මෙහි මැ 'සිටුවමින්' 'සදමින' යනු ද එ සේ මැ යැ. සළු බරණ — වස්ත්‍රාභරණ. සදමින — හඳවා පලඳවා.

181. මෙ බඳු රූසිරින් යු ත්
නිසි රජ දුවක ලද හො ත්
කොරෙමි මෙහෙසුන් ප ත්
කියා යැවූයේ මවු බිසොව වෙ ත්

**විසඳුම් :** මෙහෙසුන් පත් කොරෙමි —මහිෂී භාවයට පත් කෙරෙමි යි. මෙහි 'කෙරෙමි' යනු 'කොරෙමි' වියැ යුතු වුව ද ඡන්දස රැකෙනැ පිණිස මෙ සේ හ්‍රස්ව වැ සිටියේ යැ. කොරෙමි+යි = කෙරෙමි + ඉ = කෙරෙමි. යැවූයේ — 'යා' (ගමන්හි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය අතීත කෘදන්ත නාමය පළමු වන විබත ('ඒ' යනු) ගෙනැ තිපන. යැවූ+ඒ= යැවූයේ=යැවූයේ.

18?. තිදසින් බට සුර'ඟන මෙ න
දිළි රන් රුව රැගෙනැ ගොසි න
බිසොවුන් දක්වා සිටැ කෙ න
කුමරුන් ඉඟි කි නතු මෙ න

**විසඳුම් :** තිදසින් — තව්තිසා දෙව් ලොවින්. තව්තිසා දෙව්ලොව තිදස යන නම් ලැබූ සැටි පෙරැ කියැවිණ. බට— බැස්සා වූ. කොයට බට ද ? මිනිස් ලොවට බට. තිදස මෙර මුදුනෙහි පිහිටියේ යැ. එ හෙයින් මිනිස් ලොවට ඒමට නම් බැස්සැ මනා මැ යැ. 'බට' යනු 'බස්' (බැසුම්හි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'බස්' ධාතුව පරස්මෛපද යි. අකර්මක යි. බසී-බසිති-බට-බටු. මේ ධාතුව මෙන් වර නැගෙන ධාතු 'බස්' ආදි ගණයට අයත් යැ. දිළි—බබළින්නා වූ. ගොසින — කොහි ද ? බිසොවුන් වෙතට. දක්වා — පෙන්වා. කුමරුන් — බිසොව ගේ පුතණුවන් වූ කුස කුමරුන්. ඉඟි—අභිප්‍රාය. නතු මෙන—තථාත්වාකාරයෙන්. ඇති සැටියේ. නො වළහා. කි — මෙහි උක්තය තරහල් දෙවූ සඳහා අධ්‍යාහාර වූ 'හේ' යනු යි. අර්ථය ප්‍රකට හෙයින් මේ නිදෙසි. පූර්ව පද්‍යයෙහි 'යැවූයේ' යන්නෙන් යවනු ලැබූයේ ද මෙ තරහල් දෙවූ මැ යැ.

183. බි සො වු'න් පැවැසූ බස' සා
මැ ති ය න් රැස් කැරැ නො ල සා
අ ම ව න් පියූ බසිනි ර සා
මෙ ලෙසි න් සබ මැදූ පව සා

අන්වය: බිසොව උන් පැවැසූ බස් අසා, නො ලසා මැතියන් රැස් කැරැ, අම වන් රසා පිය බසිනි මෙ ලෙසින් සබ මැදූ පවසා.

විසඳුම්: උන්—ඒ තරහල් දෙටුවා. මැතිශන්—මැති+ අන්. 'ය' කාරාගම යි. අම වන් රසා පිය බසිනි— දෙවියන් ගේ පරම රමණීය භොජනය වන අමාව ඉතා රසවත් යැ. පිය බස් ද කනට ප්‍රියඞකර හෙයින් ඉතා රසවත් යැ, අම කෑ යුතු ද බස් ඇසියැ යුතු ද වන නමුත් දෙකෙහි මැ සමාන වශයෙන් ලැබෙන රසවද් භාවය සලකා මෙ සේ කියැවෙයි. පවසා — ප්‍රකාශ කෙරෙයි. අඛ්‍යාත පද යි. මෙහි උක්තය 'බිසොව' යනු යි.

184. මහ පි න් ඇති අප කුමරි ඳු
සූ රි ඳු න් දුන් කෙනෙකැ පසි ඳු
එ බැවි න් මේ රන් රුව බ ඳු
රු සි රි න් මුළු ලොවැ පරසි ඳු

අන්වය: මහ පින් ඇති අප කුමරිඳු පසිඳු සූරිඳුන් දුන් කෙනෙකැ. එ බැවින් මේ රන් රුව බඳු, රුසිරින් මුළු ලොවැ පරසිඳු-(මතු සම්බන්ධ යි.)

විසඳුම්: කුමරිඳු — මෙහි 'ඉඳු' යනු උත්තමාර්ථය දෙයි. පසිඳු සූරිඳුන් — සකල ලෝකයෙහි ශක්‍රයන් සේ ප්‍රසිද්ධ වූ අන් සූර්දෙක් නැති. කෙනෙකැ — කෙනෙක් + යැ = කෙනෙක් + ඇ = කෙනෙකැ.

185. සො බ ම න් රජ දූවක නිම ල්
කෙරෙමින් නිසි විවා මඟු ල්
පැහැ සන් හිරු'වරණි නු'දු ල්
සි හ'සු න් පත් කැරැ මන ක ල්

අන්වය: සොබමන් නිමල් රජ දූවක නිසි විවා මඟුල් කෙරෙමින්, පැහැ සන් හිරු අවරණින් උඳුල් මන කල් සිහසුන් පත් කැරැ– (මතු සම්බන්ධ යි.)

විසඳුම් : නිමල් — කුල වංශ පරම්පරායෙන් ද ශීලාදි ගුණ ධර්මයෙන් ද නිර්මල වූ. නිසි — මලය දෙශයෙහි රජ බවට පැමිණෙන කුස කුමරුවෝ මුළු දඹදිවට මැ අන රජ වෙති. එ බඳුවූ ඔවුනට නිසි වන. 'විවා මඟුල්' යන්නට විශෙෂණ යි. පැහැ සත් — ප්‍රභායෙන් ජනනා වූ. පැහැයෙන් වැසුණු වූ. ඉතා පැහැ පත් වූ යනු අර්ථ යි. තිරවරණින් — තිර+අවරණින්. 'අවරණ' නම් ආවරණය යි, තෙවත් වැස්ම යි. තිර (අච්ච) ආවරණය වනුයේ යමෙකින් ද ඒ තිරවරණ. මේ ඡත්‍රයට නම්. මෙහි කියැවුණේ ශ්වෙතච්ඡත්‍රය යි. 'පැහැ සත්' යි වෙසෙසුණේ ද එ හෙයිනි. ශ්වෙතච්ඡත්‍රය චනාහි රජුන් ගේ ප්‍රධාන රාජ චිහ්නය යි. මෙය වනුයේ සිංහාසනය මුදුනෙහි යැ. සිහසුන් පත් කැරැ — සිංහාසනයට පත් කිරීම නම් රජ කම පැවැරීම යි.

186. මි න් මතු මුළු ලොව රකිා ට
පි න් ඇති අප ගේ කුමරු වූ
ම න් පිනවන ළඳක් සතු ට
නා න් දෙසැ විමසන විලස ට

විසඳුම් : මුළු ලොව — සකල ජම්බුද්වීපය සලකා මෙ සේ කියැවෙයි. සතුට — 'ළඳක' යන්නට විශෙෂණ යි. නන් දෙසැ — නානා දිශායෙහි නොයෙක් රටවලැ.

1.7. වෙ සෙ ස් මෙ රන් රුව ගෙනැ ගො ස්
ස ව ස් වරෙහි දන වන රැ ස්
නො සි ස් තැනෙකැ තබා සක ස්
අ දි ස් වැ සිටි කලැ වෙමින් ස්

අන්වය : වෙසෙස් මෙ රන් රුව ගෙනැ ගොස්, සවස් වරෙහි දන රැස් වන නො සිස් තැනෙකැ සකස් තබා අස් වෙමින් අදිස් වැ සිටි කලැ-(මතු සම්බන්ධ යි.)

විසඳුම් : වෙසෙස් — විශිෂ්ට වූ. දන — ජනයා. සෙනඟ. නො සිස් තැනෙකැ — ජනයා රැස් වන තැනෙක් නම් නො සිස් මැ වේ ද ? සකස් — සකසා. මනා කොට. අස් වෙමින් — පසෙකට වැ. අදිස් වැ — අදෘශ්‍ය වැ. නො පෙනී.

188\. ම න ක ල් මෙ රුවට පැහැ ප ත්
එ ක තු ල් ලිය එ පුර ඇතො ත්
අ සු ව ල් දුව දෙ පවස ත්
එ තෙපුල් අසමින් රසව ත්

අන්වය : මන කල් පැහැ පත් මෙ රුවට එක තුල් ලිය එ පුර ඇතොත්, "අසුවල් දුව දෙ" පවසත්. එ රසවත් තෙපුල් අසමින්-(මතු සම්බන්ධ යි.)

විවරණ : මන කල් — 'මන' නම් සිත යැ. 'කල්' යනු 'කාන්ත' - 'ප්‍රිය ජනක' යන අරුත් ඇත්තේ යැ. එ බැවින්-මනට කල් = මන කල්. පැහැ පත් — ප්‍රභාසම්පන්න. දිලියෙන. බබලන. පැහැයට පතුයේ (පැමිණියේ) පැහැ පත්. එක තුල් — එක සමාන. ලිය — ස්ත්‍රීන් ද්විතීයා බහුවචන යි. මෙ තන්හි විභක්ති ලොපයෙන් ප්‍රකෘති රූපය ගත. දෙ — ද + හෝ = දෙහෝ = දෙ + ඕ = දෝ. රසවත් — රන් රුව දුටු බොහෝ දෙන, "මෙ බඳු රූපසම්පන්න මනුෂ්‍ය ස්ත්‍රියක් නම් නැත් මැ යැ" යනු කී හ. කුස කුමරුන් ගේ මහත් පින් ඇති බව දත් සීලවතී බිසොව එ පමණෙකින් නො සෑහී එ තරම් රූමත් කුමරියක සෙවීමට මැ නිශ්චය කැරැ ගත්තා යැ. "රන් රුව නානා දෙශයනට ගෙනැ ගොස් පරීක්ෂා කරවූ" යැ යි කියනුයේ එ හෙයිනි. එ සේ ගෙනැ ගිය ද එ බඳු රූමත් කුමරියක සොයා ගැන්ම නම් පහසුයෙන් කළ නො හැකි බව ඕ දන්නී යැ. බොහෝ රටවලැ දී බොහෝ නගරවලැ දී රිසි පුත් වන බව ද නිසැක යැ. එ සේ හෙයින් යම් කිසි තැනෙකැ දී "මේ (රන් රුව). අසුවල් දුව ද හො" යි කියැවුණ හොත් එය රසවත් බසක්- ඇසීමට අතිශයින් ප්‍රිය වචනයක්- බව ප්‍රත්‍යක්ෂ යැ.

189\. සො ඳු රු ඔවුන් දකැ පැහැ දි
ප ඬු රු පිණිස රන් රුව දි
ම හ රු මඟුල් කැරැ උරු දි
ල පි රු තොසින් එවු නො රැ දි

අන්වය : සොඳුරු ඔවුන් දකැ පැහැදී, පඬුරු පිණිස රන් රුව දී, මහරු මඟුල් උරුදී කැරැ, ල පිරු තොසින් නො රැඳී එවූ.

**ටිප්පණි:** **ඔවුන්** — 'මේ අසුවල් දූව යේ' යි පැවැසෙනු සමකුන් ගැනැ ද ඔවුන්. **පැහැදී** — 'පහද' (ප්‍රසන්න වීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. මේ ධාතුව 'බස්' ආදි ගණ ද 'රක්' ආදි ගණ ද වෙයි. අකර්මක යි. 'බස්' ආදි ගණ වූ කල්හි පරස්මෛපද යි. පහදී-පහදිති-පහනි-පහනු. 'රක්' ආදි ගණ වූ කල්හි ආත්මනෙපද යි. පැහැදේ-පැහැදෙති-පැහැදිණි, පැහැදී- පැහැදුණු, පැහැදී. **පඬුරු** — ත්‍යාග. **දී** — ඔවුනට දී. **උරැදි සැරැ** — නිශ්චය (නිත්‍ය) කොට මෙනෙනැ. 'උරැදි' යනු 'ඒකාන්ත' 'නිශ්චය' යන අර්ථයෙහි වෙයි. **ළ පිරැ** — හෘදයය පිරුවා වූ. **නො රැදි** — නො නැවැතී. වහා. ඉක්මන් කොට. 'රැදි'-යනු 'රද' (රැඳුම්හි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'රද' ධාතුව 'බල' ආදි ගණ ද 'රක්' ආදි ගණ ද වෙයි. අකර්මක යි. 'බල' ආදි ගණ වූ කල්හි පරස්මෛපද යි. රඳා-රදති-රැදි-රැදූ. 'රක්' ආදි ගණ වූ කල්හි ආත්මනෙපද යි. රැදේ-රැදෙති-රැදිණි-රැදී, රැදුණු-රැදී. **එවු** — 'සෙපි' යනු ආධ්‍යාහාසී උක්තය යි.

190\. මෙ ලෙසින් දන්වා තොර තු රු
ය න වු න් හට දී තන තු රු
ග න ර න් රුව දී විසි තු රු
නු ව රි න් ඇරියා දෙස තු රු

**අන්වය:** මෙ ලෙසින් තොරතුරු දන්වා, යනවුන් හට තනතුරු දී, විසිතුරු ගන රන් රුව දී, නුවරින් අතුරු දෙස ඇරියා.

**ටිප්පණි:** **මෙ ලෙසින්** — මේ ඉහතින් කියැවුණු පරිද්දෙන්. **දන්වා** — ඒ රන් රුව ගෙනැ යන්නා වූ මනුෂ්‍යනට දන්වා. 'දන්වා' යනු 'දන්' (දැනීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා නිපාත යි. 'දන්' ධාතුව 'බස්' ආදි ගණ යි. පරස්මෛපද යි. (කතු කරු) - දනී - දනිති - දනි - දනු. (කර්ම කරු) දැනේ - දැනෙති - දැනිණි - දැනුණු. **යනවුන්** — යන + උන් = යනවුන්. 'යන' යනු 'ය' (යෑමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'යනවුන්' යනු එය ද්විතීයා බහුවචන ගත් තැනි. **හට** — සම්ප්‍රදානාර්ථය හඟවන්නා වූ නිපාත පදයෙකි. **අතුරු දෙස** — අනතුර දෙශයට. දෙශාන්තරයට. පිට රටට. දෙස් + අතුරු = දෙසතුරු.

ඇරියා — 'හර' (හැරුම්හි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය සත්‍රී ලිඞ්ගයෙහි 'ආ' ප්‍රත්‍යයය ගෙනැ සිටි තැනි. මේ වාක්‍යයෙහි 'වූ' යනු ආඛ්‍යාතයි යි. එයින් උක්ත වනුයේ 187 වන පද්‍යයෙහි එන 'බිසොව' යනු යි.

191. බිසොවුන් වදහල බස'සා මැති ද න
ගන රන් රුව සළු බරණින් සදමි න
නිසි රන් සිවි ගෙයෙකින් ගෙනැ බබල න
නුවරින් නුවරට වදිමින් නො ලසි න

අන්වය: මැති දන බිසොවුන් වදහල බස් අසා, ගන රන් රුව සළු බරණින් සදමින, බබලන නිසි රන් සිවි ගෙයෙකින් ගෙනැ, නුවරින් නුවරට නො ලසින් වදිමින— (මතු සම්බන්ධ යි.)

විසඳුම්: සදමින — සරසා. සිවි ගෙයෙකින් — දොලාවෙකින්. නො ලසින — ඉක්මන් වැ. වහා. වදිමින — ප්‍රවිෂ්ට වැ. ඇතුළු වැ. ගොස්.

192. නන් දන කැන් රැස් වන නොමි නේ යා
ළින් තොට ගං තොට ආදි තැ නේ යා
රන් රුව සිටුවා අස් වෙමි නේ යා
උන් හැම සිටි සඳැ නො පෙනෙමි නේ යා

අන්වය: නොමිනේයා නන් දන කැන් රැස් වන ළින් තොට ගං තොට ආදි තැනේයා රන් රුව සිටුවා අස් වෙමිනේයා උන් හැම නො පෙනෙමිනේයා සිටි සඳැ— (මතු සම්බන්ධ යි.)

විසඳුම්: නොමිනේයා — 'නොමින්' යැ යි සිටියැ යුතු තන්හි මෙ සේ වී. නන් දන — නොයෙක් ජනයා. කැන් — සමූහ. ළින් තොට ගං තොට ආදි — පැන් ගෙන යනු සඳහා ද ස්නාන බොවන ආදිය සඳහා ද මේ ස්ථානවලට බොහෝ දෙන රැස් වෙති. තැනේයා — 'යා' යනු එළිය ද සඳැස ද රකී. 'වෙමිනේයා'–'පෙනෙමිනේයා' යන තන්හි 'වෙමින්'–'පෙනෙමින්' යැ යි විය යුතු. උන් හැම — ඒ රන් රුව රැගෙනැ ගිය මනුෂ්‍යින් සියලු දෙනා.

193\. වෙ සෙ ස් එ රන් රුව දැකැ රැස් වූ ද න
ති ද ස් පුරින් බට සුරඟන මිසැ වෙ න
මි නි ස් ලියක් නැත මෙ රුවට සරි ව න
මෙ බ ස් කියත රන් රුව එ තැනින් ගෙ න

විපසණ් : තිදස් පුරින් — තව්තිසා දෙව් ලොවින්. සරි වන — සමාන වන්නා වූ. මිනිස් ලියක් — මනුෂ්‍ය ස්ත්‍රියක්. කියත — 'දන' යනු මෙයට අනුක්ත කර්තෘ යි. ගෙනැ — ඉවත් කොට ගෙනැ.

194\. සෙනඟින් යුතු ඇත් අස් රිය පා බ ල
ඉ සු රි න් සුර පුර බට මෙන් මිහි ත ල
සොබමන් නුවරට මද්‍ර රටැ සාග ල
ග න ර න් රුව ගෙනැ වන්නු යැ පැහැ දුල

අන්වය : ඇත් අස් රිය පා බල සෙනඟින් යුතු, ඉසුරින් මිහි තල බට සුර පුර මෙන් සොබන, මද්‍ර රටැ, සාගල නුවරට, පැහැ දුල ගන රන් රුව ගෙනැ වන්නු යැ.

විපසණ් : ඉසුරින්—සම්පත්තියෙන්. මිහි තල—පොළෝ තලයට. බට — බැස්සා වූ. වන්නු — 'වද' (ප්‍රවේශනයෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය ප්‍රථමා බහුවචන විභක්තිය ගෙනැ සිටි තැනි. වන් + හු = (පූර්ව රූපයෙන්) වන්නු. යැ — අර්ථාවසානයෙහි නිපාත පද යි. මෙහි 'වූ' යැ යි අවසාන ආඛ්‍යාතය අධ්‍යාහාර්‍ය යි. එහි උක්තය 195 වන පද්‍යයෙහි එන 'මැති දන' යන්න යැ. මද්‍ර රටැ — පුරාණ දඹදිවැ උත්තරාපථයෙහි උතුරින් කාශ්මීරයට ද බටහිරින් ගන්ධාර දේශයට ද දකුණින් කාම්බෝජයට ද නැගෙනහිරින් කුරු රටට ද මැදි වූ කුඩා ප්‍රදේශයක් වැ පැවැත්තේ යැ. මුළු ප්‍රදේශය සින්ධු නදියේ ජලයෙන් සාරවත් වූයේ යැ. මෙහි අග නුවර 'සාගල' නම් වූ බව මෙහි මැ කියැවෙයි. එය සින්ධු නදියෙහි මැ ශාඛාවක් වූ චන්ද්‍රභාගා නදී තීරයෙහි පිහිටියේ යැ. මෙය දැන් පංජාබ පළාතට අයත් යැ.

195\. එ ක ල් එ රජ හට දූ වූ එක සැ වි
නි ම ල් දූන් අට දෙන ගෙන් වැඩි සි වි
ල ක ල් පබාවති නම් ලද නො කිලි වි
සි ය ල් රුවින් දිසි දන මන කැරැ අ වි

අන්වය: එ කල්. එ රජ හට දූ වූ, එක සැටි නිමල් දූන් අට දෙන ගෙන් මැඩි සිටි, ලු කල් පබාවති නම් ලද, නො කිලිටි සියල් රුචින් දන මින අපි කැරැ දිසි.

විපසණ: එ රජ හට — ඒ මද්‍ර රටැ සාගල පුරයෙහි රජුට. හෙ ද 'මද්‍ර' නම් යැ. එක සැටි — සියලු දෙනා මැ මනොහර රූපශ්‍රීන් සිටි හෙයින් මෙ සේ කියැවෙයි. ඒ 'නිමල්' යන්නට විශෙෂණ යි. සියලු දෙනා ම එක සැටි නිමල යැ. ල කල් — ලයට කල් = ලු කල්. 'සිත් කලු' යි කිව ද 'මන කල්' යි කිව ද 'ලු කල්' යි කිව ද එකාර්ථ යැ. නො කිලිටි — ප්‍රභාවතිය සකල (ස්ත්‍රී) ලක්ෂණයෙන් හෙබියා යැ. එහි කිසියම් දෙෂාංශුවකුදු නැති හෙයින් නො කිලිටි යි කියැවිණ. දන මන — ජනයන් ගේ සිත්. අපි කැරැ — අභිලාෂය ඇති කොට. ප්‍රභාවතිය දුටු කවර නම් පුරුෂයකුට වුව ද ඇය ගේ වැනි රූපශ්‍රීන් යුක්ත ස්ත්‍රියක ඇත හොත් මැනැවැ යි යන අභිලාෂය උපදී. එ හෙයින් ප්‍රභාවතිය දන මන අපි කෙරෙයි. දිසි — පෙනුණා යැ. 'දිස්' ධාතුයෙන් වූ අතීත ආඛ්‍යාත යි. මෙහි 'දිස්' ධාතු 'රක්' ආදි අත් පද යි. උක්තය. ස්ත්‍රීලිඞ්ග (ලඳ) වූයෙන් මෙහි 'දිසි' යනු බහුවචන යි. එහෙත් රූපය දෙ බස්හි මැ සමාන යැ.

196. තෙරක් නුදුටු ගැඹුරැති මහ මුහුදි නි
බිඳක් රැගෙනැ සත හට පානා මෙ නි
මඳක් කියමි එ ලඳ ගෙ රුව වියති නි
අමක් ලෙසින් බොවු දෙ සවන් දෝති නි

අන්වය: (අපරාධියෙහි) එ ලඳ ගෙ රුව මඳක් කියමි. වියතිනි, අමක් ලෙසින් දෙ සවන් දෝතිනි බොවු.

විපසණ: තෙරක් නුදුටු — මහා සාගරයේ තෙරක් දැකීම ඉතා දුෂ්කර හෙයින් මෙ සේ කියැවෙයි. නුදුටු — නො + දුටු = (පර රූපයෙන්) නුදුටු. බිඳක් රැගෙනැ සත හට පානා මෙනි — "මහා සාගරය නම් මෙ පමණ ජලස්කන්ධයෙකැ" කියා හෝ "මෙ පමණ දිගු පුළුලින් යුක්ත යැ, මෙ පමණ ගැඹුරු යැ" කියා හෝ ප්‍රමාණයක් කළ නො හැකි යැ. එ බඳු වූ මහා සාගරයෙන් දිය බිඳුවක් ගෙනැ, "මහා සාගරය නුදුටු කෙනෙක් වෙත් නම් මෙය බලා එය ඇඳිනැ ගනිත් වා" යැ යි

කියමින් පැම හාස්‍යයට කාරණ වෙයි. එ සේ මැ ප්‍රභාවතිය ගේ රූප සාගරය මෙතෙකැ යි කීම කළ නො හැකි යැ. මිතු ප්‍රකාශ වන පද්‍ය කිහිපයෙකින් ඇය ගේ රූප සාගරය වර්ණනා කිරීමට ප්‍රයත්නයක් දරනු ලැබේ. ඒ ප්‍රයත්නය නම් සාගරයෙන් දිය බිඳුවක් ගෙනැ පාන්නාක් මෙන් හාස්‍ය ජනක වෙයි. කවරකු විසින් වුව ද ප්‍රභාවතිය ගේ රූපය වනා නිම කොට ලියැ නො හෙන බව මේ කී සැටි යැ. විසතිනි— වියත් සඳින් ආලපනයෙහි 'ඉනි' විභක්ති වූ තැනි. අමත්— අමෘතයක්. දෙවියන් ගේ පරම රමණීය වූ භොජනය වන අමෘතය ඉතා රසවත් යැ. කරන්නට ඇන ඇගේ රූප වර්ණය ද එ තරම් මැ රසවත් බව මෙයින් හැගැවෙයි. දෙ සවන් දෙතිනි— අමෘතය දෙතින් ගෙනැ බියැ යුතු යැ. ප්‍රභාවතිය ගේ රූප වර්ණනය සවනින් ඇසියැ යුතු යැ. එ හෙයින් 'දෙ සවන් දෙතිනි' යි කියැවිණ. බොවු— 'පො' (බිමෙහි) ධාතුයෙන් වී. විධාන යි. මෙයින් උක්ත වන්නා වූ 'තෙපි' යනු ආඛ්‍යාතයි යි. 'පො' ධාතුව 'බල ආදි ගණ යි, පරස්මෛ- පද යි. (කතු කරු) බෝ–බොති–පි–පූ. (කම් කරු) පෙවේ– පෙවෙති–පෙවිණි–පෙවුණු. මෙහි කර්තෘ කාරක වර්තමාන යෙහි ද අනිතයෙහි එක වචනයෙහි ද 'ප' යන්නට 'බ' යනු ආදෙශ වෙයි. බොවු — පෝ + තු = බෝ + වු = බොවු.

197. නි ල් ගෙල පිල් කලබෙ'ව නිති බබළ නා
ම ල් දම් දුළ ඇගෙ මුහුලස සසොබ නා
දු ල් විදු කිඳු තොර නො වමින් වොරද නා
නි ල් ඝන කුළු සිරි පැසි දන මන ගෙ නා

අන්වය: නිල්ගෙල පිල් කලබ එව් නිති බබළන, මල් දම් දුළ, සසොබන ඇගෙ මුහුලස, දුල් විදු කිඳු තොර නො වමින් වොරදන, නිල් ඝන කුළු සිරි, දන මන ගෙනැ, පැ යි.

විසපණි: නිල්ගෙල—(නිල් වූ ගෙල යමකු ගේ ද හේ.) නීලග්‍රීවයා ගේ. මොනරා ගේ. නීලග්‍රීව, නීලකණ්ඨ යනු මොනරුනට නමි. ඔවුන් ගේ ග්‍රීවාව නීල යැ. පිල් කලබ එව්—පිච්ඡ කලාපය (පිල් වැටිය) මෙන්. මල් දම් දුළ— මාලා දමයන් බබළන්නා වූ. 'දම්' යනු දුළ යන්නට කර්තෘ යි. සසොබන — සංශොභිත (මැනැවින් බබළන්නා) වූ. මුහුලස— කෙශ කලාපය. ප්‍රභාවතිය ගේ කෙශ කලාපය මල්

දමින් බබලන්නේ යැ. එය මොනර පිල් කලඹක් බඳු යැ. එය ඉතා දික් වැ මනා වැ වැඩුණු බව ද අතිශයින් නීලවර්ණ බව ද කියැවුණු සැටි යැ. විදු කිඳු—විද්‍යුත් සංඝ. විදුලිය සමූහ. තොර නො වමින්—නිතොර වැ. ගන කුළෙහි විදු කිඳු නිතොර නො වෙයි. පබවතිය මුහුලසෙහි මල් දම් නිතොර යැ. එ හෙයින් මුහුලසට සමාන වනුයේ, වරින් වර ඇති වැ නො පෙනී යන හෙයින් තොර වන විදු කිඳු ඇති, ගන කුළෙක් නො වේ. විදු කිඳු නිතොර වනා සියලු කල්හි විදුලියෙන් බබලන, ගන කුළෙක් වේ නම් එය යි. නිල් ගන කුළු—නීලවර්ණ වූ වැසි වලා කුළු. කෙශ කලාපයෙහි වූ මල් දම් ගන කුලෙහි වූ විදුලිය බඳු යැ. සිරි—ශොභාව. ආකාරය. පැසි—පැ+සි. 'පැ' යනු 'පා' (පෑමෙහි) ධාතුයෙන් වූ අතීත අඛ්‍යාත පද යි. වොරඳන—'වොරඳ' (විරාජමාන වීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'වොරඳ' ධාතුව 'රක්' ආදි ගණ උභයපද යි, අකර්මක යි. (පර පද) වොරඳි-වොරඳිති-වොරැඳි. (අත් පද) වොරැඳේ-වොරැදෙති- වොරැඳිණි, වොරැඳි- වොරැඳුණු, වොරැඳි.

198. නොයෙක් රුවින් දිසි එ ළඳ ගෙ සිරිම ත
උ ද ක් කියඹු තල යුතු පටු නළල තු
ප ස ක් වැසුණු ගන කුළෙකින් කැළැලො ත
ස ස ක් මඬල ලෙස බබලයි පැහැ ප ත

අන්වය: නොයෙක් රුවින් දිසි සිරිමත එ ළඳ ගෙ, උදක් කියඹු තල යුතු පටු නළලත, පසක් ගන කුළෙකින් වැසුණු කැළැල ඔත පැහැ පත සසක් මඬල ලෙස, බබලයි.

අර්ථ: අනෙක රූප ශොභායෙන් පෙනුණ වූ ශ්‍රීමත් වූ එ කාන්තාව ගේ හුදක් අලකා ද තිලකය ද (අලකා ද තිලකය ද පමණක්) යුක්ත වූ පටු වූ ලලාටය (තෙමේ,) පාර්ශ්වයක් මෙඝ කූටයෙකින් වැසුණ වූ කැළැල ඇත්තා වූ ප්‍රභාසම්පන්න වූ චන්ද්‍ර මණ්ඩලය මෙන් බබලයි.

එ ළඳ ගේ නළල පටු යැ. අලකාවලිය පසෙකින් නළල මතැ හුණුයේ යැ. නළල් මැද තිලකය වෙයි. මෙ සේ වූ නළල (අඩ) සඳ වැන්නැ. අලකාවලියෙන් පසක් වැසී යැම චන්ද්‍රයා ගේ පාර්ශ්වයක් වැසි වලා කුළෙකින් වැසී යැම වැන්නැ. තිලකය සඳෙහි ලපය වැන්නැ.

මේ පැසැසියැ යුතු බැඳුමෙක් ඕනා වේ. 'නොයෙක් රුවින් යුතු' යනු පබවත ගේ රුපය විහිළුවක් කෙරෙයි. 'උදක්' යන්නා අතර පූරවන්නට යෙදුණු අනව්‍ය පදයෙකි. නළල සසක් මඩල වැනි නම් ඕනාවට සුදුසු යැ. 'අඩ සඳ' නම් 'සසක් මඩල' යන්නෙන් නො තේරේ.

විසඳුණි : සිරිමත — සිරි ඇතියේ සිරිමත්. තද්ධිත යි. උදක් — හුදක්. 'පමණක්' යනු අර් යි. කියඹු — අගින් සිදැ ගොතා නළල දෙ පසැ හෙන්නට සැලැසෙන කෙස් රොද 'කියඹු' නම්. 'අලකා' යනු සංස්කෘත යි. තල — තිලකය. නළල් මැදැ කස්තුරි ආදියෙන් කැරෙන ලකුණෙකි. මේ අර්යෙහි 'තලා' යනු ද වේ. කැළැලොත — 'කැළැල වැටුණු' යනු අර් යි. මේ කැළැල නම්.සස ලපය යි. ඔත — 'ඕ' (බැදුම්හි) ධාතුයෙන් වූ අතිත කෘදන්ත නාම යි. 'ඕ' ධාතුව 'බස්' ආදි පර පද යි. ඔවී–ඔවිති–ඔති–ඔතු. ඔතු–ඔත්–ඔත යන රූප තුන මැ සාධු යි. සසක් — චන්ද්‍රයා. සසයා (හාවා) අක් (අඩකය = ලකුණ) වූයේ යම්ක්හු ගේ ද හේ සසක්. බබළ යි— බබළා + යි. 'බබළා' යනු වර්තමාන ආඛ්‍යාත යි. 'බබළ' ධාතු 'බල' ආදි පර පද යැ. බබළා–බබළති–බැබැළි–බැබළුැ. මේ ධාතුව 'රක්' ආදි අත් පද ද වෙයි. බැබැළේ-බැබැළෙති–බැබැළිණි, බැබැළි. බැබළුණු, බැබැළී. පැහැ පත—පැහැයට පැමිණි. පැහැයෙන් යුත්. පත — 'පමුණු' ධාතුයෙන් වූ අතිත කෘදනත නාම යි. 'පමුණු' ධාතු 'බස්' ආදි අත් පද යි. පැමිණේ– පැමිණෙති- පැමිණිණි, පැමිණි, පති- පැමුණුණු, පැමිණී, පතු.

199. ඝන නිල් දද යුග බඳ රන් යට බඳ
මන කල් එ ළඳ ගෙ බැම ගහනත නඳ
දිගු නිල් පත් යුගෙකින් සැදි හැම සඳ
සුහුඹුල් රන් රඹ පැලයෙකැ සිරි ලද

අන්වය : ඝන නිල් දද යුග බඳ රන් යට බද, මන කල් එ ළඳ ගෙ නඳ බැම ගහනත, හැම සඳැ දිගු නිල් පත් යුගෙකින් සැදි සුහුඹුල් රන් රඹ පැලයෙකැ සිරි ලද.

විසඳුණි : ඝන නිල් — ඉතා නිල්. දද යුග — ධවජ යුගමයක්. කොඩි දෙකක්. බඳ — බඳනා ලද. රන් යට බඳ— සවණි යෂ්ටියක් බදු වූ. රන් ලීයක් වැනි වූ. නඳ — අනඳ

ජනක වූ. 'බැම ගහනාත' යන්නට විශෙෂණ යි. බැම ගහනාන — භ්‍රෑ යුග්මය හා ඝ්‍රාණය (නාසිකාව.) ගහනත රන් යට යැ. බැම එහි බඳ ගත නිල් දද යුග යැ. පත් යුගෙකින් — කොළ දෙකෙකින්. හැම සඳෑ — 'සැදි' යන්නට විශෙෂණ යි. සැදි — අලංකෘත වූ. සුහුඹුල් — මනාව වැඩුණු. රන් රඹ — රන් කෙසෙල්. සිරි — ශ්‍රීය. ලද — ලද්දේ යැ.

මෙයින් වැනුණේ ප්‍රභාවතිය ගේ දෙ බැම සහිත නාසය යැ. නාසය රන් යටෙකි. දෙ බැම එහි බඳනා ලද නිල් කොඩි දෙකෙකි. යළි, නාසය තරුණ කෙසෙල් පැළයෙකි. දෙ බැම එහි වූ නිල් කොළ දෙකෙකි. ළෙන කෙසෙල් ගස්හි කොළ ගණන ක්‍රමයෙන් වැඩි වෙයි. එ හෙත් මෙහි සියලු කල්හි කොළ දෙක මැ යැ.

පැරකුම්බා රජාණෝ ද කී හ-

" ගහනත මනහර-කවර වනා හළ පුවළ
රඹ ළ ගබ සඳන ලේ-නළලතැ දෙ පත් බැම ලේ" -යි.

200. සොබනා එ ළඳ ගෙ රූසිරින් දියත අ ග
දිලෙනා ඉඳුවර ඉඳුනිල් මිණි ර ග
නදනා දිගු නිල් පැහැ සර නෙතු යු ග
කෙළනා මිත් යුවළෙකි තුනු සිරි ග ග

අන්වය : රූසිරින් දියත් අග සොබනා එ ළඳ ගෙ, ඉඳුවර ඉඳුනිල් මිණි රඟ දිලෙනා නඳනා දිගු නිල් පැහැ සර නෙතු යුග, තුනු සිරි ගඟැ කෙළනා මින් යුවළෙකි.

විසඳුම : රූසිරින් — රූප ශ්‍රීයෙන්. දියත් — ජගත්. ලොකය. අග — අග්‍ර වූ. ප්‍රධාන වූ. රූපශ්‍රීන් ප්‍රභාවතියට සමාන වූ ස්ත්‍රියක් සමස්ත ලොකයෙහි නැති. එ හෙයින් ඕ රූසිරින් ජගදග්‍ර වූ. ඉඳුවර — ඉන්දීවර. නිල් මානෙල්. ඉඳුනිල් මිණි — ඉන්ද්‍රනීල මාණික්‍ය. රඟ — ආකාරයෙන්. මෙ තන්හි ක්‍රියා විශෙෂණයෙහි ද්විතීයා යි. 'දිලෙනා' යන්නට විශෙෂණ යි. නඳනා — (සන්තොෂකර වූ) නෙතු යුග — නෙත්‍ර යුග්මය. තුනු සිරි ගඟැ — ශරීර ශ්‍රීය නමැති ගඞ්ගායෙහි. කෙළනා — ක්‍රීඩා කරන්නා වූ. 'කෙළනා' යනු 'කෙළ' (කෙළම්හි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි 'කෙළ' ධාතුව 'රස්' ආදි ගණ යි, පරස්මෛපද යි, අකර්මක යි. කෙළි-කෙළිති-

කෙළි. මින් සුවලෙකි— මත්ස්‍ය යුගලයෙකි. ක්‍රීඩා කරන්නා වූ මත්ස්‍යයෝ ඒ අතැ මේ අතැ පනිති, වරල් ගසති. එ කල්හි ඔවුන් ගේ ශරීර පාර්ශ්වයන්හි ශෝභාව මැනැවින් පෙනේ. ඇඹින් කැරෙන වහස් බැලුම් ආදියට මෙහි මත්ස්‍යයන් ගේ ක්‍රීඩනය උපමිත යි. ස්ත්‍රීන් ගේ දෑස මත්ස්‍ය යුගලයකට සමාන කොට දැක්වීම බෙහෙවින් ලැබෙන්නෙකි.

මයුර සන්දේශයෙහි–

"නුවන් යුවල මින් යුවලෙකි එහි නො බද"
යනා ආදිය සලකන්නේ යැ.

201. පැහැ පත් ලවනත් පත් පෙළිනු'දු ලා
දිසි දත් මුවරද සුවඳැති නිම ලා
දන නෙත් කැන් බිඟු කැන් සෙවි ලොබලා
සිරි ගත් තෙ යැ එ ළඳ ගෙ මුව කම ලා

අන්වය: පැහැ පත් ලවනත් පත් පෙළින් උදුලා, දත් මුවරද දිසි, නිමලා සුවඳ ඇති, දන නෙත් කැන් බිඟු කැන් ලොබ ලා සෙවි, එ ළඳ ගෙ මුව, කමලා සිරි ගත්තෙ යැ.

විපසණ: ලවනත් — තොල්. මෙහි අන්තයෙහි වූ 'අත්' යනු විශේෂ අර්ථයක් දෙන්නේ නො වේ. පත් — මල් පෙති. දිසි — පෙනෙන්නා වූ. දත් මුවරද — දත් නමැති රේණු. පැහැයෙන් හෝ අඟුරින් හෝ දත් මුවරද වැනි නො වේ. බෙහෙවින් බුලත් කන කටෙකැ දත් නම් මුවරද යැ යි කිව ද කම් නැත. දිසි — පෙනෙන්නා වූ. දන නෙත් කැන් — ජනයන් ගේ නෙත්‍ර කාන්ති. බිඟු කැන් — භෘඞ්ග සමූහයන්. ලොබ ලා — ලෝභ කොට. මහත් ආශායෙන්. 'ලොබ' යනු 'ලා' යන්නට කර්ම යි. සෙවි — සෙවනය කරන ලද. ආශ්‍රිත. 'සෙවි' යනු 'සෙව්' (සෙවනය කිරීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'සෙව්' ධාතුව 'රක්' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) සෙවී–සෙවිති–සෙවි. (කම් කරු) සෙවේ–සෙවෙති–සෙවිණි–සෙවුණු. මුව— මුඛය. කට. කමලා — පද්මයෙකැ. සිරි — ශෝභාව. ආකාරය.

ප්‍රභාවතිය ගේ මුඛය පද්මයෙකැ ශොභාව ගත්තේ යැ. ඒ පද්මයෙහි පත්‍ර පඞ්ක්තිය නම් ඇය ගේ පැහැ පත් ලවනත් යැ. පද්මයෙහි පෙති රතු යැ. තොල් ද රතු යැ. පද්මයෙහි රේණු නම් ඇය ගේ දත් යැ. පද්මය සුවඳවත් යැ. ඇය ගේ මුඛය ද සුවඳින් යුක්ත යැ. පද්මය භෘඞ්ග සමූහයන් විසින් මහත් ලොභයෙන් සෙවුනා ලැබෙයි. ඇය ගේ මුඛයෙහි ජනයන් ගේ නෙත්‍ර කාන්තිය වැටෙයි. ඒ පද්මයෙකැ බිඟුන් හැසිරෙන්නා වැන්නැ. ප්‍රභාවතිය ගේ මුඛය ජනයන් විසින් මහත් ලොභයෙන් බැලෙන බව මේ කී පරිදි යි.

202\. ප ස න් කොපුල් තලැ පිළිබිඹු පත් ස ඳ
නි ති න් පෙනෙන දිසුණු වැ සතරක් ලෙ ද
ස ව න් වොරැඳි රන් තෝඩු සුවල සො ඳ
ලෙසි න් දිලෙයි රිය සක් සතරෙ'ව ම ද

අන්වය: පසන් කොපුල් තලැ පිළිබිඹු පත් සඳැ දිසුණු වැ සතරක් ලෙද නිතින් පෙනෙන, සවන් වොරැඳි සොඳ රන් තෝඩු සුවල, මද රිය සක් සතර එව් ලෙසින් දිලෙයි.

විසඳුම්: පසන් — 'පහන්' යන්නෙහි 'හ' කාරයට 'ස' කාරාදෙශ වූ යේ යැ. 'පහද' (පැහැදීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'පහද' ධාතුව 'බස්' ආදි ගණ යි, උභයපද යි, අකර්මක යි. (පරස්මෛපදයෙහි) පහදී-පහදිති-පහනී-පහනු. (ආත්මනෙපදයෙහි) පැහැදේ-පැහැදෙති-පැහැදිණි, පැහැදි-පැහැදුණු, පැහැදි. 'කැට පතක් සෙයින් පහන්' යන ආදි තන්හි 'පහන්' සද මේ අර්ථයෙහි යෙදෙයි. කොපුල් තලැ — කපොල තලයෙහි. කපොලය නම් කම්මුල යි. පිළිබිඹු — ප්‍රතිබිම්බය. යම් කිසිවෙකැ රූ සටහනක් තවත් යම් කිසි වස්තුවෙකැ පරාවර්තනය වැ පෙනෙන විටැ ඒ පිළිබිඹු යැ යෙත්. පත් — පැමුණුණු වූ. වර්තමාන ව්‍යවහාරයෙහි මෙ බඳු තන්හි 'වැටුණු වූ' යනු යෙදේ. දිසුණු — ද්විගුණ. එක දෙක වීම ද්විගුණ වීම යි. සවන් — පස් වන විබත් බහුවචන යි. මෙ තන්හි විභක්ති ලොපයෙන් ප්‍රකෘති රූපය ගත. 'සවන්හි' යන අර් යි. තෝඩු — තාඩඞ්කා. වට වූ කර්ණාභරණයෙකි. මද — අනඞ්ගයා ගේ. රූපාදි පඤ්ච කාමයන්හි මිනිසුන් මත් කරවනුයේ අනඞ්ගයා යැ

යෙන්. එ හෙයින් හේ මෙ නමින් ගන්නා ලද. 'රිය සක් සතර එව් ලෙසින් — රථ චක්‍ර සතරට බඳු වූ ආකාරයෙන්. ලේ සේ අළු කිව ද. එව් - ලෙසින් - යන දෙක මැ එක් තන්හි යෙදූ සේ නො මැනැවි. එළි වැට බැඳිම මැ පමණැ යි සිතන්නන් ගේ නො කටයුත්තක් බැලූව මැනැවි.

ප්‍රභාවතිය ගේ දෙ කන්හි රන් තෝඩු යුවලෙක් වෙයි. ඇගේ කොපුල් තල අතිශයින් ප්‍රසන්න යැ. එ හෙයින් රන් තෝඩු යුවලෙහි පිළිබිඹු කොපුලත්හි පෙනෙයි. එ විටැ ඒ රන් තෝඩු යුවල ද්විගුණ වැ සතරක් මෙන් දිසෙයි. එය කුමක් වැනි ද? අනඞ්ගයා ගේ රථයෙහි චක්‍ර සතර වැනි යැ.

අනඞ්ගයා ගේ රථයෙහි රෝද සතර පෙනේ නම් ඒ ඔහු එන බවට නිසැක ලකුණෙකි. හේ පැමිණෙන්නේ මැ මිනිසුන් ගේ සිත්හි කාමය ද උපදවන්නේ යැ. ප්‍රභාවතිය ගේ කන්හි වූ තෝඩු දුටු පමණින් මැ මහත් ආශා උපදවන බව මෙයින් ධ්වනිත යි.

මෙ මැ කියැවිණි, කාව්‍යශෙඛරයෙහි —

"කොපුලැ පිළිබිඹු ප   ත්
දිලුණු වැ පෙනෙන පැහැප   ත්
රන් තෝඩු සවන   ත්
මදන රිය සත් සතර සිරි ග   ත්" — යි.

203. තුන් නෙත කල් දිනු රුසිරැ'ති එ කළු න
තුන් ලොවෙහි මැ කිසි කෙනෙක'න් සරි වන
තුන් වනු වැ මැ නැති යැ යි බඹ ඇඳි මෙ න
තුන් ගිරි රැඳි ගෙල බබලයි හැම දි න

අන්වය: "තුන් නෙත කල් දිනු රුසිරු ඇති එ කළුන සරි වන අන් කිසි කෙනෙක්, තුන් ලොවෙහි මැ, තුන් වැනි වැ මැ, නැති යැ"යි බඹ ඇඳි මෙන, තුන් ගිරි රැඳි ගෙල බබලයි.

විවරණ: තුන්නෙත — නෙත් තුනක් ඇත්තේ යමකු හට ද ඒ තුන්නෙත්. ඊශ්වර දෙවි. මෙ තන්හි සම්බන්ධයෙහි ද්විතීයා යි. කල් — කාන්තාව. ස්ත්‍රිය. ඊශ්වරයා ගේ කාන්තාව නම් උමා යැ. ඕ අතිශය රූපශ්‍රීන් විරාජමාන යැ. දිනු — 'දිනූ' යැ යි වියැ යුතු තන්හි ඡන්දොහෙතුයෙන් 'දිනු' යැ යි

වි යැ. "දිනූ යනු 'දින' (ජය ගැනුම්හි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'දින' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛ පද යි. (කතු කරු) දිනා-දිනති-දිනී-දිනූ. (කම් කරු) දිනේ-දිනෙති-දිනිණි-දිනුණු. තුන් නෙත කල් දිනූ රුසිරු ඇති — ප්‍රභාවතිය ඊශ්වර කාන්තාව (උමා) දිනූ රුසිරු ඇත්තී යැ යි කීමෙන් ඇගේ අතිමනොහර රූපලාවණ්‍යය වර්ණිත යැ. කලුන — 'කලුන්' යි වියැ යුතු තන්හි මෙ සේ සිටියේ එළිය රැකෙනු පිණිස යැ. ප්‍රකෘතිය 'කල්' යනු යි. 'උන්' යනු විභක්ති යි. කල්+උන්. ද්විතීයා බහුවචන යි. සරි වන — සමාන වන්නා වූ. තුන් වැනි වැ මැ — නිරවශෙෂයෙන් නිශ්චය කොටැ මැ. යමෙක් තුන් වැනි වරටත් කියැවිණි ද ඒ නිරවශෙෂයෙන් නිශ්චය කොට කියැවුණේ නම් වෙයි. බඹ ඇඳි මෙන — සකල ලොකය මවන්නේ බ්‍රහ්මයා යැ. එ හෙයින් ප්‍රභාවතිය ද ඔහු ගේ නිර්මාණයෙකි. ඇඳි — 'අඳ' (ඇඳීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'අඳ' ධාතුව 'රක්' ආදි ගණ යි, පරස්මෛ පද යි. (කතු කරු) අඳි-අඳිති-ඇඳි. (කම් කරු) ඇඳේ-ඇඳෙති-ඇඳිණි-ඇඳුණු. තුන් හිරි — හිරි තුන. රූමත් කතුන් ගේ ගෙලෙහි හිරි තුනක් ඇඳි සේ පෙනෙයි. රැඳි — රැඳුණා වූ. ගෙල — ග්‍රීවාව.

ප්‍රභාවතිය උමාව ද දිනූ රුසිරින් යුක්ත යැ. ඇගේ ගෙල හිරි තුනෙකින් අලංකෘත වැ බබළයි. ඒ හිරි තුනින් කිමෙක් ඇඟැවේ ද? "රූපයෙන් මැයට සමාන වූ අන් කිසි ස්ත්‍රියක් සමස්ත ලොකයෙහි මැ නැත්තේ යැ" යි මහා බ්‍රහ්මයා විසින් "පළමු වනු වැ ද දෙවනු වැ ද තුන් වනු වැ ද නැතැ" යි කියා නිශ්චය කළ ලෙසෙක් හැඟැවෙයි.

201\. මල් සර මුදුනතැ සුසැදූ පැහැප ත
ජූල් සසු මල් දම් වන් ඇගෙ කොමළ ත
කැල් මෙන් යුතු වැ මැ පවතින නො නැවැ ත
ඝල් විදු දම් සුවලෙසැ සිරි සර ග ත

විසඳුම් : මල්සර — මල් සර වනුයේ යමක්හු හට ද හේ මල්සර. අනඞ්ගයා. ස්ත්‍රීපුරුෂයන් ගේ සිත්හි කාමය උපදවන අනඞ්ග තෙමේ සවකීය කාර්‍ය්‍ය සඳහා දුන්නක් යොදන්නේ යැ. එය උක් දඬුවෙකි. එහි ජ්‍යාය (ලනුව) බිඟු වැලෙකි. ඒ දුන්නෙහි යෙදෙන සර (ඊ තල) නම් —

"අරවින්දමසෝකඤ්ච චූතඤ්ච නවමල්ලිකා
නීලෝත්පලඤ්ච පඤ්චෙතෙ පඤ්චබාණස්ස සායකා" —

යි කීවැවුණු, නෙළුම් යැ, 'අශෝක යැ, අඹ යැ, සත්පෙති දෑසමන් යැ, නිල් මානෙල් යැ යන මේ යැ. අනඞ්ග මල්සර නම් වනුයේ මෙ හෙයිනි. අනඞ්ගයා නම් කවීන් ගේ නිර්මාණයෙකි. ඔහු ගේ දුන්න ද මල් සර ද කවීන් ගේ මැ නිර්මාණ යි. සිතෙහි උපදනා රාගය කවීහු දෙවියකු කළ හ. ශරීරයක් නැති හෙයින් ගේ 'අනඞ්ග' යි; සිතෙහි උපදනා හෙයින් 'මනසිජ' යැ, 'මන්යොන්' යැ; සිත මත් කරවන හෙයින් 'මදන' යැ; සිත කලඹන හෙයින් 'මන්මථ' යැ; ආශාව වන බැවින් 'කාම' යැ. උන්මාදන යැ තාපන යැ ශොෂණ (වියැළීම) යැ ස්තම්භන (ශරීරය අකර්මණ්‍ය වීම) යැ සම්මොහන (මහත් මුළාවට පැමිණීම) යැ යි රාගය නිසා ඇති වන අවස්ථා පස අනඞ්ගයා ගේ ශර යි. කවීන් විසින් මල් සර පසෙක් මවන ලද්දේ මෙ කී අවස්ථා පස සඳහා යැ. බලවත් රාග උපදිනුයේ වසන්ත ඍතුයෙහි දී යැ. එ හෙයින් වසන්ත අනඞ්ගයා ගේ පරම මිත්‍ර යි. රාගය දල්වන චන්ද්‍ර මන්ද මාරුතාදීහු ද මිත්‍රයෝ යැ. අනඞ්ගයා ගේ ධ්වජය මකරයෙකි (මෝරෙකි.) එ හෙයින් ඔහුට මකරධ්වජ – මීනධ්වජ – මීන් දද–යන ආදී නාමයෝ වෙති. මුඳුනනැ — මල්සරා ගේ මුදුනෙහි. සූසැඳූ — මොනොවට අලංකාර කළා වූ. 'සූසැඳූ' යනු 'සුසද' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. 'සුසද' නම් 'සු' පූර්‍ව 'සද' ධාතුව යි. 'සද' ධාතුව පෙරළු වරනැඟිණ. පුල් — පිපුණු. කොමළත — කොමළ + අත. කොමල වූ හස්තය. 'කොමල' යනු මෘදු, මොළොක්, සුකුමාර, යන අ ඇත්තේ යැ. මෙහි හස්ත අවයව මැ ගැනෙයි. 'විදු දම් සුවළෙකැ' යන්නෙන් එය වඩා ලා මැ පැහැදිලි වෙයි. කැල්මෙන් — කාන්තියෙන්. මෙහි ප්‍රකෘතිය 'කැලුම්' යනු යි. කැලුමෙන් =(මධ්‍යස්වර ලොපය වීමෙන්) කැල්මෙන්. නො නැවැතැ — අඛණ්ඩ වැ නිතොර වැ. හැම කල්හි. විදු දම් නො නැවැතැ කැල්මෙන් යුතු වැ මැ පවතින්නේ නො වේ. අත් එ සේ පවති. එ හෙයින් මෙහි ගත මනා නිරතුරු කැල්ම ඇති විදු දම් යැ මෙහි 'නැවැතැ' යනු 'නවත' (නැවැතීමෙහි) ධාතුයෙන් වූ පූර්‍ව ක්‍රියා නිපාත යි. අකර්මක 'නවත' ධාතුව 'රක්' ආදි ගණ යි, පර පද යි. නවත්–නවතිති–නැවැති. දුල් — බබළන්නා වූ. විදු දම් — විද්‍යුද්දාම. විදු ලියෙන් කරන ලද දම්.

ප්‍රභාවතිය ගේ හස්ත ද්වයය විද්‍රුම යුගලයෙකි. කෙබඳු විද්‍රුම යුගලයෙක් ද? අඛණ්ඩ වැ කාන්තියෙන් යුක්ත වැ පවතින්නා වූ විද්‍රුම යුගලයෙකි. ඒ හස්ත ද්වයය යළි කෙබඳු ද? අනඞ්ගයා ස්වකීය මස්තකයෙහි පැළැඳැ ගත්තා වූ පැහැ පත් වූ පිපුණු වූ සපු මල් දම් යුවළක් බඳු යැ. ඒ යුවළත දුටුවවුන් ගේ සිත්හි බලවත් රාග උපදනා හෙයින් රාග උපදවන අනඞ්ගයා ගේ මුදුනෙහි පැළැඳි මල් දම් වැන්නැ යි කී හ. අත් රන් වන් හෙයින් රන් වන් සපු මල් මැ ගැනිණ.

මේ පද්‍යය කාව්‍යශෙඛරයෙහි –

“මලවි දෙව් මුදුන ත
සපු මල් දමෙව් පැහැ ප ත
ඇගෙ යුවළ මොලොක ත
නිතොර දිසි විදු දමෙක සිරි ග ත”

යන පද්‍යයා ගේ ප්‍රතිබිම්බයෙකි.

205. ම ද ගජ කුඹු විලසින් දිසි හැම ස ඳ
ළ ඳ තුල් නව මිණි හර බඳ පැහැ න ඳ
සොඳ තුඟු පියොවුරු යුග රන් හුය බ ඳ
ම ද රද අබිසෙව රන් කුඹු සිරි ල ද

**අන්වය:** මද ගජ කුඹු විලසින් හැම සඳැ දිසි, ළඳ, තුල්, නව මිණි හර බඳ, පැහැ නඳ, සොඳ, තුඟු, පියොවුරු යුග, මද රද රන් හුය බඳ, අබිසෙව් රන් කුඹු සිරි ලද.

**විසපණ්:** මද ගජ කුඹු — හස්ති කුම්භයෝ විශාලය හ. මත්ත හස්තියා දර්පිත වැ සිටුනා හෙයින් මෙහි මද ගජ කුඹු ගැනිණ. පයොධරයන් ගේ මහත් බව ද දැඩි බව ද හඟවන පිණිස යැ. තුල් — විශාල වූ. නව මිණි හර බඳ — නව විධ මණියෙන් කළා වූ හාරයෙකින් (දැමයෙකින්) බඳනා ලද. හර බැඳෙනුයේ ගෙලෙහි යැ. එහෙත් වැටෙනුයේ පයොධර මත්තෙහි යැ. එ හෙයින් මෙ සේ කියති. පැහැ නඳ — ප්‍රභායෙන් නද්ධ (වැසුණු) වූ. තුඟු — උස් වූ. රන් හුය බඳ — ස්වර්ණ සූත්‍රයෙකින් (රනින් කළ නූලෙකින්) බඳනා ලද. ‘රන් කුඹු’ යන්නට විශේෂණ යි. මද රද — අනඞ්ගයා ගේ.

අබිසෙව් — අභිෂේකයෙහි. අභිෂේකයෙහි රන් කුඹු ගැනේ. ඒ වටා රන් හුයෙක් බැඳේ. රන් කුඹු — ස්වර්ණ කුම්භයෙහි. රන් කලයෙහි. සිරි — ශෝභාව. ආකාරය. ලද — ලද්දේ යැ.

ප්‍රභාවතිය ගේ පියොවුරු යුග තුනු යැ, සොඳ යැ, පැහැයෙන් නද යැ, නව මිණි හරින් බඳනා ලද්දේ යැ, තුල් යැ. එය හැම කල්හි මිද ගජ කුඹු විලසින් දිසෙයි. එ බඳු වූ ඒ පියොවුරු යුග (යළි) කෙ බඳු ද? අනඩගයා ගේ අභිෂේකයෙහි ස්වර්ණ සූත්‍රයෙන් බඳනා ලද ස්වර්ණ කුම්භ (යුගලයක්) බඳු යැ. පයොධරයන් මිණි හරින් බැඳීම ද අභිෂේකයට ගන්නා ඝටයන් රන් හුයෙකින් බැඳීම ද සිරිති. අනඩගයා ගේ අභිෂේකයට ගැනෙන රන් කුඹු වැනි යැ යි කීමෙන්, අනඩගයා විසින් කළ යුතු කාසියට හෙවත් අශා වර්ධනයට ප්‍රභාවතිය ගේ පයොධරයන් බෙහෙවින් වහල් වන බව හැඟැවෙයි. අභිෂේකය නම් රජ බවට පමුණුවනු පිණිස වොටුනු පලඳවන්නට පළමු හිසෙහි දිය වත් කිරීම යි.

කාව්‍යශෙඛරයෙහි දු මෙ මැ කියැවිණ –

"රුවන් හර මන න          ද
පියොවුරු යුවළ පියබ          ද
වට පට හුයින් බ          ද
බිසෙව් මිණි කළ වැනි මුවරද          ද" — යි.

206. සොබම න්  දෙවඟන මෙන් මෙ ලොවට බට
රු සි රි න්  බබලන එ ළඳ ගෙ නො කිලි ට
ග න ර න්  පෝරුව විලසින් දිසි පි ට
ද න ම න්  තොස වඩවයි දුටු දුටු වි ට

අන්වය : මෙ ලොවට බට සොබමන් දෙව් අඟන මෙන් නො කිලිට රුසිරින් බබලන එ ළද ගෙ ගන රන් පෝරුව විලසින් දිසි පිට, දුටු දුටු විටැ, දන මන් තොස වඩවයි.

විපසණි : බට — බැස්සා වූ. මේ 'බස්' (බැසීමෙහි) ධාතුයෙන් වූ අනිත කෘදන්ත නාම යි. මූල් රූපය 'බටු' යනු යි. අන්ත්‍ය ස්වරය ලොප් වීමෙන් හා එ සේ වූ තන්හි නැවැත 'අ' කාරය වීමෙන් හා 'බට' යනු ලැබේ. නො කිලිට රුසිරෙන්— ඇගේ රූපශ්‍රීයෙහි කිසි ද දෝෂාංශුවක් නැත්තේ

යැ. එ හෙයින් එය 'නෝ කිලිටි' යැ. නො 'කිලිටි' යි වියැ යුතු තන්හි එළි වැට සඳහා මෙ සේ සිටියේ යැ. **පෝරුව** — ලෑල්ල. 'පෝරු' යනු පූවරු = පූ + අරු = පෝරු — යන විසින් සිද්ධ යි. සිංහලයෙහි උ + අ දෙ දෙනාට 'ඕ' යනු වෙයි. 'ඖ' වනුයේ 'අ + උ' දෙ දෙනාට යැ. **දිසි** — පෙනෙන්නා වූ.

**207.** ම න් පිනවන ඇගෙ තුනු තුරු මුඳුන ට
ම න් මද රද සිත සේ මැ නැගිම ට
ව න් වල නැබැ සිටුවමිනි වසා ය ට
තු න් විලි මහ බඹු බැඳි වැනි සැර ප ට

**අන්වය :** තුන් විලි, මන් පිනවන ඇගෙ තුනු තුරු මුඳුනට මන්මද රද සිත සේ මැ නැගීමට, වළ වන් නැබැ වසා යට සිටුවමිනි, මහ බඹු බැඳි සැර පට වැනි.

**විසඳුම් :** **තුන් විලි** — උදරයෙහි වූ රැළි තුන. **තුනු තුරු** — ශරීර නමැති වෘක්ෂයේ. **මන්මද රද** — අනඞ්ග රජයා. මිනිසුන් ගේ සිත් කාමයෙන් කළඹන හෙයින් අනඞ්ග තෙමේ 'මන්මද' (මන්මථ) යන නාමයෙක් ද දන්නා ලැබේ. **වළ වන්** — ආවාටයක් බඳු වූ. නාභියෙහි ගැඹුර සලකා මෙ සේ කියැවෙයි. **වසා යට** — වසා රාජිය නමැති යෂ්ටිය (රිට). වසා රාජිය නම් ළයෙන් පටන් ගෙනැ පහතට විහිදූ ගිය ලොම් පෙළ යි. එයට මෙ තන්හි යෂ්ටියෙක් උපමිත යි. **සිටුවමිනි** — කතීෘ 'මහ බඹු' යනු යි. **සැර පට** — උස් ගසකට නැගීම පහසු වන පිණිස දිග රිටක් ගසට තබා හිණි මං පෙති මෙන් ගසා වටා බැදෙන බැඳුම්.

ප්‍රභාවතිය ගේ තුන් විලි මහ බඹු බැඳි සැර පට වැන්නැ. කුමක් සඳහා කෙ සේ බැඳුණු සැර පට ද? ඇගේ ශරීර නමැති වෘක්ෂ මස්තකයට නැගීම සඳහා නාභිය නමැති වැළෙහි වසා රෙද නමැති රිට සිටුවමින් බැඳුණු සැර පට. කා ගේ නැගීම පිණිස ද? මන්මද රද ගේ නැඟීම පිණිස යැ.

**208.** නි ම ද ගජන් කුඹු තල වන් මන ර : ග
එ ල ඳ ළ පිරු තුඟු තුල් පියොවුරු යු ග
නි බ ඳ 'සුලා වැහැරුණු වන් ඉග සු ග
පැහැද දිළෙසි මද රද මිට දුන් ර ග

**අන්වය :** තිමද ගජන් කුඹු තල වන් මන රඟ ඒ ළද ළ පිරු තුඟු තුල් පියොවුරු යුග නිබද උසුලා වැහැරුණු වන් ඉඟ සුඟ, මද රද මිට දුන් රඟ පැහැදූ, දිළෙයි.

**අර්ථ :** ත්‍රිමද ගලිත හස්තීන් ගේ කුම්භස්ථලය වැනි වූ මනොනුකූල වූ ඒ ස්ත්‍රිය ගේ හෘදයය පුරා සිටියා වූ උස් වූ මහත් වූ පයොධර යුගමය නිරන්තරයෙන් උසුලා (සිටීම කරණ කොට ගෙනැ) කෘශ වූවාක් වැනි වූ කෘශ වූ කටිය, අනඞ්ග රාජයා මිට දුන්නා වූ (මිටට ගත්තා වූ) ආකාරය ප්‍රකාශ'වැ, බබළයි.

මිටින් ගත හැක්කේ සිහින් වස්තුවෙකි. මෘදු වූ වස්තුවෙක් නම් මහත් වුව ද මිටින් ගත් තැන සිහින් වෙයි. ප්‍රභාවතිය ගේ මධ්‍ය ප්‍රදෙශය අනඞ්ගයා විසින් මිටින් (අත මිට මොළවා) ගත් ආකාරය දනුදු පෙනෙයි. ඉඟ එ තරම් සිහින් යැ.

**ටිප්පණි :** **තිමද ගජන්** — තුන් තැනෙකින් මද ගලන්නා වූ හස්තීන්. මේ තුන් ස්ථානය නම් රහසඟ හා දෙ කන් මුල යැ. **කුඹු තල** — කුම්භ තලය. සිත් අලවන්නා වූ කුම්භය. ප්‍රභාවතිය ගේ පයොධරයන් ත්‍රි මද ගලිත හස්ති කුම්භස්ථල වැන්නැ යි කීමෙන් ඒ පයොධරයන් ගේ විශාලත්වය වැනිණ. **ළ පිරු** — හෘදය ප්‍රදෙශය පුරා සිටි. **තුඟු** — උස් වූ. **තුල්** — මහත් වූ. **නිබඳ උසුලා වැහැරුණු වන්** — මත්ත හස්ති කුම්භස්ථල වැනි වූ ද හෘදයය පුරා සිටියා වූ ද උස් වූ ද මහත් වූ ද ඒ පයොධරයන් ඉතා බර වියැ යුතු යැ. එ හෙයින් එය නිරන්තරයෙන් උසුලා සිටීම පහසු කාර්යයෙක් නො වේ. එ තරම් දුෂ්කර වූ ඒ කාර්යය කැරෙන්නේ ඉඟිනි (කටියෙනි.) එ හෙයින් ඉඟ වැරි (කෘශ වී) ගියා වැන්නැ. **ඉඟ සුඟ** — මෙහි 'සුඟ' යනු ඉඟෙහි ඉතා මඳ බව හඟවයි. 'සුඟු' යනු අල්පාර්ථයෙහි නාම පද යි. **මද රඳ** — මද රාජයා. අනඞ්ගයා. මොහු මෙ තැනට ගැනුණේ ඒ ඉඟ දුටු විටැ ද බලවත් ආශාව උපදනා බව හැඟැවීමට යැ. **මිට දුන් රඟ** — මිට දුන්නා වූ ආකාරය. මිටින් ගැනීම මිට දීම යි. අත දුන් යනු අතින් ගත්–අල්ලා ගත්–යන අර්ථය දෙන්නා මෙන්, මෙ ද මේ අර්ථය දෙයි. **දුන්** — 'දෙ' දීමෙහි දයින් වූ අතීත කෘදන්ත නාම යි. 'දෙ' ධාතු 'බස්' ආදී

පර පද යි. (කතෘ කාරු) දේ-දෙති-දිති-දුනු. (කර්ම කාරු) දෙවේ-දෙවෙති-දෙවිණ්-දෙවුණු. පෑහැද — ප්‍රකාශ වැ. පැදී. (ම්ව දුන්) 'රග' යනා මෙහි අනුකත් කතෘ යි.

කාව්‍යශෙඛරයෙහි-

"කරන දන මන ද ග
ගත හැකි මිටින් ඉග සු ග
සපිරි පියොවුරු යු ග
නිබඳ උසුලා වැහැරූ ගිය ර ග"

යනු ද —

"වියොවග මන ර ගා
මද මත් යොවුන් සණු ගා
තුනී කල සස ගා
මිටින් ගත හැකි සිඟිත් වල ගා"

යනු ද, ආදියේ යැ.

209\. ලෙ ව න් නුවන් මින් රළ කෙළි හැම ව ර
යො වු න් ගගෙහි වැලි තල වන් පෑහැ ස ර
දු ව න් පෙදෙස එ ළඳ ගෙ සව් සිරි බ ර
සු ව න් කමින් කළ රිය සක එක'සු ර

අන්වය : ලෙවන් නුවන් මින් රළ හැම වරැ කෙළි, යොවුන් ගගෙහි පැහැ සර වැලි තල වන්, සව් සිරි බර එ ළඳ ගෙ දුවන් පෙදෙස, සුවන් කමින් කළ රිය සක එක් අසුරැ.

අර්ථ : ලොක සත්ත්වයන් ගේ ඇස් නමැති මත්ස්‍ය සමූහයා සියලු කාලයෙහි ක්‍රීඩා කළා වූ, යෞවන නමැති නදියෙහි ප්‍රභාසාර වූ වැලි තලාව වැනි වූ, සකල ශොභා භාර ඇති ඒ කාන්තාව ගේ ජඝන ප්‍රදෙශය (උකුළු පෙදෙස) තෙමේ, සුවණ් කර්මයෙන් කළා වූ රථ චක්‍රය හා එකාකාර යැ.

විසඳුම් : යොවුන් ගගෙහි — ප්‍රභාවතිය ගේ යෞවන භාවය නමැති ගඞ්ගායෙහි. මේ ගඞ්ගායෙහි හැම වරැ කෙළනා මින් රළ වෙයි. ඒ නම් ලොකයා ගේ නෙත්‍ර යැ. සියල්ලෝ ඇය දෙස බලති. දුවන් — ජඝන. උකුළ. සුවන් කමින් — සුවණ් කර්මාන්තයෙන්. එක් අසුරැ — එක බඳු යැ.

ප්‍රභාවතිය ගේ ජඝන ප්‍රදෙශය රන් කම්න් කළා වූ රථ චක්‍රය හා එක බඳු යැ. කුමක් වැනි ජඝන ප්‍රදෙශය ද? ඇය ගේ යෞවන භාවය නමැති ගඟෙහි පැහැ සර වැලි තලාවක් වැනි වූ ජඝන ප්‍රදෙශය.

ස්ත්‍රීන් ගේ උකුළු පෙදෙස වැලි තලාවකට ද රථ චක්‍රයකට ද සමාන කිරීම බොහෝ කවීන් ගෙන් කැරුණේ යැ. කාව්‍යශෙඛරයෙහි —

“සුලකළ මිණි මෙවු ල්
රන සක ලසින් සුවිසු ල්
පුළුලු කුළු මන ක ල්
යොවුන් මිණි ගඟ වැලි තලා තු ල්”

යන පද්‍යයෙහි හා මෙහි හා සමානත්වය සලකන්නේ යැ.

210. ග ජ න ත් රඹ කඳ ජය ගෙනැ තෙවු නා
සි රි ම ත් එ ළඳ ගෙ දෙ වටොර සොබනා
ම ද් ම ත් සලෙල ගජන් බැඳෑ රඳ නා
පැහැ ප ත් රන් වැම් යුවලෙ‘වි දිලෙ නා

අන්වය: ගජන් අත් රඹ කඳ ජය ගෙනැ තෙවුනා සිරිමත් එ ළඳ ගෙ සොබනා දෙ වටොර, මද මත් සලෙළු ගජන් බැඳෑ රඳනා දිලෙනා පැහැපත් රන් වැම් යුවළ එවි.

විසඳුම්: ගජන් අත් — හස්තින් ගේ සොඬ. ඇතා අතෙකින් ගන්නා මෙහෙය සොඬින් ගන්නා හෙයින් එය ද ‘අත්’ නමින් ගැනේ. ‘ඇත්’ සද ලැබෙනුයේ ද මෙසිනි. අත් ඇති යේ ඇත් රඹ — රම්භා. කෙසෙල්. තෙවුනා — ‘තෙවු’ (විරාජමාන වීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. ‘තෙවු’ ධාතුව ‘රක්’ ආදි ගණ යි, පරස්මෛපද යි, අකර්මක යි. තෙවී–තෙවිති–තෙවි. වටොර — වට + උර. වට වූ උර. ‘උරු’ නම් උෟරු (කලවා) යැ. මද මත් — මදයෙන් මත් වූ. තරුණ මද, ආරොග්‍ය මද, ජීවිත මද, ධන මද ආදි විසින් මදය ප්‍රභෙදවත් යැ. මෙහි ප්‍රධාන වශයෙන් ගැනෙනුයේ තරුණ මදය යි. මත් වීමට කාරණ වන හෙයින් මද යැ යෙත්. සලෙළු — කෙළි දෙලෙන් කල් යවන තරුණයෝ සලෙළුවෝ යැ. සලෙළු ගජන් — සලෙළුන්

නාමැති ඇතුන්. යුවලෙව් — යුවල+එව්. යුගලයක් වැනි යැ. මෙහි අවසානයට 'වේ' යනු ආධ්‍යාහාර කැරැ ගත යුතු 'දෙ වටොර රන් ටැම් යුවලැ එව් වේ' යැ යි වාක්‍යය සලකන්නේ යැ

ප්‍රභාවතිය ගේ වට වූ ඌරු දෙක ඇත් සොඬ ද කෙසෙල් කඳ ද ජය ගත්තේ යැ. ඇතුන් ගේ සොඬ වට බවත් මහත් බවත් සැබෑ යැ. එ හෙත් එය සිලුටු නො වේ. කර්කශ භාවයෙන් යුක්ත යැ. ප්‍රභාවතිය ගේ දෙ වටොර වනාහි අතිශයින් සිලුටු යැ, පැහැපත් යැ. කෙසෙල් කඳ වට බවත් මහත් බවත් සිලුටු බවත් සත්‍ය වේ. එ හෙත් එය අනවරතයෙන් මැ ශීතල භාවයෙන් යුක්ත යැ. ප්‍රභාවතිය ගේ ඌරු යුගලය වනාහි ඒ දෝෂයෙන් ද මිදුණේ වේ. එ හෙයින් එය ඇත් සොඬ ද රඹ කඳ ද පැරැද්වී. එ සේ වූ ඒ ඌරු යුගලය (යළි) කුමක් වැනි ද? මදයෙන් මත් වූ සලෙළුවන් නමැති හසතින් බැඳ නවතන්නා වූ ප්‍රභාසම්පන්න සුවර්ණ ස්තම්භ යුගලයක් වැනි යැ. ඇතුන් බැඳෑ ලීමට මහත් ටැඹ අවශ්‍ය වේ. ඒ ඇතුන් මද මත් නම් ටැඹ වඩාලාත් විශාල වියැ යුතු යැ. ප්‍රභාවතිය ගේ වෘත්තෝරු යුග්මය මද මත් ඇතුන් වැනි සල්ලාලයන් බැඳෑ රැඳැවීමට සුදුසු තරම් මහත් යැ. එ පමණෙක් නො වේ. ඒ පැහැ පත් රන් ටැම් යුවළෙකි. ප්‍රභාවතිය ගේ ඌරු දර්ශනය කරන්නා වූ කවර නම් සලෙළුකු වුව ද ටැඹෙක බන් ඇතකු මෙන් රැඳැවෙන බව මෙයින් කියැවිණ.

ඌරුවට හසති ශුණ්ඩාව ද රඹ කඳ ද උපමා කිරීම බෙහෙවින් කැරෙන්නෙකි. කාව්‍යශේඛරයෙහි –

"පැහැසර සිලුටු ම ට
සරි නො වන ඇගෙ වටොර ට
ගජන'ත් ඉදිරි කො ට
සරනු විළි නැති බැවිනි හැම වි ට

"තම ගහනත සු බා
පැරැයූ වටොර මහ බා
සහලා වන ර ඹා
ගජඟු වෙර්නෙ'ව් බිඳති නො ත බා"

යනු ආයේ යැ.

**211.** සියල් රුවින් දිව'සර මෙන් බබළ  න
එකල් බඳුන් යුග දණ මන පිනව  න
විපුල් උතුරු සයුරින් නැගි සසොබ  න
නිමල් බුබුළු යුවළෙ'ව් නො මැ වියැකෙන

**අන්වය :** සියල් රුවින් දිවසර මෙන් බබළන එ කල්-බඳුන මන පිනවන යුග දණ, විපුල් උතුරු සයුරින් නැගි සසොබන නො මැ වියැකෙන නිමල් බුබුළු යුවල එව්.

**විවරණ :** **දිවසර** — (දිව + අසර) දිව්‍ය අප්සරාවක. 'අප්සරස්' යනු කිරි මුහුදින් පහළ වූ රම්භාදි දිව්‍ය ස්ත්‍රීනට නම් ඔහු අප් හෙවත් ජලය මථනය කිරීමෙන් උපන්නාහු යි **කල්බඳුන්** — 'කල්බද' ශබ්දය ගෞරවාර්ථයෙහි අවිනිය බහු-වචන 'උන්' විබත් ගෙනැ සිටි තැනි. 'කල්බද' යනු ස්ත්‍රීපර්‍යාය නාම පදයෙකි. කල් (කල්‍ය) වූ හෙවත් කාන්ත වූ බඳ (දෙහය) වනු යමකට ද ඕ කල්බද. **මන පිනවන** — දුටුවන් ගේ මන පිනවන. **යුග දණ** — ජානු යුග්මය. දණ (ඉස්) දෙක. **උතුරු සයුරින් නැගි** — උත්තර සාගරයෙන් නැඟුණා වූ. මේ උත්තර සාගරය නම් මහ මෙරට උතුරින් පිහිටි සාගරය යි. එය ස්වර්ණ සාගරයෙකි. එයින් නැඟුණු දිය බුබුළෙක් වේ නම්, එය රන් බුබුළෙකි. **වියැකෙන** — 'වියක' (මැකී යැමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'වියක' ධාතුව 'රක්' ආදි ගණ යි, ආත්මනෙපද යි. වියැකේ-වියැකෙති-වියැකිණි, වියැකි- වියැකුණු, වියැකි.

සකල රූපයෙන් දිව්‍යාප්සරාවක මෙන් බබළන්නා වූ ඒ කල්බද ගේ (ප්‍රභාවතිය ගේ) දුටුවන් මන පිනවන්නා වූ ජානු යුග්මය, මහත් වූ ස්වර්ණ සාගරයෙන් නැංගා වූ අතිශයින් ශොභන වූ නො මැ වියැකෙන්නා වූ (දිය) බුබුළු යුවළක් බඳු යැ.

ස්වර්ණ සාගරයෙන් උද්ගත වුව ද බුබුළු නම් වියැකෙන්නේ යැ. ප්‍රභාවතිය ගේ ජානු යුග්මය රන් මෙන් පැහැපත් යැ, නිර්මල යැ, දිය බුබුළු මෙන් පිරී සිටියේ යැ. එ හෙත් ඒ වියැකෙන්නේ නො වේ. එ හෙයින් ඒ රන් මුහුදින් නැඟුණු සසොබන නිමල් බුබුළු යුවළකට ද වඩා මැනැවි.

212. සොබ න රුචින් දිසි එ ළඳ ගෙ මන ර ඟ
දි ලෙ න නිතොර රන මොනරිඳු කර ර ඟ
නොමින පැහැ ති සසිළුවු වූ සුග ද ඟ'
ද කි න සතන් මන නෙත් කරවයි ද ඟ'

අන්වය: සොබන රුචින් දිසි මන රඟ එ ළඳ ගෙ රන මොනරිඳු කර රඟ නිතොර දිලෙන, නොමින පැහැ ඇති සසිළුවු වූ සුග දඟ දකිනා සතන් මන නෙත් දඟ කරවයි.

විසපණි: රන මොනරිඳු — ස්වර්ණ මයූරේන්ද්‍රයකු ගේ. 'මොනරිඳු' යන තන්හි සම්බන්ධාර්ථයෙහි ද්විතියා යි. කර — ග්‍රීවාව. රඟ — ආකාරයෙන්. සසිළුවු — ඉතා සිලුටු. සුග දඟ — ජඞ්ඝා යුගමය. කෙණ්ඩා දෙක. දඟ කරවයි — බද්ධ කරවයි. දඟ කිරීම, නම් අභිමත පරිදි ක්‍රියා කරන්නට අවකාශ නො දී බැඳ තැබීම යි. 'දඟ ගෙයි ලෑම්' ආදියෙන් ඒ බව පැහැදිලි යැ. ප්‍රභාවතිය ගේ ජඞ්ඝා යුගමය දුටු සත්ත්වයන් ගේ සිත් බැඳෙයි. වෙන යමක් ගැනැ සිතන්නට අවකාශ නො ලැබෙයි. ඔවුන් ගේ නෙත් ද බැඳෙයි. වෙන යමක් දකින්නට නො ලැබෙයි.

ජඞ්ඝා මයුර ග්‍රීවාවට සමාන බව කියැවිණි, මයුර සන්දේශයෙහි —

"පසිඳු සිඳුරැ කර සිඳුරැ සි ඳුරැ ම තමා
සොඳුරු සිනිඳු රළුඳුල යුවළ දඟ තමා
උසස පෙදෙස සිහිනැ සි යන අඩුව තමා
මොනර කර යැ සරි නම් යන්තමක් තමා" — යි.

පරෙවි සන්දේශයෙහි —

"එ පුර 'ගනන් තන පිඩු වැනි යොවුනි'ති රි
එ බර 'සුලා හඬනෙව් නද මෙවුල් සි රි
පව ර මොනර කර දඟ වී තම නො ස රි
නිතර කියන වැනි මිණි නූපුර ගිගි රි"

යනු ආයේ යැ.

213. ඉ ඳු නි ල් අබරණ බිඟු දූල් වට ක ල
පැහැ දුල් රනැඟිලි දල පෙළ සල ක ල
ර ජ ක ල් බඳ තිසර'ගන සෙවුම් ක ල
දෙ පතු ල් ඇගෙ රත සර සිරි පල ක ල

**අන්වය :** ඇගෙ දෙ පතුල්, ඉඳුනිල් අබරණ බිගු දැල් වටා කළ පැහැ දුල් රතු ඇඟිලි දල පෙළ සුලකළ රජ කල්-බඳ නිසර අඟන සෙවුම් කළ රත සර සිරි පළ කළ.

**විසඳුම් :** අබරණ — සලඹ නූපුර ආදී පාදාභරණ. **බිගු දැල්** — භෘඞ්ග ජාලයන් විසින්. කර්තෲ සි. **දල පෙළ** — පත්‍ර පඞ්ක්තිය සි. **රජ කල්බඳ** — රාජ කන්‍යාවන් **නිසර අඟන** — හංස ධේනූන් විසින්. **සෙවුම් කළ** — සෙවනය කළා වූ. **රත සර** — රක්ත පද්මයෙකැ. **සිරි** — ආකාරය. **පළ කළ** — ප්‍රකාශ කෙළේ යැ.

ප්‍රභාවතිය ගේ දෙ පතුල රක්ත පද්මයෙකැ ශොභාව පළ කෙළේ යැ ඒ දෙ පතුලෙහි වූ ඉන්‍ද්‍රනීල මණිමය පාදාභරණ ඒ පද්මය වට කළ බිඟු දැල් යැ. බිඟුහු කළු පැහැ ඇත්තෝ යැ. එ හෙයින් වර්‍ණයෙන් ඉන්‍ද්‍රනීල මාණික්‍යයනට සමාන වෙති. බිඟුන් ගේ "ගුමු - ගුමු" නාදය වෙයි. පාදාභරණයන්හි නාදයෙක් වේ යැ. ඒ දෙ පතුලෙහි වූ රතු ඇඟිලි පද්මයෙහි වූ පත්‍ර පඞ්ක්තිය සි. ඇඟිලි රතු බව ඉදුරා කියැවිණ. පද්මයෙහි පත්‍ර ද රතු යැ. ඇඟිලි දික් වෙයි, මෘදු මොළොක් වෙයි. පද්ම පත්‍ර ද දික් යැ, මෘදු මොළොක් යැ. ඒ දෙ පතුල රාජ කන්‍යාවන් විසින් සෙවිත යැ. අන්‍ය රාජ කන්‍යාවෝ ප්‍රභාවතිය ගේ පතුල් වඳිති. පද්මය හංසාඞ්ගනාවන් ÷ විසින් සෙවුනා ලද්දේ යැ. හංසයෝ පද්මයන් මධුපානාදිය පිණිස සෙවිත්.

මෙ මැ කියැවිණි, කාව්‍යශෙඛරයෙහි ද —

"ඇගෙ නිල් මිණිනුදු ල
සලඹින් සරණ සුලක ල
බමර වැට වට ක ල
සුපිපි තඹරන් විලස දුර හ ල" යි.

214. දි මු ත් සු ර ත් ලවනත් පබල'කු රැ
ම හ ත් ගඳැ ත් කුඹු වත් තන ල සි රැ
බ ල ත් ව න ත් එ ළඳ ගෙ තුනු රැසි රැ
ස ක ත් අ න ත් මුත් වත් වෙති කවු රැ

**අන්වය :** සුරත් ලවනත් පබළ අකුරු දිමුත්, මහත් ගඳ ඇත් කුඹුවත් තන ල පිරු, එ ළඳ ගෙ තුනු රුසිරු බලත් වනත්, සකත් අනත් මුත් කවුරු වත් වෙති.

**විසඳුම්:** **ලවනත්**—තොල්. **පබළ අකුරු**—ප්‍රවාලාඞ්කුර. පබළු දළු **බලත්**—බලත හොත්. අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. **වනත්**—වර්ණනා කරතොත්. මෙ ද අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. **සකත්**—ශක්‍රයා ද. සක්+අත්. සක්කක් (ශඞ්ඛයක්) අත්හි වනුයෙන් ශේ 'සකත්' නම්' ඔහුට ඇස් දහසෙකි. එ හෙයින් ඉතිරි නො කැර බැලීමට සමත් යැ. "එ ළඳ ගෙ තුනු රුසිරු බලත් සක් වත් වෙති"යි කියැ වූයේ එ හෙයිනි. **අනත්**—අනන්ත නම් නාගයා. මොහුට මුව දහසෙක් ල. එ හෙයින් ඉතිරි නො කැර කීමට සමත් යැ. "එ ළඳ ගෙ තුනු රුසිරු වනත් අනත් වත් වෙති"යි එ හෙයින් කියැවිණි.

ප්‍රභාවතී කුමරිය ගේ ශරීර රූප ශ්‍රීය නිරීක්ෂණය කරතොත් ශක්‍රයාත් වර්ණනා කරතොත් අනන්තයාත් මිසැ වෙන කවුරු පොහොසත් වෙත් ද? කවුරුත් නො වෙති. ඇය ගේ රූපය දර්ශනවිෂයාතික්‍රාන්ත වර්ණනාවිෂයාතික්‍රාන්ත බව මෙයින් හැඟැවිණ.

**215.** රන් රුව ගෙනැ එ ව ර
එ පුරට පත් ඇමති ව ර
එ රජු ගෙ පොකුණු තෙ ර
එ රන් රුව සිටුවමින් සිටි ව ර

**අන්වය:** එ වර රන් රුව ගෙනැ එ පුරට පත් ඇමති වර එ රජු ගෙ පොකුණු තෙර එ රන් රුව සිටුවමින් සිටි වර-(මතු සම්බන්ධ යි.)

**විසඳුම්:** **එ පුරට**—ඒ සාගල පුරයට. **වර**—උත්තමාර්ථය හඟවන නාම පදයෙකි. **එ රජු ගෙ**—ඒ මද්‍ර රජු ගේ. **වර**—කාලයෙහි.

**216.** රිවි පත පෙර ගිර ට
පබවතිය නහවනුව ට
ගෙනැ රන් රිදී ග ට
දියට එත ළඳ අට දෙනකු තු ට

**අන්වය:** රිවි පෙර ගිරට පත පබවතිය නහවනුවට රන් රිදී ගට ගෙනැ ළඳ අට දෙනකු තුට දියට එත-(මතු සම්බන්ධ යි.)

විසඳුම් : පිවි පෙර ගිරව පත— සූර්යයා පූර්ව පර්වතයට පැමිණි කල්හි. උදය කාලයෙහි සූර්යයා එක් පර්වතයෙකින් නැගෙන්නේ යැ යි ද සවස් වූ විටැ අනෙක් පර්වතයෙකින් බසින්නේ යැ යි ද පුරාතනයෝ සැලැකූ හ. එ හෙයින් නැගෙනහිරි දිශායෙහි වූ පර්වතය පෙරගිර-උදය ගිර-යන ආදි නම්වලින් ද බස්නාහිරි දිශායෙහි වූ පර්වතය අවර ගිර-අත් ගිර- යන ආදි නම්වලින් ද ගත් හ. පත— 'පවුණු' (පැමිණීමෙහි) ධාතුයෙන් වූ අතීත අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. පතු+අ=පත්+අ=පත. නහවනුවට — 'නහ' (නෑමෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය භාවකෘදන්ත නාමය සම්ප්‍රදානාර්ථයෙහි 'අට' විබත් ගෙනැ සිටි තැනි නහවනු+අට. මෙහි 'ව' කාරාගම යි. 'නහ' ධාතුව 'බල' ආදි ගණ යි. පරස්මෛපද යි, අකර්මක යි. නහා-නහති-නැති-නැහු. 'නහ' ධාතුව 'හ' කාර ලොපයෙන් හා සවර්ණ දීර්ඝයෙන් හා 'නා' යැ යි ද සිටී. එ කලැ අතීත රූපය 'නෑ' යනු යි. ගට — කළ. සංස්කෘත පාළි දෙක්හි 'ඝට' යනු සමානාර්ථ යි. එත — කාලාර්ථයෙහි අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. දියට — දිය පිණිස.

217. එ කුමරි හට දිමු ත්
කිරි මවු තනතුරට ප ත්
කුදු වූ ගතිනි යු ත්
මැහැලි අඟන ද ඔවුන් සහ'වු ත්

අන්වය : දිමුත් එ කුමරි හට කිරි මවු තනතුරට පත් කුදු වූ ගතිනි යුත් මැහැලි අඟන ද ඔවුන් සහ අවුත්-(වතු සම්බන්ධ යි.)

විසඳුම් : එ කුමරි — ඒ ප්‍රභාවතී කුමරිය. කිරි මවු — ධනවත් ගෙවලැ දරුවනට කිරි දිම සඳහා බැහැරින් ස්ත්‍රීන් පත් කැරැ ගැනීම සිරිති. දරුවා කිරෙන් ඇරුණ ද කිරි මව ගෙදර මැ රැඳේ. දරුවා රැකැ බලා ගැනීම් ආදිය ද මෙ සෙසින් කිරි මව කෙරෙහි පැවැරේ. සංස්කෘතයෙහි 'ධාත්‍රී' යැ යි කියැවෙනුවෝ මේ කිරි මවුවරු යැ. ඔවුන් — පබවතිය නහවනුවට රන් රිදී ගට ගෙනැ දියට ආ ස්ත්‍රීන්.

218. රන් රුව දුටු ම — නා
පබවති යැ යන සිති — නා
තනි වැ නෙපි මේ තැ — නා
කුමට අවු දැ යි කියා රොසි — නා

**අන්වය :** මනා රන් රුව දුටු පබවති යැ යන සිතිනා “නොපි මෙ තැනා තනි වැ කුමට අවු දැ” යි රොසිනා කියා- (මතු සම්බන්ධ යි.)

**විසඳුම් :** **පබවති යැ යන සිතිනා**— රන් රුව ප්‍රභාවතිය හා එ තරම් රූපයෙන් සමාන වැ සිටි බව මෙයින් පෙනේ. ප්‍රභාවතියගේ කිරි මවට මැ ඇඳිනැ නැතිම බැරි වීමෙන් මෙහි සාම්‍යය වඩා ලා මැ ප්‍රත්‍යක්‍ෂ යැ. **තැනා**— ස්ථානයට. මෙහි ‘ආ’ යනු ජනුස එළි වැට ද රැකෙන පිණිස යැ. සිතින්-රොසින්- යනු ද මෙ සෙයින් මැ සිතිනා-රොසිනා යැ යි වී. **අවු**—ආ + හු, ‘ආ’ යනු ‘එ’ (පැමිණීමෙහි) ධාතුයෙන් වූ මධ්‍යම පුරුෂ අතීත බහුවචන ආඛ්‍යාත පද යි. ආ + හු + ආ + වු = අවු. **රොසිනා** — රොෂයෙන්.

219. තරේ අත ඔ — සු වා
පරුස බැණැ නුසුදු — සු වා
සරි ද මා නැ — සු වා
කියා කන් සක් පිටට ගැ — සු වා

**අන්වය :** අත තරේ ඔසවා, නුසුදුසුවා පරුස බැණැ, “මා නැසුවා සරි ද” කියා, කන් සක් පිටට ගැසුවා.

**විසඳුම්:** **තරේ**—දැඩි ලෙස. **ඔසවා**—‘ඔසව’(එසැවීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. ‘ඔසව’ ධාතුව ‘බල’ ආදි ගණ යි, පරස්මෙපද යි. (කතු කරු) ඔසවා–ඔසවති–එසැවී–එසැවූ. (කම් කරු) එසැවේ–එසැවෙති–එසැවිණි–එසැවුණු. එළියට ‘ඔසුවා’ යැ යි වී. **නුසුදුසුවා** — මෙහි ‘වා’ යනු එළි වැට නිසා, ‘වු’ අධිකයෙකි. **නැසුවා**— ‘නස්’(නැසීමෙහි) ධාතුයෙන් වූ අතීත භාවකෘදන්ත නාමය ‘ආ’ විබත් ගෙනැ සිටි තැනි. නැසූ + ආ =(‘ව’ කාරාගමයෙන් හා හ්‍රස්වයෙන් හා) නැසුවා. **කන් සක් පිටට**—කර්ණ චක්‍රය පිටට. ‘කන් සක්’ නම් කන වටා සිටි ප්‍රදේශය යි. කන වසා පහර ගසන සේ දැනුදු කියති.

ගැසුවා — 'ගස' (ගැසීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය සඳි අර්ථයෙහි 'ආ' ප්‍රත්‍යයය ගෙනැ මෙ සේ සිද්ධ යැ. 'ගස' ධාතුව 'බල' ආදී ගණ යි, පරස්මෛපද ධාතු යි. ගසා-ගසති-ගැසී-ගැසූ. (කම් කරු) ගැසේ-ගැසෙති-ගැසී-ගැසුණු.

220\. නො දුනැ ඇතී සේ දී
රන් රුවට පහරක් දී
නො මඳ වැ අත රි දී
මෙ සේ පවසයි මැහැලි එ කු දී

අන්වය: ඇති සේදී නො දුනැ රන් රුවට පහරක් දී, අත නො මඳ වැ රිදී, මැහැලි එ කුදී මෙ සේ පවසයි.

විසඳුම් : සේදී — තාන්තවය. අලගියවන්න මුකවෙටි තුමන් මේ දෙමලෙන් ගත් හ යි සිතේ. දෙමලෙහි 'සෙයිදි' යනු වෙයි. රිදී — 'රිද' (රිදීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'රිද' ධාතුව 'රක්' ආදී ගණ යි, ආත්මනෙපද යි. රිදේ-රිදෙති-රිදිණි, රිදී- රිදුණු, රිදී.

221\. ම දුව යැ යි සැක කො ට
පහර දී රන් රුවක ට
වෙහෙස ද විය‍ැ අත ට
අහෝ නපුරෙක් වී යැ අද ම ට

අන්වය : ම දුව යැ යි සැක කොට රන් රුවකට පහර දී, අතට වෙහෙස ද වියැ. අද මට නපුරෙක් වී යැ. අහෝ!

විසඳුම් : ම දුව යැ යි — කිරි මවු වරු තමන් කිරි දුන් දරුවනට අවිශෙෂයෙන් මෙ සේ කියති. අහෝ — ඛෙද විස්මයාදියෙහි නිපාත යි. නපුරෙක් — අශුභයෙක්.

222\. කියත ඇය මෙ ලෙස ට
මැති දනෝ බැසැ එළිය ට
වඩමින් සිතැ සතු ට
කරුණු පිළිවිසියෝ නියම කො ට

අන්වය : ඇය මෙ ලෙසට කියත, මැති දනෝ එළියට බැසැ, සිතැ සතුට වඩමින්, කරුණු නියම කොට පිළිවිසියෝ.

**විස්තර :** **මැති දෙනෝ** — කුසාවත් පුරයෙන් රන් රුව ගෙනැ ගිය මනතුනු. **එළියට බැසැ** — රන් රුව පොකුණු තෙරැ සිටුවා ඔවුන් අස් වී සිටි බව මෙයින් හැඟැවෙයි. **සැරැණු** — රන් රුව ඇගේ දුව යැ යි සිතා කුදිය ඊට පහර දෙන්නට කැරුණු. **පිළිවිසියෝ** — 'පුළුවුස්' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය වූ 'පිළිවිසි' යන්නට ප්‍රථමා බහුවචන 'ඕ' විභක්තිය වීමෙන් නිපන. 'ය' කාරාගම යි.

223\. මෙ රන් රුව සරි ව ... නා
කුමරියකුත් ඇද්ද මෙ ... නා
තම අපට තතු ලෙසි ... නා
කිවොත් යෙහෙකැ යි කිවු අයදිම් ... නා

**අන්වය :** මෙ රන් රුව සරි වන වෙන කුමරියකුත් ඇද්ද? තතු ලෙසින මෙ අපට කිවොත් යෙහෙකැ යි අයදිමින කිවූ.

**විස්තර :** **කුමරියකුත්** — කුමරියක් + දු = කුමරියකු + දු = කුමරියකු + ද් = කුමරියකුත්. මෙහි 'දු' නිපාතයෙන්, ඒ මනතුන් මෙබන්දක් ඇසීමට හැකි වෙති යි නො සිතූ බව හැඟැවෙයි. **වෙන** — අන්‍ය වූ. මේ තැනැහි ත්‍රුසුදුසු යැ. වෙන කුමරියක් ඇද්දැ යි ඇසීයැ යුතතේ එක් කුමරියක ඇති කලැ යැ. **ඇද්ද** — ඇත් + ද. **යෙහෙකැ** — යෙහෙක් + යැ = යෙහෙක් + ඇ = යෙහෙකැ. **අයදිමින** — මහත් ගෞරව බහුමාන පූර්වක වැ කථා කළ බව හැඟවීමට මේ යෙදිණ. **කිවු** — කී + හු = කී + වූ = කිවූ. මෙ සේ කීවෝ 'මැති දෙනෝ' යැ.

224\. එ බස'සා එ කා ... ලී
දුරැ'රැ උන් සිතැ කුහු ... ලී
රස තෙපලෙන් බ ... ලී
මෙ සේ පවසයි එ කුදු මැහැ ... ලී

**අන්වය :** එ කලී එ කුදු මැහැලී එ බස් අසා, උන් සිතැ කුහුලී දුරැ හැරැ, බලී රස තෙපලෙන් මෙ සේ පවසයි.

**විස්තර :** **එ කලී** — 'කලැ' යි වියැ යුතු. විකෘතිය එළිය සදහා යැ. **එ බස්** — ඒ මනතුන් කී වචනය. **උන්** — ඒ මනතුන් ගේ. සම්බන්ධ යි. **කුහුලී** — කුතුහලය. දැනීමට ආශාව

ප්‍රකෘතිය 'කුහුල්' යනු යැ. බළි — බලවත් වූ මනුෂ්‍යන් ගේ කුතුහලය ඉතා බලවති. මේ රන් රුවට සර් වන කුමරියක් ඇත් නම් දුනැ ගැනීමට ඔවුන් ගේ ආශාව ඉතා මහති. එ හෙයින් මේ දැඩි කුහුල විනෝදය කිරීමට බලවත් කරුණු අවශ්‍ය යැ. කුදිය සැරැසූයේ එ බඳු බලවත් කරුණු කිමට යැ. ඇය ගේ බස් මැතිනට මහත් රසයෙන් යුතු යැ. රස — රන් රුවට සමාන වන්නා වූ කුමරියක් ඇතැ යි අසන්නට ලැබෙතොත් ඒ ඉතා රසවත් වනු දුදුම් නො වේ.

225. පරසිඳු මෙ මිහි ත ල
මදු රටැ මෙ පුරැ සාග ල
මදු රදුට බෝ බ ල
දුවක් ඇත පබවති නමින් දු ල

අන්වය : මෙ මිහි තලැ පරසිදු මදු රටැ, මෙ සාගල පුරැ, බල බෝ මදු රදුට, පබවති නමින් දුල දුවක් ඇත.

විසඳුම් : බල බෝ — බලය බොහෝ වූ. බොහෝ බලවත් වූ.

226. සිවු රියන් ගෙය කු ස
වැදූ ඉඳින සඳැ එ දිගැ ස
දුරැ වෙයි අඳුරැ රැ ස
මිණි පහන් ගණනක් නැඟු ලෙ ස

අන්වය : එ දිගැස සිවු රියන් ගෙය කුසැ වැදූ ඉඳින සදැ, මිණි පහන් ගණනක් නැඟු ලෙස, අඳුරු රැස දුරු වෙයි.

විසඳුම් : එ දිගැසැ — ප්‍රභාවති නම් වූ ඒ දීර්ඝාක්ෂිය. සිවු රියන් — සතර රියන්. වඩු රියනින් සතරක් දිගු පුළුල ඇති. රියනක් ද මිටි රියනක් ද එක් වූ කලැ වඩු රියනෙකි. යාරයකට ඉංචි සතරක් පමණ අඩු යැ. කුසැ — කුක්ෂියෙහි. 'කුස්' යනු 'ඇතුල' යන අර්ථයෙහි නාම පද යි. වැදූ — ප්‍රවෙශ වැ. ඇතුළු වැ. මිණි පහන් — මාණික්‍ය ප්‍රදීප. මැණික් පහන සාමාන්‍ය පහනකට වඩා ආලෝකවත් යැ. ඒ මැණික් පහන් කීපයක් මැ දැල්වූව හොත් ආලෝකය වඩා ලා මැ අධික වෙයි.

ප්‍රභාවතිය ගේ ශරීර කාන්තියෙන් මිණි පහන් ගණනක් මැ නැගූ ලෙස සිවු රියන් ගෙය ආලෝක වෙති යි කීමෙන් ඇය ගේ ජවි සම්පත්තිය උත්කර්ෂයෙන් වර්ණිත යි.

**227.** **නිසි දෙ සඳුන් සුව ද**
**නික්මෙයි ඇඟින් මන න ද**
**මහනෙල් මල් සුව ද**
**පිටත් වෙයි ඇගෙ මුව ගැබින් සො ද**

**අන්වය :** ඇගෙ මන නද ඇඟින්, නිසි දෙ සඳුන් සුවද නික්මෙයි. (ඇගෙ) සොඳ මුව ගැබින් මහනෙල් මල් සුවද පිටත් වෙයි.

**විසඳුම්:** **මන නඳ ඇඟින්** — ඒ ප්‍රභාවතිය ගේ මනෝනන්දනීය වූ ශරීරයෙන්, 'ඇඟින්' යන තන්හි 'ඇඟ' ශබ්දය යි. අවධි අර්ථයෙහි තුන් වන විබත් ගෙනැ 'ඇඟින්' යි සිටියේ යැ. **නිසි** — මනා. **දෙ සඳුන්** — රත් සඳුන් සුදු සඳුන් යන දෙක. **ගැබින්** — ගර්භයෙන්. 'ගබ' යනු ද 'ඇතුළ' යන අර්ථය දෙන නාම පදයෙකි. තුන් වන විබත් ගෙනැ 'ගැබින්' යි සිටැ ගත. තුන් වන පස් වන විබත් ගන්නා කලැ ඇතැම් ශබ්දයන් ගේ ස්වරයෝ අන්‍යත්‍ව භාවයට යෙති. කම්, (කැමින්-කැමෙහි-) දහම්, (දැහැමින්-දැහැමෙහි-) බව්, (බැවින්-බැවෙහි-) රුක්, (රිකින්-රිකෙහි-) මුව, (මියෙන්-මියෙහි-) යනාදිය මේ ශබ්ද ගණයට අයත් යැ.

**228.** **එ කුමරි වසන තැ න**
**රජ කුමරියනැ'තත් වෙ න**
**නො මැ දිලෙත් රුසිරි න**
**දිනිඳු අබියෙසැ ලූ පහන් මෙ න**

**අන්වය :** එ කුමරි වසන තැනැ වෙන රජ කුමරියන් ඇතත්, දිනිඳු අබියෙසැ ලූ පහන් මෙන, රුසිරින නො මැ දිලෙත්.

**විසඳුම් :** **දිනිඳු** — දිනේන්ද්‍රයා. සූර්යයා. දවසට (දිනට) ඉන්ද්‍ර (අධිපති) වේ නු යි දිනිඳු. මෙ තන්හි සම්බන්ධාර්ථ යි. **අබියෙසැ** — අභිමුඛයෙහි. **ලූ** — තුබූ. මෙහි තිබීම නම් පහන් දල්වා තිබීම යි. **දිලෙත්** — මෙහි උක්තය 'ඔහු' යනු යැ. ඒ අධ්‍යාහාර යි. 'ඔහු' නම් වෙන රජ කුමරියෝ යැ.

සූර්යයා අභිමුඛයෙහි කොතරම් පහන් ගණනක් දල්වූව ද, ඒ පහන් කොතරම් ආලෝකවත් වූව ද, ඒ සියල්ල එහා මැ නිෂ්ප්‍රභ භාවයට යෙයි. එ මෙන් මැ, රූපයෙන් කොතරම් අග්‍ර වූ රූප කන්‍යාවක වූව ද ප්‍රභාවතිය ගේ අබියෙසට පැමිණි වූ කල්හි (ඒ ප්‍රභාවතිය ගේ ඉතා මහත් රූපශ්‍රිය කරණ කොටැ ගෙනැ) විරූප භාවයට යෙයි. ප්‍රභාවතිය ගේ රූප ලාවණ්‍යය මෙයින් අතිශයොක්තියෙන් වැනිණ.

229. මෙ කනා රුව සුම ට
රැගෙනැ ගිය හොත් ඇ වෙත ට
සරි කල සුරඹක ට
වැදිරියක සේ සිතෙයි මෙ නොප ට

අන්වය : සුමට මෙ කනා රුව ඇ වෙතට රැගෙනැ ගිය හොත්, සුර අඹකට සරි කළ වැඳිරියක සේ, මෙ නොපට සිතෙයි.

විපසණි : සුමට — සුමෘෂට. ඉතා මට්ටම් වූ. සුරඹකට— දිව්‍ය ස්ත්‍රියකට. සුර + අඹු = සුරඹු. සරි කල — සමාන කළා වූ. සුරඹක හා වැඳිරියක හා රූපයෙන් කිසි ද සාම්‍යයෙක් නැත. ඇත්තේ නම් දෙ දෙනා මැ ස්ත්‍රී ජාති වීම යි. අත් පා කන් නාසාදිය ඇත ද ඒ අතිශයින් වෙනස් යැ. සුරඹක් වනාහි අතිරමණීය රූප ශොභායෙන් යුක්ත යැ. වැඳිරියක් වනාහි ඉතා විරූප වෙයි. මේ රන් රුව ප්‍රභාවතිය වෙතට ගෙන ගිය හොත් සුරඹක වෙතට ගෙනැ ගියා වූ වැඳිරියක හා සම වෙයි. මෙයින් ද ප්‍රභාවතිය ගේ රූපය උත්කර්ෂයෙන් වැනිණ.

230 තරු පිරිවරන ල ද
සරා සඳ මඬලක් ලෙ ද
පිරිවර ලියන් මැ ද
දිලෙයි පබවත් නමැති රජ ල ද

අන්වය : පබවත් නම් ඇති රජ ළඳ, තරු පිරිවරන ලද සරා සඳ මඬලක් ලෙද, පිරිවර ලියන් මැද දිළෙයි.

විපසණි : තරු පිරිවරන ලද සරා සඳ මඬලක් ලෙද— (70 වැනි පද්‍යය ද බලන්නේ යැ.) චන්ද්‍රයා තාරකාවන් ගෙන් පරිවෘත වූයේ විශෙෂ ශොභාවක් උසුලයි. තාරකාවලින් ලැබෙන එළියෙහි ද චන්ද්‍රයා ගෙන් ලැබෙන එළියෙහි ද

මහත් ශෝභාස ප්‍රත්‍යක්ෂ වැ පෙනෙන හෙයිනි. ශරදෘතුයෙහි අහසෙහි වලාකුළු නැති හෙයින් චක්‍ෂුරාලෝකය අසම්බාධ වැ පැතිරෙයි. එ හෙයින් මෙහි සරා සඳ මඬල මැ ගැනිණ. ප්‍රභාවත් නමැති චන්‍ද්‍ර මණ්ඩලය පිරිවරා සිටි තරු නම් පරිවාර සත්‍රිහු යැ.

**231.** **පබවත රුව පබ ද**
**ඇමැතියන් හට කී ස ද**
**වඩවමිනි සිතු ඔ ද**
**සිසි කිරණ වන් කිරි සයුර ලෙ ද**

**අන්වය :** පබවත පබද රුව ඇමැතියන් හට කී සදැ, සිසි කිරණ වන් කිරි සයුර ලෙද, සිතු ඔද වඩවමිනී- (මතු සම්බන්ධ යි.)

**විසඳුම් :** **පබවත** — සම්බන්ධාර්ථ යි. **පබද** — ප්‍රබන්ධ වූ. අබණ්ඩ වූ. **කී** — මෙහි කර්තෘ පදය 'ඇය' යි අධ්‍යාහාර්ය යි. එ ද, 228 වන පද්‍යයෙහි එන 'එ කුදු මැහැලී' යන්න හා සම්බන්ධ කොට සලකන්නේ යැ. **සිසි කිරණ වන් කිරි සයුර** — 36 වන පද්‍යයට ලියූ විසඳුම්ය බැලියැ යුතු. සාමාන්‍ය මුහුදෙහි දු චන්‍ද්‍රයා ගෙන් ඔද වැඩෙයි. කිරි මුහුදෙහි විශෙෂයෙන් මැ වැඩෙයි. **ඔද** — ඔජස. 'මහත් සතුට' යන අර්ථ යි. **වඩවමිනි** — මෙහි කර්තෘ පදය 'උන්' යි අධ්‍යාහාර්ය යි. එ ද 'ඇමතියන්' යනු හා සබඳි.

**232.** **රන් රුව ගෙනැ සුම ට**
**වදිමින් රජ විමනත ට**
**තම සිටි තතු රජු ට**
**කියන ලෙස කිවු අග මැතිඳු හ ට**

**අන්වය :** සුමට රන් රුව ගෙනැ රජ විමනතට වදිමින්, තම සිටි තතු රජුට කියන ලෙස අග මැතිඳු හට කිවු.

**විසඳුම් :** **රජ විමනතට** — මද්‍ර රජු ගේ මාළිගයට. **වදිමින්** — පූර්ව ක්‍රියාර්ථ යි. **තම** — ද්විතියා බහුවචන යි. විභක්ති ලොපයෙන් ප්‍රකෘති රූපයෙන් සිටි තැනි. **තම සිටි තතු** — තමන් සිටියා වූ තත්ත්වය. **රජුට** — මද්‍ර රජුට. **අග මැතිඳු** — මද්‍ර රජු ගේ අග මැතිඳු. **කිවු** — උක්ත කර්තෘ පදය 'ඔහු' යි අධ්‍යාහාර්ය යි. ඔහු නම් රන් රුව ගෙනැ ගිය ඇමැතියෝ යැ.

233. එ මැනිඳු ගොස් ඒ වි ට
නම කෙරෙමින් නිරිඳු හ ට
මුදුනැඳිලි බැඳැ සි ට
එ තතු සැල කළ සඳෙහි නිසි කො ට

අන්වය : එ විටැ එ මැනිඳු ගොස්, නිරිඳු හට නම කෙරෙමින්, මුදුනැ ඇඳිලි බැඳැ සිටැ, එ තතු නිසි කොට සැල කළ සඳෙහි-(මතු සම්බන්ධ යි.)

විසඳුම් : එ මැනිඳු — මද්දු රජු ගේ අග මැනිඳු. නිරිඳු හට — මද්දු රජු හට. මුදුනැ — මස්තකයෙහි. හිසෙහි. ඇඳිලි — එක් කළ දත ඇඳිලි නම් වෙයි. පාළියෙහි ද සංස්කෘතයෙහි ද අඤ්ජලි නමි. මුදුනෙහි ඇඳිලි බැඳීම නම් දෙහොත් මුදුන් දීම යි. එ තතු — රන් රුව ගෙනැ ආ අමාත්‍යයන් කී තොරතුරු.

234. රජු එ තතු අසමි න්
එ ආ මැතියන් අට දෙ න
බුහුමන් වඩවමි න
වෙතට කැඳවමිනි දක්වා ගෙ න

විසඳුම් : බුහුමන් වඩවමින — මේ අමාත්‍යයන් පැමිණියේ ඔක්කාවස් රජු ගෙනි. ඔක්කාවස් නරනිඳු මද්දු රජු හට ද අග රජ වෙයි. බුහුමන් වඩවන ලද්දේ එ හෙයිනි. 'බුහුමන්' නම් බහුමාන යි, මහත් ගෞරව යි. වෙතට — තමා සමීපයට. කැඳවමිනි — 'කැඳ' (කැඳීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය මිශ්‍ර ක්‍රියා නිපාත යි. මෙහි ප්‍රයොජක කර්තෘ 'රජු' යි. ප්‍රයොජ්‍ය කර්තෘ 'අග මැනිඳු' යි. කර්මය 'මැතියන් අට දෙන' යනු යි. දක්වා — මෙ ද ප්‍රයොජ්‍ය පූර්ව ක්‍රියා නිපාත පද යි. මෙහි ධාතුව 'දිස්' යැ. 'දක්' යනු එයට ආදෙශ යි.

235. නිරිඳු ගෙ දෙරණිසු රු
සුව දුක් අසා අනතු රු
මැතියන් අතින් සු රු
ඇසි තම වෙත සැපත් තොරතු රු

අන්වය : දෙරණි ඉසුරු නිරිඳු ගෙ සුව දුක් අසා, අනතුරු සුරු මැතියන් අතින්, තම වෙත සැපත් තොරතුරු ඇසී.

විසඳුම් : දෙරණිසුරු — ධරණීශ්වර. මුළු ලොවට අධිපති. ඔකාවස් රජු මුළු දඹ දිවට අග පත් යැ. මේ ඔහු සලකා කියැවෙයි. අනතුරු — අනන්තර වැ. ඉක්බිති වැ. අතර නො තබා අනතුරු. අව්‍යය සමාස යි. සුරු — ශූර වූ. තම වෙන සැපත් තොරතුරු — තමා සම්පව පැමිණීමේ ප්‍රවෘත්තිය. ඈසි — මදු රද ඇසී යැ.

අනතුරු පද්‍ය ත්‍රයයෙන් කියැවෙනුයේ කුසාවත් පුරයෙන් ආ අමාත්‍යයන් මදු රජුට පිළිතුරු වශයෙන් කී දෑ යැ.

236. දස දහසක් සො දුන්
දඹ දිව් තෙලෙහි නිරි ඳුන්
හැමට මැ පත් මු දුන්
ඔකාවස් නිරිඳුට සුරිඳු දුන්

අන්වය : දස දහසක් සොඳුන් දඹ දිව් තෙලෙහි නිරිඳුන් හැමට මැ මුදුන් පත් ඔකාවස් නිරිඳුට සුරිඳු දුන්- (මතු සම්බන්ධ යි.)

විසඳුම් : දස දහසක් සොඳුන් දඹ දිව් තලෙහි — ජම්බූ ද්වීපය සොඳුන් දස දහසෙකැ යි පුරාතනයන් විසින් සලකන ලද. නිරිඳුන් හැමට මැ මුදුන් පත් — මුදුන් පැමිණීම නම් ප්‍රධාන වීම යි. මුදුන ඉහළ මැ ස්ථානය යි. එයට වඩා ප්‍රධාන ස්ථානයෙක් නැති. ඔකාවස් රජ මුළු දඹ දිවැ සියලු රජුනට අග රජ වෙයි. මේ එය කී සැටි යැ. සුරිඳු දුන් — කුස කුමරු ගේ උත්පත්තිය සම්බන්ධයෙන් 128 වන පද්‍යයේ සිට 145 වන පද්‍යය තෙක් කියැවුණු කරුණු සලකන්නේ යැ.

227. සව් සිප් මහ සයු ර
දුටු නැණ නැවින් පර තෙ ර
යුතු වූ කෙසර ස ර
කුස කුමරු යන නමින් පුවත ර

අන්වය : සව් සිප් මහ සයුරු පර තෙර නැණ නැවින් දුටු, කෙසර සර යුතු වූ, කුස කුමරු යන නමින් පුවතර— (මතු සම්බන්ධ යි.)

විසඳුම් : කෙසර සර — සිංහ ස්වරය, සිංහ ස්වරය තරම් අගිත වූත් ගම්භීර වූත් භීෂණ වූත් අනෙක් හඬෙක් සකල සත්ත්ව ලෝකයෙහි නැති. කුස රජු ගේ හඬ එම බඳු යැ. මුළු දඹ දිවිහි පැතිරෙන්නේ වේ. කිසැවිණි මැ නු, ආචාර්ය ගුරුළු ගෝමින් විසින්–

"සතර ශබ්ද කෙනෙක් මුළු දඹ දිවිහි පතල හ. කවර සතර ශබ්දය හ යත් :— පූර්ණ යක් ධනඤ්ජය මහ රජහු හා දූ කෙළැ, දූත අපොලා, 'මම් දිනිම්' සි යම් හඬක් හැඬි ද, සක් දෙව් රජ, කසුබු සම්මා සම්බුදුන් වහන්සේ ගේ සස්න නස්නා කලැ, විස්සම් දෙව් පුත්හු බලු වෙස් ගන්වා, තෙමේ වැදි වෙස් ගෙනැ අවුදු, 'මම් පව්ටි මහණනුද් මෙහෙණනුද් උපාසකයනුද් උපාසිකාවනුද් හැම අධර්මවාදීන් කම්' සි යම් හඬක් හැඬි ද, කුස රජ — ප්‍රභාවතිය සඳහා සත් රජක්හු අවුදු නුවර පිරි කොට වටා ගත් කල්හි, ප්‍රභාවතිය හා සමග ඇත් කදැ හිදැ නුවරින් නික්මැ, සිංහ ස්වරයෙන්, 'අහං කුසො' සි යම් හඬක් හැඬි ද, අළවු යක් කෙලෙස් ගල් මුදුනෙහි සිටැ යම් හඬක් හැඬි ද, එ හැම හඬ මුළු දඹ දිවැ දොරැ දොරැ සිටැ හැඬූ හඬ වැනි වියැ. තුන් දහස් යොදුන් හිමවත් කම්පිත වී"–යැ සි ?

234. පවර එ කුමරු හ ට
ඔබ කුමරි මෙහෙසුන් කො ට
ගැනුමට නියම කො ට
ගෙනැ ආමු රන් රුව පඩුරු කො ට

අන්වය : පවර එ කුමරු හට ඔබ කුමරි මෙහෙසුන් කොට නියම කොට ගැනුමට, රන් රුව පඩුරු කොට ගෙනැ ආමු.

විසඳුම් : ඔබ–සම්බන්ධාර්ථ සි. ආමු–'අපි' යනු ආධ්‍යාහාර්ය උක්ත කර්තෘ සි. මෙහි 'සි' යනු අධ්‍යාහාර කොටැ වාක්‍යය සම්බන්ධ කළ යුතු යැ.

235. අසා උන් කී බ ස්
ලදෙව් අමුතු වැ අබිසෙ ස්
සිතෑ සසුරු සතො ස්
මහත් රජ පෙරහරින් එ දව ස්

අන්වය: උන් කී බස් අසා, අමුතු වැ අබිසෙස් ලද එව් සිතැ සතොස් සපුරා, එ දවස් මහත් රජ පෙරහරින්– (මතු සම්බන්ධ යි.)

විසඳුම් : උන් — කුසාවත් නුවරින් ආ අමාත්‍යයන්. අමුතු වැ අබිසෙස් ලද එව සිතැ සතොස් සපුරා— අභිෂේකය ලද්දවුන් ගේ මහත් සන්තොෂයට හෙතු යැ. අභිෂේකය කැරවුනුයේ රාජ්‍ය ශ්‍රී ප්‍රතිලාභයෙන් සිංහාසනාරූඪ වූ විටැ යැ. කුසාවත් නුවරින් ආ අමාත්‍යයන් කී බස් අසා අමුතුයෙන් අභිෂේකයක් ලැබුණා සේ ප්‍රීති වීමට කවර හේතුවෙක් වී ද? ඔකාවස් රජ මුළු දඹ දිවට අග යැ. තමා ද ඒ රජුට යටත් යැ. නොබෝ කලෙකින් ඔකාවස් රජු ගේ අග රජ පදවිය කුස කුමරුට හිමි වේ. ඉදින් ඔහුට මසිල් වන්නට ලැබුණොත් ඒ කො තරම් මහත් ලාභයෙක් ද? මද්‍ර රජු ගේ ඉතා මහත් සතුටට හේතුව මේ යැ. සිතැ සතොස් සපුරා — සිතෙහි සන්තොෂය මැනැවින් පුරා ගෙනැ. බලවත් සතුටට පත් වූ බව මේ කී සැටි යැ.

240. රන් රුව පඩුරු කො ට
ගෙනැ තමන් කුමරිය හ ට
එ ආ මැතිවරුන ට
නො මඳ සව් සිරි දෙමින් ගරු කො ට

අන්වය : රන් රුව තමන් කුමරිය හට පඩුරු කොට ගෙනැ, එ ආ මැතිවරුනට නො මඳ සව් සිරි දෙමින් ගරු කොට– (මතු සම්බන්ධ යි.)

විසඳුම් : තමන් — සම්බන්ධාර්ථ යි. කුමරිය හට—කුමරිය වෙනුයෙන්. නො මඳ සව් සිරි — බොහෝ වූ සියලු සම්පත්ති. සියලු වූ ගෙහි සම්පත් බෙහෙවින් දුන් බව මෙ සේ කියැවිණි.

241. දඹ දිවට අග ප ත්
ඔකාවස් නරනිඳුට ත්
පඩුරු බැඳැ නන් ව ත්
පිටත් කොළෙ වඩවමින් මෙත් සි ත් .

අන්වය : දඹ දිවට අග පත් ඔකාවස් නරනිඳුටත් නන් වත් පඩුරු බැඳැ, මෙත් සිත් වඩවමින් පිටත් කොළෙ.

විපසණි : නන් වන් — නොයෙක් වසතුන්. පඬුරු බැඳැ — ප්‍රාකෘත වශයෙන් සලසා. කෙලෙ — මදු රජු සඳහා 'හේ' යන උක්ත පදය ආඛ්‍යාතයයි ය. 239 වන පද්‍යයෙහි අසා– සපුරු– යන කෘදන්ත නිපාත පදයනට ද, 240 වන පද්‍යයෙහි දෙමින්– (ගරු) කොට– යන කෘදන්ත නිපාතයනට ද, මෙහි 'බැඳැ' යන්නටද කර්තෘ වනුයේත් හේ මැ යැ.

මදු රජ, කුසාවත් නුවරින් රන් රුව ගෙන ආ අමාත්‍යයනට බොහෝ වූ සත්කාරලෙශ්වයිය දුන්නේ යැ. (ඒ බව 240 වන පද්‍යයෙන් කියැවිණ.) එ පමණක් නො වේ. ඔකාවස් රජුට ද නන් වන් පඬුරු බැඳැ යැවී.

242. නික්මැ වුත් මැති ද න
සිය යොදුන් මග ගෙවමි න
කිසි දුකක් නො වමි න
කුසාවත් පුර පිවිසැ සතොසි න

අන්වය : මැති දන නික්මැ අවුත්, සිය යොදුන් මග ගෙවමින, කිසි දුකක් නො වමින, සතොසින කුසාවත් පුර පිවිසැ– (මතු සම්බන්ධ යි.)

විපසණි : නික්මැ — සාගල පුරයෙන් පිටත් වැ. සිය යොදුන් මග — කුසාවත් පුර සිටැ සාගල නුවරට සිය යොදුනක් ඇති බව මෙයින් හැඟැවෙයි. ගෙවමින — පූර්ව ක්‍රියාව යි. කිසි දුකක් නො වමින — 'සුව සේ' යනු මේ හි සැටි යැ. සතොසින — තමන් ගිය කාර්‍යය ඇජී ප්‍රකාරයෙන් සමෘද්ධ වූ හෙයින් සතොස ඇති වේ මැ යැ.

243. ඔකාවස් නර ව ර
සමගින් අග බිසෝ ව ර
දැකැ වැඳැ කැරැ අද ර
කිවු යැ ආ ගිය කරුණු තොරතු ර

අන්වය : ඔකාවස් නර වර සමගින් අග බිසෝ වර දැකැ, වැඳැ අදර කැරැ, ආ ගිය කරුණු තොරතුරු කිවු යැ.

විපසණි : සමගින් — මේ මෙහි සමුච්චයාර්ථ නිපාතයක් සේ යෙදිණ. කිවු — කී+හු=කී+වු=කිවු. පූර්ව පද්‍යයෙහි ආ '(මැති) දන' යනු මෙහි උක්ත කර්තෘ පදය යි.

244. ඔවුන් කි තෙපුල ට
නරනිඳු වෙමින් සිත තු ට
සෙනඟ පිරිවර කො ට
යන්ට සැරැසී විවා මඟුල ට

අන්වය: නරනිඳු, ඔවුන් කී තෙපුලට සිත තුට වෙමින්, සෙනඟ පිරිවර කොට, විවා මඟුලට යන්ට සැරැසී– (මතු සම්බන්ධ යි.)

විසපණ: ඔවුන් — ඒ අමාත්‍යයන්. තෙපුලට — කරණාර්ථයෙහි සතර වන විබත්ති. මඟුලට — මඟුල් පිණිස. සැරැසී — කර්මකාරක පූර්ව ක්‍රියා නිපාත යි. 'සරස' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කැරු) සරසා- සරසති - සැරැසී - සැරැසූ. (කම් කරු) සැරැසේ - සැරැසෙති - සැරැසිණි - සැරැසුණු.

245. ගොස කරවා පස‘ ඟ
කුඩ කොඩි වසා නුබ ම ඟ
සමඟින් බිසොව අ ඟ
නික්මැ වුත් රජු ගෙවා‘තර ම ඟ

අන්වය: රජු, පසඟ ගොස කරවා, නුබ මඟ කුඩ කොඩි වසා, අඟ බිසොව සමඟින් නික්මැ, අතර මඟ ගෙවා අවුත්– (මතු සම්බන්ධ යි.)

විසපණ: පසඟ — පස් + අඟ. පඤ්චාඞ්ගය. මෙහි කියැවුණේ පඤ්චාඞ්ග තූර්ය යි. නුබ මඟ — ආකාශ මාර්ගය. කුඩ කොඩි — කුඩ-කොඩියෙන්. කරණාර්ථ යි. නුබ මඟ කුඩ කොඩි වසා — අහස ඡත්‍ර ධ්වජ ආදියෙන් වැසීම නම් බොහෝ කුඩ කොඩි එසැවීම යි. බිසොව ද සමඟින් රජු ගමන් කරන හෙයින් ඉතා මහත් ගණනක් කුඩ කොඩි නැගූ බව මේ කී පරිදි යි. නික්මැ — ස්වකීය රාජධානිය වූ කුසාවතී පුරයෙන් නික්මැ. අවුත් — 'එ' (පැමිණීමෙහි) ධාතුව නිසා නිපතිත වූ පූර්ව ක්‍රියා පදයෙකි. මෙහි ප්‍රකෘති රූපය 'අවුදු' යැ. අන්ත්‍ය ස්වර ලොපයෙන් හා අඝොෂාදෙශයෙන් හා එය 'අවුත්' යි වේ.

246. ඉඟ‘තැ සැඩ තල වැ ද
ගොඩ ගලන සමුදුර ලෙ ද
මහ සෙන් සහ නො ම ඳ
එ සාගල පුර වෙතට පත් ස ඳ

අන්වය: (අපරාර්ධය) නො මද මහ සෙන් සහ ඒ සාගල පුර ඉවතට පත් සඳැ- (මතු සම්බන්ධ යි.)

විසපණි: යුගන්තැ — යුග + අන්තැ. යුගාන්තයෙහි. සැඩ නල — චණ්ඩ වූ වාතය. කල්පාන්තයෙහි දී අතිශයින් චණ්ඩ වූ වාතයෙක් හට ගනී ල. මහා සමුද්‍රය එයින් ඇළැලී මසිාද, හෙදය කොට සියලු පොළොව යට කොට ගලන්නේ වේ. සාගල පුරය බලා පිටත් වූණු ඔකාවස් රජු ගේ සෙනඟ කල්පාන්ත මාරුතය වැදී ගොඩ ගමන් ගත් මහා සමුද්‍රය මෙනැ යි කීමෙන් ඒ සෙනායෙහි අති විශාලත්වය ද, තූර්යාදියෙන් කැරුණු මහා ඝෝෂය ද, හැඟැවිණ.

247. මද නරනිඳු එ දි ත
සිවුරඟ සෙනඟ සමඟි ත
පෙර මඟට අවුදි ත
කැඳවමින් සිත සපිරූ අදරි ත

විසපණි: කැඳවමින් — කැඳවනු ලැබූයේ 'ඔකාවස්' රජ යැ. පෙර මඟට — ඉදිරි මාර්ගයට. යම් කිසිවකු තමා සමීපයට එන විටැ එන්නහු පිළිගැනීමට තමා ද මඳක් තැන් ඉදිරියට ගමන් කිරීම, පෙර මඟට යැම යි.

248. රජ විමනතට වැ ද
සුද'තුල මිණි අසුන් මැ ද
වැඩැ හිඳුවා එ ර ද
අදර කැරැ එ නරනිඳු උන් ස ද

අන්වය: (අපරාර්ධයෙහි) එ රද වැඩැ හිඳුවා, එ නරනිඳු අදර කැරැ උන් සඳැ- (මතු සම්බන්ධ යි.)

විසපණි: රජ විමනතට — රාජ මන්දිරයට. සුද'තුල — සුද + අතුල. 'සුද' යනුයෙන් ශ්වේත වස්ත්‍ර ගැනෙයි. වර්තමාන ව්‍යවහාරයෙහි ද "සුද අතුරනවා" "පුටුවෙහි සුදක් එළා" යනා ආදිය යෙදේ. අසුන් මැද — ආසන මධ්‍යයෙහි. එ රද — ඒ ඔකාවස් රජයා. එ නරනිඳු — ඒ මද්‍ර රජු.

249. කිප දිනයක් වැ ස
සිලවති එ බිසෝ නො ස
තම කිම් හට වෙසෙ ස
කිවු යැ පබවත් දකින අදහ ස

**අන්වය :** නිප දිනරැස් මැසැ, නොඅඳ සිලවතී එ බිසෝ, වෙසෙස පබවත් දකිනා අදහස, තම හිමි හට කිවූ යැ.

**විසඳුම්: වැසැ**—වාසය කොට. **වෙසෙස**– විශේෂයෙන්. 'දකිනා' යන්නට විශේෂණ යි. **හිමි හට**—ඔකාවස් රජුට. **කිවු**—ආඛ්‍යාතය බුහු බසින් සිටියේ උක්තය ස්ත්‍රීලිඞ්ග වූ හෙයිනැ.

* **250.** **එ පවත් මඳු රදු ට**
**පවසා යවනා එ මැ වි ට**
**එ ලෙස පබවත් හ ට**
**කියා යැවි නැඳි-මයිල් දකිනා ට**

**අන්වය :** එ මැ විටැ එ පවත් මඳු රදුට පවසා යවනා, එ ලෙස නැඳි-මයිල් දකිනාට පබවත් හට කියා යැවී.

**විසඳුම් : එ පවත්**—ප්‍රභාවතිය දැකීමේ අභිලාෂය ශිලවතී බිසොව ප්‍රකාශ කළ බව. **පවසා යවනා**—කියා යැවූ කල්හි. **යැවි**—'යැවී' යැ යි වියැ යුතු තන්හි හ්‍රස්වය වූයේ ඡන්දොහෙතුයෙනි. 'යැවී' යනු 'යා' (ගමන්හි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය අතීත ආඛ්‍යාත පද යි. යැවූයේ මඳු රද යි.

---

* බොහෝ පිට පත්වලැ 251. වන පද්‍යය ලෙස පෙනෙනුයේ–

"පු පු ල් කජ තුරන් හිසැ නිකුත් රන ලිය ක් සේ
නි ම ල් හස'ගනන් මැදැ කසුන් හස'ගන ක් සේ
ල ක ල් තරු පිරිවරින් ගමන් ගත් සඳ ක් සේ
වි පු ල් කෙණෙර'ගන පිරිවැරු නා ලිය ක් සේ"

යන්න යැ. එ හෙත් මේ නම් ප්‍රක්ෂිප්තයක් බවට සැකයෙක් නැත. අලඞ්කවත්නයත් වැත්තකුට ද නිසුවට හෙතු යැ. අපි මෙසේ වෙයි:—

මනා වැ පිපුණු කල්ප වෘක්ෂයන් ගේ මුදුනෙහි නික්මුණා වූ ස්වර්ණ ලතාවක් මෙන් (ද,) නිර්මල වූ හංසාඞ්ගනාවන් මධ්‍යයෙහි ස්වර්ණ හංසාඞ්ගනාවක සේ (ද,) මනොඥ වූ තාරකා පරිවාරයෙන් ගමන් ගන්නා වූ චන්ද්‍රයකු සේ (ද,) බොහෝ වූ ඇතින්නන් පිරිවැරු ඇතින්නක සේ(ද,)—

'කෙණෙර' යනු හස්තිනී පර්යාය නාමයෙකි. 'නා ලියක්' යන තන්හි 'නා' (නාග) යනු හස්ති පර්යාය යි.

මෙහි 'කජ තුරන් හිසැ නිකුත් රන ලිය' අයුරු වන සේ නො හැඟෙයි. යෙහෙළියෝ ද කිරි මවුවරු ද කජ තුරු මෙන් සමුදු උපමාව නො ගැළැපෙයි. 'සඳක් සේ' යන තන්හි හිනන ලිඞ්ග දොෂය වෙයි. 'අඟනක් සේ' (නා) 'ලියක් සේ' යන දෙ තැන මැ ව්‍යාකරණ විරොධ යැ. උක්ත නුවූ තන්හි ස්ත්‍රීලිඞ්ග ශබ්දයෝ 'අක්' අනත නො වෙති. අඟනක සේ– ලියක සේ– යනු මැ සාධු යි.

251. කනා මිණි බරණ ගෙනැ දරමි තේ යා
නනා සෙහෙළි කිරි මවු සමගි තේ යා
මනා ගුණ පබාවති එ මැ දි තේ යා
පිනා නැඳි මසිල් දුකැ සිටි තැ තේ යා

අන්වය : මනා ගුණ පබාවති, එ මැ දිනේයා, කනා මිණි බරණ ගෙනැ දරමිනේයා, නනා සෙහෙළි කිරි මවු සමගිනේයා, පිනා නැඳි-මසිල් දුකැ සිටි තැනේයා-(මතු සම්බන්ධ යි.)

විසඳුම් : දිනේයා — අන්තයෙහි වූ 'යා' යනු ජනපද ද එළි වැට ද නිසා අධික වැ යෙදුනෙකි. 'දරමිනේයා'-'සමගිනේයා' යන දෙතන්හි 'ඒයා' යනු ද 'තැනේයා' යන්නෙහි 'යා' යනු ද මෙ සේ මැ යැ. කනා — කනක. රන්. දරමිනේයා — 'පැලැඳැ ගෙනැ' යනු අරු ය. නනා — 'නන්' යනු එළි රක්නට 'ආ' ගෙනැ සිටි යේ යැ. සෙහෙළි — 'සහළු' යන්න ස්ත්‍රී-ප්‍රත්‍යයවත් වූ තැනි. මෙ සේ ස්ත්‍රී-ප්‍රත්‍යයවත් වන කලැ ස්වර අනම්‍ය වියැ යුතු යැ. එ හෙත් මෙහි 'අ' යන්නට 'එ' යන්න වී යැ. මහණ-මණවු-යන්නෙන් වූ මෙහෙණ-මෙණෙවි-යනු ද මෙ සෙයින් නිපන. පිනා — සනොතාෂ වැ. නැඳි - මසිල් — කුස කුමරු හා ප්‍රභාවතී කුමරිය හා අතරැ ශරණ බන්ධනය ඒකාන්ත සිද්ධියක් බවට ස්ථිර කැරැ ගන්නා ලද බව මේ යෙදුමෙන් හැඟැවෙයි. 'නැඳි-මසිලන්' යැ යි සිටියැ යුතු තැන්. විශෙෂණ තුවූ තන්හි මෙ සේ ප්‍රකෘති රූපයෙන් සිටිවීම රමණීය නො වෙ. තැනේයා — අවස්ථායෙහි.

252. නැඳි මසිල් එ දෙ දෙ න
පබවත රුසිරු නො මදි න
නරඹා සිය ඇසි න
ඉතා සතුටු වැ සිතූ මෙ ලෙසි න

අන්වය : එ නැඳි මසිල් දෙ දෙන පබවත රුසිරු සිය ඇසින නො මඳින නරඹා, ඉතා සතුටු වැ, මෙ ලෙසින සිතූ.

විසඳුම් : සිය ඇසින නො මඳින නරඹා — ප්‍රභාවතිය අතිමනොහර රූපයෙන් යුක්ත බව ඔකාවස් රජ ද ශීලවතී දෙවිය ද ස්වකීය අමාත්‍යයන් කෙරෙන් අසා දැනැ සිටිය හ. ඒ ප්‍රවෘත්තිය පිළිබඳ සැකයක් නැති වූව ද, එය තමින්

ඇඟිලිමක් පමණෙකි. මේ වාරයෙහි ඒ දෙදෙනා ප්‍රභාවතිය ගේ රූපය සිය ඇසින් මැ නැරැඹූ හ. 'නො මඳින' යනු නැරැඹීමෙහි අඩුපාඩුවක් නො වන ලෙසට නැරැඹූ බව හැඟැවීමට යෙදිණ. **නරඹා** — 'නරඹ' (බැලීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'නරඹ' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) නරඹා–නරඹති–නැරැඹී–නැරැඹූ. (කම් කරු) නැරැඹේ–නැරැඹෙති–නැරැඹිණි–නැරැඹුණු. මෙ **ලෙසින** — මේ මතු කියැවෙන ආකාරයෙන්. **සිතා** — 'සිත' (සිතීමෙහි) ධාතුයෙන් වූ අනිත ආඛ්‍යාත පද යි. 'සිත' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) සිතා–සිතති–සිතී–සිතූ. (කම් කරු) සිතේ–සිතෙති–සිතිණි–සිතුණු.

**253.** විසුළු මුහුණින් යු ත්
අප කුමරු මූ දුටුවො ත්
නො රඳති ඔහු ගෙ වෙ ත්
කුමක් කරමු ද සිතා නැවැතැ ත්

**අන්වය:** "මූ, විසුළු මුහුණින් යුත් අප කුමරු දුටුවොත් ඔහු ගෙ වෙත් නො රඳති. කුමක් කරමු ද ?" සිතා, නැවැතැත්—(මතු සම්බන්ධ යි.)

**විසඳුම්:** මූ — මොහු + මූහු = මූ + උ = මූ. ගෞරව සඳහා බහුවචන යි. 'රඳති' යන ආඛ්‍යාතයෙන් උක්ත යි. **දුටුවොත්** — දුටුව + හොත් = දුටුවො + හොත් = දුටුවො + ඔත් = දුටුවෝත් + දුටුවොත්. **වෙත්** — සමීපයෙහි. අවිකෘත රූපය 'වෙතැ' යි විය යුතු යැ. **කරමු ද** — මෙයින් වාක්‍යය කෙළවර යැ. 'සිතා' යනුයෙන් ඇරැඹෙනුයේ අන්‍ය වාක්‍යයෙකි. **නැවැතැත්** — 'යළි දූ' යනු අර්ථ යි.

**254.** තිසුණු නුවණින් යු ත්
සිලවති නම් රජ ක ත්
උපායක් බලව ත්
සොද විමසා කියයි මෙ සිරි ත්

**අන්වය:** (අපරාධියෙහි) බලවත් උපායක් විමසා සොදා, මෙ සිරිත් කියයි.

**ටිප්පණි:** තිසුණු — තීක්ෂණ. **රජ කත්** — රාජ කාන්තාව. **සිරිත්** — චාරිත්‍රය. එය අනතුරු පද්‍ය ත්‍රයයෙන් කියැවෙයි. **කියයි** — (කියා + යි) උක්තය 'රජ කත්' යනු යැ.

**255. මෙ අප රජ පර පු　　ර**
**පැවැති සිරිතෙකි සිටැ පෙ　　ර**
**සම කුල සුත් පව　　ර**
**කුමරියක කුමරකුට ගත් ව　　ර**

**අන්වය:** මෙ අප රජ පර පුරැ පෙරැ සිටැ පැවැති සිරිතෙකි. කුමරකුට සම කුල සුත් පවර කුමරියක ගත් වරැ — (මතු සම්බන්ධ යි.)

**ටිප්පණි:** **පරපුරැ** — පරම්පරායෙහි. **සිරිතෙකි** — සිරිතෙක් + යි = සිරිතෙක් + ඉ = සිරිතෙකි. 'සිරිතෙක් වේ' යැ යි වාක්‍යය සම්පූර්ණ වෙයි. **සම කුල සුත්**—සමාන කුලය ඇති වූ. **කුමරියක** — ද්විතීයා ඒකවචන යි. 'ගත්' යන්නෙහි කර්මය යි.

**256. එ කුමරි හට සොඳු　　රැ**
**දරැ ගබක් පිහිටන තු　　රැ**
**දහවල් දවස'තු　　රැ**
**එ ළඳ හට නො පෙනෙමින් එ කුමරැ**

**අන්වය:** සොඳුරු එ කුමරි හට දරු ගබක් පිහිටන තුරු, එ කුමරු දහවල් දවස් අතුරු, එ ළද හට නො පෙනෙමින්— (මතු සම්බන්ධ යි.)

**ටිප්පණි:** **සොඳුරැ** — සුන්දර වූ. **දහවල් දවස් අතුරැ**— දවල් කාලය තුළෙහි. **දහවල්** — දව + **කල්**. 'ක' කාරයට 'හ' කාරාදේශ යි. 'ව' කාර 'හ' කාරයන් ගේ විපර්යාසයෙන් 'දහවල්' යැ යි සිටී. **දවස** — මේ මෙහි දිනාර්ථ යි. දවස, දවල් දවස යැ රෑ දවස යැ යි ද්විභේද වේ.

**257. සමහම් වැ රැ දි　　නා**
**රිවි උදයට පළමුයෙ　　නා**
**නැගි යෙයි සහනි　　නා**
**මේ යැ අප කුලැ සිරිත පැවැතෙ　　නා**

**අන්වය:** රැ දිනැ සමහම් වැ, රිවි උදයට පළමුයෙන සහනින නැගී යෙයි. අප කුලැ පැවැතැ එන සිරිත මේ යැ.

විසඳුම් : රෑ දිනෑ — රාත්‍රි දිනයෙහි. සමහම් වෑ — සමාගම වෑ. එක් ඒ. 'සමහම්' යනු 'සමාගම' යන අර්ථ ඇත්තේ ය. 'සමගම්' යන තන්හි 'ග' කාරයට 'හ' කාරාදේශ වීමෙන් නිපනැ යි යෙති. මෙහි සමාගමය කුමර-කුමරියන් ගේ ය. පිළි — සම්බන්ධා යි. උදයට — උදා වීමට. ශේෂ — පූර්ව පද්‍යයෙහි වූ 'කුමර' යනු මෙහි කර්තෘ පදය යි. අප කුලෑ පැවැතෑ එන සිරිත මේ ය — අප ගේ කුලයෙහි පැවැති ගෙනෑ එන්නා වූ චාරිත්‍රය මෙය යි.

258. එ බැවින් මේ සිරි ත
ලෙස පවතිතොත් පබව ත
අසව යි කැරැ නිය ත
කියා යැවුවා මදු නිරිඳු වෙ ත

අන්වය : එ බැවින්, පබවත මේ සිරිත ලෙස පවතිතොත්, නියත කැරැ අසව යි මදු නිරිඳු වෙතැ කියා යැවූවා.

විසඳුම් : එ බැවින් — අප ගේ කුල සිරිත මෙ සේ වන හෙයින්. නියත කැරැ — නිශ්චයය කොට. යැවුවා — 'යා' (ගමන්හි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය අතීත කෘදන්ත නාමය සත්‍යර්ථයෙහි 'ආ' ප්‍රත්‍යයය ගෙනැ සිටියේ ය. මේ වාක්‍යයෙහි උක්තය 254 වන පද්‍යයෙහි එන 'සීලවතී නම් රජ කත්' යන තන්හි වූ 'කත' යනු ය.

259. රජ එ පවත් අ සා
තම දූ සඳුට පව සා
මැනැවැ යි කී නි සා
කී යෑ නැඳි-මසිලනට නො ල සා

විසඳුම් : රජ — මදු රජ. තම දූ සඳුට — ප්‍රභාවතිය හට. මෙහි 'සඳ' යනු උත්තමාර්ථය පිණිස ය. මැනැවැ යි — යහපතැ යි. කී — මෙහි කර්තෘ පබවත සඳහා යෙදෙන 'ඈ' යනු ය. එය මෙහි අධ්‍යාහාර්‍ය යි.

260. එ කෙළුල් අම රසි න
සතුටු සිත් වූ එ දෙ දෙ න
මදු රජු හට පෙම් න
සොඳුරු පිය බස් දෙමින් අම ව න

**අන්වය :** එ තෙපුල් අම රසින සතුටු සිත් වූ එ දෙ දෙන මද්‍ර රජු හට පෙමින අම වන සොඳුරු පිය බස් දෙමින් — (මතු සම්බන්ධ යි.)

**විසඳුම් :** එ තෙපුල් අම රසින — ප්‍රභාවතිය "මැනැවැ" යි කී තෙපල නමැති අමෘත රසයෙන්. ඔවුන් ගේ පරම්පරායෙහි පැවැතැ එන්නා වූ කුල සිරිතෙකැ යි ඔක්කාවස් රජ ද සීලවතී බිසොව ද කියේ බොරුවෙකි. එයට මද්‍ර රජ හෝ ප්‍රභාවතිය හෝ එක් වර මැ රැවටෙති යි ඔහු නො සිතූ හ. එ හෙයින් සැක ද ඇති වියැ. රන් රුවට සමාන වූ රූප ශ්‍රීන් යුත් වූවා, ප්‍රභාවතිය පමණෙකි. ඉදින් යම් හෙයෙකින් මද්‍ර රජ ප්‍රමුඛ පිරිස නො රැවැටුණාහු නම් කුස කුමරුට රාජ්‍යය පැවැරීම දුෂ්කර බව ද ඔහු දත් හ. එ හෙයින් ප්‍රභාවතිය ගේ 'මැනැවැ' යනු ඔවුනට අමෘත රසයෙක් වී යැ. එ දෙ දෙන — ඔක්කාවස් රජු හා සීලවතී බිසොව. අම වන — අමෘතය හා සමාන වූ. මෙ 'බස්' යන්නට විශෙෂණ යි. මෙහි 'අම වන' යනු අර්ථ දෙකක් සදහා යෙදිණ. එකක් නම් ඔක්කාවස් රජු ගේ හා සීලවතී බිසොව ගේ හා ඉතා මහත් සතුට ඇගැවීම යැ. අනෙක නම් තමන් ද ඇතුළු වූ සියලු දඹදිව රජුනට අග්‍ර වන්නට ඉන්නා කුස කුමරුට මයිල් වන්නට ලැබීම මේ පිය බසින් ස්ථිර වූ බව දැනීම නිසා මද්‍ර රජුට ඇති වන ඉතා මහත් සතුට යැ.

261\. පබවත ගෙනැ එ ව ර
කරවා මහත් පෙරහ ර
පිළිවෙළිනි මග'ත ර
ගෙවා ගොස් වැදූ කුසාවත් පු ර

**අන්වය:** එ වර පබවත ගෙනැ, මහත් පෙරහර කරවා, අතර මග පිළිවෙළිනි ගෙවා ගොස්, කුසාවත් පුර වැදූ — (මතු සම්බන්ධ යි.)

**විසඳුම් :** මහත් පෙරහර කරවා — මහත් පිරිවරින් උත්සව පවත්වා. අතර මඟ — අන්තර මාර්ගය. වැදූ — ප්‍රවෙශ වැ.

262. මිනිසුන් සිර ගෙව ලැ
සියොතුන් සහ මැදිරිව ලැ
බැඳි සිවි දම්ව ලැ
මුදා සිවුපා කැලන් එ මැ ක ලැ

**අන්වය:** සිර ගෙවලැ මිනිසුන් මැදිරිවලැ සියොතුන් සහ දම්වලැ බැඳි සිවි සිවුපා කැලන් එ මැ කලැ මුදා—(මතු සම්බන්ධ යි.)

**විසඳුම්:** **මැදිරි**—කූඩු. පාළි සංස්කෘත දෙක්හි 'පඤ්ජර' යනු මේ අර්ථයෙහි වෙයි. **සියොතුන්**—පක්ෂීන්. **දම්වලැ**—දාමයන්හි.

ඔක්කාවස් රජ සහ පිරිස කුසාවත් පුරයට වත් කෙණෙහි මැ කළ දෑ මේ පද්‍යයෙන් කියැවිණි. රජ කෙනකු සරණ පාවා ගැනීම වැනි බන්ධනයකට පැමිණි කලැ, අන්‍යයන් බන්ධනයෙන් මුදා හැරීම පෙර පැවැති සිරිතෙක් වියැ. දැනු දු මෙය නැත්තේ මැ නො වේ.

263. රන් පිදී කල සා
මාරුක් මලින් ගව සා
ලද පස් මල් ඉ සා
දෙ පසැ රන් මිණි තොරණ සර සා

**විසඳුම්:** **කලසා**—අවිකෘත රූපය 'කලස්' යනු යැ. **මාරුක්**—පොල්. **ගවසා**—'ගවස' දයින් වූ පූර්ව ක්‍රියා නිපාත යි. මේ ධාතුව 'බල' ආදි පර පද යි. (කතෘ කරු) ගවසා–ගවසති–ගැවැසි–ගැවැසූ. (කර්ම කරු) ගැවැසේ–ගැවැසෙති–ගැවැසිණි–ගැවැසුණු. අකර්මක 'ගවස' ධාතුව 'රක්' ආදි අත් පද යි. ගැවැසේ–ගැවැසෙති– ගැවැසිණි, ගැවැසි–ගැවැසුණු, ගැවැසි. **ලද පස් මල්**—ලාජ, පස් වනු කොට ඇති මල පස් වගීය. ලාජ නම් විලඳ (වී පොරි) යැ. ඒ පස නම් සමන්, කැකුළු, හී තණ, අබ, සුදු සහල්, විලඳ යන මේ යැ. පුරාතනයෝ මේ හැම මල් කොට සැලැකූ හ. කිසි යම් උත්සව දිනයක් වූ විටැ වීථි මණ්ඩප ආදිය සැරසීමෙහි දී මේ ලද පස් මල් ඉසීම සිරිතක් වැ පැවැත්තේ යැ. **ඉසා**—'ඉසැ' යන්න මේ විකෘතියට භාජන වූයේ එළිය හෙයිනි. **දෙ පසැ**—රජ මාළිගයට ප්‍රවේශ වන්නා වූ රාජ මාර්ගයෙහි දෙ පසැ. **රන් මිණි තොරණ**—රතින් හා මිණියෙන් හා කළ තොරණ.

264. සුර පුරයක් ලෙ සා
තමන් පුර වර සර සා
කරවා තුරු ඝො සා
රජ විමන් වැදූ සෙමින් සතො සා

අන්වය: සුර පුරයක් ලෙසා තමන් පුර වර සරසා, තුරු ඝොසා කරවා, සතොසා වෙමින් රජ විමන් වැදූ- (මතු සම්බන්ධ යි.)

විසඳුම්: තුරු ඝොසා — තුරු ඝොෂය. මෙහි තුරු නම් පඤ්ච තූර්ය යි. 'ඝොසා' යන තන්හි වියැ යුතු අවිකෘත රූපය 'ඝොස' යනු යැ.

265. කුස කුමරුට පව ර
විවා මඟුල ද සිදූ කැ ර
මැතින් සෙන් රැස් කැ ර
බාර කළ රජ ඉසුරු එ නුව ර

අන්වය: කුස කුමරුට පවර විවා මඟුල ද සිදු කැර, මැතින් සෙන් රැස් කැර, එ නුවර රජ ඉසුරු බාර කළ.

විසඳුම්: විවා මඟුල — විවාහ මඞ්ගල්‍යය. පුරුෂයකුට ස්ත්‍රියක ගෙනැ ඊම ආවාහ නම්. විවාහ නම් ස්ත්‍රියක පුරුෂයකු ගේ කුලයට යැවීම යි. මෙ තන්හි 'විවා' යනු අවිශෙෂයෙන් යෙදිණ. මැතින් සෙන් රැස් කැර — කුසාවත් නුවරෙහි රාජෛශ්වර්‍ය්‍යය කුස කුමරුට බාර දීමට පෙරැ එ රට මන්ත්‍රීන් ද මහා ජනයා ද රැස් කැරුණහ යි කීමෙන්, ඒ ජන සම්මත රාජ්‍යයක් බව පෙනේ. කළ — 'කර' ධාතුයෙන් වූ අතීත ආඛ්‍යාත පද යි. මේ දෙ බස්හි මැ සාධාරණ රූප යි. මෙ තන්හි බුහු බසි. මෙයින් උක්ත වනුයේ 260 වන පද්‍යයේ එන 'එ දෙ දෙනා' යන්න යි.

266. මවු සඳ නිසොවි නි
දහවල් දවසැ නො පෙ නි
පබවත සමහි නි
විදි සිරි රති මදන ලෙසි නි

අන්වය: (සතර වන පාදයෙහි) රති (සමඟිනි) මදන ලෙසිනි සිරි විඳි.

විසඳුම්: මමු සඳ — සිලවනි බිසොව ගේ නියොවිනි— නියෝගයෙන්. නියෝ + ඉන් = ('ව'කාරාගමයෙන් හා ගුණයෙන් හා) නියොවින්. රති මදන ලෙසිනි — "රති සමගිනි මදන ලෙසිනි" යි වාක්‍යය පූරවා ගත යුතු. "පබවත සමගිනි" යන තැනින් 'සමගිනි' යනු එයි. "රතිය සමගින් අනඞ්ගයා සිරි විඳිනා ලෙසින් සිරි විඳි" යැ යි අර්ථ ගත යුතු. 'රති' නම් අනඞ්ග භාර්‍යාව යි. සිරි — සම්පත්තිය. විඳි — උක්තය 'කුස රජ' යනු යි. එය මෙ තන්හි සිතා ගත යුතු. අධ්‍යාහාරයට සුදුසු තැනෙක් නො වේ.

267. නික්මෙන කැලුම් ක ඳ
පබවත වුවනතින් සො ඳ
මහිමෙන් එ රජ තෙ ද
අදිසි වෙසි රිවි දුටු කදෙ‍්‍යා ලෙ ද

අන්වය: පබවත සොඳ වුවනතින් නික්මෙන් කැලුම් කඳ, එ රජ තෙද මහිමෙන්, රිවි දුටු කද්‍යෝ ලෙද, අදිසි වෙසි.

විසඳුම්: පබවත — සම්බන්ධ යි. කැලුම් කඳ — කාන්ති ස්කන්ධය. ආලොක සමූහය. මේ සම්බන්ධයෙන් 226 වන පද්‍යය කියවා බලන්නේ යැ. එ රජ — ඒ කුස රාජයා ගේ. තෙද මහිමෙන් — තෙජෝනුභාවයෙන්. රිවි දුටු කදෙ‍්‍යා ලෙද — 'කද්‍යෝ' නම් ඛද්‍යෝතයා (කණාමැදිරියා) යැ. උහු ගේ යම් තම් ආලොක මාත්‍රයක් ඇති බව සැබෑ යැ. එ හෙත් සූර්‍ය්‍යයා පායා සිටි කල්හි එය නො පෙනී මැ යෙයි. සූර්‍ය්‍යයා ගේ ඉතා මහත් ආලොක ස්කන්ධය වන හෙයිනි. කුස රජ කරන ලද මහත් පින් ඇත්තේ යැ. ඒ පුණ්‍ය තෙජෝනුභාවය ඉදිරියෙහි ප්‍රභාවතිය ගේ සකල අනුභාවය පැවි වෙයි. අදිසි — අදෘශ්‍ය. නො පෙනෙන්නේ. වෙසි — 'කැලුම් කඳ' යනු මෙහි ප්‍රකෘති කර්තෘ යි. 'අදිසි' යනු විකෘති කර්තෘ යි.

268. කුස නිරිඳු මන න ඳ
කව් නළු ගඳැව් රඟ වි ඳ
රජ ඉසුරින් නො ම ද
නො බෝ දවසක් පසු වැ ගිය ස ඳ

අන්වය: කුස නිරිඳු මන නඳ කව් නළු ගඳැව් රඟ විඳැ, නො මද රජ ඉසුරින් නො බෝ දවසක් පසු වැ ගිය සඳැ — (මතු සම්බන්ධ යි.)

**විසඳුම් : මන නඳ** —'රස' යන්නට විශේෂණ යි. **කව නළු ගඳැව්** — කාව්‍ය නාටක ගන්ධර්ව. මෙහි 'කව්' නම් රජුට ස්තෝත්‍ර මුඛයෙන් වන්දින් විසින් බැඳුණු කාව්‍යයෝ යි. 'නළු' නම් නට-නටින් විසින් දක්වනු ලබන්නා වූ නෘත්‍ය යි. **ගඳැව්**–තූර්‍ය වාදනය යි. **රස** — ශෘංගාර, හාස්‍ය, කරුණා, රෞද්‍ර, වීර, භයානක, බීභත්ස, අද්භූත, ශාන්ත යන නව ප්‍රභේදයෙන් යුක්ත වූ නාට්‍ය රසය. **කව නළු ගඳැව්රස** විඳැ-අභිනවයෙන් ආවාහ විවාහ වූවෝ කලක් ගතවන තෙක් මැ මේ රස විඳිති. කියැවිණි මැ නු, කාව්‍යශේඛරයෙහි දු –

“කුල රූ නුරූ සිරි සර සමග වැ එ ළ ද
ගල-තල උයන් ලිය මඩු පුල් විලට වැ ද
කව් නළු ගඳැව් දූ සැණ කෙළි කෙළ නො ම ද
රුවින'ග සපල කෙළෙ තම ලද වයස ළ ද” —යි

**බෝ** — බොහෝ. 'හ' කාර ලෝපයෙන් හා සවර්ණ දීර්ඝයෙන් හා 'බෝ'.

269. මවු බිසොව අබියෙ ස
පිවිසැ සුව දුක් පිළිවි ස
දහවලෙකැ නිසි ලෙ ස
දුන්වි ඔබවත් දකිනා අදහ ස

**විසඳුම් : බිසොව** — සම්බන්ධාර්ථ යි. **පිවිසැ** — 'පිවිස්' (පිවිසීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'පිවිස්' ධාතුව 'බස්' ආදි ගණ යි, ආත්මනෙපද යි. පිවිසේ-පිවිසෙති-පිවිසිණි, පිවිසි, පිවිටි–පිවිසුණු, පිවිසී, පුවුටු. **දකිනා** — 'දිස්' ධාතුයෙන් වූ භාව කෘදන්ත නාම යි. **දුන්වි** — 'දූන්වී' යි වියැ යුතු. හ්‍රස්වය ඡන්දොහේතුයෙනි. මේ ආඛ්‍යාතයෙන් උක්ත වන්නා වූ කර්තෘ පදය පූර්ව පද්‍යයෙහි ආ 'නිරිඳු' යන්න යැ.

270. අසමින් මැ එ තෙපු ල්
තොප බිසොව හට මන ක ල්
දරු ගබක් වන ක ල්
දකුම් නො පැතුව මැනැවි දහව ල්

**අන්වය : එ** තෙපුල් අසමින් මැ, “තොප මන කල් බිසොව හට දරු ගබක් වන කල් දහවල් දකුම් නො පැතුව මැනැවි”–(මතු සම්බන්ධ යි.)

**විසඳුම් :** **එ තෙපුල්** — "පබවත් දහවලෙකැ තීසී ලෙස දකිනා අදහස ඇත්තෙමැ" යි කුස රජු කී වචනය. **අසමින්** මැ — ඇසූ සැටියේ මැ. **දූකුම්** — භාව කෘදන්තය හේයින් සම්බන්ධවයක් අවශ්‍ය යැ. කා ගේ දූකුම් ද? ඇය ගේ දූකුම්. 'ඇය' නම් 'තොප බිසොව' යැ. **පැතුව** — 'පත' (පැතීමෙහි) ධාතුයෙන් වූ අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. පත + අ = පැතු + අ = පැතුව. 'පත' ධාතුව 'බල' ආදී ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතු කරු) පතා–පතති–පැතී–පැතූ. (කම් කරු) පැතේ–පැතෙති–පැතිණි–පැතුණු.

"තොප බිසොව හට දරු ගබක් වන කල් දවහල් දූකුම් නො පැතුව මැනැව්" යනු මවු බිසොව කී දෑ යැ.

**271.** කියතු දු මේ ලෙසි ‍ න
පබවත දූකුම් අපිසෙ ‍ න
නො නවතිනා බැවි ‍ න
නැවැතැ පවසයි බිසොව මෙ ලෙසි න:

**අන්වය :** බිසොව මේ ලෙසින කියතු දු, පබවත දූකුම් අපිසෙන නො නවතිනා බැවින, නැවැතැ මේ ලෙසින පවසයි.

**විසඳුම් :** **බිසොව** — මවු බිසොව. **මේ ලෙසින** — පූර්ව පද්‍යයෙන් කියැවුණු ආකාරයෙන්. **අපිසෙන** — අපි + එන. 'අපි' යනු අභිලාෂ යන අර්ථයෙහි නාම යි. **නවතිනා** — 'නවත' (නැවැතීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. නො නවතින්නේ කුස නිරිඳු යැ. **නැවැතැ** — 'රක්' ආදී ගණ අකර්මක 'නවත' ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'යළි' යන අර්ථයෙහි වෙයි.

**272.** රජ වෙස් වලා සො ‍ ද
ඇත් ගොවුවන් මැදට වැ ‍ ද
සිටි කලැ තොප ම ම ‍ ද
රැගෙනැ පබවත් එම් කියා සෙ ‍ ද

**අන්වය :** "තොප, සොද රජ වෙස් වලා ඇත් ගොවුවන් මැදට වැදැ සිටි කලැ, මම ද පබවත් රැගෙනැ සෙද එම්" කියා—(මතු සම්බන්ධ යි.)

විසඳුම් : වෙස් — වෙශය. වලා — සඟවා. මාරු කොට්. 'වලා' යනු 'වළහ' (වැළැක්වීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. වළහ්= ('හ' කාර ලොපයෙන්) වළ+අ= (සවර්ණ දීර්ඝයෙන්) වළා. 'වළහ' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි, සකර්මක යි. (කතෘ කාරු) වළහා-වළහති-වැළැහී-වැළැහූ. (කර්ම කාරු) වැළැහේ-වැළැහෙති-වැළැහිණි-වැළැහුණු. සෙද — වහා. එමි — 'එති' යි විය යුතු තන්ග ග්‍රසව යි.

273\. සෙහෙළියන් සමඟි නි
ඇත් හල තුළට වදිමි නි
මඟුලැතුන් දකිමි නි
යනුව නික්මුණු සඳෙහි සතොසි නි

විසඳුම් : සෙහෙළියන් — ග්‍රාමීණ ව්‍යවහාරයෙහි 'ලේළි' යනුයෙන් ව්‍යවහාර වේ. යෙහෙළි+අන්. 'ස' කාරාගම යි. ද්විතියා බහුවචන යි. බුහු බස ගෞරවාර්ථය පිණිස යැ. යනුව — යනු පිණිස. අපර ක්‍රියා නිපාත යි. යා+නුව= යනුව.

274\. කුස රජ අබිමති න
ඇත් තොවූ මැදෙහි සිටැ ගෙ න
ඇත් ඉලත්තියෙකි න
ගැසී පබවත් පුවට නරයෙ න

විසඳුම් : අබිමතින — සිය කැමැත්තෙන් මැ. සිතා මැ. වැරැදීමෙක් නො වේ. ඉලත්තියෙකින — ඇතුන් ගේ වසුරු පිඬු 'ඉලත්ති' නම්. පබවත් — විභක්ති ලොප යි. සම්බන්ධාර්ථ යි. ගැසී — 'ගස' (ගැසීමෙහි) ධාතුයෙන් වූ අතීත ආඛ්‍යාත පද යි. 'ගස' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛ පද යි, සකර්මක යි. (කතෘ කාරු) ගසා-ගසති-ගැසී-ගැසූ. (කර්ම කාරු) ගැසේ-ගැසෙති-ගැසිණි-ගැසුණු.

275\. එ පහර වැදැ එ ළ ඳ
සරසැවි සරෙසින් සා ද
සොළ තව සරන ව ද
බලව අප කිමි හට කියා අ ද

අන්වය: එ ලද එ පහර වැදූ කරකැවී තද සරොසින්, "කොලු, අප හිමි හට කියා අද තට කරන මද බලව."

විපසණ්: වැදූ — වැදී. කරකැවී — 'කර' උප පද කොට ඇති 'කා' (කැමෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය කම් කාරක පූර්ව ක්‍රියා නිපාත පද යි. සරොසින් — මහත් රොසින්. කොලු — රොෂයෙන් ආමන්ත්‍රණය කරන කලැ යෙදෙන නිපාතයෙකි. අප හිමි හට — අප ගේ සවාමියා හට.

276. මෙ සේ උන් කි ස ඳ
සිලවති නම් බිසොව ද
කිපිඟා මෙන් නො ම ඳ
ඔහුට තරයේ කියා තද බ ද

අන්වය: උන් මෙ සේ කී සදැ, සිලවති නම් බිසොව ද, නො මිද කිපියා මෙන්, ඔහුට තරයේ තද බද කියා — (මතු සම්බන්ධ යි.)

විපසණ්: උන් — ඒ ප්‍රභාවතිය. නො මඳ — බොහෝ සේ. 'නො මද වැ' යන අරු යි. කිපිඟා — 'කුප්' (කිපීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය ස්ත්‍රී ලිඞ්ගයෙහි 'ආ' පස ගෙනැ සිටි තැනි. 'කුප්' ධාතුව 'රුස්' ආදි ගණ ආත්මනේපද යි. කිපේ– කිපෙති– කිපිණි, කිපි– කිපුණු, කිපි. ඔහුට — ඒ ඇත් ගොව්වාට. තරයේ — තර කොට. කරණාර්ථයෙහි පස් වණ විභක්ති යි. තද බද — තර්ජන සහිත වචන.

277. ඇත් ගොව්වෝ සිය ල
නො පණත් කෙරෙති හැම ක ල
එ බැවින් උන් තැප ල
ඉවැසිම නිසි ගුණෙකි සුවිපු ල

අන්වය: "සියල ඇත් ගොව්වෝ හැම කලැ නො පනත් කෙරෙති. එ බැවින් උන් තැපල ඉවැසිම සුවිපුල නිසි ගුණෙකි."

විපසණ්: ඇත් ගොව්වෝ– හස්ති ගොපකයෝ. ඇතුන් බලන්නෝ. 'ගොව්වෝ' යන මෙහි 'ගොවු' යනු ප්‍රකෘති යි. ආරක්ෂා කරන්නා– රැකැ බලා ගන්නා– යනු අරු යි. නො පනත් — නො නිසි දෑ. නුසුදුසු ක්‍රියා. නීති විරොධ දෑ.

නැපල — චපල භාවය. මෙහි 'නැපල' යි ගැනුණේ නො පනුත් කමු යැ. සුවිසුල — 'ඉතා බොහෝ වූ' යනු අර්ථ යි. මෙහි නො ගැළැපෙන්නා වූ විශෙෂණයෙකි.

278. පවසා මේ ලෙ සා
යෙහෙළණියන් අස්ව සා
වඩමින් සිතැ තො සා
වසන සඳැ රජ විමන පිවි සා

අන්වය : මේ ලෙසා පවසා යෙහෙළණියන් අස්වසා, සිත් තොසා වඩමින්, රජ විමන පිවිසා වසන සඳැ—(මතු සම්බන්ධ යි.)

විසඳුම් : මේ ලෙසා — පූර්ව පද්‍යයෙන් කියැවුණු පරිද්දෙන්. අස්වසා — 'අස්වස' (අස්වැසිමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'අස්වස' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) අස්වසා–අස්වසති–අස්වැසී–අස්වැසූ. (කම් කරු) අස්වැසේ–අස්වැසෙති–අස්වැසිණ්–අස්වැසුණු. විමන — විමානයට. රජ මන්දිරයට. පිවිසා— 'පිවිසැ' යි සිටියැ යුතු තැනි. සඳැ — කාලයෙහි.

279. එ රජ පෙර ලෙස වා
අවුත් දිනිතිය වෙත වා
පබවත දකිනා වා
ලොල් වූ බව දැන්වී යැ එ වි වා

අන්වය : එ රජ පෙර ලෙසවා දිනිතිය වෙතවා අවුත්, එ විටා පබවත දකිනටා ලොල් වූ බව දැන්වී යැ.

ලෙසවා, වෙතවා, දකිනටා, එවිටා යන සිවු තැන්හි මැ දීර්ඝය කැරුණේ ඡන්දස රක්මට යැ

විසඳුම් : පෙර ලෙසට — පළමු වරක් මෙ බන්දක් කළ හෙයින් මෙ සේ කියැවෙයි. දිනිතිය — (ජනයින්ද්‍රි) මව, ජනනය (ඉපැදීම) කරවන්නී. එවිට — ඒ කාලයෙහි. දකිනට — දැකීමට. මෙයින් කියැවෙනුයේ දහවල් දැකීමට යැ. 'පෙර ලෙසට' යි මුලින් කීයන ලද හෙයින් ඒ හැගෙයි. වූ— 'වූ' යී වියැ යුතු වූව ද ඡන්දොහෙතුයෙන් හ්‍රස්ව වියැ.

280. මවු සඳ ඒ අසමි නා
අස් කොවු වෙසක් ගනිමි නා
සිවුව යි පවසමි නා
එ පබවත සැඳවමින් අවුදි නා

විසඳුම් : සිවුව — විධාන යි. සැඳවමින් — 'සැඳ' ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය මිශ්‍ර ක්‍රියා නිපාත යි.

281. අස් හල් තුළ පිවි සා
අසුන් ගේ නම් පිළිවි සා
යෙහෙළින් සමග තො සා
නික්මැ එත කුස නිරිඳු පෙර ලෙ සා

විසඳුම් : පිළිවිසැ — අසා. 'පුළුවුස්' දයින් වූ පූර්ව ක්‍රියා-නිපාත යි. තොස — සන්තොෂයෙන්. 'එත' යන්නට විශෙෂණ යි. එත—(බිසොව ද පබවත ද) එන කල්හි. පෙර- ලෙස — අනතුරු පද්‍යයෙහි කියැවෙන්න හා සම්බන්ධ යි.

282. අස් වසුරක් රැගෙ න
තරණය පිටට ගැසුයෙ න
රැස් වූ එ බිසොවු න
අස්වසා පිය තෙපුල් කියමි න

විසඳුම් : පිටට — ප්‍රභාවතිය ගේ පිටට. පූර්ව පද්‍යයෙහි ආ 'පෙර ලෙස' යනු සිහි කරන්නේ යැ. ගැසුයෙන — 'ගස' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය 'එන්' විබත් ගෙනැ සිටි තැනි. බිසොවුන — ඒ ප්‍රභාවති බිසොවුන්. අස්වසා — අස්වැසුවා සීලවතී බිසෝ යැ.

283. සීලවතී රජ ළ ද
යෙහෙළණියන් සමග සො ද
රජ විමනතට වැ ද
නො බෝ දවසක් වැසැ ඉදිග ස ද

විසඳුම් : යෙහෙළිණියන් යෙහෙළි සඳින් ගෞරවාර්ථයෙහි 'අණි' ප්‍රත්‍යය වැ ද්විතීයා බහුවචන 'අන්' විභක්තිය වූ තැනි. ගෞරවාර්ථයෙහි ප්‍රත්‍යය වූ පසු කිසි නාම පදයක් එකවචන රූපයෙන් නො සිටී. යෙහෙළි + අණි = යෙහෙළණි.

284. මෙන් සුර'ගන තුනු රුසිරින් තෙවු 'නා
මන් පිනවන පබවත ලද සොබ නා
පින් සර තම් හිමි දැකුමට ලොබි නා
නැන් දණියන් හට කිවු පිය බසි නා

අන්වය : සුර අඟන මෙන් තුනු රුසිරින් තෙවුනා මන් පිනවන සොබනා පබවත් ලද, පින් සර තම හිමි දැකුමට ලොබිනා, නැන්දණියන් හට පිය බසිනා කිවු.

විසඳුම් : තෙවුනා — බබලන්නා වූ. මෙහි 'තෙවු' ධාතු යි. 'රත' ආදි පරපද යි. තෙවී-තෙවිති-තෙව්. නැන්දණියන් හට — ශීලවතී බිසොව හට. නැඳි + අණි = නැන්දණි. 'අණි' යනු ගෞරවාර්ථ ප්‍රත්‍යය යි. කිවු — කිය ධාතුයෙන් වූ අතීත ආඛ්‍යාතය බුහු බසැ 'හු' නිපාතය ගෙනැ (කී + හු = කී + වූ = කිවු) සිටි තැනී. අතීත වූ හෙයින් ද, උක්තය ස්ත්‍රී ලිඞ්ග වූ හෙයින් ද 'ලද' යි එය එක බසින් සිටිය ද, මෙය බුහු බසින් මැ සිටියේ යැ.

285. එ පවත් අසමින් එ බිසොව මෙ තොප ට
දරු'පත් වන තෙක් තම හිමි දැකුම ට
සරි නැත් තේ යැ යි අප රජ කුලය ට
තෙපලත් දින් ඒ නො මැ ගෙනැ සිතක ට

අන්වය : එ බිසොව එ පවත් අසමින්, "මෙ තොපට දරු උපත් වන තෙක් තොප හිමි දැකුමට අප රජ කුලයට සරි නැත්තේ යැ" යි තෙපලත් දිත්, ඒ සිතකට නො මැ ගෙනැ-- (මතු සම්බන්ධ යි.)

විසඳුම්: එ බිසොව — ඒ ශීලවතී බිසොව. එ පවත්— හිමියන් දැකුමට ලොබ ඇතැ යි ප්‍රභාවතිය කී ප්‍රවෘත්තිය. දරු උපත් වන තෙක් — දරුකොත්පත්තියක් වන් තෙක්. ගැබ්යක් පිහිටන තුරු. දැකුමට — 'දිස්' ධාතුයෙන් වූ 'දැකුම්' යන භාව කෘදන්ත නාමය සතර වන විබත් ගෙනැ සිටි තැනී. ව්‍යවහාරයෙහි දු – 'කරන්නට හරි නැහැ' – 'බලන්නට නො වටී' යන ආදි වශයෙන් මෙබඳු තන්හි මේ විභක්තිය ලැබේ. එහෙත් යෙදියැ යුත්තේ පළමු වන විබත යි. තෙපලත් — 'තෙපල' ධාතුයෙන් වූ අසම්භාව්‍ය කෘදන්ත-නිපාත යි. 'තෙපල' ධාතුව' 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි.

(කතු කර) තෙපලා-තෙපලත්-තෙපැලී-තෙපැලූ. (කම් කරු) තෙපැලේ-තෙපැලෙති-තෙපැලිණි-තෙපැලුණු. දින් — දී+ දු=දී+ද්=දීන්=දීත්. දී—'දෙ' (දීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. දු— නිපාත යි. තොපලන් දී ද යන්නෙහි පදාර්ථ නම් 'කියන කල්හි (එයට ඉඩ) දී පවා' යනු යැ. "මදු රදුන් රත් යා දී" යනාදී තන්හි 'දී' යනු පසෙකැ යි (ප්‍රත්‍යයෙකැ යි) කියන්නෝ නො දන්නෝ යැ.

256. පබවත් තම හිමි දැකුමට ලොබි නා
නැවැතැත් පැවැසුයෙන් අයදිමි නා
ඇගෙ සිත් පිනවා රස මුසු බසි නා
නැවැතත් එ බිසෝ කිවු මෙ ලෙසි නා

අන්වය : පබවත් තම හිමි දැකුමට ලොබිනා, නැවැතැත් අයදිම්නා පැවැසුයෙන්, ඇගෙ සිත් රසමුසු බසිනා පිනවා, නැණවත් එ බිසෝ මේ ලෙසිනා කිවු.

විසඳුම් : ලොබිනා — ආශායෙන්. පැවැසුයෙන් — 'පවස' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය 'එන්' විබත ගෙනැ සිටියේ යැ. ඇගෙ — ප්‍රභාවතිය ගේ. පිනවා — 'පින' (සතුටු වීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය පූර්ව ක්‍රියා නිපාත යි. පිනන්නේ සිත යැ. පනවන්නේ එ (ශීලවතී) බිසෝ යැ. 'පින' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි, අකර්මක යි. පිනා-පිනති-පිනී-පිනූ. මෙ ලෙසිනා — මේ මතු කියැවෙන පරිද්දෙන්.

257. සොබමන් එරවණ ගිජිඳුට, නැගෙමි න
සුදසුන් වේ මැදිනෙ'න සුර රදු මෙ න
නැගෙමින් තුඟු ගිජිඳුට සෙට දවසෙ' න
හිමියන් දැකැ සිත සනසව නියම් න

අන්වය : "සොබමන් එරවණ ගිජිඳුට නැගෙමින සුදසුන් වේ මැදින් එන සුර රදු මෙන, තුඟු ගිජිඳුට නැගෙමින් සෙට දවස් එන හිමියන් දැකැ, නියමින සිත සනසව."

විසඳුම් : එරවණ ගිජිඳු — මේ ශක්‍රයා ගේ වාහනය වූ හස්තියා යැ. මේ ඇතු, ගුත්තිල කාරයන් විසින්- "ඇතෙකැ දෙ තිස් කුඹු දල සිවු සැටක් ඇති" යන ආදීන් වැනිණ. සංස්කෘතයෙන් 'ඓරාවණ' යැ යෙත්. සුදසුන් වේ — සුදර්ශන

වීථිය. තව්තිසා දෙව් ලොවෙහි ප්‍රධාන වීථිය මෙය යි. සුරිඳු — සුර රජයා. ශක්‍රයා. තුඟු — උස් වූ. ගිජිඳුට — ගජේන්ද්‍රයාට. ඈතා පිටට. ගජ + ඉඳු = ගජිඳු = ගිජිඳු. ගිම්යතුන් — 'තොප ගේ ගිම්යන්' යි සම්බන්ධය සලකන්නේ යැ. එන — 'එ' (පැමිණීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'ගිම්යන්' යන්නට විශෙෂණ යි. නියමින — නියමයෙන. නිශ්චිත වශයෙන්. සගසව — විධාන යි.

288. රු සි රි න් බබළන විලස රති න් ද
සො බ ම න් එ ජයම්පති කුමරි න් ද
බ ර ණි න් තුනු සරසා මන න න් ද
වෙ සෙ සි න් තුඟු මඟුලැතු පිටැ ඉ න් ද

අන්වය : රුසිරින් රති ඉන්ද විලස බබළන සොබමන් එ ජයම්පති කුමරින්ද, මන නන්ද තුනු බරණින් සරසා, තුඟු මඟුල් ඈතු පිටැ වෙසෙසින් ඉන්ද- (මිතු සම්බන්ධ යි.)

විපසණ් : රති ඉන්ද — අනඬගයා. අනඬගයා ගේ භාර්‍යාව 'රති' නමු. ඇය ගේ ඉන්ද-අධිපතියා-ස්වාමියා-යන අර්ථයෙන් අනඬග තෙමේ මෙ නම් වී. ජයම්පති කුමරින්ද— කුස රජු ගේ බාල සොහොයුරා. මන නන්ද — සිත් සතුටු කරන්නා වූ. ගේ රූපසම්පන්න යැ. තුනු— ශරීරය. බරණින්— (රාජ) ආභරණයෙන්. මඟුල් ඈතු — රජ්ජුරුවන ගේ ගමනය සඳහා විශෙෂයෙන් වෙන් කැරුණේ මඟුල් ඇත් යැ. 'මඟුල්' යනු 'ශුභ' යන අර්ථ ඇත්තේ යැ. රාජ භොගයට සුදුසු වූ හෙයින් ශුභ වී, උත්තම වී. ඉන්ද — හිඳුවා. 'ශද්' (සිඳීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය පූර්ව ක්‍රියා නිපාත පද යි. 'හ' කාර ලොපයෙන් මෙය 'ඉඳු' යි සිටී. ඉඳුවා = ඉන්ද්වා = (එක ස්ථානයෙහි තුන් වන ව්‍යඤ්ජනය ලොප් වීමෙන්) ඉන්ද.

289. පි න් ව ත් කුස රජු දූප්පත් ලෙසි නා
වෙසිනැ'ත් ගොව්වකු මෙහෙ කොටැ සිටි නා
ම ඟු ලැ ත් පසු අස්නේ හිඳුවමි නා
එ ම හ ත් සිවුරඟ සෙන් පිරිවරි නා

අන්වය : පින්වත් කුස රජු, දුප්පත් ලෙසිනා, මෙහෙ කොට සිටිනා ඇත් ගොව්වකු වෙසින්, මඟුල් ඇත් පසු අස්නේ හිඳුවමිනා, පිරිවරිනා එ මහත් සිවුරඟ සෙන්- (මිතු සම්බන්ධ යි.)

**විසඳුම් :** **ඇත් ගොච්චකු වෙසිනා** — ඇත් ගොච්චකු ගේ වෙශයෙන්. 'ගොච්චකු' යන තන්හි සම්බන්ධාර්ථයෙහි දෙ වන විබති. **ඇත්** — හස්තියා ගේ. මෙ තන්හි විභක්ති ලොප යි. **හිඳුවමිනා** — කුස රජු කවර හෙයින් ඇතු පිටැ හිඳුවන ලද ද? අවශ්‍ය වැ පැවැත්තේ ප්‍රභාවතිය රැවැට්ම පමණෙකි. මෙහි දී කුස රජුට ද ප්‍රභාවතිය දැකීමට අවසථාවෙක් ලැබිණ. එයින් ප්‍රයෝජන ලබා දීමට සිතූ ශිලවති බිසොව කුස රජු ඇතු පිටැ හිඳුවූව. **පිරිවරිනා** — 'පිරිවර වැ' යනු අර්ථ යි. මී ලඟ පද්‍යයෙහි **'එන'** යන්නට විශෙෂණ යි. **එ මහත් සිවුරඟ සෙන්** — ඒ මහත් වූ චතුරඞ්ගිනී සෙනාව. ඒ සිවුරඟ සෙනඟ ඉතා මහත් යැ. එ තරම් මහත් බව හඟවන්නට 'එ' යනු යෙදිණ. 'එ සා මහත්' යැ යි අර්ථ ගන්නේ යැ. ඇත් අස් රිය පා බල යනු සේනායෙහි චතුරඞ්ගය යි. "ජයම්පති කුමරින්දු තුනු බරණින් සරසා තුඟු මඟුලැතු පිටැ ඉන්දූ, කුස රජු...... ඇත් ගොච්චකු වෙසින් මඟුලැත් පසු අස්නේ හිඳුවමින්, පිරිවරින් එ මහත් සිවුරඟ සෙන් ..... එන ....." යනාදි විසින් අන්වය සලකන්නේ යැ.

**290.** **න ද කරවා පසතුරු සිඳු ගොස සු ර**
**පැ ද කුණු කොට පුර එන සහ පිරිව ර**
**ර ද විමනතැ සි මැඳුරතැ දොර හැ ර**
**ල ද පබවත් බලමින් ඒ විසිතු ර**

**අන්වය :** පසතුරු නද සිඳු ගොස අයුරු කරවා, පුර පැදකුණු කොට එන, සහ පිරිවර පබවත් ලද රද විමනතැ සී මැදුරතැ දොර හැරැ, ඒ විසිතුර බලමින්–(මතු සම්බන්ධ යි.)

**විසඳුම් :** **පස තුරු**—පඤ්ච තූර්‍ය. ආතත, විතත, ආතත විතත, ඝන, ශුෂිර යන තූර්‍ය පඤ්චකය. පුරාතනයෙහි රාජකීය තූර්‍ය ගණය වශයෙන් පැවැත්තේ මේය යි. **සිඳු ගොස සුර** — සමුද්‍ර ඝොෂය මෙන්. පඤ්ච තූර්‍ය රවයෙහි නාදය අතිශයින් මහත් බව හැඟැවීමට මේ කියැවිණ. **පැදකුණු කොට** — ප්‍රදක්ෂිණ කොට. රජවරු කලින් කලැ සියලු රාජ ගෞරව සහිත වැ නගරය බැලීමට යෙති. නගර ප්‍රදක්ෂිණා කිරීම නම් එය යි. යමක් වටා යේ නම්, දකුණත එ දෙසට හැරී සිටුනා සේ යැම පැදකුණු කිරීම යි. **එන** — 'එ' ධාතු යෙන් වූ කාලාර්ථයෙහි අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. මේ 'එන' යන්නෙහි ද 'පැදකුණු කොට' යන තන්හි 'කොට'

යත්නෙහි ද කනීඃ පූජී පද්‍යයෙහි එනු (සිවුරඟ) 'සෙන්'. යනු යි. සි මැඳුරනැ — සීහ පඤ්ජරයෙහි. මේ මැඳුරනැ යන තන්හි ද 'විමනුතැ' යන තන්හි ද 'අත්' යනු නිරර්ථක යි. ඒ විසිතුර— පඤ්ච තූර්‍ය නාදයෙන් ද සියලු රාජ ගෞරවයෙන් ද යුක්ත වැ රජු සමග සිවුරඟ සෙනග නගර ප්‍රදක්ෂිණා කිරීමේ වෛචිත්‍ර්‍යය.

291. මෙ මට සුඳසු ගිම්යකු ලදිම් යි සො ද
ස තු ට වෙමින් එ බිසෝ ළඳ සිටි ස ද
ර ජු ට පසු වැ උන් ඇත් ගොච්චකු ලෙ ද
කා ප ට එ කුස රජ වඩමින් සිතු ඔ ද

අන්වය: "මෙ මට සුදුසු සොඳ ගිම්යකු ලදිම්" යි එ බිසෝ ළඳ සතුට වෙමින් සිටි සඳැ, රජුට පසු වැ ඇත් ගොච්චකු ලෙද උන් කපට එ කුස රජ, සිතු ඔද වඩමින්-(මතු සම්බන්ධ යි )

විපසණි: ලදිම්—'ලබ' ධාතුයෙන් වූ අතීත ආඛ්‍යාත යි. මෙ තන්හි 'ලබ' ධාතු 'බස්' ආදී අත් පද යි. (කතු කරු) ලැබේ- ලැබෙති- ලැබිණි, ලැබි, ලද්- ලැබුණු, ලැබි, ලදු. (කම් කරු) ලැබේ- ලැබෙති- ලැබිණි- ලැබුණු. 'බල' ආදී වූ තන්හි ලබා- ලබති- ලැබී- ලැබූ- යන ආදිය වෙයි. කම් කරු නො වෙනසි. එ බිසෝ ළඳ — ප්‍රභාවතිය රජුට — රාජ වෙශයෙන් සිටි ජයම්පති කුමරු හට. සිතු ඔද වඩමින් — ප්‍රභාවතිය ගේ දර්ශනයෙහි මේ ඔද වැඩීම වූයේ.

292. දු දු ළු සකුරු මෙන් පිසැ දැ ගිය ර ළු
නැබුළු පුවක් විලසින් මැ ඉතා ක ළු
ර වු ළු නො මැති චූවනින් ගහනා සු ළු
උ සු ළු විසුළු පාමින් වනමින් ස ළු

අන්වය: දුදුළු සකුරු මෙන් පිසැ දැ ගිය, රළු, නැබුළු පුවක් විලසින් මැ ඉතා කළු, ගහනාත සුළු, රවුළු නො මැ ඇති චූවතින් උසුළු විසුළු පාමින්, සිළු වනමින්-(මතු සම්බන්ධ යි.)

විපසණි: දුදුළු සකුරු මෙන් පිසැ— දුදුළු සකුරු පිසින්නා සේ (ඉතා බොහෝ වේලාවක්) පිසීම හෙතු කොට ගෙනැ. 'දුදුළු සකුරු' නම් දූත් 'කළු දොදොල්' නමින් හැනෙන්න යැ යි හැගේ. ඒ බොහෝ වේලා පිසියැ යුතු යැ. එයින් මැ කළු වෙයි. පිසැ — 'පිස' (පිසීමෙහි=පූදනයෙහි)

ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. මෙ තන්හි හෙතුවෙ යි. 'පිස' ධාතුව 'බණ' ආදී ගණ යි, උභය පද යි. (කතු කාරු-පර පද) පිසී- පිසිති- පිසී-පිසූ. (අත් පද) පිසේ- පිසෙති. (කම් කාරු) පිසේ- පිසෙති- පිසිණි- පිසුණු. **දා**— 'දා' (දැමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'දා' ධාතුව බල ආදී ගණ යි, පරස්මෙපද යි. දා-දති-දූ-දූ. අතීතයෙහි දී දා+ඊ= (ධාතු ස්වරය අනම්‍යයට යෑමෙන්) දූ+ඊ= (ප්‍රත්‍යය පූර්ව රූපයට යෑමෙන්) දූ+ඌ=(සවර්ණ දීර්ඝයෙන) දූ. දා+උ=දූ+උ=දූ+ඌ=දූ. **නැබුළු**—මහත් වූ. **පුවක්** — පූපයක්. කැවුම් පෙත්තක්. පූ+අක් පුවක්. **ගහනත** — ඝ්‍රාණය. නාසය. මෙහි 'අත' යනු නිරර්ථක යි. **සුළු**— මුහුණේ ප්‍රමාණයට නාසය ඉතා කුඩා හෙයින් 'ගහනත සුළු' යි කියැවිණ. **මුවනින්** — වක්ත්‍රයෙන්. මුහුණින්. **උසුළු විසුළු** — උස්සුක විස්සුක. කුඩා මහත් විහිළු. **සිළු වනමින්** — ශිඛාව (හිස) වනවනා.

කුස රජ ප්‍රභාවතියට විහිළු කෙරෙමින් හිස වන වනා ගිය බව මෙ කියැවුණු සේ යැ. කිමෙකින් විහිළු කෙළේ ද? මුහුණින් විහිළු කෙළේ යැ. කෙබඳු මුහුණින් ද? (පිසිමෙහි දී) දා ගියා වූ මහ කැවුමක් ලෙසින් ඉතා කළු වූ රවුළ නැත්තා වූ නාසය මිටි වූ මුහුණින්. දුඹුළු සකුරු පිසන්නාක් මෙන් බොහෝ වේලා පිසීමෙන් කැවුම දා යෙයි (පිලිස්සෙයි.) එ කලැ ඒ ඉතා කළු යැ

293. මඳ තැන් ඇතු මෙහෙයා සිටි බැවි නා
බිසොවුන් පබවත් වෙත'වුත් තොසි නා
සොබමන් රුසිරැ'ති තොපට මැ ඔබි නා
හිමි යන් දුටු දූ සී කිවු පිය බසි නා

**අන්වය:** මඳ තැන් ඇතු මෙහෙයා සිටි බැවිනා, බිසෝ තොසිනා උන් පබවත් වෙත අවුත්, "තොපට මැ ඔබිනා සොබමන් රුසිරි ඇති හිමියන් දුටු දූ" යි පිය බසිනා කිවු.

**විවරණ:** **මඳ තැන්** — මද තැනකට. ස්වල්ප දුරකට. **මෙහෙයා** — ගමන් කරවා. 'මෙහෙය' ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'මෙහෙය' ධාතුව 'බල' ආදී ගණ යි, පරස්මෙපද යි. (කතු කාරු) මෙහෙයා-මෙහෙයති-මෙහෙයී-මෙහෙයූ. (කම් කාරු) මෙහෙයේ-මෙහෙයෙති-මෙහෙයිණි-මෙහෙයුණු.

**සිටි** — 'සිටු' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. **බිසොවුන්** — බිසෝ + උන්. **බිසෝ** — ශීලවතී බිසොව. **රුසිරැති** — රුසිරි + ඇති. 'රුසිරි නම් රූප සම්පත්තිය යි. **හිමියන්** — තොප ගේ හිමියන් යි අර්ථ සම්බන්ධය සලකන්නේ යැ. **දුටු** — 'දිස්' ධාතුයෙන් වූ මධ්‍යම පුරුෂ බහු වචන අතීත ආඛ්‍යාත පද යි. දුටු + හු = දුටු + උ = දුටූ. ශ්‍රාව්‍යය ජන්‍යහෙතුයෙනි. 'තෙපි' යනු ආඛ්‍යාතාර්ථ උක්තය යි. **දූයි** — ද + යි = ද + ඇයි = දූයි. මෙහි 'ද' යනු ප්‍රශ්නාර්ථයෙහි නිපාත යි. 'යැ' යනු අර්ථාවසානයෙහි නිපාත යි. යනු වාක්‍ය අඟවන නිපාත පද යි. මේ ආඛ්‍යාතයෙන් උක්ත වන්නා වූ කර්තෘ පදය 'බිසෝ' යනු යි. 'බිසොවුන්' යන තැන්හි ඒ 'උන්' යන කෘදන්තය හා සන්ධි වැ සිටියේ ය. සතර පාදයෙහි මැ ඇගැවූ 'ආ' යනු ජනස රක්ම පිණිස යෙදිණ.

294\. උදක් මෙ ලෙස එ බිසෝ සඳ පවස න
නැතක් කුහුල් සපුරා ගෙනැ තම සි න
නොහික් මැ සිටි ඇත් ගොව්වා සුතු මැ න
කුමක් පිණිස හිඳුවූ දූ යි රජු වෙ න

**අන්වය :** එ බිසෝ සඳ උදක් මෙ ලෙස පවසන, තම සිතැ නැතක් කුහුල් සපුරා ගෙනැ, "නො හික්මැ සිටි මැත සුතු, ඇත් ගොව්වා රජු වෙතැ කුමක් පිණිස හිඳුවූ දූ" යි- (මතු සම්බන්ධ යි.)

**විසඳුම් :** **එ බිසෝ සඳ** — ඒ ශීලවතී බිසොව. **උදක්** — නිකම්. අන් කිසිවක් නො කියා. ශීලවතී බිසොව විසින් තව ද කියැ යුතු දෑ බොහෝ යැ. එ හෙත් ඇය ඇසුයේ මේ ප්‍රශ්නය පමණෙකි. ඒ සැකයට හේතු යැ. **තම සිතැ** — තමා ගේ චිත්තයෙහි. මෙහි 'තම' යනු පබවතිය සඳහා යෙදිණ. **නැතක්** — බොහෝ. **කුහුල්** — කුතුහලය. සැකය. **හීන** — ගරු සරු නැති බව. **හික්මැ** — 'හික්ම' (හික්මීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'හික්ම' ධාතුව 'රක්' ආදි ගණ යි, ආත්මනෙපද යි. හික්මේ-හික්මෙති-හික්මිණි, හික්මි- හික්මුණු, හික්මි. "නො හික්මැ සිටි මැත සුතු ඇත් ගොව්වා රජු වෙත කුමක් පිණිස හිඳුවූ ද?" මේ ප්‍රභාවතිය ගේ වචන යි. අනතුරු පද්‍යය හා සම්බන්ධ කොටැ අර්ථය සලකන්නේ යැ.

295. කියමින් සිරි පබවත් හට කුහුලි නා
තිරිඳුන් හට රකවරණට පස'සු නා
වැදූ උන් එක් ඇත්-ගොව්වෙකැ කියමි නූ
බිසොවුන් ගිය සඳැ පිනවා උන් ම නූ

**අන්වය :** කියමින් කුහුලිනා සිරි පබවත් හට, "නිරිඳුන් හට රකවරණට පසු අසුනැ වැදූ උන් එක් ඇත් ගොව්වෙකැ" කියමින, බිසොවුන් උන් මන පිනවා ගිය සඳැ– (මතු සම්බන්ධ යි.)

**විපසණ :** **කියමින්** — කුමක් කියමින් ද යනු පූර්ව පද්‍යයෙන් කියැවිණ. **රකවරණට**— රක්‍ෂාවරණයට. **පසසුනැ**– පශ්චිමාසනයෙහි. **වැදූ උන්** — වැදී උන්නා වූ. 'වැදූ' යන්නෙන් ඔහුගේ මැ ඕනෑ කමින් යන අරුතෙක් හැගැවෙයි. **එක්** — අනියමාර්ථයෙහි වෙයි. **ගොව්වෙකැ** — ගොව්වෙක් + යැ = ගොව්වෙක් + ඇ = ගොව්වෙකැ. **බිසොවුන්** — ශීලවතී බිසොව. **උන්** — ප්‍රභාවතිය ගේ. **පිනවා**— සතුටු කොට. "සතුටු කරන්නට උත්සාහ කොටැ"යි කියැවිණි නම් වඩා මැනැවි. "නිරිඳුන් හට රකවරණට පසසුනැ වැදූ උන් එක් ඇත් ගොව්වෙකැ"යනු ශීලවතී බිසොව ගේ වචන යි. පූර්ව පද්‍යයෙහි ආ ප්‍රභාවතිය ගේ ප්‍රශ්නයට මේ පිළිතුරැ යි.

296. එ තමන් ඇති කල නිසි සුත පෙම් නා
නිතියෙන් වෙතැ සිටි සේසා ලෙසි නා
රහසින් කුද කැඳවා නොවලසි නා
මෙ ලෙසින් පවසා ලයි පිය බසි නා

**අන්වය :** නිසි සුත පෙම්නා එ තමන් ඇති කල, සේසා ලෙසිනා නිතියෙන් වෙතැ සිටි කුද, නො අලසිනා රහසින් කැඳවා, පිය බසිනා මෙ ලෙසින් පවසා ලයි.

**විපසණ :** **නිසි සුත පෙම්නා** — දරුවකු කෙරෙහි දක්විය යුතු ප්‍රෙමයට බඳු ප්‍රෙමයෙන්. කුද ප්‍රභාවතිය ගේ කිරි මවු බව කියන ලදී. තමා ගේ මැ සුතකුදු නො වූ ප්‍රභාවතියට කුද ගේ ප්‍රෙමය ඉතා මහත් බව මෙ සේ කියැවිණ. **එ තමන්**—මෙහි 'එ' යනු 'එ බඳු වූ' යන අර්ථය දෙයි. **සේසා** — ජාතාවක්. **සේසා ලෙසිනා නිතියෙන් වෙතැ සිටි**–

ප්‍රභාවතිය කුද විසින් ඉතා හොඳින් රැකැ බලා ගන්නා ලද බව මෙයින් කියැවිණ. තමන් කොාහි ගිය ද සේයාව ද එහි යන් හෙයින් කිසි කලෙක අත් නො හරී. "තිසි සුත පෙම්නා එ තමන් ඇති කල, සේයා ලෙසිනා තිතියෙන් වෙතැ සිටි" යනු 'කුද' යන්නට විශෙෂණ යි. නිතියෙන් — 'නිති' යන නිපාතය 'එන්' විභක්තිය ගෙනැ සිටි තැනි. නොවලසිනා — නො + අලසිනා = ('ව' කාරාගමයෙන්) නොවලසිනා, අලස නො වැ, වහා. ලසි — (ලා + සි) 'ලා' යනු 'ල' ලීමෙහි ධාතුයෙන් වූ ආඛ්‍යාත පද යි. පවසා ලූවා ප්‍රභාවතී යැ.

297. නි ගොසින් එක් පෙදෙසෙකැ සිටැ බලමින
නැගෙමින් ඇතු උන් දෙ දෙනා අතුරි න
නි රි දු න් මේ යැ යි දූනැ එව නො ලසින
බි සො වු න් කි සඳැ කුද කි මෙ ලෙසි න

අන්වය : "නි ගොසින්, එක් පෙදෙසෙකැ සිටැ බලමින, ඇතු නැගෙමින් උන් දෙ දෙනා අතුරින, නිරිඳුන් 'මේ යැ' යි දූනැ, නො ලසින එව" බිසොවුන් කී සඳැ, කුද මෙ ලෙසින කී.

විසඳුම් : නි — 'නී' යි වියැ යුතු තන්හි ඡන්දෝ හෙතුයෙන් හ්‍රස්ව වී. ගොසින් — 'ය' (ගමන්හි) ධාතුව නිසා නිපතිත වූ පූර්ව ක්‍රියා නිපාත පදය වන 'ගොස්' යනු 'ඉන්' පස ගෙනැ සිටියේ යැ. නිරිඳුන් — දූනැ යන්නට කම් යි. "මේ තෙමේ යැ"යි. 'නිරිඳුන්' යනු සඳහා යෙදුණෙන් 'මේ' යන එකවචන රූපය නුසුදුසු යැ. බිසොවුන්— මේ ප්‍රභාවතිය සඳහන් කොට කියැවිණ. මෙ ලෙසින් — මේ මතු කියන ආකාරයෙන්.

298. මදෙකින් මෙ වදන් ඔබ කි පමණි න
ඔහු වෙන් කොට මම දූනැ එම් කෙ ලෙසින
වෙන අන් කරුණක් කිව ඔබ නුවණි න
රජු ඉ න් මෙ යැ යි දූනැ එම් නො ලසි න

අන්වය : ඔබ මදෙකින් මෙ වදන් කී පමණින මම ඔහු වෙන් කොට කෙ ලෙසින දූනැ එම්. ඔබ නුවණින වෙන අන් කරුණක් කිව, ඉන් රජු 'මේ යැ' යි දූනැ, නො ලසින එම්.

විසඳුම් : මදෙකින් — "රජු අසුවලා යැ ය දූනැ එව" යි ප්‍රභාවතිය විසින් කුදට කියන ලද්දේ යැ. කවර කරුණක්

හෙතු කොට ගෙනැ රජු-අසුවලා යැ යි දනැ ගත හැකි ද යන ආදී කිසිවෙක් නො කියන ලද්දේ යැ. 'මදෙකින්' යන ආදිය දුන් කුද විසින් කියනු ලබනුයේ එ හෙයිනි. බඳු — රජු. වෙන් කොට — අනෙක් අය ගෙන් වෙන් කොට. ඇතු පිට හුන් දෙ දෙනා ගෙන් රජු වෙන් කොට. වෙන අන් — 'වෙන' යි කිව ද 'අන්' යි කිව ද අර්ථය පිරිමැසේ. එ හෙයින් මෙ දෙකින් එකෙක් අධික යැ, අනවශ්‍ය වූ එළි වැටක් නිසා මේ අධික පද ප්‍රක්ෂෙපය වෙයි. කිව — 'කිය' ධාතුයෙන් වූ අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. කිය + අ = කියු + අ = කියුව = කි ව = කිව. ඉන් — ඒ කියන්නා වූ අන කරුණින්. මුළු පද්‍යය කුද ගේ වචන යි.

299\. මෙ වදන් ඇය පැවැසූ සඳැ තතු ලෙ ද
ඇතු ගෙන් පෙරවූ වැ බවුයේ සෙන් මැ ද
ර ජැ මින් දනැ එව කිවෙන් බිසෝ ස ඳ
ඇ නොසින් විමසා බලා සිටිනා ස ඳ

අන්වය : ඇය මෙ වදන් තතු ලෙද පැවැසූ සදැ, බිසෝ සඳ, "සෙන් මැදූ ඇතු ගෙන් පෙරවූ වැ බවුයේ රජ යැ. මින් දනැ එව" කිවෙන්, ඇ නොසින් විමසා බලා සිටිනා සඳැ-(මතු සබඳි.)

විසඳුම් : ඇය — කුදිය. මෙ වදන් — පූර්ව පද්‍යයෙන් කියූ වදන්. බිසෝ සඳ — ප්‍රභාවතිය. 'කිවෙන්' යන තන්හි 'කි' යන්නට අනුකත කාතීෘ යි. සෙන් මැදූ — සෙනා මධ්‍යයෙහි. පෙරවූ වැ—පළමු කොටැ. බවුයේ— 'බස්' ධාතුයෙන් වූ 'බටු' යනු පෙර එබත් එක බස ගෙනැ සිටියේ යැ. රජැ—රජ + යැ. රාජයා යැ. මින් — මෙයින්. සෙනා මධ්‍යයෙහි හසතියා ගෙන් පළමු කොට බැසීමෙන්. එව — විධාන යි. මෙ තන්හි ද 'යි' යන්නත් හෙලා යත යුතු. කිවෙන් — කී හෙයින්. ඇ— කුදිය, 'ඇ' යි වියැ යුතු වූව ද ඡන්ද හෙතුයෙන් හ්‍රස්ව වියැ. විමසා — පරීක්‍ෂා කෙරෙමින්. මිශ්‍ර ක්‍රියාර්ථ යි. සිටිනා — 'සිටු' ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි.

300\. පර සි ත් අදුනන අනැ'ඹුල විලසි නා
මහ ස ත් එ පවත් නුවණින් දනැ ගෙ නා
ඇගෙසින් පිනවා රස මුසු තෙපුලෙ නා
ප බ ව ත් හට නො කිසව පැවැසූයෙ නා

**අන්වය :** පර සිත් අතැ ඇඹුල විලසින අදුනන මහ සත්, එ පවත් නුවණින් දැනැ ගෙනැ, ඇගෙ සිත් පිනවා, රස මුසු තෙපුලෙන, "පබවත් හට නො කියව" පැවැසූයෙන-(මතු සම්බන්ධ යි.)

**විසඳුම් :** **පර සිත්** — අන්‍යයන් ගේ අදහස්. **අතැඹුල**- අතෙහි වූ නෙල්ලි ගෙඩිය. යම් කිසිවක් ඉතා පහසුයෙන් දැනැ ගත් කලැ "අතැඹුල ලෙසින් දත් හ" යි යෙති. යම් කිසිවකු අතෙහි ඇඹුල පලක් (නෙල්ලි ගෙඩියක්) ඇති වැ සිටිනා විටෙකැ ති කරුණක් (ඔහු මැනැවින් දන්නා බව හැගැවීමට, "මේ අත්හි වූ ඇඹුල ලෙසින් එය මම දනිමි" යි කියනු යෙදෙයි. **අඳුනන** — 'අඳුන' (ඇඳිනීමෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'අඳුන' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි (කතු කරු) අඳුනා-අඳුනති-ඇඳිති-ඇඳූනු. (කම් කරු) ඇඳිනේ-ඇඳිනෙති-ඇඳිනණි-ඇඳූනුණු. මේ ධාතුව 'රක්' ආදි ද වෙයි. අඳුනී-අඳුනිති-ඇඳිති. වර්තමාන රූපයෝ අප්‍රයුක්තයෝ යැ. **මහ සත්** — මහා සත්ත්වයා මේ කුස රජු සලකා කියැවෙයි. මතු සම්‍යක් සම්බුද්ධත්වයට පැමිණැ සියලු සතුන් දුක් ගිම් නිවා-සනහා ලන හෙයින් මෙසේ කියත්. **එ පවත්** — "රජු මේ යැ යි දැනැ ගෙනැ එව" යි ප්‍රභාවතිය විසින් කුදිය එවන ලදු යැ යන ප්‍රවෘත්තිය. **ඇගෙ** — කුදිය ගේ. **රස මුසු තෙපුලෙන** — කරුණාර්ථිත වචනයෙන් **නො කියව** — කුමක් නො කියව ද යනු මෙහි නො කියැවෙයි. ඇතු පිටින් පලමු කොට බටුයේ ඇත් ගොව් වෙසින් සිටි කුස රජ යැ. කුදිය විසින් ඒ බව දක්නා ලදී. ප්‍රභාවතියට නො කියව යි කීයේ මේ බව යැ. **කියව**— විධාන යි. කිය + හි = කිය + හ = කියව. මෙහි 'ව' කාරාදෙශ යි. ඇතැම් තන්හි 'ග' කාරාදෙශය ද වෙයි. එ සේ වූ කල්හි 'කියග' යන රූපය ලැබේ. මෙ තන්හි ද 'යි' යන්නෙකින් වාක්‍ය සම්බන්ධය කළ යුතු යැ. **පැවැසූයෙන** — 'පවස' (පැවැසීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය 'එන්' විභක්තිය ගෙනැ සිටියේ යැ. පැවැසූ එන්. 'ය' කාරාගම යි. 'පැවැසූයෙන්' යන තන්හි 'මහසත්' යනු අනුක්ත කර්තෘ යි. "පබවත් හට නො කිය ව" යනු කම් යි.

301. බ ර ණි න් සැරැසි විලසින් සුර ර ද
ල කු ණෙ න් යුතු තුගු ගිජිඳු හෙ මන න ද
පෙ ර 'සු න් ඉඳැ පෙරමු වැ බැසැ පු ර ද
ම ඇ සි න් දුමු සෙමි පැවැසු සඳැ කු ද

අන්වය : "සුර රද විලසින් බරණින් සැරැසී ලකුණෙන් යුතු තුඟු මත නද ගිජිඳු ගෙ පෙර අසුන් ඉඳැ පෙරටු වැ බැසැපූ රද ම ඇසින් දුටුයෙමි" කුද පැවැසූ සිඳැ- (මතු සම්බන්ධ යි)

විපසණ : සුර රද — දෙවියන් ගේ රජ. ශක්‍රයා. බරණින් — රාජාභරණයෙන්. ලකුණෙන් — ශුභ ලක්‍ෂණයෙන්. රජුන් ගේ පරිභෝගයට සුදුසු වූ උතුම් හස්තින් ගේ ශුභ ලක්‍ෂණ කීපයෙකි. තිසර සඳෙස්හි —

"විසි නිය කොපොල් බොල් සත් තැන් බිම පිහි ටි
උස් කුඹු දකුණු දල දෙ අසුන් සම වැ සි ටි
මද මත නො මද සුද මේ ගිගුමට නො ගැ ටි
ඔල මොල බලග එගි තුඟු මඟුලැතුන් සැ ටි"

යනුයෙන් ගජ ලක්‍ෂණ කියැවිණි.

තුඟු — උස් වූ. ගිජිඳු — ගජේන්ද්‍රයා ගේ. පෙරසුන් — ඉදිරි පස් වූ ආසනයෙහි. පෙරටු වැ — පළමු කොට: බැසැ පූ — බටුවා වූ. 'බැසැ පූ' යැ යි කිව ද 'බට' යි කිව ද එකාර්ථ යි. පූ — පියූ. 'පිය' (හැරීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. පූර්ව වැ යෙදෙන පූර්ව ක්‍රියා පදයා ගේ අර්ථය නො වෙනස් කරනුයෙන් මේ නිරර්ථක යැ. 'ගත්' 'ල' යනාදී ධාතූනු ද මෙසේ යෙදෙති. 'පිය' ධාතු 'බල' ආදී පර පද යි. (කතු කරු) පියා–පියති–පියී, පී–පියූ, පූ. (කම් කරු) පියැවේ–පියැවෙති - පියැවිණි - පියැවුණු. රද — (බටුවා වූ) රජු. ම ඇසින් — මාගේ ඇසින්. විශ්වාස කරවන්නට මෙසේ කිව. දුටුයෙමි — 'දුටුයෙමි' යි . වියැ ;සුතු තන්හි ඡන්දෝහෙතුයෙන් හ්‍රස්ව වියැ 'දුටුයෙමි' යනු දුටුයෙමි+යි= දුටුයෙමි+ඉ=දුටුයෙමී යන විසින් නිපදී. එහි 'යි' යනු වාක්‍ය සම්බන්ධයෙහි නිපාත පද යි.

302. ඇ විසින් පැවැසූ බොරු බස් නොම්ම නේ
එ තමන් බොරු බස් නො මැ දත් බැවි නේ
නි සැකින් සැබැවැ යි අදහා රැගෙ නේ
බිසොවුන් සැනැසී උන් සඳැ තොසි නේ

අන්වය : ඇ විසින් නොම්මිනේ පැවැසූ බොරු බස්, එ තමන් බොරු බස් නො මැ දත් බැවිනේ, "නිසැකින් සැබැවැ"යි අදහා රැගෙනේ, බිසොවුන් සැනැසී තොසිනේ උන් සඳැ- (මතු සම්බන්ධ යි.)

**විපසණි :** **ඈ විසින්** — කුදිය් විසින්. **නොයිනේ** — බොහෝ සෙයින්. **එ නමන්** — මෙහි 'එ' යනු අනවශ්‍ය යැ. **සැබැවැ** — සැබෑ + යැ = ('ව්' කාරදේශයෙන්) සැබැවැ. මෙහි යැ 'යනු' වාක්‍ය සම්බන්ධයෙහි නිපාත යි. **අදහා** — 'අදහ' (ඇදහීමෙහි) ධාතුයෙන් වූ පූර්‍ව ක්‍රියා නිපාත පද යි. 'අදහ' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) අදහා–අදහති–ඇදහී–ඇදහූ. (කම් කරු) ඇදහේ–ඇදහෙති–ඇදහිණි–ඇදහුණු.

303. **සො** **දු** **රු** සිරින් පල කල ලොවට සුර ර **ද**
**ස** **පි** **රු** දිගත තද තෙද'ගින් යුත් පබ **ඳ**
**ගැ** **ඹු** **රු** කෙසර සර යුතු කුස නිරිඳු ස **ඳ**
**ම** **හ** **රු** මවු බිසොව රැඳි රද විමන් වැ **ද**

**අන්වය :** සොඳුරු සිරින් ලොවට සුර රද පල කල, දිගතැ සපිරු පබඳ තද තෙද අගින් යුත්, ගැඹුරු කෙසර සර යුතු කුස නිරිඳු සඳ, මහරු මවු බිසොව, රැඳි රද විමන් වැදූ-(මතු සම්බන්ධ යි.)

**විපසණි :** **සිරින්** — ඓශ්වර්‍ය්‍ය කාරණ කොට ගෙනැ. **සුර රද** — ශක්‍රයා. මේ තෙමේ ඉතා මහත් වූ ඓශ්වර්‍ය්‍යයෙන් යුක්ත යැ. ඓශ්වර්‍ය්‍යයෙන් සුර රජයා ලොකයට ප්‍රකාශ කිරීම නම් ඉතා මහත් ඓශ්වර්‍ය්‍යයෙන් යුක්ත වැ විසීම යි. සුර රද (ශක්‍රයා) වෙසෙනුයේ තව් තිසා දෙව් ලොවෙහි යැ. එ හෙයින් ඔහු ගේ ඓශ්වර්‍ය සම්පත්තිය මෙ බඳු යැ යි ලොක වාසීහු නො දනිති. යමකු ගේ ඓශ්වර්‍ය්‍යය දෙස බලා දෙව් ලොවැ සුර රජු ගේ ඓශ්වර්‍ය්‍යයත් එ බඳු යැ යි කියැ හැකි වේ නම්, ඔහු අග්‍ර ඓශ්වර්‍ය්‍යයෙන් යුක්ත වන බව හැඟෙයි. කුස රජු එ බඳු වූ ශ්‍රෙෂ්ඨ ඓශ්වර්‍ය සම්පත්තියෙන් වැජැඹුණු බව මෙ සේ කියැවිණි. **දිගත** — දිගු + අත. දිශා කෙළවර. **සපිරු** — සම්පූර්ණ කළා වූ. මෙහි 'ස' පූර්‍ව 'පූර' ධාතු යි. සකර්මක 'පූර' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) පුරා–පුරති–පිරී–පිරූ. (කම් කරු) පිරේ–පිරෙති–පිරිණි–පිරුණු. අකර්මක 'පූර' ධාතුව 'බස්' ආදි ගණ යි, ආත්මනෙපද යි. පිරේ–පිරෙති–පිරිණි–පිරි, පිනි–පිරුණු, පිරි, පුනු. 'සපිරු' යි වියැ යුතු තන්හි ඡන්ද හෙතුයෙන් 'සපිරු' යි වියැ. **පබඳ** — ප්‍රබන්ධ නො කඩ වූ. **තද** — ඝනබද්ධ වූ. දැඩි. **තෙද අගින්** — තෙජස් නමැති

ගිත්තෙනත්. කුස නිරිඳු දිශාවන් සම්පූර්ණ කළා වූ නද වූ තෙජස් නමැති ගිත්තෙන් යුක්ත යැ යි කීමෙන් ඒ රජු ගේ තේජස ලොව පුරා පැතිරී ගිය බව කියැවේ. කෙසර සර — සිංහ ස්වරය. මහරු — මහාර්ඝ වූ. පූජාවට සුදුසු වූ. රද විමන් — රාජ විමානයට. වැදූ — ප්‍රවිෂ්ට වැ

304. සු නි ම ල් වතින් බබළන ලෙස සරා සි සි
සුර ක ල් සදිසි තුනු රුසිරින් නිතොර දි සි
මන ක ල් ගුණෙන් යුත් පබවත් නම් මෙහෙ සි
අ ම තු ල් බසින් කී දහවල් දකින රි සි

අන්වය: සරා සිසි ලෙස සුනිමල් වතින් බබළන, සුර කල් සදිසි තුනු රුසිරින් නිතොර දිසි, මන කල් ගුණෙන් යුත්, පබවත් නම් මෙහෙසි දහවල් දකින රිසි, අම තුල් බසින් කී.

විවරණ: සරා සිසි — ශරත් චන්ද්‍රයා. ශරත් කාලයෙහි අහසෙහි වලා කුළු නැත්තේ යැ. එ හෙයින් චන්ද්‍රයා සම්බාධයක් නැති වැ බබළයි. වතින් — වක්ත්‍රයෙන්. මුහුණින්. සුර කල් — දිව්‍ය කාන්තාවක. දිව්‍ය ස්ත්‍රියක. කල් යනු 'කාන්තා' යන අර්ථ ඇත්තේ යැ. නිතොර — හැම කල්හි මැ දිව්‍ය ස්ත්‍රියක මෙන් දෘශ්‍යමාන වන බව හැඟැවීමට මේ යොදන ලද. මන කල් — සිතට කාන්ත වූ. සිත් ප්‍රිය කරන්නා වූ. දහවල් — දව + කල් = දවහල් = දහවල්. 'ක' කාරයට 'හ' කාරාදේශ යි. ව්‍යඤ්ජන විපර්යය යි. 'නවහම්' යන ආදී තන්හි දු 'හ' කාරාදේශය මෙසේ වෙයි. රිසි — අභිලාෂය. කැමැත්ත. අම තුල් — අමෘතය වැනි වූ. ඉතා රසවත් වූ. කී — පූර්ව පද්‍යයෙහි ආ (කුස නිරිඳු) 'සද' යනු මෙහි උක්ත කර්තෘ යි.

305. එ ප ව ත් අසා එ බිසෝ සද මන නඳ න
සු නි සි ත් නැණින් 'පා විමසමිනි වෙන වෙ න
ප බ ව ත් රැගෙනැ එම් උයනට පිරිවරි න
සුභ නෙත් පුරා දැකැ සැනැසෙව පැවැසුයෙ න

අන්වය: මන නඳන එ බිසෝ සද එ පවත් අසා, සුනිසිත් නැණින් වෙන වෙන උපා විමසමිනි, "පබවත්

රැගෙනැ පිරිවරින උයනට එම්. සුග නෙත් පුරා දකැ 'සැනැසෙව' පැවැසුයෙන - (මතු සම්බන්ධ යි.)

විසඳුම් : එ පවත් — 'ප්‍රභාවතිය දහවල් දකින්නට කැමැත්තෙමැ' යි කුස නිරිඳු කී පවත්. සුනිසිත් — අතිශයින් තීක්‍ෂණ වූ. 'නැණින්' යන්නට විශෙෂණ යි 'සුනිසිත' යි වියැ යුතු තැනි. සංස්කෘතයෙහි 'නිශිත' යනු සිහුම් මුවහත් කළ - තියුණු - යන ආදි අර් ඇත්තේ යැ. පිරිවරින — පරිවාරයෙන් යුක්ත වැ. උපලක්‍ෂණාර්ථයෙහි තුන් වන විභක්ති යි. සුග නෙත් — දෑස. 'තොප ගේ' යැ යි ගෙනැ අර් සම්බන්ධය සලකන්නේ යැ. සුග නෙත් පුරා දකා — 'රිසියෙන සේ බලා' යන අර්ථයෙහි වෙයි. සැනැසෙව — 'සනස' ධාතුයෙන් වූ කර්මකාරක ආඛ්‍යාත යි. විධාන යි. මෙ තන්හි වාක්‍ය සම්බන්ධයෙහි 'යි' යන්නක් හෙළා ගත යුතු. පැවැසුයෙන — පවැසූ හෙයින්.

306. එ කල් කුස නිරිඳු සඳ උයනට පිවි . සා
මගුල් පොකුණෑ කට පමණක් දියට බැ සා
විසල් නෙළුම් පතෙකින් වසමින් සිර සා
සුපුල් පියුමෙකින් සිටි සඳැ මුහුණ ව සා

අන්වය : කුස නිරිඳු සඳ එ කල් උයනට පිවිසා, මගුල් පොකුණැ කට පමණක් දියට බැසා, විසල් නෙළුම් පතෙකින් සිරසා වසමින්, සුපුල් පියුමෙකින් මුහුණ වසා සිටි සඳැ- (මතු සම්බන්ධ යි.)

විසඳුම් : එ කල් — ඒ කාලයෙහි. "පිරිවරින පබවත් රැගෙනැ උයනට එම්. සුග නෙත් පුරා දකැ සැනැවෙස" යි ශීලවතී බිසොව පැවැසූ කල්හි. පිවිසා — 'පිවිසැ' යි වියැ යුතු තන්හි එළි වැට හා ජඝස හා රැක්මට මේ විකෘතිය කැරිණ 'පිවිසැ' යනු 'පිවිස්' (ප්‍රවෙශයෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'පිවිස්' ධාතුව 'බස්' ආදි ගණ යි. ආත්මනෙපද යි, අකර්මක යි. පිවිසේ - පිවිසෙති - පිවිසිණි, පිවිසී, පිවිටි-පිවිසිණු, පිවිසි, පිවිටු. මගුල් — රජ පරිභොගයට සුදුසු වැ උතුම් වැ සිටි හෙයින් මගුල් (මඞ්ගල) නම් වෙයි. කට පමණක් — මුඛය දක්වා ගිලෙන තරම් ගැඹුරු වූ. බැසා — 'බැසැ' යි වියැ යුතු. සිරසා — අනැ 'ආ' යන්න ජඝස රක්නා පණිස ආයේ යැ.

307. අ න් ද සිහිදු රන් කම් කල සළු නිම ලා
ර න් ද සැමඟ මිණි අබරණ සරා ගෙ ලා
නැ න් ද සුරඹ වන් පබවතිය මන ක ලා
කැ න් ද ගෙනැ උයන් කෙළියට පිටත් වැ ලා

අන්වය: රන් කම් කල නිමලා සිහිදු සළු අන්දා, සැම අඟ මිණි අබරණ රන්දා ගෙලා සරා. සුර අඹ වන් මන කලා පබවතිය කැන්දා ගෙනැ, නැන්දා උයන් කෙළියට පිටත් වැ ලා — (මතු සම්බන්ධ යි.)

විසඳුම්: අන්දා — 'හඳ' (හැඳීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා නිපාත යි. 'හඳ' ධාතුව 'රක්' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) හඳි-හඳිති-හැඳි. (කම් කරු) හැඳේ-හැඳෙති-හැඳිණි-හැඳුණු. හඳ + වා = හන්ද් + වා = හන්දා. 'හ' ලොපයෙන් අන්දා. 'හඳ' ධාතු 'බස්' ආදි වූයෙහි අනුගි හනි-හනු-යනු වෙයි. සැම අඟ මිණි අබරණ — සියලු අඟ වූ රත්නාභරණයන්. රන්දා — රඳවා. පලඳවා. රඳ + වා = රන්ද් + වා = රන්දා. ගෙලා සරා — ග්‍රීවාව සරහා (අලඞ්කෘත කොට.) කැන්දා — කැඳවා = කැන්ද් + වා = කැන්දා. නැන්දා — ප්‍රභාවතිය ගේ නැන්දා වූ ශීලවතී දෙවිය. උයන් කෙළියට — උයනෙහි ක්‍රීඩා කිරීම පිණිස. පිටත් වැ ලා — මෙහි 'වැ' යනු 'ව' (වීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. 'ලා' යනු 'ල' (ලීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත පද යි. කැරැ ලා-ගොසින් ලා-කියා ලා- ආදි අනෙක ස්ථානයන්හි යෙදෙන මේ 'ලා' යනු විශෙෂ අර්ථයක් දෙන්නේ නො වේ.

මෙහි පැනෙන අන්දා - සරා - කැන්දා - ගෙනැ - වැ - ලා යන පූර්ව ක්‍රියාවනට කර්තෘ වූයේ 'නැන්දා' යනු යි.

308. කා න වා සඳුන් පලු ගෙ උයනැ පසෙහි සු ග
එ න වා මඳින් මඳ විඳැ සෙහෙළිය සම ග
උ න වා තුනු ගිමන් අසමින් නද පස ග
පි න වා දනන් මන ගෙවමින් වීදි ම ග

අන්වය: සුග පසෙහි ගෙ උයනැ සඳුන් පලු කනවා, මඳින් මඳ එන වා, සෙහෙළිය සමග විඳැ, තුනු ගිමන් උනවා, පසඟ නද අසමින්, දනන් මන පිනවා, වීදි මග ගෙවමින් — (මතු සම්බන්ධ යි.)

විපසණ්ණි : සුග පසෙඟි — ශිත විපිංනෙි උනය පාංඥිවයෙහි වූ. ගෙ උශනෑ—නෑහොඥානයන්හි. ගෙ වතුවලැ. සඳුන් පලු — සඳුන් ගස්හි දළු. තනවා — කම්පිත කරවා. සොලවා. මෙහි 'තන' ධාතු යි. ඒ 'බම' ආදි ගණ යි, උභය පද යි. (පර පද) තනා-තනති-තිනී-තුනු. (අත් පද) තෙනේ-තෙනෙති. 'තනවා' යනු ප්‍රයොජ්‍ය පූර්ව ක්‍රියා නිපාත පද යි. තනන්නේ දළු යැ. තනවන්නේ වා (සුලඟ) යැ. එන වා — එන්නා වූ වාතය. යෙහෙළිය — ප්‍රභාවතිය. විඳෑ — කතීං පදය 307 වන පද්‍යයෙහි එන 'නැන්දෑ' යනු යි. තුනු ගිමන්— ශරීර ග්‍රීෂ්මය. විඩාව. උනවා — මොචනය කරවා. මුදවා. 'උන' (ඉනීමෙහි=මිදීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය පූර්ව ක්‍රියා නිපාත යි. 'උන' ධාතුව 'බල' ආදි ගණ යි, පරසෙමපද යි. (කතු කරු) උනා-උනති-ඉනී-ඉනු. (කම් කරු) ඉනේ-ඉනෙති-ඉනිණි-ඉනුණු. ගිම් උනන්නේ වාතය යි. උනවන්නේ යෙහෙළිය ද සමග පැමිණි නැන්දෑ යැ. පසඟ නද අසමින්— මේ රාජකීය පිරිස තුසි වාදක පිරිස සහිත වූ පෙරහරින් පැමිණි බව මෙයින් හැගැවූ හ. 305 වන පද්‍යයෙහි එන 'පිරිවරින' යනු ද සලකන්නේ යැ. දනන් මන පිනවා විදි මග ගෙවමින් — මේ රාජකීය පිරිස වීථි මාර්ගය ගෙවමින් (පසු කොට) එන්නාහු, දනන් මන කෙ සේ පිනවත් ද? මේ පිරිස – විශෙෂයෙන් ප්‍රභාවතිය – අතිශය රූප සම්පත්තියෙන් විරාජමාන යැ. ඔවුන් මහත් පෙරහරින් වීථි මාර්ගය ගෙවා එන විට ඔවුන් දැකීමෙහි රිසි වූ මහා ජනයෝ වීථි දෙ පසැ රැස් වෙති. දුටුවන් උමතු කරවන තරම් මනහර රූ සපුයෙන් යුත් ඔවුන් දැක්මෙන් දනන් මන පිනයි. පිනන්නේ මන යැ. පිනවන්නී යෙහෙළිය ද සමගින් එන්නා වූ නැන්දෑ යැ. 'පිනවා' යනු 'පින' (ප්‍රිණනයෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය පූර්ව ක්‍රියා නිපාත යි. 'පින' ධාතුව 'බල' ආදි ගණ යි, පරසෙමපද යි. පිනා-පිනති-පිනී-පිනු. ගෙවමින් — 'ගෙව' (ගෙවීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියාර්ථයෙහි මිශ්‍ර ක්‍රියා නිපාත පද යි. 'පසු කොටැ' යනු අර්ථ යි. 'ගෙව' ධාතුව 'බල' ආදි ගණ යි, පරසෙමපද යි. (කතු කරු) ගෙවා-ගෙවතී-ගෙවී-ගෙවූ. (කම් කරු) ගෙවේ-ගෙවෙති-ගෙවිණි-ගෙවුණු.

809. න ද  මිහිලොල් ලිය ගි නද යුතු මියු  රැ
න ඳ  කොවුලන් හඬ පසතුරැ ඝොස සපි  රැ
ම ද  නලැ සල ලිය ලිය රැඟුමැ'ති සොඳු  රැ
සෙද  වතු'යන මද රද රඟ හල අසු  රැ

අන්වය: මිහිලොල් නද මියුරු ලිය ගී නද යුතු, කොවුලන් නද හඬ පස තුරු ඝොස සපිරු, මඳ නලැ සල ලිය ලිය සොඳුරු රැඟුම් ඇති, මද රද රඟ හල අසුරු උයන් සෙද වන්.

විසඳුම්: මිහිලොල් — මධුලෝලයන් ගේ හෙවත් මී මැස්සන් ගේ. මෙහි විභක්ති ලොප යි. මිහියෙහි ලොල් යමක්හු ගේ හේ මිහිලොල්. අන් අරුත් සමසි මිහි නම් මල් පැණි යි. නද — නාද නමැති. ලිය — ලයාන්විත වූ. ලය නම් සංගීත ශාස්ත්‍රයෙහි ඉගැන්වෙන ස්වරයන් ගේ යථාප්‍රමාණ වූ. සමත්වය යි. ගි නද — ගීතිකා නාදය. නඳ — නන්දනීය වූ. සිත් සතුටු කරන්නා වූ. හඬ — ශබ්දය හෙවත් නාදය නමැති. පස තුරු ඝොස — පඤ්ච තූර්ය ඝොෂය. සපිරු — සම්පූර්ණ කළා වූ. මඳ නලැ සල — මන්ද මාරුතයෙහි චලිත වන්නා වූ. ලිය — ලතා නමැති. ලිය — ස්ත්‍රීන් ගේ. රැඟුම් ඇති — නැටීම් ඇත්තා වූ. මද රද — අනඞ්ගයා ගේ. රඟ හල — නෘත්‍ය ශාලාව. සෙද — වහා. උයන් වන් — උද්‍යානයට වන්නාහු යැ.

ඒ උයන නෘත්‍ය ශාලාවෙකි. එ සේ මෙ සේ වූවකු ගේ නො වැ අනඞ්ගයා ගේ නෘත්‍ය ශාලාවෙකි. නෘත්‍ය ශාලාවක් වූව හොත් එහි ලයාන්විත වූ ගීත නාද ද පස තුරු ඝොස ද ස්ත්‍රීන් ගේ සුන්දර වූ රැඟුම් ද ඇති විය යුතු යැ. මේ උයන නමැති නෘත්‍ය ශාලායෙහි වූ ලයාන්විත ගීත නාද නම් මධුලෝලයන් ගේ නාදය යි. පස තුරු ඝොස නම් කෝකිලයන් ගේ නන්දනීය වූ රවය යි. ස්ත්‍රීන් ගේ සුන්දර වූ රැඟුම් නම් ලතාවන් මන්ද මාරුතයෙහි සෙලැවීම යි. එ හෙයින් රැඟුම් හලෙකැ අවශ්‍යයෙන් වියැ යුතු නෘත්‍ය-ගීත-වාදිතයෝ මේ උද්‍යානයෙහි වෙති. මී මැස්සන් ගේ හා කෝකිලයන් ගේ හා හඬ ද මන්ද මාරුතය ද කාමොද්දීපනයට අතිශයින් ඉවහල් වන හෙයින්, අනඞ්ගයා ගේ රඟ හල යැ යි කී හ.

310. මි ය ඹ  රස'ඹ පානය කෙරෙමින් වැහෙ· න
නිල'බ  පැහැති පරපුටු කැල තුටු රැව්  න
සිය'ඹ  සමග තුරු හිසැ දෙන නද නඳ  න
එ පබ  වත ගෙ තුති ගී කියනෙව් ගුව  න

අන්වය: නිල් අබ පැහැ ඇති පරපුටු කැල, සිය අඹ සමග, මි අඹ වැහෙන රස අඹ පානය කෙරෙමින්, තුරු හිසැ තුටු රැවින දෙන නදන නද, ගුවනැ එ පබවත ගෙ තුති ගී කියන එව්.

අර්ථ: නිල් අඟු (වලා කුළු) පැහැ ඇත්තා වූ කෝකිල සමූහයා, ස්වකීය අඹුවන් හා සමග, මී අඹයෙහි වැහෙන්නා වූ රසවත් වූ ජලය (ඉස්ම) බී, ගස් මුදුන්හි සතුටු හඬින් දෙන්නා වූ සනෙතාෂකර වූ නාදය, (කෙබඳු ද යත් හොත්,) ආකාශයෙහි ඒ ප්‍රභාවතිය ගේ සතුති ගීතිකා කියන්නා වැන්නැ.

විශේෂ: මියඹ — මී + අඹ = මීයඹ = මියඹ. 'ය' කාරය පර වැ පැමිණි කලැ පූර්ව ස්වරය හ්‍රස්ව වී. වැහෙන — 'වහා' (වහනයෙහි) ධාතුයෙන් වූ කර්මකාරක වර්තමාන කෘදන්ත නාම යි. 'වහ' ධාතු 'බල' ආදී පර පද යි. (කතු කරු). වහා-වහති-වැහී-වැහූ. (කම් කරු) වැහේ-වැහෙති-වැහිණි-වැහුණු. නිලබ පැහැති — කළු

311. එ මු ය න  ලිය ලියන් තුරු හිමි වලඳිම්  න
ලෙළ දෙන  අතු අතින් සා මුව සුතන් ගෙ  න
සු පි පෙ න  පත් ලවන් සුත් කුසුම මුව'ගි  න
න ළ ව න  වැන්නෑ බිඟු සන් සුරතල් බසි  න

අන්වය: එ උයනැ තුරු හිමි, ලිය ලියන් වලඳමින, ලෙළ දෙන අතු අතින් සා මුව සුතන් ගෙනැ, සුපිපෙන පත් ලවන් සුත් කුසුම මුව අගින, බිඟු සන් සුරතල් බසින, නළවන වැන්නැ.

අර්ථ: ඒ උයනෙහි වෘක්ෂ නමැති ස්වාමීහු, ලතා (වැල්) නමැති ස්ත්‍රීන් වැලැඳැ ගෙනැ (සිපැ ගෙනැ) ලෙළ දෙන්නා වූ අතු නමැති අතින් ශාඛා මෘගයන් (වඳුරන්) නමැති දරුවන් ගෙනැ, මනා සේ පුබුදින්නා වූ පත්‍ර නමැති තොල් ඇති මල් නමැති මුවඅ ගින්, සාධකයන්ගේ ස්වන (නාද) නමැති සුරතල් වචනයෙන්, නළවන වැන්නෝ යැ.

ඒ උයනෙහි ගස් වැලැදැ ගත්තා වූ වැල් වෙයි. ගස්හි අතුවලැ වඳුරෝ වෙත්. ගස්හි පත් විහිදෙන්නා වූ මල් ඇති. මල්හි බමරු වෙති. උන් ගේ නාදය මලින් නික්මෙයි. සියල්ල එක් කොටැ ගත් කලැ ඒ ගස්හු, සතින් බඳු, ගෙනැ අතින් දරුවන් ගෙනැ තොල් විහිදුවමින් මුවින් සුරතල් බස් කියකියා නලවන්නවුන් වැන්නෝ යැ.

මේ අර්ථය, මයුර සන්දේශයෙහි –

"තුරු හිමියෝ ලිය ලිය වලඳමි නී
සා මුව දරු වඩමින් සා අති නී
බිගු සත් සුරතල් බස් මල් මුවි නී
කියමින් නලවන වැනි ලෙලවමි නී"

යන්නෙන් ගැනුණේ යැ.

විපසණ: හිමි — 'හිමියෝ' යැ යි සිටියැ යුතු තැනි. සා මුව — ශාඛාවන්හි යන මුවන් වන බැවින් වඳුරෝ මෙ නම් වෙති. නළවන — 'නල' (රුවැටිමෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය වර්තමාන කෘදන්ත නාම යි. 'නල' ධාතු 'බම' ආදි ගණ යි, අකර්මක යි, පරස්මෛපද යි. නලා–නලති–නිළී–නුළුැ. ප්‍රයොජ්‍ය වූ තන්හි නලවා–නලවති–නැලැවී–නැලැවූ–යන ආදිය වෙයි. වැන්නැ — වැනි + යැ = වැන් + යැ = වැන්නැ.

312. ස ළු නා ප නා අඹ දඹ තුරු පෙල දිලෙ න
බි ගු නා දි නා සුත් මන සවන පිනව න
ගි ම නා උ නා ගතැ සුවඳැති නල හම න
න ත නා වි නා කො වනා සොබන එවුය න

අන්වය: සළු නා පනා අඹ දඹ තුරු පෙල දිලෙන, මන සවන පිනවන බිගු නාදිනා සුත්, සුවඳ ඇති නල ගතැ ගිමනා උනා හමන, සොබන එ උයන, නත නා විනා, කො වනා?

විපසණ: පනා — පනස හෙවත් කොස්. තුරු පෙල දිලෙන — වෘක්ෂ පඞ්ක්තිය බබලන්නා වූ. 'උයන' යන්නට විශෙෂණ යි. මන සවන — සිත කන. සිත ද කන ද. බිගු — භෘඞ්ගයන් ගේ. සම්බන්ධාර්ථයෙහි ෂෙ වන විභක්ති යි. නාදිනා — 'නාද' යනු 'ඉන්' විබත ගත් සේ යැ. 'නාදයෙන්' යනු විනා 'නාදින්' යනු ව්‍යවහාරයට අනුකූල නො වේ. ගතැ — ශරීරයෙහි. ගිමනා — විඩාව. අගැ 'ආ' යනු ආයේ

එළිය රැස්ම පිණිස යැ. හමුන — 'හම' (හැම්මෙහි) ධාතුයෙන් වූ වර්තමාන කෘදන්ත නාම යි. 'හම' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි, අකර්මක යි. හමා–හමති–හැමී–හැමූ. එවුසන— එ+උසන 'ව' කාරාගම යි. නන නා— අනන්ත නම් නාගයා. විනා — 'මිසක්' යන අර්ථයෙහි නිපාත පද යි. කො — කවරෙක්. මෙහි බහුවචන රූපය 'කෙ' යනු යි. වනා — වණීනා කෙරේ ද? ප්‍රශ්නාර්ථයෙහි නිපාතයක් නැත ද ආඛ්‍යාතයට පෙරටුයෙන් වූ 'කො' යනුයෙන් එය ප්‍රශ්නාර්ථ සූචක බව හැඟැවේ.

මේ පද්‍යය, කොවුල් අස්නෙහි –

"සිරි නා මනා රඟ මඟ අසැ තුරු රැ න් ද
බිඟු නා දී නා පිරි පිපි සපු එරහැ න් ද
මලි නා වනා එන මද නල මකර න් ද
ගිම නා උනා විදැ විදැ යව මිතුරි න් ද"

යන පද්‍යයට මදක් සමාන යැ.

317. නෙ ළ මි න් කුසුම් කැන් තැනැ තැනැ කෙළැ ඇවි ද
දු නු යෙ න් සියල'ඟෙහි ඩා බිඳු මඳින් ම ද
සො බ ම න් මදු රදූ සඳ පොකුණ තුළ වැ ද
දෙහොතින් ගනුත් දිය මුව දෝනට පැහැ ද

**අන්වය:** කුසුම් කැන් නෙළමින් තැනැ තැනැ කෙළැ ඇවිදූ, සියල් අඟෙහි ඩා බිඳු මඳින් මද දුනුයෙන්, සොබමන් මදු රදූ සඳ පොකුණ තුළ වැදූ, පැහැදූ මුව දෝනට දෙහොතින් දිය ගනුත් — (මතු සම්බන්ධ යි.)

**විවරණ:** කුසුම් කැන් — මල් පොකුරු. නෙළමින් — 'නෙළ' (නෙළීමෙහි=කැඩීමෙහි) ධාතුයෙන් වූ මිශ්‍ර ක්‍රියා නිපාත පද යි. 'නෙළ' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි. (කර්තෘ කාරු) නෙළා–නෙළති–නෙළී–නෙළූ. (කර්ම කාරු) නෙළේ–නෙළෙති–නෙළිණි–නෙළුණු. ඇවිදූ — 'ඇවිදු' (ඇවිදීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. මෙ තන්හි හෙත්වර්ථ යි. 'ඇවිදු' ධාතුව 'රක්' ආදි ගණ යි, පරස්මෛපද යි, අකර්මක යි. ඇවිදී–ඇවිදිති–ඇවිදී. සියල් අඟෙහි — සකල ශරීරයෙහි. ඩා බිඳු — ස්වේද බිඳුන්. දුනුයෙන් — දුනු+එන්=('ය' කාරාගමයෙන් හා හ්‍රස්ව විධියෙන් හා)

දුනුයෙන්. 'දන' (ජනිත වීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාමය කරණාර්ථයෙහි තුන් වන විබත ගෙනැ සිටි තැනි. 'දන' ධාතුව 'බම' ආදි ගණ යි, ඌනපද යි. දනා-දන්නි-දිනි-දුන්නු. මද්‍ර රදු සඳ — මද්‍ර රජු ගේ දියණියන්. රද + ඤ = රඤ. 'ද' ලොපයි. 'සඳ' යනු උත්තමාර්ථ යි. පොකුණ — කුස රජු සැගැ වී උන් පොකුණ. පොකුණ තුළ වැද — 'පොකුණට බැසැ' යනු අර්ථ යි. පැහැද — ප්‍රසන්න වැ. සතුටු සිතින්. දෙනට — 'දෙ' (බොවනයෙහි = සේදීමෙහි) ධාතුයෙන් වූ භාව කෘදන්ත නාමය සිවු වන විබත් ගත් තැනි. දොනු + අට = දොනට. 'දො' ධාතුව 'රක්' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) දෙවී-දෙවිති-දෙවි. (කම් කරු) දෙවේ-දෙවෙති-දෙවිණි-දෙවුණු. ගනුත් — 'ගත්' ධාතුයෙන් වූ අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි. ගත් + තු = ගත් + ඉ + තු = ගතිතු = ගනුතු = ගනුත්.

314. සොබමන් කුස නිරිඳු නම් මම යැ පල කො ට
වසමින් සිරි නෙළුඹු මල් පත් ඉවත් කො ට
විලසින් දිය රකුසු තර කෙසර නද කො ට
බිසොවුන් කොමල අත ගත් සඳෙහි තර කො ට

අන්වය : "සොබමන් කුස නිරිඳු නම් මම යැ" පල කොට, වසමින් සිරි නෙළුඹු මල් පත් ඉවත් කොට, දිය රකුසු විලසින් තර කෙසර නාද කොට, බිසොවුන් කොමල අත, තර කොට ගත් සඳෙහි — (මතු සම්බන්ධ යි.)

විසර්ජන : සොබමන් — ශොභමාන වූ. කවර හෙයින් සොබමන් ද යනු නම් නො කියැවෙයි. අතිශයින් විරූප වූ කුස රජු ගේ කවර නම් ශොභනත්වයෙක් ද? පල කොට — ප්‍රකාශ කොට. කියා. වසමින් — පූර්ව ක්‍රියාර්ථ යි. සිරි — 'සිවු' ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම යි. නෙළුඹු මල් පත් — නෙළුම් මල ද නෙළුම් පත ද. දිය රකුසු — ජල රාක්ෂසයකු ගේ. මෙ තන්හි අනියමාර්ථය වියැ යුතු වූව ද, එ සේ නො වී යැ. අර්ථ ව්‍යක්තිය සඳහා වියැ යුත්තේ 'දිය රකුසකු' යනු යැ. බිසොවුන් — ප්‍රභාවතිය ගේ. කොමළ — මෘදු වූ. අත ගත් සඳෙහි — අතින් ඇල්ලූ කලැ. සතර පාදයෙහි මැ එන 'කොට' යන පූර්ව ක්‍රියා නිපාතය කවිහු ගේ වාග්පරිද්‍යන 'පල කොට' සිටි.

315\. වි සුළු මුහුණ දකිමින් එ මැ ස දේ යා
නැබුළු යකෙක් මා අත ගති ත දේ යා
අ වු ළු වමින් ළැමැ සෝ ගිනි ක දේ යා
ක දු ළු සලා හඬමින් ඉකි බි දේ යා

අන්වය : විසුළු මුහුණ දකිමින්, එ මැ සදේයා "නැබුළු යකෙක් මා අත ගති" තදේ යා, ළැමැ සෝ ගිනි කදේයා අවුළුවමින්, කදුළු සලා, ඉකි බිදේයා හඬමින්- (මතු සම්බන්ධ යි.)

විෂපණි : **විසුළු මුහුණ** — කුස රජු ගේ විරූප මූණ. **දකිමින්** — පූර්ව ක්‍රියාව යි. **එ මැ සදේයා** — 'විසුළු මුහුණ දුටු විගසැ මැ' යනු අර්ථ යි. 'යා' යනු අධික යි. **නැබුළු** — මහත්. විශාල වූ. **ගති**—'ගන්' ධාතුයෙන් වූ අතීත ආඛ්‍යාත යි. **තදේ යා** — තදින් කියා. කුමක් කියා ද? "නැබුළු යකෙක් මා අත ගති" යනු කියා. **තදේ** — කරණාර්ථයෙහි පස් වන විබත් ගත් තැනි. **යා** — කියා. 'ය' කීමෙහි ධාතු 'බල' ආදි උභය-පද යි. (කතු කරු–පර පද) යා–යති–යී–යූ. (අත් පද) යේ-යෙති. (කම් කරු) යැවේ–යැවෙති–යැවිණි–යැවුණු. **ළැමැ** — හෘදයයෙහි. **සෝ ගිනි කදේයා** — ශෝක නමැති ගිනි කද, 'ඒයා' යනු අධික යි. **අවුළුවමින්** — අවුළු (ඇවිළීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයෝජ්‍ය මිශ්‍ර ක්‍රියා නිපාත පද යි. 'අවුළු' ධාතුව 'රක්' ආදි ගණ යි, ආත්මනෙපද යි, අකර්මක යි. ඇවිළේ–ඇවිළෙති–ඇවිළිණි–ඇවිළි–ඇවුළුණු, ඇවිළ්. **බිදෑ** — 'බිදු' (බිඳීමෙහි) ධාතුයෙන් වූ පූර්ව ක්‍රියා නිපාත යි. 'බිදු' ධාතුව 'බස්' ආදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) බිදී–බිඳිති–බිනී–බුනු. (කම් කරු) බිදේ–බිදෙති–බිඳිණි–බිඳුණු. **හඬමින්**– 'හඬ' (හැඬීමෙහි) ධාතුයෙන් වූ මිශ්‍ර ක්‍රියා නිපාත පද යි. 'හඬ' ධාතුව 'බල' ආදි ගණ යි, පරස්මෛපද යි, අකර්මක යි. හඬා–හඬති–හැඬි–හැඬූ. 'හ' කාර ලොපයෙන් මෙය 'අඬ' යි ද සිටී.

316\. සැපත් නළැ සසල රන ලියක විලසි නී
ගතත් වෙවුලමින් දස දෙසෙහි වැනිවැ නී
වතත් නෙතු යුගත් කොමල'නි නි වසමි නී
මහත් දුකින් සිටැ සැළැකුසැ මේ ලෙසි නී

අන්වය : සැපත් නලැ සසල රන ලියක විලසිනි, ගතත් වෙවුලමින් දස දෙසෙහි වැනිවෑනි, වතත් නේතු ලූගුත් කොමල අතිනි වසමිනි, මහත් දුකින් සිටැ මේ ලෙසිනී සැලැකු සැ.

විපසණි : සැපත් — සම්ප්‍රාප්ත වූ. නලැ — මාරුතයෙහි. සුළගෙහි. සසල — චංචල වූ. රන ලියක — සවණී ලතාවක ගේ. 'ලියක' යන තන්හි සම්බන්ධාර්ථයෙහි දෙවන විභක්ති සි. විලසිනි — ආකාරයෙන්. ගතත් — ශරීරය ද. ගත + ද= ගත+ද්=ගතත්. මෙහි 'ද' යන සමුච්චයාර්ථ නිපාතය 'වෙවුලමිනි'—'වැනිවැනි' යන කෘදන්ත නිපාත දෙකෙහි සම්බන්ධත්වය සඳහා සැ. සිංහලයෙහි වනාහි ක්‍රියා රූප දෙකෙකැ සම්බන්ධය සමුච්චයාර්ථයෙහි නිපාතයෙකින් හැඟැවුව මනා කල්හි නිපාතය ඒ ක්‍රියා රූපයනට මුලින් සිටි නාමයක් හා යෙදේ. 'හේ බතුත් කා ගෙදර ගියේ' යන වාක්‍යයෙහි 'බතුත් කා' යන තන්හි වන 'ද' යනුයෙන් හැඟැවෙනුසේ 'හේ බතුත් තවත් දැයකුත් කෑ බවක් නො වැ 'කා' 'ගියේ' යන ක්‍රියා රූප දෙකෙහි සමුච්චයය සි. වෙවුලමිනි — 'වෙවුල' ධාතුයෙන් වූ මිශ්‍ර ක්‍රියා නිපාත සි. 'වෙවුල' ධාතුව 'බල' ආදි ගණ සි, පරස්මෛපද සි, අකර්මක සි. වෙවුලා - වෙවුලති - වෙවිලී-වෙවුලූ. දස දෙසෙහි වැනිවැනී — 'හැම අතට මැ වැනිවැනි' යනු අර්ථ සි. වතත් — වක්ත්‍රය ද. මුහුණ ද. නෙතු ලුගත්—නෙත්‍ර යුගමය ද. ඇස් දෙක ද. සැලෑකුසැ—සැලැකූ + සැ. සැලැකූ — 'සලක' (සැලැකීමෙහි) ධාතුයෙන් වූ අතීත බහුවචන ආඛ්‍යාත සි. මෙයින් උක්ත වූ කර්තෘ පදය 313 වන පද්‍යයෙහි එනු 'මදු රදු සඳ' යනු සි. 'සලක' ධාතුව 'බල' ආදි ගණ සි, පරස්මෛපද සි. (කතු කරු) සලකා-සලකති-සැලැකී-සැලැකූ. ( කම් කරු ) සැලැකේ - සැලැකෙති - සැලැකිණි-සැලැකුණු. මේ ලෙසින් — මේ මතු කියැවෙනු පරිද්දෙන්.

317\. ගහනත ඉකා මි වි
කොසුල් තලැ දළි නො මැ සි වි
ද ගිය පුවක් සැ වි
වුවනතින් පල රකුසකු ශෙ සැ වි

**අන්වය:** ගහනාත ඉහා මිටි, කොපුල් තලැ දළි නො මැ සිටි, දෑ ගිය පුවක් සැවි, වුවනතින් රකුසකු ගෙ සැවි පල- (මතු සම්බන්ධ සි.)

**විසඳුම්:** **ගහනාත** — නාසය. මෙහි අනාතයෙහි වන 'අත' යනු නිරර්ථක යැ. **කොපුල් තලැ** — කපොල තලයෙහි කම්මුලෙහි. **දළි** — රවුළු. **නො මැ සිටි** — (රවුල) නො මැ ඇත්තා වූ කිසි සේත් රවුල නැති. **පුවක්** — කැවුමක්. පු+අක්=පුවක්. **සැවි** — බඳු වූ. ප්‍රථම පාදත්‍රයය මැ සතර වන පාදයෙහි වන 'වුවනතින්' යන්නට විශෙෂණ සි. **රකුසකු ගෙ සැවි පල** — රාක්‍ෂසයකු ගේ ආකාරය ප්‍රකාශ වූ.

318. දවසැ'රැ ඉදැ මොහු ට
වඩා මෙ ලැබෙන සැපත ට
අප මවු-පිය වෙත ට
ගමන යෙහෙකැ සි සිතා තර කො ට

**අන්වය:** "මොහුට දවස් හැරැ ඉදැ මෙ ලැබෙන සැපතට වඩා, අප මවු-පිය වෙතට ගමන යෙහෙකැ" සි තර කොට සිතා- (මතු සම්බන්ධ සි.)

**විසඳුම්:** **මොහුට** — ආධාරාර්ථයෙහි සිවු වන විභක්ති සි. 'මොහු කෙරෙහි' යනු අර්ථ සි. **දවස් හැරැ** — කල් ගත කොට. **ගමන** — යෑම. **යෙහෙකැ** — යෙහෙ+යැ=යෙහෙක්+ඇ= යෙහෙකැ. **යෙහෙක්** — 'යහ' ශබ්දය අනියමාර්ථ 'එක්' පස ගත් තැනි. යහ+එක්=යහෙක්=යෙහෙක්.

319. මා'ත ඇල්ලූ ය ම්
තැනැත්තෙක් කුස රජ න ම්
එ වකැ සිටැ අද හි ම්
මෙ මා වෙසෙසුයෙ හෙ මැ සැ සලක ම්

**විසඳුම්:** **මාත** — මා අත. **ඇල්ලූ** — 'අත්' යනු හා යෙදුණු 'ල' (ලීමෙහි) ධාතුයෙන් වූ අතීත කෘදන්ත නාම සි. 'අත්ලා' (අල්ලා) යන්නෙහි අර්ථ නම් 'අත දමා' යනු සි. දැන් 'අල්ල' යනු මැ 'බල' ආදි ගණ ධාතුවක් සේ වර නැඟෙයි. එහෙයින් සමහරුන් ලියන 'අල්වා' යනා ආදිය සදොසි. **එ වකැ** — ඒ කාලයෙහි. 'වක' නම් තිවිය සි. දැන් කාලාර්ථයෙහි

යෙදේ. මෙ තන්හි 'එ වීකා' යි කියැවුණේ ප්‍රභාවතිය ඇත් හලට ගිය දිනැ ඇත් ඉලත්තියෙකින් පහර ලැබූ තැනැ යැ. අද ගිම්— අද දස්වා. අද සිමා කොට. වෙහෙසුණෙ— ක්ලමට කම් කෙළේ. විහිළු කෙළේ. 'වෙහෙස' ධාතු 'බල' අදි ගණ යි, පරස්මෛපද යි. (කතු කරු) වෙහෙසා–වෙහෙසති–වෙහෙසී – වෙහෙසූ. (කම් කරු) වෙහෙසේ–වෙහෙසෙති–වෙහෙසිති–වෙහෙසුණු. 'වෙහෙසූ' යන අතීත කෘදන්ත නාමය 'ඒ' විබත් ගෙනැ'වෙහෙසූයේ' යැ යි සිටී. හෙ මැ යැ—හේ මැ යැ. ඒ තැනැත්තේ මැ යැ. "මට එ දා ඇත් ඉලත්තියෙකින් පහර දුන්නේ ද, එ දා අස්වසුරෙකින් පහර දුන්නේ ද, එදා උසුළු විසුළු කෙළේ ද, කුස රජ මැ යැ "යි ශ්‍රී ලේස් යි.

**320. පැවැසු නියම කො ට**
**නුවණැති දනන් පෙර සි ට**
**නුපුරුදු දිගය ට**
**පුරුදු කනවැන්දුම යෙහෙකි ම ට**

අන්වය : පෙර සිටැ නුවණ ඇති දනන් නියම කොට පැවැසූ පුරුදු කනවැන්දුම මට නුපුරුදු දීගයට යෙහෙකි.

අර්ථ : පුරාතනයෙහි සිට ඥානවත් ජනයන් නියම කොට පැවැසූවා වූ පුරුදු වූ කනවැන්දඹු බව, මට නුපුරුදු වූ දීගයට වඩා යහපති.

"නුපුරුදු දීගයට වඩා පුරුදු කනවැන්දුම් බව යහපති" යනු පුරාතනයෙහි සිටැ පැවැතැ එන කීමෙකි. කනවැන්දුම් බව නම් කිමෙක් ද? සුදුසු වයස පැමිණෙන්නට පෙර මැ ළදරුවකුට ළදැරියක පාවා දීම දූනුදු ජම්බුද්වීපයෙහි පවත්නා සිරිතෙකි. එ සේ පාවා දුන ද පුරුෂයා විසින් ස්ත්‍රිය කැඳවා ගෙනැ යන්නට පෙර පුරුෂයා මළේ නම්, කන්‍යා වූ ද ස්ත්‍රීය වැන්දඹු වෙයි. ඕ නැවැතැ පුරුෂයකු නො පතන්නී යැ. යමෙක් විවාහ යොජනාවක් කෙළේ නම් ඕ "නුපුරුදු දීගයට වඩා පුරුදු කනවැන්දුම යෙහෙකැ"යි කියන්නී යැ.

**321. සිතමින් මැ එ මැ ව ර**
**තම කැපි වැ ආ පිරිව ර**
**කැඳවා ගෙනැ නො හැ ර**
**යනුව නික්මුණු සඳෙකි සිය පු ර**

අන්වය : සිතමින් මෑ, එ මෑ වරැ, තම කැටි වෑ අ පිරිවර නො හැරැ කැඳවා ගෙනෑ, සිය පුර යනුව නික්මුණු සඳෙහි- (මතු සම්බන්ධ යි.)

විසඳුම් : සිතමින් — පූර්ව පද්‍යයෙන් ගෙන් කියැවුණු ආකාරයෙන් සිතා. තම — තමන් හා. කැටි වෑ — සමගින්. සමග වෑ. සිය පුර — ස්වකීය නගරයට. සාගල පුරයට. යනුව — යන පිණිස. 'යා' (යෑමෙහි) ධාතුයෙන් වූ අපර ක්‍රියා නිපාත යි යා + නුව = යනුව.

322. එ පවත් තතු ලෙසි න
දුනෑ මවු බිසොව සෑණෙකි න
කුස රජු හට නඳ න
පවසමින් යෑවුවා යෑ නොලසි න

අන්වය : මවු බිසොව එ පවත් තතු ලෙසින සැණෙකින දූනෑ, නඳන කුස රජු හට නො ලසින පවසමින් යැවූවා යැ.

විසඳුම් : එ පවත් — පබවතිය තමන් කැටි වෑ අ පිරිවර ද නො හැරැ කැඳවා ගෙනෑ සිය පුර යනුව නික්මුණු පුවත්. සැණෙකින — ක්‍ෂණයෙකින්. මොහොතෙකින්. නඳන — (නන්‍දන) පුත්‍ර වූ. නො ලසින — වහා. පවසමින් — පූර්ව ක්‍රියාව යි. යෑවුවා — 'යා' (ගමනෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය අතීත කෘදන්ත නාමය ස්ත්‍රීලිඞ්ගික 'අා' ප්‍රත්‍යය ගෙනෑ නිපන්නේ යෑ. යෑවූ + අා = යෑවූවා.

323. රජ අසා එ වදන
වැළැකුව හොතින් මෙ ගම න
පබවත් ළඳ දුකි න
පැළී මළ හොත් නපුරැ සිතමි න

අන්වය : රජ එ වදන අසා, "මෙ ගමන වැළැකුව හොතින් පබවත් ළඳ දුකින පැළී මළ හොත් නපුරු යෑ" සිතමින- (මතු සම්බන්ධ යි.)

විසඳුම් : රජ — කුස රජයා. එ වදන — ප්‍රභාවතිය යන්නට නික්මුණු බව කියා එවූ වචනය. වැළැකුව— 'වළක' ධාතුයෙන් වූ අතීත අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි.

වළක + අ = වැළැකු + අ = වැළැකුව. මෙහි 'වළක' ධාතු සකර්මක යි, 'බල' ආදි පර පද යි. (කතු කරු) වළකා-වළකති-වැළැකී - වැළැකූ. (කම් කරු) වැළැකේ - වැළැකේති-වැළැකිණ්-වැළැකුණු. නපුරැ — නපුරු + යැ = නපුරු + ඇ = නපුරැ.

324. පබවත අප පුර ට
තෙද විකුම් බල පළ කො ට
ගෙන'වුත් කප් හිම ට
පතුරුවමි මගෙ යසස තෙ දිය ට

අන්වය : තෙද විකුම් බල පළ කොට, පබවත අප පුරට ගෙන අවුත්, මගෙ යසස කප් හිමට තෙ දියට පතුරුවමි.

විසපණි : තෙද විකුම් බල—තෙජසෙහි ද වික්‍රමයෙහි ද බලය. පළ කොට — පෙන්වා. කප් හිමට — කල්ප සීමාව; දක්වා. කල්පාන්තය දක්වා. තෙ දියට—ජගත්‍රයෙහි. තුන් ලොවෙහි. ආධාරාර්ථයෙහි සිවු වන විබත්. පතුරුවමි — 'පතුරු' (පැතිරීමෙහි) ධාතුයෙන් වූ ප්‍රයොජ්‍ය ආඛ්‍යාත පද යි. මෙහි පතුරු ධාතු 'බස්' ආදි අත් පද යි. පැතිරේ-පැතිරෙති-පැතිරිණි, පැතිරි, පතිළි - පැතුරුණු, පැතිරි, පතුළ. ප්‍රයොජ්‍ය වූ තන්හි පතුරුවා-පතුරුවති-යනාදිය වේ.

325. මෙ ලෙස සිත තර කැ ර
සමගිනැ'ය ආ පිරිව ර
යන මෙන් සිය නුව ර
උනට දුක සේ දිනි යැ අවස ර

අන්වය : සිත මෙ ලෙස තර කැරැ, ඈය සමගින් ආ පිරිවර සිය නුවර යන මෙන්, උනට අවසර, දුක සේ දිනි යැ.

විසපණි : සිත — ස්වකීය චිත්තය. කුස රජු ගේ සිත. මෙ ලෙස — පූර්ව පද්‍යයෙන් කියැවුණු පරිද්දෙන් සිතා. තර කැරැ — ස්ථිර කොට ගෙනැ. ඈය සමගින් — ප්‍රභාවතිය හා. ආ — පැමිණියා වූ. උනට—ඒ ප්‍රභාවතියට ද පිරිවරට ද. දිනි — 'දෙ' (දීමෙහි) ධාතුයෙන් වූ අතීත එකවචන ආඛ්‍යාත යි. මෙයින් උක්ත වනුයේ 323 පන පද්‍යයෙහි ආ 'රජ' යන්න යැ.

කුස ජාතක විවරණයෙහි
ප්‍රථම භාගය නිමියේ යැ.



